NATIONAL CHRISTIAN
EVANGELICAL ALLIANCE
SRI LANKA



# ශ්‍රී ලංකාවේ ආගමික නිදහසේ තත්ත්වය

## වාර්ෂික වාර්තාව 2024

# ශ්‍රී ලංකාවේ ආගමික නිදහසේ තත්ත්වය

## වාර්ෂික වාර්තාව 2024

ශ්‍රී ලංකාවේ ආගමික නිදහස පිළිබඳ තත්ත්වය
2025

**ශ්‍රී ලංකාවේ ආගමික නිදහස පිළිබඳ තත්ත්වය | වාර්ෂික වාර්තාව 2024**

© 2025 ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය (NCEASL)

URL: www.nceasl.org

සියලුම හිමිකම් ඇවිරිණි.

මෙම ප්‍රකාශනයේ ප්‍රකාශන අයිතිය ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය (NCEASL) සතු වන අතර, මෙම වාර්තාවේ බුද්ධිමය දේපළ අයිතිය සහ බෙදා හැරීමේ අයිතිය ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය (NCEASL) පමණක් සතු වේ.

මෙම අධ්‍යයනයේ කතුවරුන් වන්නේ ජොවීටා අරුලානන්තම් සහ යනිත්‍රා කුමාරගුරු වන අතර, අමාරා නිලඟ්දීන් පර්යේෂකවරියක් ලෙස දායක විය.

NATIONAL CHRISTIAN EVANGELICAL ALLIANCE SRI LANKA

# ස්තූතිය

මෙම වාර්තාව පර්යේෂණ කර ප්‍රකාශයට පත් කිරීමට හැකි වූයේ සෙන්ටර් ෆෝ චර්ච් බේස්ඩ් ඩිවලොප්මන්ට් (CKU) සහ ෆ්‍රෙඩ්රික්ස්බර්ග් ඒකාබද්ධතා සංගමය (FIF) හි නොමසුරු සහයෝගය සහ හවුල්කාරීත්වය මතය.

ශ්‍රී ලංකාවේ ආගමික නිදහසේ තත්ත්වය

# අන්තර්ගතය


හැඳින්වීම 01

දළ විශ්ලේෂණය 07

පර්යේෂණ ක්‍රමවේදය 11

01

## නීති සම්පාදනය සහ ප්‍රතිපත්ති

ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සඳහා ඇති ප්‍රධාන දේශීය සහ ජාත්‍යන්තර ආරක්ෂණ 18

ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සහ, ආරක්ෂාවට හා මහජන සාමයට ඇති තර්ජන 21

ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සහ ප්‍රකාශනයේ නිදහස 28

ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහසට බලපාන වෙනත් නීති සම්පාදන/ප්‍රතිපත්ති 33

ස්ත්‍රීපුරුෂ සමාජභාවය සහ ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස 41

ලකුණු රැස් කිරීම සහ RAG ශ්‍රේණිගත කිරීම 45

02

## සමාජ දේශපාලනය සහ ආණ්ඩුකරණය

ආගමික උරුම ආරක්ෂා කිරීම 50

උරුමය පිළිබඳ විසංවාදවලදී ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස 52

බුද්ධාගම සහ නීතිය හා සාමය 57

කලාපීය බහුතරවාදය, නීතිය ක්‍රියාත්මක කිරීම සහ ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස 60

දැඩි මතධාරී දේශපාලන-ආගමික සංවිධාන 65

ඉස්ලාම් භීතිකාව සහ මුස්ලිම් විරෝධී හැඟීම 68

ආගමික වාද සහ සංකේතකරණය 71

ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස ප්‍රවර්ධනය උදෙසා රාජ්‍යයේ මැදිහත්වීම් 74

ලකුණු රැස් කිරීම සහ RAG ශ්‍රේණිගත කිරීම 79

03

## ප්‍රජාව සහ සංස්කෘතිය


කලාපීය බහුතර බලය, සාමූහික සබඳතා සහ ආගමික නිදහස 87

ගැටලුකාරී ආගමික ප්‍රචාරණය 89

ආගමික ප්‍රවණතා සහ අන්තර්/අභ්‍යන්තර ආගම් සමූහ ගැටුම් 91

වෙනස්කම් නොඉවසීම 96

ස්වයංව නම්කරගත් ගුරුවරුන් සහ දේශකයන් 97

ජාතික-ආගමික සහජීවනය සහ සහයෝගීතාවය 99

ලකුණු රැස් කිරීම සහ RAG ශ්‍රේණිගත කිරීම 102


04

## මහජන හා මාධ්‍ය මතවාදය


ජාති-ආගමික ප්‍රජාවන්ට සහ ආගමික නිදහසට බලපාන වෛරී ප්‍රකාශන හා ආගම් හා විශ්වාස ඇදහීමේ නිදහස 109

ඉස්ලාම් විරෝධී සහ මුස්ලිම් විරෝධී අන්තර්ගතය 111

ක්‍රිස්තියානි විරෝධී ආඛ්‍යාන 113

හින්දු-බෞද්ධ උරුමය පිළිබඳ ගැටුම 116

නව බුද්ධාගම් ගුරුවරුන් සහ බුදුදහම විකෘති කිරීම 117

දේශපාලන සහ මැතිවරණ ප්‍රකාශ 118

ජනවාර්ගික-ආගමික කණ්ඩායම් සහ උද්ගත වී ඇති ගැටලු පිළිබඳ මාධ්‍ය නිරූපණය 121

ලකුණු රැස් කිරීම සහ RAG ශ්‍රේණිගත කිරීම 126

ප්‍රධාන නිර්දේශ 129

ඇමුණුම 1 135

# හැඳින්වීම

ශ්‍රී ලංකාව විවිධ ජනවාර්ගික, ආගමික සහ භාෂාමය කණ්ඩායම් සඳහා නිවහනකි. බුද්ධාගම, ඉස්ලාම්, හින්දු සහ ක්‍රිස්තියානි ආගම් නිල වශයෙන් ආගම්[1] ලෙස පිළිගෙන ඇති අතර, බුද්ධාගමට "ප්‍රමුඛස්ථානය" ලබා දී එය ආරක්ෂා කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් රාජ්‍යයට භාර කරනු ලබයි.[2] බුද්ධාගමට හිමි ස්ථානය කෙසේවුවද, ශ්‍රී ලංකාව බොහෝ ආකාරවලින් එහි ජනවාර්ගික ආගමික සුළුතරයන්ට අනුග්‍රාහකත්වයෙන් කටයුතු කර ඇත.[3]

හින්දු, ඉස්ලාමීය සහ ක්‍රිස්තියානි දින දර්ශනවල ඇති සුවිශේෂී දිනයන් රජයේ නිවාඩු දින ලෙස සලකනු ලැබීම ද, සෑහෙන තරමකට ස්වාධීනව ක්‍රියාත්මක වන ඇදහිලි මත පදනම් වූ පෞද්ගලික පාසල් පැවතීම ද, එසේම, ආගමික ඇඳුම් පැළඳුම් සඳහා වර්තමානයේ කිසිදු නීතිමය සීමා නියම කොට නොමැති වීම ද, සියළුදෙනා ඇතුළත් වන පරිසරයක් පවතින බවට සංඥා කරයි. රජය, සියලුම පිළිගත් ආගම් සඳහා වෙනම ආගමික දෙපාර්තමේන්තු පවත්වාගෙන යාම අඛණ්ඩව සිදු කරන අතර, එහිදී මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ඉතිහාසය 1950 ගණන් දක්වා ම දිව යයි.[4] මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ සංශෝධන ඇණහිටීම පිළිබඳ ගැටලුව පිළිගන්නා අතර ම, සංස්කෘතික වශයෙන් ඇතුළත් නීතිමය රාමුවක් සඳහා විභවය ඇඟවුම් කරමින් මුස්ලිම්, උඩරට සිංහල[5] සහ උතුරු දෙමළ අයවලුන් සඳහා සම්ප්‍රදායික නීති පැවතීම වැදගත් සාධකයක් බව සඳහන් කරනු ලැබේ.

| ආගමික කණ්ඩායම | ප්‍රතිශතය | විස්තරය | භූගෝලීය ප්‍රදේශය (පළාත) |
|---|---|---|---|
| බෞද්ධ | 70% | සියලුම බෞද්ධයන් පාහේ සිංහල ජාතිකයෝ වන අතර ථෙරවාද බුද්ධාගම අදහනු ලබති. | බෞද්ධයන්ගෙන් බහුතරයක් මධ්‍යම, උතුරු-මැද, වයඹ, සබරගමුව, දකුණ, ඌව සහ බස්නාහිර පළාත්වල ජීවත් වෙති. |
| හින්දු | 12% | හින්දු භක්තිකයන් යනු "ශ්‍රී ලාංකික දෙමළ වැසියන්" [සියවස් ගණනාවකට පෙර දකුණු ඉන්දියාවෙන් සංක්‍රමණය වූ දෙමළ කතා කරන කණ්ඩායම් වලින් පැවත එන්නන්] හෝ "මලයියාභ/උඩරට දෙමළ" [මෑත කාලීන ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ වැසියන්] වේ. | "ශ්‍රී ලාංකික දෙමළ" ජනතාව වැඩි වශයෙන් උතුරු හා නැගෙනහිර පළාත්වල ජීවත් වන අතර "මලයියාභ/උඩරට දෙමළ" ජනතාව මධ්‍යම, සබරගමුව සහ ඌව පළාත්වල ජීවත් වෙති. |

1 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ජනගහන හා නිවාස සංගණනය - 2012, (ශ්‍රී ලංකා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව), 2012, https://www.statistics.gov.lk/pophousat/cph2012visualization/htdocs/index.php?usecase=indicator&action=Data&indId=10

2 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 1978, 9 වැනි ව්‍යවස්ථාව

3 මෙම වාර්තාවෙන් 'ආගමික' ප්‍රජාවන්ට වඩා 'ජනවාර්ගික ආගමික' ප්‍රජාවන් කෙරෙහි අවධානය යොමු කරයි. මෙම යෙදුම භාවිතා කිරීම ශ්‍රී ලංකාවේ ආගමික ප්‍රජාවන්ගේ අතිච්ඡාදනය වන වෙනස්කම් ආමන්ත්‍රණය කරන අතර ශ්‍රී ලංකාවේ කිතුනුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ ප්‍රවණතා විශ්ලේෂණය (ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය ශ්‍රී ලංකාව සහ වෙරිටේ රිසර්ච්, ඔක්තෝබර්, 2023) වාර්තාවේ තවදුරටත් සාකච්ඡා කෙරේ. https://minormatters.org/wp-content/uploads/2024/08/Trend-Analysis-of-Violence-Against-Christians-in-Sri-Lanka-November-2022-October-2023.pdf, 35

4 ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව, "අප ගැන", (කොළඹ, ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව, 2020), https://www.christian.gov.lk/aboutus.php; බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය, හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කාර්යසාධන සහ ප්‍රගති වාර්තාව, 2015, (කොළඹ, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය, 2015), https://www.parliament.lk/uploads/documents/paperspresented/performance-report-department-of-hindu-religious-2015.pdf,4; මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, "ඉතිහාසය", (කොළඹ, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 2015), https://muslimaffairs.gov.lk/history/

5 මධ්‍යම පළාතේ පිහිටා ඇති, බ්‍රිතාන්‍ය යටත් විජිතකරණයට පෙර ශ්‍රී ලංකාවේ අවසන් ස්වාධීන රාජාණ්ඩුව වූ උඩරට රාජධානියට සම්බන්ධ පෙළපතක් සහිත සිංහලයන්

| | | | |
|---|---|---|---|
| මුස්ලිම් | 9.7% | මුස්ලිම්වරුන් වෙනම ජනවාර්ගික ආගමික කණ්ඩායමක් ලෙස පිළිගැනේ. බොහෝ දෙනෙක් යෝනක හෝ මැලේ ජාතිකයන් වන අතර බහුතරයක් සුන්නි ඉස්ලාම් ආගම අදහති. | මුස්ලිම්වරුන්ගෙන් බහුතරයක් නැගෙනහිර පළාතේ ජීවත් වන නමුත් මධ්‍යම, උතුරු මැද, වයඹ, සබරගමුව, ඌව සහ බටහිර පළාත්වල සැලකිය යුතු පිරිසක් වෙසෙති. |
| ක්‍රිස්තියානි | 7.4% | ප්‍රධාන වශයෙන් සිංහල, දෙමළ සහ බර්ගර් ජාතිකයන්ගෙන් [ලන්දේසි හෝ පෘතුගීසි පරම්පරාවෙන් පැවත එන්නන්ගෙන්] සමන්විත වේ.<br>බොහෝ දෙනෙක් රෝමානු කතෝලික ආගම අදහන අතර අනෙත් අය ඇන්ග්ලිකන්වාදය සහ මෙතෝදිස්තවාදය වැනි ප්‍රධාන පෙළේ රෙපරමාදු කණ්ඩායම්වලට අයත් වෙති.<br>සංඛ්‍යාත්මකව නොදන්නා නමුත්, මෑත වසරවලදී, එවැන්ජලිකල් සහ ස්වාධීන කණ්ඩායම්වල වර්ධනයක් තිබී ඇත. | කිතුනුවන් රට පුරා විසිරී සිටියද, නැගෙනහිර, උතුර, වයඹ සහ බස්නාහිර පළාත්වල වඩා විශාල සංඛ්‍යාවක් ජීවත් වෙති. |

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2012 සංගණනයේ සහ එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ "ජාත්‍යන්තර ආගමික නිදහස පිළිබඳ 2022 වාර්තාව: ශ්‍රී ලංකාව" හි ප්‍රකාශිත දත්ත මත පදනම් වේ.**

වඩාත් ම වැදගත් දෙය නම්, සියලුම ජනවාර්ගික ආගමික කණ්ඩායම්වල ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාවට සැලකිය යුතු ව්‍යවස්ථාමය සහ නීතිමය රාමුවක් පැවතීමයි. මෙයට "ආගමක් තිබීමට හෝ පිළිගැනීමට" සහ "නමස්කාරය, පිළිපැදීම, ප්‍රගුණ කිරීම සහ ඉගැන්වීම"[6] හරහා ආගම ප්‍රකාශ කිරීමට ඇති නිදහස ඇතුළත් වේ. ඊට අමතරව, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය වැනි ජාත්‍යන්තර ගිවිසුම්වල අත්සන්කාර පාර්ශවයක් ලෙස ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට ඇති කැපවීම ප්‍රබලය.[7]

කෙසේ වෙතත්, නිල හෝ අනුග්‍රහය ලැබෙන ආගමක්[8] ඇති බොහෝ රටවල මෙන්, රාජ්‍යයක් යම් ආගමක් සමඟ සමීප සම්බන්ධතාවයක් පවත්වන්නේ නම් අනිවාර්යයෙන්ම ඉන් එම ආගමට විශේෂ තත්වයක් ලබා දෙන අතර, අනෙකුත් ආගම් ද්විතීයික තත්ත්වයකට නොහොත් දෙවැනි තැනකට පත් කරයි. සංකේතාත්මක හා සාපේක්ෂව හානිදායක නොවන මට්ටමකදී, මෙය, රාජ්‍ය සංකේත භාවිතයේදී සහ උත්සව අවස්ථාවලදී බුද්ධාගමට ගරු කිරීමට යොමුවීමටත්, බෞද්ධ නිවාඩු සහ සංස්කෘතික උත්සව සඳහා ප්‍රමුඛතාවය ලබා දීමටත් හේතු වී තිබේ. කෙසේ වෙතත්, බෞද්ධාගමට ප්‍රදානය කර ඇති විශේෂ තත්ත්වය සංකේතාත්මක භාවිතයෙන් ඔබ්බට විහිදේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ බුද්ධාගමට ලබාදී ඇති උත්තරීතරභාවය සහ බහුතර බෞද්ධ ප්‍රජාවේ අවශ්‍යතා කෙරෙහි ගරු කිරීමට යොමුවීම, රටේ නීතිමය පරිසරයට සහ, දේශපාලන, වාර්ගික සහ පෞද්ගලික ක්ෂේත්‍රවල චින්තනයට බලපා තිබේ. මෙය බොහෝවිට අනෙක් ජනවාර්ගික ආගමික කණ්ඩායම්වල ස්ථානය සහ ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස පිළිබඳ ඔවුන්ගේ අයිතියට හානි කිරීමට හේතු වී ඇත.

6 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 1978, 10 සහ 14 ව්‍යවස්ථා

7 සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය 18 (1 වගන්තිය), 1966 දෙසැම්බර් 19 දින අත්සන් කිරීම සඳහා විවෘත කරන ලදී, 999 U.N.T.S. 171, 6 I.L.M. 30 (1976 මාර්තු 23 දින සිට බලාත්මක විය)

8 පිව් පර්යේෂණ මධ්‍යස්ථානය, බොහෝ රටවල් නිල වශයෙන් හෝ නිල නොවන ලෙස නිශ්චිත ආගම්වලට කැමැත්තක් දක්වයි, (පිව් පර්යේෂණ මධ්‍යස්ථානය, 2017), https://www.pewresearch.org/religion/2017/10/03/many-countries-favor-specific-religions-officially-or-unofficially/

1948 දී නිදහස ලැබූ තැන් පටන්, ලිඛිත නොවන රීතියක් මගින්, ජනාධිපති සහ අගමැති තනතුරු දැරීමට නියම වී ඇත්තේ තමන් බෞද්ධ යැයි විවෘතව හඳුන්වා ගන්නා අයට පමණකි.[9] බලයට පත්වූවන් ඔවුන්ගේ ධුර කාල තුළ විවිධ මට්ටම්වලට රාජ්‍යයේ සිංහල බෞද්ධ ස්වභාවය සහ තත්ත්වය ආරක්ෂා කර ඇත. කෙසේ වෙතත්, 2024 දී ජනාධිපති අනුර කුමාර දිසානායක සහ නව පාර්ලිමේන්තුව තේරී පත්වීම තුළ, මෙම තත්ත්වයේ වෙනස්වීමක් පෙන්නුම් කරයි.

2024 මැතිවරණය පැවැත්වුණේ, ජනාධිපති ධුරයට පත් වූ හමුදා නිලධාරියෙකු වූ ගෝඨාභය රාජපක්ෂ සිය වැරදි ආර්ථික කළමනාකරණය හේතුවෙන් 2022 ජූලි මාසයේදී අරගලය[10] ලෙස වඩාත් ප්‍රකට වූ එම මහජන විරෝධතා මගින් බලයෙන් පහ කිරීමෙන් අනතුරුව ය. එහිදී, අගමැති ධුරය දැරූ ඔහුගේ සහෝදරයා වන මහින්ද රාජපක්ෂට ද ධුරයෙන් ඉවත් වීමට බල කෙරිණි. ඔවුන්ගේ ඉවත්වීමෙන් පසු, හය වතාවක් අගමැති ධුරය දැරූ රනිල් වික්‍රමසිංහ, ඔහුගේ සහයක මන්ත්‍රීවරුන් විසින් ජනාධිපති ධුරයට තෝරා පත් කරගන්නා ලද්දේ 2024 දී මැතිවරණයක් පවත්වන තෙක් පැවති ධුර කාල සීමාව සඳහා ය.[11]

රාජපක්ෂ සහෝදරයන් 2005-2015 සහ 2019-2022 අතර ජනාධිපතිවරුන් ලෙස කටයුතු කළ අතර බෞද්ධ අනාරක්ෂිතභාවයන් මත ඔවුන්ගේ බලය වඩාත් තහවුරු විය. මුස්ලිම්, හින්දු සහ ක්‍රිස්තියානි ජනකොටස් දේශපාලන වාසි සඳහා ගොදුරු කරගත් ක්‍රියාමාර්ග හඳුන්වා දීම සඳහා ඔවුහු තම දේශපාලන හා හමුදා බල කඳවුරු භාවිතා කළහ.[12] 2019 පාස්කු ඉරිදා ප්‍රහාර සහ මුස්ලිම් විරෝධී පළිගැනීම්වලින් පසුව තේරී පත් වූ ගෝඨාභය රාජපක්ෂ, ජාතික ආරක්ෂාව සඳහා ශක්තිමත් නායකත්වයක් සැපයීම යන්න මත තම දේශපාලන ප්‍රචාරක ව්‍යාපාරය පදනම් කර ගත්තේය.[13] 250කට වැඩි පිරිසක් ඝාතනයට ලක් වූ, එම එකිනෙකට සම්බන්ධ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර මාලාවට, ශ්‍රී ලංකාවේ රැඩිකල්කරණය වූ මුස්ලිම් කණ්ඩායමක් සම්බන්ධ වී තිබුණු අතර දේශීය දේශපාලන බලවේග ද මෙයට සම්බන්ධ වූයේ යැයි පුළුල් ලෙස සැලකෙයි.[14]

රාජපක්ෂ පාලන සමයේ දී, සටන්කාමී බුද්ධාගම වේගයෙන් පැතිර ගිය අතර, මුස්ලිම්වරුන්ට සහ, ඊට තරමක් දුරකට අඩුවෙන් කිතුනුවන්ට එරෙහිව මැර කල්ලි සහ කෝලාහල මෙහෙයවීමේ දී, බොදු බල සේනාව වැනි අන්තවාදී බෞද්ධ සංවිධාන ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන ලදී. ගෝඨාභය රාජපක්ෂ නැවත නැවතත් එම කණ්ඩායම අනුමත කරන බවක් දක්නට ලැබුණු අතර, 2021 දී සුළු ජාතීන්ට අදාළ වන සියලුම සම්ප්‍රදායික නීති අහෝසි කිරීමට උත්සාහ කළ නීති ප්‍රතිසංස්කරණ සලකා බැලීම සඳහා ඇතිකළ ජනාධිපති කාර්ය සාධක බලකායක ප්‍රධානියා ලෙස එම සංවිධානයේ නායකයා පත් කරන ලදී.[15]

---

9 “ශ්‍රී ලංකාව: නව ප්‍රඥප්තියේ බුද්ධාගම ප්‍රමුඛස්ථානය ගනී”, අල්ජසීරා, 2017 ජූලි 12, https://www.aljazeera.com/news/2017/7/12/sri-lanka-buddhism-to-remain-paramount-in-new-charter

10 රජයට සහ එහි ආර්ථිකය හැසිරවීමට එරෙහිව 2022 දී දියත් වූ මහජන විරෝධතා මාලාව වේ.

11 මීරා ශ්‍රීනිවාසන්, “ගෝඨාභය රාජපක්ෂ ඉවත් වේ, රනිල් වික්‍රමසිංහ ශ්‍රී ලංකාවේ වැඩබලන ජනාධිපතිවරයා ලෙස දිවුරුම් දෙයි”, ද හින්දු, 2022 ජූලි 15, https://www.thehindu.com/news/international/sri-lanka-crisis-president-gotabaya-rajapaksas-resignation-confirmed/article65642804.ece
අයේෂියා පෙරේරා සහ සයිමන් ෆ්‍රේසර්, “ශ්‍රී ලංකා අර්බුදය: ගෝඨාභය රාජපක්ෂ ප්‍රවීණ දේශපාලනඥයෙකු අගමැති ලෙස පත් කරයි”, බීබීසී ප්‍රවෘත්ති, 2022 මැයි, 13, https://www.bbc.com/news/world-asia-61417972

12 සුහයිර්, අයේෂා, පශ්චාත්-යුද්ධ ශ්‍රී ලංකාවේ සිංහල-බෞද්ධ ජනවාර්ගික-ජාතිකවාදයේ ගතිකය, (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2016), https://www.cpalanka.org/wp-content/uploads/2016/04/Dynamics-of-Sinhala-Buddhist-Ethno-Nationalism-in-Post-War-Sri-Lanka.pdf

13 ජාත්‍යන්තර අර්බුද කණ්ඩායම, ශ්‍රී ලංකාවේ පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් පසු: අනාගත ප්‍රචණ්ඩත්වයේ අවදානම් අඩු කිරීම, (ජාත්‍යන්තර අර්බුද කණ්ඩායම්, 2019), http://www.crisisgroup.org/asia/south-asia/sri-lanka/302-after-sri-lankas-easter-bombings-reducing-risks-future-violence

14 වෙරිටේ රිසර්ච්, ඒකාබද්ධ සමීක්ෂණ: පාස්කු ඉරිදා ප්‍රහාර, 2023 ඔක්තෝබර්, (වෙරිටේ රිසර්ච්, 2023 නොවැම්බර්), https://archive.veriteresearch.org/handle/456/6419

15 “ශ්‍රී ලංකා ජනාධිපතිවරයා මතභේදාත්මක එක රටක් එක නීතියක් කාර්ය සාධක බලකායේ සේවා කාලය දීර්ඝ කරයි”, ඉකොනොමි නෙක්ස්ට්, 2022 ජූනි 2, https://economynext.com/sri-lanka-president-extends-tenure-of-controversial-one-country-one-law-task-force-95065/

රාජපක්ෂවරු, උතුරු හා නැගෙනහිර පළාත්වල හින්දු භක්තිකයන්ට වැදගත් ස්ථාන බෞද්ධ ස්ථාන ලෙස නම් කිරීම සහ වන්දනාවට ප්‍රවේශය සීමා කිරීම සම්බන්ධයෙන් චෝදනා එල්ල වූ ව්‍යාපෘති, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, බෞද්ධ පූජක පක්ෂය සහ හමුදාව සම්බන්ධ කරගෙන මෙහෙයවූහ.

දූෂණ විරෝධී සහ දරිද්‍රතාවයට එරෙහි වේදිකාවක ප්‍රචාරක කටයුතුවල නියැලුණු, දැඩි වාමාංශිකයෙකු වූ දිසානායක, පුරුද්දක් ලෙස බුද්ධාගම කෙරෙහි තිබූ අධි අවධානය පසෙක ලා, ආගම දේශපාලනයෙන් දුරස් කර තැබීම වෙනුවෙන් පෙනී සිටියේය. බුද්ධාගමට පක්ෂපාතී නොවන බවක් පෙනුණු ඔහුගේ ස්ථාවරය සම්බන්ධයෙන් යම් විවේචන තිබියදීත්, සැප්තැම්බර් මාසයේ දී ඔහු ජනාධිපති ලෙස තේරී පත් විය. රාජපක්ෂ පවුල සමග සමීපව සම්බන්ධ ගති ලක්ෂණ වූ දූෂණයට සහ ගජ මිතුරු සැලකිල්ලට එරෙහි ඔහුගේ ස්ථාවරය පැරණි දේශපාලන බල කණුවලින් හෙම්බත් වූ ඡන්දදායකයින් ආකර්ෂණය කර ගන්නා ලදි.[16] ඊට අමතරව, අපකීර්තිමත් රාජපක්ෂවරුන් සමග බැඳී ඇති තවත් දේශපාලන උපාය මාර්ගයක් වන භේදකාරී ආගමික කියවීමෙහි ආකර්ෂණය නැති වී ගොස් තිබුනේ, "ජාතිවාදයට ඉඩක් නොතිබිය යුතුය" යනුවෙන් දිසානායක කළ ආමන්ත්‍රණය වඩාත් ආකර්ශනීය කරවමිනි.[17]

ජනවාර්ගික ආගමික ප්‍රජාවන්, විශේෂයෙන් උතුරු හා නැගෙනහිර දෙමළ ජනතාව, දිසානායකට සහාය දැක්වීමට පසුබට වූහ. දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය (LTTE) සහ ශ්‍රී ලංකා රාජ්‍යය අතර සන්නද්ධ ගැටුමේදී ඔහුගේ පක්ෂය වන ජනතා විමුක්ති පෙරමුණ (JVP) බොහෝ විට රාජපක්ෂවරුන් ඇතුළු සිංහල-බෞද්ධ ජාතිකවාදීන් සමග පෙළ ගැසෙමින් නිරූපණය කළ ඓතිහාසික භූමිකාව ඔවුන්ගේ මතකයේ රැඳී තිබිණි.[18] විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස ජනාධිපතිවරණ සමයේදී උතුරු හා නැගෙනහිර පළාත්වල වැඩිම ඡන්ද ප්‍රතිශතයක් ලබා ගත්තේය.[19] කෙසේ වෙතත්, පාර්ලිමේන්තු මැතිවරණයේදී, දෙමළ ජනතාව ජනාධිපතිවරයාගේ සංධානය වන ජාතික ජන බලවේගය (NPP) සඳහා විශාල ඡන්ද සංඛ්‍යාවක් ලබා දුන් අතර, උතුරු හා නැගෙනහිර මැතිවරණ දිස්ත්‍රික්ක සියල්ලේ ම පාහේ බහුතර ආසන ගණනක් ජාතික ජන බලවේගය විසින් දිනා ගන්නා ලදි.[20] ජනවාර්ගික දේශපාලනයෙන් සහ ඔවුන්ගේ දෙමළ ජාතිවාදී නියෝජිතයින්ගෙන් විඩාවට පත්වීම, යෝග්‍ය විකල්ප හිඟවීම, සහ සංවර්ධනය සඳහා ඉල්ලුම වැඩිවීම මෙම වෙනසට බලපෑවාක් විය හැක.[21]

මෙම වාර්තාවේ විස්තර කරන ලද පරිදි, 2024 දී දිසානායක සහ වික්‍රමසිංහ යන දෙදෙනාම තම පූර්වගාමී නායකයින් අනුගමනය කළ, සුළුතර කණ්ඩායම්වල ජනයා ආන්තීකරණයට තුඩු දුන් ප්‍රතිපත්තිවලින් දුරස් වූහ. කොවිඩ්-19 වසංගතය අතරතුර විශේෂඥයන්ගේ අදහස්වලටත් මුස්ලිම් ආගමික විශ්වාසවලටත් පටහැනිව මළසිරුරු අනිවාර්යයෙන් ආදාහනය සඳහා අනුගමනය කළ ප්‍රතිපත්තිය පාස්කු ඉරිදා ප්‍රහාරයෙන්

---

16 ජොයෙල් ගින්ටෝ සහ අයේෂා පෙරේරා, "ශ්‍රී ලංකාවේ නව වාමාංශික ජනාධිපතිවරයෙකු දිවුරුම් දෙයි", BBC News, සැප්තැම්බර් 23, 2024, https://www.bbc.com/news/articles/cqxr03x4dvzo; ජාතික ජන බලවේගයේ (NPP ශ්‍රී ලංකා) මැතිවරණ ප්‍රකාශනය, පොහොසත් රටක් ලස්සන ජීවිතයක්, (ජාතික ජන බලවේගය ශ්‍රී ලංකාව, 2024 අගෝස්තු), https://www.npp.lk/up/policies/en/nppolicystatement.pdf ප්‍රවේශය 2024 සැප්තැම්බර් 1

17 මීරා ශ්‍රීනිවාසන්, "ශ්‍රී ලංකාවේ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම, ජාතිවාදය අතුගා දැමීම ප්‍රමුඛතාවයකි, ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක පවසයි", ද හින්දු, 2024 සැප්තැම්බර් 3, https://www.thehindu.com/news/international/fixing-sri-lankas-economy-wiping-out-racism-top-priority-says-jvp-leader-anura-kumara-dissanayake/article68601908.ece.

18 නිරූපමා සුබ්‍රමනියම්, "ජනතා විමුක්ති පෙරමුණ පිළිබඳව", ද හින්දු, මාර්තු 8, 2024, https://www.thehindu.com/news/international/on-the-janatha-vimukthi-peramuna-explained/article67926353.ece; අම්බිහයි අකිලන්, "වෙනස් වන ශ්‍රී ලංකාවේ දෙමළ ප්‍රශ්නය: දිසානායකගේ වාමාංශික න්‍යාය පත්‍රයේ සීමාවන්", රාජ්‍ය තාන්ත්‍රිකයා, 2024 නොවැම්බර් 13, https://thediplomat.com/2024/11/the-tamil-question-in-a-changing-sri-lanka-the-limits-of-dissanayakes-leftist-agenda/

19 ශ්‍රී ලංකා මැතිවරණ කොමිසම, "2024 ජනාධිපතිවරණ - සමස්ත ලංකා ප්‍රතිඵල", https://results.elections.gov.lk/pre2024/index.php

20 ශ්‍රී ලංකා මැතිවරණ කොමිසම, "2024 පාර්ලිමේන්තු මැතිවරණය - සමස්ත ලංකා ප්‍රතිඵල", https://results.elections.gov.lk/

21 අමිත් බරුවා, "ශ්‍රී ලංකාව එහි වාර්ගික දේශපාලනයේ වෙනසක් අත්විඳිමින් සිටිනවාද?", පෙරටුගාමී, 2024 නොවැම්බර් 12, https://frontline.thehindu.com/world-affairs/sri-lanka-parliamentary-elections-2024-dissanayake-srilankan-tamils-jaffna-voters-economic-crisis/article68860523.ece

පසුව පැවති මුස්ලිම් විරෝධී අදහස්වල දිගුවක් ලෙස සලකනු ලබන අතර, ඒ පිළිබඳව වික්‍රමසිංහ සමාව ඉල්ලා සිටීම විශේෂයෙන් සළකිය යුතු ය.

කෙසේ වෙතත්, ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහසට දිගු කලක් තිස්සේ තර්ජනය කරන ප්‍රවණතා සම්පූර්ණයෙන් ම ආපසු හැරවී නොමැති අතර නීති ප්‍රතිපත්ති සහ රාජ්‍ය ක්‍රියාමාර්ග කෙරෙහි ඒවා තවදුරටත් බලපෑම් සිදු කරයි. එසේම, ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සහ බහුත්වවාදය සඳහා උරදෙන පරිසරයට තර්ජනයක් වන, ප්‍රජා මට්ටමේ දුක්ගැනවිලි සහ ආගමික ප්‍රවණතාවලින් අයුතු ප්‍රයෝජන ලබන දේශපාලන-ආගමික දැඩි මතධාරී කණ්ඩායම් ඇතුළු අනෙකුත් අනෙකුත් බාධක ද මෙහි ලා වැදගත් වේ.

# දළ විශ්ලේෂණය

මෙම වාර්තාවෙන් ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සඳහා සෘජුවම බලපාන, හෝ ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස ක්‍රියාත්මක කිරීමේ පරිසරයට සහාය වන, හෝ එය අඩපණ කරන ප්‍රධාන රටාවන් ඉස්මතු කරයි. මෙය පෙන්නුම් කිරීම සඳහා එය රාජ්‍ය සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් සම්බන්ධ වන, 2024දී ඇති වූ සිදුවීම් සහ වෙනස්වීම් යොදාගෙන තිබේ. මෙහි සෑම පරිච්ඡේදයකටම පසුව, සිදුවීම් සහ වෙනස්වීම් ඇගයීම සඳහා මාර්ගෝපදේශයක් ලෙස භාවිතා කෙරෙන දර්ශක මාලාවක් සහ ලකුණු කාඩ්පතක් ඇතුළත් කර තිබේ.

1 වන පරිච්ඡේදය, ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහසට බලපෑමක් සහිතව සිදුවූ වෙනස්වීම් ගවේෂණය කරන අතරම, ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස පිළිබඳ නීති සහ ප්‍රතිපත්ති රාමුව පරීක්ෂා කරයි. මෙම පරිච්ඡේදයෙන් ආගමික සුළුතරයන් අසමාන ලෙස ඉලක්ක බවට පත්විය හැකි යැයි කියැවෙන, "ආගමික හැඟීම් මතුකරවන" ප්‍රකාශ අපරාධයක් ලෙස සලකන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත (OSA) පිළිබඳ අවධානය යොමු කර තිබේ. එවැනි නීති ක්‍රියාත්මක කිරීම සඳහා පූර්වාදර්ශය වී ඇත්තේ, ජනවාර්ගික ආගමික කණ්ඩායම් ආරක්ෂා කිරීම අදහස් කරගෙන සම්පාදනය කළ ද, ඒ වෙනුවට, ව්‍යාජ අපහාස නීතියක් ලෙස සහ සුළුජාතීන් ඉලක්ක කර ගැනීම සඳහා භාවිතා කර ඇති, (2007 අංක 56 දරන) සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත වැනි නීති ක්‍රියාවට නංවා ඇති අන්දම බව එයින් යෝජනා කරයි. යුද්ධයේ අවසානය සැමරීම සඳහා හින්දු කෝවිලක සිදුකරන ලද චාරිත්‍ර හේතුවෙන්, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත යටතේ ත්‍රිකුණාමලයේ දෙමළ ජාතිකයින් සිව්දෙනෙකු අත්අඩංගුවට ගැනීම මෙම ගැටලුව සඳහා උදාහරණයකි. එමෙන්ම, ඇතිව තිබෙන වෙනස්කම් අතර වැදගත් වෙනස්කමක් ලෙස, ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සඳහා සහායවීමට අදහස් කර පැනවූ විධිවිධාන වෙනත් අයිතිවාසිකම් උල්ලංඝනය සඳහා අනිසි ලෙස භාවිතා කළ හැකි ආකාරය පෙන්නුම් කරන, ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතාවය පිළිබඳ පනත් කෙටුම්පතට එරෙහිව ලබාදී ඇති තීන්දුව දැක්විය හැකිය. දැඩි රෙගුලාසි නියම කිරීම තුළ ඇදහිලි පදනම් කරගත් සංවිධානවලට බලපෑම් කළ හැකි, රාජ්‍ය නොවන සංවිධාන අධීක්ෂණ සහ ලියාපදිංචි කිරීම පිළිබඳ පනත් කෙටුම්පත හඳුන්වාදීම පිළිබඳව ද සාකච්ඡා කර තිබේ.

2 වන පරිච්ඡේදය රජයට සහ දේශපාලන ක්‍රියාකරුවන්ට බලපාන ප්‍රධාන ප්‍රවණතා සහ රටා ගවේෂණය කරන අතර, බොහෝ ගැටුම්වලදී බලධාරීන් බෞද්ධ බහුතරයේ අවශ්‍යතාවලට ද, එසේම, ප්‍රාදේශීය මට්ටමේ වාර්ගික ආගමික සුළුතරයන් අතර ඇතිවන ගැටුම්වලදී ප්‍රාදේශීය බහුතරයේ අවශ්‍යතාවලට ද, බොහෝ විට ප්‍රමුඛත්වය දෙන ආකාරය ඉස්මතු කරයි. ආගමික පූජනීය ස්ථාන පිළිබඳ නීති ක්‍රියාත්මක කිරීමේදී සහ ප්‍රජා ආරවුල් හැසිරවීමේදී මෙය දැකගත හැකිය. එසේම, වවුනියාවේ වෙඩුක්කුනාරි සහ මුලතිව්හි කුරුන්තූර්මලෙයි ඇතුළු මතභේදයට ලක් වූ ආගමික ස්ථානවල ඇති වී තිබෙන තත්වයන්, ආගමික උරුම ස්ථාන සංරක්ෂණය කිරීමේදී සිංහල-බෞද්ධ අවශ්‍යතා සඳහා ඇති පක්ෂග්‍රාහී නැඹුරුව හෙළි කරයි. රාජ්‍ය ක්‍රියාමාර්ගවලට බලපෑම් කිරීමට උත්සාහ කරන අතරම, ක්‍රිස්තියානි විරෝධී සහ මුස්ලිම් විරෝධී හැඟීම් ප්‍රවර්ධනය සඳහා හින්දුත්ව ආභාෂය ලත් දේශපාලන-ආගමික කණ්ඩායම් අතර ක්‍රියාකාරකම්වල වැඩිවීමක් ද, වසර පුරා වූ සිදුවීම් ගණනාවක් පදනම් කරගනිමින්, වාර්තාව මගින් ඉස්මතු කරයි. මීට අමතරව, හිස් ආවරණ පිළිබඳ මාර්ගෝපදේශ මෙම වසරේ වැරදි ලෙස අදාළ කරගැනීමෙන් හෙළි වූ, ඇතැම් රාජ්‍ය නිලධාරීන් අතර පවතින මුස්ලිම් විරෝධී හැඟීම් ද වාර්තාව තුළ අවධානයට යොමු කරවයි.

3 වන පරිච්ඡේදය, ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සහ බහුත්වවාදය සහිත පරිසරයට තර්ජන එල්ල කරමින් ප්‍රජා සාමාජිකයින් විසින් උසිගන්වන ලද සිදුවීම්වල ස්වභාවය අවධානයට ගෙන

එයි. එවැන්ජලික හෝ ස්වාධීන දේවස්ථාන ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක වූ එවැනි බොහෝ සිදුවීම් හරහා, බහුතරවාදය සහ තමන්ට වැඩි වරප්‍රසාද හිමිවිය යුතුය යන හැඟීම පෙන්නුම් කරයි. සිදුවීම්වල ස්වභාවයෙන් ද යෝජනා කෙරෙන්නේ ආගමට හරවාගැනීමට ඇති බිය මෙවන් ක්‍රියා සඳහා පොළඹවන සාධකයක් බවයි. මෙම ගැටලුව තවදුරටත් ගවේෂණය කරමින් මෙම පරිච්ඡේදය හරහා, ආගම ප්‍රචාරණය පිළිබඳ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති සීමා සහ ආගමට හරවාගැනීමට එරෙහි සංස්කෘතික හා සමාජීය නැඹුරුව තම ඇදහිල්ල බෙදා ගැනීම අනිවාර්ය කරන විශ්වාසයන් ඇති ආගමික කණ්ඩායම්වලට බලපා ඇති ආකාරය ඉස්මතු කරයි. එවැන්ජලික කණ්ඩායම් අතර පවතින ප්‍රචාරණය පිළිබඳ ව්‍යවහාර මෙම පරිච්ඡේදය හරහා ගැඹුරින් සාකච්ඡා කෙරෙන අතර අන්තර් සහ අභ්‍යන්තර-ප්‍රජා ගැටුම් ඇති කරන්නට තුඩු දෙමින් ක්‍රිස්තියානි, හින්දු සහ ඉස්ලාමීය ප්‍රජාවන් තුළ පවතින ආගමික ප්‍රවණතා කෙරෙහි අවධානය යොමු කරයි. එසේම, LGBTIQ+ පුද්ගලයින්ට බලපාන ප්‍රතිසංස්කරණවලට ප්‍රතිරෝධය දැක්වීමට සහ සාම්ප්‍රදායික විශ්වාසයන්ට අභියෝග කරන බව පෙනෙන නව ආගමික නිකායන් ප්‍රතික්ෂේප කිරීමට හේතු වෙමින් ප්‍රධාන පෙළේ ආගමික ආයතනවල ඇති අගතිගාමී ආකල්ප ද ගවේෂණය කෙරේ.

4 වන පරිච්ඡේදය බහුත්වවාදය සහ ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස කෙරෙහි මහජන හැඟීම් පිළිබඳ දර්ශකයක් ලෙස, ජනවාර්ගික හා ආගමික කණ්ඩායම් පිළිබඳ වෛරී ප්‍රකාශ සහ සමාජ මාධ්‍ය අදහස් දැක්වීම් පිළිබඳව කෙටි විස්තරයක් සපයයි. ප්‍රධාන පෙළේ ආඛ්‍යාන බොහෝ විට සමාජ-දේශපාලනික සහ ප්‍රජා මට්ටමේ වූ සිදුවීම් සහ වර්ධනයන් සමඟ සම්බන්ධ වී ඇති බව එය හෙළි කරයි. ජනවාර්ගික හා ආගමික සුළුතරයන් ඉලක්ක කරගත් හානිකර අන්තර්ගතයන්හි සැලකිය යුතු අඩුවීමක් ඇතත්, සිත් කරදරයට පත් කරන අන්දමේ රටා තවදුරටත් පවතින බව මෙම පරිච්ඡේදයෙන් හුවා දක්වයි. 2024 දී සමාජ මාධ්‍ය අන්තර්ගතය සෘජුවම ප්‍රචණ්ඩත්වය දිරිගැන්වූ බවට කිසිදු සාක්ෂියක් නොමැති වුවද, වෙඩුක්කුනාරි සිදුවීම ඇතුළු මතභේදයට තුඩු දුන් ආගමික ස්ථානවල ආරවුල් උග්‍ර කිරීමට එය හේතු වූවා විය හැකිය. විශේෂයෙන්, ජනගහනයේ වෙනස්වීම් පිළිබඳ ගැඹුරින් මුල්බැසගත් භීතිකාවන්ගෙන් අයුතු ප්‍රයෝජන ලබමින්, ඉස්ලාමීය සිරිත් විරිත් භයානක යැයි පෙන්වන සහ ඉස්ලාම්වාදය ත්‍රස්තවාදය සමගින් සම්බන්ධ කරන ආඛ්‍යාන හේතුවෙන් මේ තත්වය තුළ දිගින් දිගටම වඩාත් ඉලක්කගත කණ්ඩායම ලෙස මුස්ලිම්වරු කැපී පෙනේ. මහජනයා යමක් දෙස බලන අන්දමට බලපෑම් කිරමෙහි ලා සාම්ප්‍රදායික මාධ්‍ය අඛණ්ඩව ඉටු කරන කාර්යභාරය සැලකිල්ලට ගනිමින්, මාධ්‍ය හිමිකාරිත්වය, මාධ්‍ය කණ්ඩායම්වලට බෙදීම සහ ජනවාර්ගික ආගමික පැතිකඩ ගොඩනැගීම පිළිබඳව සහ මාධ්‍ය වාර්තාකරණය කෙරෙහි එහි බලපෑම සම්බන්ධ ගැටළු ද මෙම පරිච්ඡේදය ගවේෂණය කරයි.

වසර පුරා සිදු වූ ධනාත්මක වර්ධනයන් ද මෙම වාර්තාවෙන් ඉස්මතු කරයි. එහිදී සැලකිය යුතු කරුණක් නම්, 2024 මැතිවරණ ප්‍රචාරණයේ ස්වභාවයෙන් ද පිළිබිඹු වූ පරිදි, ආගමික ප්‍රවාද සහ හානිකර කථනය භාවිතය සමස්ථයක් ලෙස අඩුවී තිබීමයි. වඩාත් ඇතුළත් සහ පිළිගන්නාසුළු සංස්කෘතියක් කරා මාරුවීමක් මෙන්ම ආගමික බෙදීම්වලින් අයුතු ප්‍රයෝජන ලැබීමට උත්සාහ කරන දේශපාලන-ආගමික කණ්ඩායම්වල පසුබෑමකට හේතු වෙමින් දේශපාලන අභිනයන් සහ සංකේත භාවිතයේ වැදගත්කම 2 වන පරිච්ඡේදය සාකච්ඡා කරයි. රජයේ සහාය ලබන යාන්ත්‍රණවල ක්‍රියාකාරිත්වය සාකච්ඡාවට ගනිමින් මෙම වාර්තාව, තම ආගමික ප්‍රකාශනය හේතුවෙන් ඉලක්ක බවට වූ  ප්‍රජාවන්ගේ ගැටලුවලට විසඳුම් සෙවීමේදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම (HRCSL) නිරූපණය කරන ඵලදායී කාර්යභාරය ද ඉස්මතු කරයි. නව නීති හෝ රෙගුලාසි හඳුන්වාදීමට වඩා විවාද සහ සාකච්ඡාවලට වැඩි උනන්දුවක් දක්වන කල්හි, අන්තර් ආගමික කණ්ඩායම් සහ මුලපිරීම්වලට ඒවාට දායකවීම සඳහා ඇති විභවය ද සලකා බලන 3 වන පරිච්ඡේදයේ ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස පිළිබඳ කාරණා වැඩිදුර ආමන්ත්‍රණය කිරීමට ඇති අවස්ථා සාකච්ඡා කරයි.

අවසාන වශයෙන්, ආගමික නායකයින් සහ ඇදහිලි පදනම් කරගත් සංවිධාන, රජයේ නිලධාරීන්, ජාත්‍යන්තර ප්‍රජාව සහ සිවිල් සමාජය සඳහා වන නිර්දේශ ආකාරයෙන්, හඳුනාගත් අවස්ථා තවදුරටත් විස්තරාත්මකව ඉදිරිපත් කෙරේ.



# පර්යේෂණ ක්‍රමවේදය

## 1. දත්ත එකතු කිරීම සහ විශ්ලේෂණය

පර්යේෂණය මිශ්‍ර ක්‍රම ප්‍රවේශයක් භාවිතා කළේය. ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍රවලින් ගුණාත්මක දත්ත රැස් කරන ලද අතර, ප්‍රමාණාත්මක දත්ත ලබා ගන්නා ලද්දේ ද්විතීයික මූලාශ්‍රවලින් ම පමණි.

ප්‍රධාන තොරතුරු සපයන්නන් සමග සිදුකළ සම්මුඛ සාකච්ඡා සහ නාභිගත කණ්ඩායම් සමග සිදුකළ සාකච්ඡාවල එකතුවක් හරහා ප්‍රාථමික ගුණාත්මක දත්ත රැස් කරන ලදී. ආගමික පූජක පක්ෂය, ඇදහිලි පදනම් කරගත් සංවිධානවල නියෝජිතයින්, නීති විශේෂඥයින්, මාධ්‍ය විශ්ලේෂකයින්, ආගමික සහජීවනය ප්‍රවර්ධනය කරන සංවිධානවල නියෝජිතයින් සහ අනන්‍යතා දේශපාලනය පිළිබඳ විශේෂඥයින් වන පර්යේෂකයින්/ශාස්ත්‍රඥයින් සමග ප්‍රධාන තොරතුරු සපයන්නන්ගේ සම්මුඛ සාකච්ඡා 28 ක් පවත්වන ලදි. කොළඹින් පිටත සිටින සහභාගිවන්නන් සමග සම්මුඛ සාකච්ඡා ඇතුළුව අවම වශයෙන් සම්මුඛ සාකච්ඡාවලින් 50% ක් දුරබැහැර ස්ථානවල පවත්වන ලද අතර, 2024 ඔක්තෝබර් සිට 2025 මාර්තු දක්වා අදියර දෙකකින් යුතුව එම කටයුතු සිදුකරන ලදී.

ගුණාත්මක ද්විතීයික දත්තවලින් විශාල කොටසක්, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය (NCEASL), විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) සහ වෙරිටේ රිසර්ච් ආයතනය ඇතුළු සංවිධාන විසින් ප්‍රකාශයට පත් කරන ලද වාර්තාවලින්, ලබාගෙන ඇත. පසුගිය වසරවල නිරීක්ෂණය කරන ලද ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස පිළිබඳ ප්‍රවණතා සහ රටා මෙන්ම මෙම වාර්තාවල ඉදිරිපත් කරන ලද විශ්ලේෂණ ඇසුරින් 2024 වූ සිදුවීම් සහ වර්ධනයන් පරීක්ෂා කරන ලදි. අනෙකුත් ද්විතීයික දත්ත අතරට එක්සත් ජාතීන්ගේ ආයතන සහ පළාත් පාලන ආයතන විසින් ප්‍රකාශයට පත් කරන ලද වාර්තා සහ ප්‍රවෘත්ති ලිපි ඇතුළත් ය.

ද්විතියික ප්‍රමාණාත්මක දත්ත බොහෝ සෙයින් ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය, හැෂ්ටැග් ජෙනරේෂන් සහ ජාතික සාම මණ්ඩලය (NPC) ප්‍රකාශයට පත් නොකළ වාර්තා මත පදනම් විය. මෙයට, ජනවාර්ගික ආගමික කණ්ඩායම් ඉලක්ක කරගත් ප්‍රචණ්ඩත්වය, බිය ගැන්වීම් සහ වෛරී ප්‍රකාශ පිළිබඳ සිදුවීම් ලේඛනගත කිරීම, සහ ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සම්බන්ධ කාරණාවලදී මහජනයාගේ වටහාගැනීම පිළිබඳව සිදුකළ සමීක්ෂණ ඇතුළත් විය.

## 2. දර්ශක සහ ලකුණු ලබාදීම

ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස හා සම්බන්ධ සිදුවීම් මැනීම සහ අනාගතයේ කෙරෙන සංසන්දනාත්මක ඇගයීම්වලට සහාය වීම අරමුණු කරගත්, 2-6 දක්වා වන දර්ශක සහ ලකුණු කාඩ්පතක් සෑම පරිච්ඡේදයකම ඇත.

දර්ශක පදනම් වී ඇත්තේ ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස කෙරෙහි බලපෑමක් ඇති ප්‍රධාන දේශීය නීති සහ ජාත්‍යන්තර වගකීම් (බැඳීමක් ඇති සහ බැඳීමක් නොමැති), ආගමික ආයතන සහ පූජක පක්ෂයේ භාවිතය සඳහා ඇදහිලි පදනම් කරගත් ආයතන විසින් ගොඩනගන ලද මග පෙන්වීම්/යහපිළිවෙත් සහ ශ්‍රී ලංකාවේ නිරීක්ෂණය කරන ලද ප්‍රධාන ප්‍රවණතා සහ රටා මත ය. රාජ්‍ය සහ රජයේ ආයතන මත නීතිමය විධිවිධාන බලාත්මක කළ හැකි බව අවබෝධයට ගනිමින්ම, ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සම්බන්ධයෙන් රාජ්‍ය සහ සමාජ මට්ටමින් වන වාතාවරණය පිළිබඳ දර්ශක සංවර්ධනය කිරීමට සහ විශ්ලේෂණයට සහාය වීම සඳහා ඒවා මෙහි භාවිතා කර තිබේ. මානව හිමිකම් මහකොමසාරිස්

කාර්යාලය[22] සහ ෆ්‍රීඩම් හවුස්[23] විසින් සකස් කරන ලද දර්ශක රාමු වලින් ද ඒ සඳහා දැනුම ලබාගෙන තිබේ.

සෑම දර්ශකයක්ම ප්‍රශ්න ස්වරූපයක් ගන්නා උප දර්ශක මාලාවකින් සමන්විත වේ. සෑම දර්ශකයක්ම සකස් කිරීමේදී ගුණාත්මක (එනම් ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සඳහා පවතින වාතාවරණය පිළිබඳ විශේෂඥ අදහස් සහ ඇගයීම්) සහ ප්‍රමාණාත්මක (එනම් ආගමික කණ්ඩායම්වලට එරෙහි බිය ගැන්වීම් සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳ නිරීක්ෂණය කළ හැකි සිදුවීම් ගණන) දත්ත යන දෙකම සලකා බලා ඇත.

පහත සඳහන් නිර්ණායක මත පදනම්ව, සෑම උප දර්ශකයක්ම 1-10 පරිමාණයකින් ශ්‍රේණිගත කර ඇත.

| ලකුණු | Rag ශ්‍රේණිගත කිරීම | නිර්ණායක |
|---|---|---|
| 0-2 | | ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සහ බහුත්වවාදයට අනුබල දෙන බවට කර ඇති සහතික කිරීම් සහ පොරොන්දුවලට අනුගත නොවන ඉතා දුර්වල කාර්ය සාධනයකි. |
| 3-4 | | ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සහ බහුත්වවාදයට අනුබල දෙන බවට කර ඇති සහතික කිරීම් සහ පොරොන්දුවලට සුළු අනුගත වීමක් සහිත දුර්වල කාර්ය සාධනයකි. |
| 5-6 | | ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහසට සහ බහුත්වවාදයට අනුබල දෙන බවට කර ඇති සහතික කිරීම් සහ පොරොන්දු අනුගමනය කිරීමේදී කාර්ය සාධනය සම්බන්ධයෙන් සැලකිය යුතු චලනයක්/අවිනිශ්චිතතාවයක් නොමැත / මෙම ක්ෂේත්‍රයේ කාර්ය සාධනය බොහෝ දුරට උදාසීන වේ. |
| 7-8 | | ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහසට සහ බහුත්වවාදයට අනුබල දෙන බවට කර ඇති සහතික කිරීම් සහ පොරොන්දු සම්බන්ධයෙන් හොඳ කාර්ය සාධනයක් සහ අනුගත වීමක් වේ. |
| 9-10 | | ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහසට සහ බහුත්වවාදයට අනුබල දෙන බවට කර ඇති සහතික කිරීම් සහ පොරොන්දු සම්බන්ධයෙන් ඉතා හොඳ කාර්ය සාධනයක් සහ අනුගත වීමක් වේ. |

එක් එක් උප දර්ශකය අගයනු ලබන්නේ අදාළ පරිච්ඡේදයේ ඉදිරිපත් කර ඇති දර්ශකයට අදාළ ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත සහ විශ්ලේෂණයන් මත ය. ලබා දී ඇති ලකුණු සඳහා සාධාරණීකරණයක් ලෙස මෙම විස්තරයේ සාරාංශයක් සපයනු ලැබේ. එක් එක් උප දර්ශකයේ එකතු කළ ලකුණුවල සාමාන්‍යය, එම දර්ශකයට ලබාදෙන ලකුණු තීරණය කරයි.

මෙම වාර්තාවේ කතුවරුන් විසින් සහ ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානයයෙහි (NCEASL) නීතිය, සමාජ විද්‍යා සහ පර්යේෂණ පිළිබඳ පසුබිමක් ඇති සමාලෝචකයින් කණ්ඩායමක් විසින් එක් එක් දර්ශකයට අදාළ ලකුණු තක්සේරු කරන ලදී.

## 3. සීමාවන්

මෙම වාර්තාවේ සාකච්ඡා කර ඇති සිදුවීම් සහ වර්ධනයන් සර්ව සම්පූර්ණ ලැයිස්තුවක් නොවන නමුත් ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස පිළිබඳ විෂයෙහි 2024 වසරේ ප්‍රධාන ගැටළු මේවායින් නියෝජනය වන්නේ යැයි අදහස් කෙරේ.

ආගමික ප්‍රජාවන්ට හෝ පූජනීය ස්ථානවලට පහර දී හෝ විනාශ කර ඇති මුත්, ඊට හේතුව පැහැදිලි නැති සිදුවීම් මීට ඇතුළත් කර නොමැත. අපරාධවලට සම්බන්ධ යැයි පුළුල් ලෙස සැලකෙන උතුරු හා නැගෙනහිර

22 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම්, මහ කොමසාරිස් කාර්යාලය, මානව හිමිකම් දර්ශක: මැනීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශයක්, (එක්සත්ජාතීන්,2012) https://www.ohchr.org/en/publications/policy-and-methodological-publications/human-rights-indicators-guide-measurement-and

23 ෆ්‍රීඩම් හවුස්, ලෝකයේ නිදහස 2024 ක්‍රමවේදය පිළිබඳ ප්‍රශ්නය, (වොෂින්ටන් ඩීසී: ෆ්‍රීඩම් හවුස්, 2024) 2024 පෙබරවාරි, https://freedomhouse.org/sites/default/files/2024-02/FIW_2024%20MethodologyPDF.pdf

ඇතැම් ප්‍රදේශවල හින්දු දේවස්ථානවල සොරකම් සිදු කිරීම මෙම කාණ්ඩයට අයත් වේ.[24]

හුදකලා සිදුවීම් බවක් පෙනෙන සහ පුළුල් ප්‍රවණතා පෙන්නුම් නොකරන සිදුවීම් සහ වර්ධනයන් මෙම වාර්තාවට ඇතුළත් කර නොමැත. නිදසුනක් වශයෙන්, පොළොන්නරුව (උතුරු-මැද) කදුරුවෙල ප්‍රදේශයේ මුස්ලිම් වෙළඳුන්ට වසර ගණනාවක් තිස්සේ පෝය[25] දිනවල තම වෙළඳසැල් වසා දැමීමට නියම කර තිබේ. මේ හා සමාන වෙනත් සිද්ධීන් වාර්තා වී නොමැති බැවින්, ශ්‍රී ලංකාවේ වෙනත් තැනක මෙම නියමය බලාත්මක කර තිබේද යන්න පැහැදිලි නැත.

එමෙන්ම, මැයි මාසයේදී, කුරුණෑගල දී සහ මාවනැල්ලේදී (සබරගමුව) මුස්ලිම් ප්‍රජාවේ සාමාජිකයින් විසින් මුස්ලිම් තරුණයින් දන්සැල්වලට[26] සහභාගී වීම වැළැක්වීම හෝ ඒ සම්බන්ධයෙන් තරවටු කිරීමේ/බැණ වැදීමේ සිදුවීම් දෙකක් කැපී පෙනිණ. මෙම සිදුවීම ප්‍රජාව තුළ නොඉවසීම සහ ඇතැම්විට මුස්ලිම්-බෞද්ධ ආතතීන් පැවතීම පෙන්නුම් කළද, වෙනත් සමාන සිදුවීම් වාර්තා වී නොමැත.[27]

දත්ත ලබා ගැනීමේ හැකියාව සහ දත්ත විශ්ලේෂණය සඳහා ව්‍යාපෘති ධාරිතාව සම්බන්ධයෙන් යම් යම් සීමාවන් ඇති බැවින් මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇති දර්ශක රාමුව දැඩි සේ ශක්තිමත් නොවේ. ඉදිරිපත් කර ඇති රාමුව, අනාගත සංස්කරණ තුළ තවදුරටත් සංවර්ධනය කළ හැකි මූලාකෘතියක් වනු ඇතැයි අදහස් කෙරේ.

දත්ත ලබා ගැනීමේ හැකියාව සහ දත්ත විශ්ලේෂණය සඳහා ව්‍යාපෘති ධාරිතාව සම්බන්ධයෙන් යම් යම් සීමාවන් ඇති බැවින් මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇති දර්ශක රාමුව දැඩි සේ ශක්තිමත් නොවේ. ඉදිරිපත් කර ඇති රාමුව, අනාගත සංස්කරණ තුළ තවදුරටත් සංවර්ධනය කළ හැකි මූලාකෘතියක් වනු ඇතැයි අදහස් කෙරේ.

වාර්තාවේ 4 වන පරිච්ඡේදය ජනවාර්ගික හා ආගමික කණ්ඩායම් පිළිබඳ වෛරී ප්‍රකාශ සහ සමාජ මාධ්‍යවල පළ කර ඇති අදහස් ගවේෂණය කරන අතර ප්‍රධාන ධාරාවේ මාධ්‍ය තුළ ජනවාර්ගික හා ආගමික ප්‍රජාවන්ගේ නියෝජනය ද සලකා බලයි. ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සම්බන්ධ කරුණු මාධ්‍ය හරහා වාර්තාකරණය පිළිබඳ ප්‍රසිද්ධියේ ලබා ගත හැකි දත්ත ඉතා අල්ප බව පර්යේෂණයෙන් සොයා ගත් අතර, එමනිසා, පර්යේෂණ සොයාගැනීම් සහ මාධ්‍ය විශේෂඥයින්ගේ නිරීක්ෂණවලින් ලබා ගත හැකි දත්ත මත මෙම වාර්තාව පදනම් වී ඇත.

මෙම ක්ෂේත්‍රයේ ඇති දත්ත සීමිත හෙයින්, වාර්තාව “ජනවාර්ගික හා ආගමික කණ්ඩායම් නියෝජනය කිරීම සහ ප්‍රධාන ධාරාවේ මාධ්‍ය මගින් ඇතිවන ගැටළු” සම්බන්ධ දර්ශකයක් සඳහා ඇගයීමක් හෝ ලකුණු ලබා නොදේ. [4 වන පරිච්ඡේදයේ, 'ලකුණු කිරීම සහ රැග් ශ්‍රේණිගත කිරීම' යන කොටස බලන්න]

හින්දු සහ මුස්ලිම් ප්‍රජාවට එරෙහි ප්‍රචණ්ඩත්වය නිරීක්ෂණය කරන ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සන්ධානයෙහි (NCEASL) ජාල, දැනට සංවර්ධනය වන මට්ටමේ පවතින අතර, ක්‍රිස්තියානි විරෝධී

---

24 ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය (NCEASL), හින්දු භක්තිකයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ බිය ගැන්වීමේ සිදුවීම් 2024, ප්‍රකාශයට පත් නොකළ වාර්තාව, 2024 දෙසැම්බර්, NCEASL

25 බුදුරජාණන් වහන්සේගේ ජීවිතයේ සිදුවීම් සිහිපත් කරන පුර පසළොස්වක පොහොය දිනයක් සමඟ සමපාත වන මාසික බෞද්ධ (සහ රජයේ) නිවාඩු දිනය

26 ශ්‍රී ලංකා බෞද්ධ දින දර්ශනයේ ඉතා වැදගත් දිනයක් වන වෙසක් උත්සවය අතරතුර බොහෝ දුරට බෞද්ධයන් විසින් තාවකාලිකව පිහිටුවන ලද නොමිලයේ ආහාර ලබාදෙන ආහාර කුටියක්. දන්සැල් ත්‍යාගශීලීභාවය සහ පුණ්‍ය කටයුතු සංකේතවත් කරන අතර බොහෝ ශ්‍රී ලාංකිකයන් වාර්ගික ආගමික පසුබිම නොසලකා දානය දීමට සහ දානය ලැබීමට උද්යෝගයෙන් සහභාගී වේ.

27 ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය (NCEASL), මුස්ලිම්වරුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ බිය ගැන්වීමේ සිදුවීම් 2024, ප්‍රකාශයට පත් නොකළ වාර්තාව, 2024 දෙසැම්බර්, NCEASL

ප්‍රචණ්ඩත්වය නිරීක්ෂණය කිරීම සඳහා පවතින දත්ත එකතු කිරීමේ යාන්ත්‍රණ තරම් ම ඒවා ශක්තිමත් නොවිය හැකිය. එබැවින්, හින්දු සහ මුස්ලිම් ප්‍රජාවන්ට එරෙහි බිය ගැන්වීම් සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳ දත්ත මෙහි මුළුමනින් ම නියෝජනය වී නොතිබීමට ඉඩ ඇත.

එමෙන්ම, කුඩා බෞද්ධ නිකායන් ඇතුළුව බෞද්ධයන්ට එරෙහි බිය ගැන්වීම් සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිදුවීම් ක්‍රමානුකූලව නිරීක්ෂණය කරන කිසිදු යාන්ත්‍රණයක් වාර්තාවේ කතුවරුන් විසින් හඳුනාගෙන නොමැත. මෙම ක්ෂේත්‍රයේ විශ්ලේෂණය පදනම් වී ඇත්තේ මාධ්‍යවල ලේඛනගත කර ඇති හෝ වාර්තා කර ඇති වෛරී ප්‍රකාශ සිදුවීම් මත වන අතර ඒ හරහා තත්වය මුළුමනින් ම නියෝජනය වී නොතිබීමට ඉඩ ඇත.

මෙම අධ්‍යයනය අතරතුර සිදුවූ ඇතැම් සංවාද හරහා, මධ්‍යම පළාතේ මලයියාහ දෙමළ ප්‍රජාවේ සාමාජිකයින්, එවැන්ජලිකල් ක්‍රිස්තියානි සංවිධාන සහ හින්දු ජාතිකවාදී කණ්ඩායම් සම්බන්ධ වාර්ගික හා ආගමික ආතතීන් පවතින බව මතු විය. කෙසේ වෙතත්, වාර්තාවේ කතුවරුන්ට තොරතුරු ලබා ගත හැකි සිදුවීම් සහ වර්ධනයන් තුළ එවන් රටා ඉස්මතු වුයේ නැත.



## 1 වන පරිච්ඡේදය

# නීති සම්පාදනය සහ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකාව තුළ ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස කෙරෙහි බලපෑම් ඇති කරන නීති සහ ප්‍රතිපත්ති රාමුව සහ එහි වර්ධනයන්

## සොයාගත් ප්‍රධාන කරුණු

- ශ්‍රී ලංකාවේ, ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විධිවිධාන මගින් ක්‍රියාත්මක වන අතර දණ්ඩ නීති සංග්‍රහය, පුද්ගලික නීති සහ ත්‍රස්ත විරෝධී නීති ඇතුළු දේශීය ව්‍යවස්ථාදායක උපකරණ කිහිපයකින් ඊට සෘජුව සහ වක්‍රව බලපෑම් ඇති කරයි.
- කෙසේ වෙතත්, ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස තවදුරටත් වැඩිදියුණු කිරීමේ අරමුණින් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත සහ පුරාවස්තු ආඥා පනත වැනි ව්‍යවස්ථාදායක උපකරණවල ඇතුළත් කර ඇති විධිවිධාන කිහිපයක්, බලධාරීන් විසින් සුළුතර ප්‍රජාවන් ඉලක්ක කර ගැනීම සඳහා භාවිතා කර ඇත්තේ ඇතැම් විටක ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සෘජුවම උල්ලංඝනය කරමිනි. මෙම ඇතැම් විධිවිධානවලින් පුළුල් පරාසයක් විශේෂයෙන් අවභාවිතයට ලක්වීමේ අවදානමට මුහුණ දෙයි. 2024 මාර්ගගත ආරක්ෂණ පනතෙහි ද එම අවදානම පවතී.
- ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහසෙහි දියුණුව සඳහා යැයි කියනු ලබන විධිවිධාන සහ මූලධර්ම, ඇතැම් විට ප්‍රකාශනයේ නිදහස සහ ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතාවය වැනි අනෙකුත් අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට හේතු වී ඇත.

ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස බලාත්මක කිරීම සහ ක්‍රියාත්මක කිරීම පුළුල් හා ඵලදායී නීති සහ ප්‍රතිපත්ති රාමුවක් මත රඳා පවතී. එබැවින්, ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සංරක්ෂණය කිරීමේදී රාජ්‍යයක නීති සහ ප්‍රතිපත්ති රාමුව, අයිතිය සහ එහි විෂය පථය තහවුරු කරමින්, එය උල්ලංඝනයවීම් වළක්වමින් සහ අයිතිවාසිකම් උල්ලංඝනය දැනටමත් සිදුවී ඇති විට පිළියම් සහ සහන ලබා දෙමින් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන්නේ ය. එබැවින් ශ්‍රී ලංකාවේ ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහසෙහි ව්‍යාප්තිය සහ ක්‍රියාත්මක කිරීම ඇගයීමට නම්, අදාළ නීති රාමුව ඇගයීම ඉතා වැදගත් වේ. ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සහතික කිරීම සඳහා නීති සම්පාදනය අත්‍යවශ්‍ය වුවද, ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සහතික කිරීම සඳහා නීතිය පමණක්ම ප්‍රමාණවත් නොවේ.[28]

# 1. ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සඳහා ඇති ප්‍රධාන දේශීය සහ ජාත්‍යන්තර ආරක්ෂණ

## 1.1 ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ වගකීම්

ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ අයිතියක් ලෙස දක්වා ඇත.[29] සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 18 වන වගන්තිය එම අයිතියම අනුනාද කරමින් මෙසේ පවසයි.

28 භවානි ෆොන්සේකා. (මානව හිමිකම් නීති විශේෂඥ), යනිත්‍රා කුමාරගුරු විසින් මෙහෙයවෙන සම්මුඛ සාකච්ඡාව, 2025 පෙබරවාරි 18, කොළඹ; J. M ස්වාමිනාදන් (නීති විශේෂඥ), යනිත්‍රා කුමාරගුරු විසින් මෙහෙයවෙන සම්මුඛ සාකච්ඡාව, 2025 ජනවාරි 16, දුරකථන ඇමතුම හරහා.

29 මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය, වගන්තිය. 18, 18, G.A Res. 217A(III), U.N. Doc. A/RES/217 (III) (දෙසැ. 10, 1948)

"සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ සහ ආගම ඇදහීමේ නිදහස සෑම කෙනෙකුටම තිබිය යුතුය. තමන් තෝරා ගන්නා ආගමක් හෝ විශ්වාසයක් දැරීමට හෝ පිළිගැනීමට ඇති අයිතිය සහ තනිවම හෝ අන්‍යයින් සමගින් එක්ව, සහ ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව සිදුකරන වන්දනාමාන පිළිපැදීම, ප්‍රගුණ කිරීම හා ඉගැන්වීම හරහා තමන්ගේ ආගම හෝ විශ්වාසය ප්‍රකාශ කිරීමට ඇති අයිතිය මෙම අයිතිවාසිකමට ඇතුළත් වෙයි."[30]

18 වන වගන්තිය මගින් ලබා දී ඇති ආරක්ෂාව දේවවාදී, දේවවාදී නොවන සහ අදේවවාදී විශ්වාසය සහ කිසිදු ආගමක් හෝ විශ්වාසයක් ප්‍රකාශ නොකිරීමේ අයිතිය දක්වා විහිදේ.[31] ඊට අමතරව, සිතීමේ සහ හෘද සාක්ෂියේ නිදහස මෙන්ම තමන් තෝරා ගන්නා ආගමක් හෝ විශ්වාසයක් දැරීමට හෝ පිළිගැනීමට ඇති අයිතියට නිරපේක්ෂ සහ කොන්දේසි විරහිත ආරක්ෂාවක් ලබා දී ඇත.[32] කෙසේ වෙතත්, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 18(3) වගන්තියට අනුව, තමන්ගේ ආගම හෝ විශ්වාසය ප්‍රකාශ කිරීමට ඇති නිදහස සීමා කළ හැකිය. මෙම නිදහස නීතියෙන් නියම කර ඇති, සහ මහජන ආරක්ෂාව, සාමය, සෞඛ්‍යය හෝ සදාචාරය හෝ අන් අයගේ මූලික අයිතිවාසිකම් සහ නිදහස ආරක්ෂා කිරීමට අවශ්‍ය, සීමාවන්ට පමණක් යටත් කළ හැකිය.[33]

ආගම හෝ විශ්වාසය මත පදනම් වූ සියලු ආකාරයේ නොඉවසීම සහ වෙනස්කම් කිරීම් තුරන් කිරීම පිළිබඳ 1981 ප්‍රකාශනය මීට බෙහෙවින් සමාන ආකාරයකින් නිදහස දක්වාලයි.

ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ වගකීම්වලින් එකක් ලෙස, ශ්‍රී ලංකාව සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය අපරානුමත කර ඇත. ඊට අමතරව, ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායක පියවර හරහා තවමත් හඳුනාගෙන නොමැති මානව හිමිකම්වලට අදාළ, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි ඇතැම් වගන්ති බලාත්මක කිරීමේ අරමුණ හේතු වශයෙන් දක්වමින්, ශ්‍රී ලංකා රජය 2007 අංක 56 දරන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත ද බලාත්මක කරන ලදී.[34]

## 1.2 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබාදෙන සහතික කිරීම්

සෑම පුද්ගලයෙකුටම ආගමක් ඇදහීමට නිදහස ඇති බවට ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වන ව්‍යවස්ථාව මගින් විධිවිධාන සලසයි. තමන් තෝරා ගන්නා ආගමක් හෝ විශ්වාසයක් දැරීමට හෝ පිළිගැනීමට ඇති අයිතිය මෙයට ඇතුළත් වේ.[35] තමන්ගේ ආගම ප්‍රකාශ කිරීමේ නිදහස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වන ව්‍යවස්ථාවේ දක්වා ඇත. මෙම නිදහස පෞද්ගලිකව හෝ ප්‍රසිද්ධියේ, තනිවම හෝ අන්‍යයින් සමගින් එක්ව භුක්ති විඳිය හැකි අතර වන්දනාමාන කිරීම, පිළිපැදීම, ප්‍රගුණ කිරීම හා ඉගැන්වීම යන ස්වරූප ගත හැකිය.[36]

ඉහත සඳහන් ආගමක් ඇදහීමේ නිදහස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව හරහා තවදුරටත්

---

30 සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය. වගන්තිය 18(1), 1966 දෙසැම්බර් 19, 999 දින අත්සන් කිරීම සඳහා විවෘත කරන ලදී U.N.T.S. 171, 6 I.L.M. 30 (1976 මාර්තු 23 දින සිට බලාත්මක විය)

31 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය (HRC), CCPR සාමාන්‍ය අදහස් අංක 22: 18 වන වගන්තිය (සිතීමේ , හෘද සාක්ෂියේ හෝ ආගමක් ඇදහීමේ නිදහස), CCPR /C/21/Rev.1/Add.4, 1993 ජූලි 30, https://www.refworld.org/legal/general/hrc/1993/en/13375

32 එම

33 සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය. 18(3) වගන්තිය

34 2007 අංක 56 දරන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත

35 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, වගන්තිය . 10

36 එම, 14 ව්‍යවස්ථාව

තහවුරු කර ඇත්තේ "සියලු දෙනා නීතිය ඉදිරියේ සමාන විය යුතු අතර නීතියේ සමාන රැකවරණය ලැබීමට හිමිකම් ඇත්තෝය" යනුවෙනි.[37] කිසිදු පුරවැසියෙකුට ආගම අනුව වෙනස් කොට සැලකීමට ඉඩ නොදිය යුතු බව 12(2) ව්‍යවස්ථාව තවදුරටත් පිළිගනී.[38] කිසිදු පුරවැසියෙකුට ආගමේ පදනම මත වෙනස්කම් නොකළ යුතු බව 12(3)[39] ව්‍යවස්ථාව මගින් සහතික කරන අතර, පොදු ස්ථානවලට ප්‍රවේශ වීම සම්බන්ධයෙන් පුද්ගලයෙකුට ඔහුගේ හෝ ඇයගේ ආගම මත පදනම්ව වෙනස්කොට සැලකීම නොකළ යුතු බව සහතික කරන අතරම, ජාතිය, කුලය, ස්ත්‍රීපුරුෂ භාවය යනාදී හේතු මත වෙනස් කොට සැලකීමකින් තොරව, තමන්ගේම ආගමේ පොදු ආගමික ස්ථානවලට ප්‍රවේශය විශේෂයෙන් සහතික කරයි.

ප්‍රේමලාල් පෙරේරා එදිරිව වීරසූරිය (1985) නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය ආගමික නිදහස පරම අයිතියක් ලෙස හඳුනා ගන්නා ලදි.[40] ආගමික විශ්වාසයක් ආරක්ෂා කිරීම සඳහා එය තාර්කික, පිළිගත හැකි, ස්ථාවර හෝ තේරුම්ගත හැකි විය යුතු නැති බවත්, ආගමික විශ්වාසයන් විච්ඡේදනය කිරීමට අධිකරණ කටයුතු නොකළ යුතුය යන ස්ථාවරයේ එල්බ සිටීමෙන් අධිකරණය ආගමික විශ්වාසයට[41] ලබා දී ඇති පුළුල් අර්ථකථනය ද පැහැදිලි ය.[42]

කෙසේ වෙතත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ, තම ආගම ප්‍රකාශ කිරීමේ නිදහස මෙන්ම සමානාත්මතාවයට ඇති අයිතිය ද සීමා කිරීම්වලට යටත් විය හැකි බවයි. තිබිය හැකි සීමාවන් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට ඉතා සමාන ආකාරයකින් දක්වා ඇති අතර, සමානාත්මතාවයට ඇති අයිතිය සහ තම ආගම ප්‍රකාශ කිරීමේ නිදහස ජාතික ආරක්ෂාව, මහජන සාමය සහ මහජන සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීම සඳහා හෝ අන් අයගේ අයිතිවාසිකම් සහ නිදහස සඳහා නිසි පිළිගැනීමක් සහ ගෞරවයක් ලබා ගැනීම සඳහා හෝ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පොදු සුභසාධනයේ සාධාරණ අවශ්‍යතා සපුරාලීම සඳහා නීතියෙන් නියම කර ඇති සීමාවන්ට යටත් විය හැකි බවට 15(7) ව්‍යවස්ථාවෙන් විධිවිධාන සලසයි.[43]

ඊට අමතරව, රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මාර්ගෝපදේශක මූලධර්මවල 27(5) වගන්තියට අනුව, වෙනස්කොට සැලකීම හා පූර්වමතය තුරන් කිරීම සඳහා ඉගැන්වීම, අධ්‍යාපනය සහ තොරතුරු යන ක්ෂේත්‍රවල පියවර ගනිමින් ආගමික කණ්ඩායම් ඇතුළු සියලුම කොටස් අතර සහයෝගීතාවය සහ අන්‍යෝන්‍ය විශ්වාසය ප්‍රවර්ධනය කිරීමෙන් ජාතික සමගිය ශක්තිමත් කිරීම සඳහා වන රාජ්‍යයේ යුතුකම වැදගත් කරුණකි.[44] 27(6) ව්‍යවස්ථාව මගින් ආගම වැනි හේතු මත ඇතිවන අශක්නුතා තුරන් කිරීම සඳහා පුරවැසියන්ට සමාන අවස්ථා සහතික කිරීම රාජ්‍යයට පවරා ඇත.[45] අවසාන වශයෙන්, 27(11) ව්‍යවස්ථාව මගින් සියලුම ආගමික

---

37 එම, 12(1) ව්‍යවස්ථාව

38 එම, 12(2) ව්‍යවස්ථාව

39 "කිසිම පුද්ගලයෙකු ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය හෝ එවැනි හේතු මත, තම ආගමේ සාප්පු, පොදු අවන්හල්, හෝටල්, පොදු විනෝදාස්වාද ස්ථාන සහ පොදු වන්දනාමාන ස්ථාන වෙත ප්‍රවේශ වීම සම්බන්ධයෙන් කිසිදු අශක්නුතාවයකට, වගකීමකට, සීමාවකට හෝ කොන්දේසියකට යටත් නොවිය යුතුය."

40 ප්‍රේමලාල් පෙරේරා එදිරිව වීරසූරිය (1985) 2 ශ්‍රී ලංකා නීති වාර්තා 177

41 අධිකරණය තවදුරටත් ප්‍රකාශ කළේ "ප්‍රකාශය අමුතු සහ පෙළඹවීම පැහැදිලිවම ආගමික නොවන්නේ නම් , ආරක්ෂාව පතන පුද්ගලයා තමන්ගේ විශේෂ ආගමික විශ්වාසයේ විධාන නිවැරදිව වටහාගෙන තිබේදැයි විමර්ශනය කිරීම අධිකරණ කාර්යය සහ අධිකරණ හැකියාව තුළ නොමැති" බවයි.

42 ප්‍රේමලාල් පෙරේරා එදිරිව වීරසූරිය. 192 පිටුව

43 ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 1978, 15(7) ව්‍යවස්ථාව

44 එම, 27(5) ව්‍යවස්ථාව

45 එම, 27(6) ව්‍යවස්ථාව

කණ්ඩායම් සඳහා හිතකර ආර්ථික හා සමාජීය පරිසරයක් සඳහා සහාය වීමට රාජ්‍යයට නියෝග කරයි.[46]

## 2. ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සහ, ආරක්ෂාවට හා මහජන සාමයට ඇති තර්ජන

ආරක්ෂාවට ඇති තර්ජන ආමන්ත්‍රණය කිරීම සහ ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වන නීති සම්පාදනය එක් හෝ දෙයාකාරයකින් ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සමඟ ඡේදනය විය හැකිය.

1. ආරක්ෂාව ලබා දීමෙන් ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම; පුද්ගලයන්ට ප්‍රචණ්ඩත්වය පිළිබඳ බියෙන් හා අනතුරකින් තොරව, සාමය උල්ලංඝනය කිරීමක් අත්විඳීමකින් තොරව ආගමක් පිළිපැදීමට, විශ්වාසයක් දැරීමට සහ හෝ ඔවුන්ගේ ආගම ඇදහීමේ හෝ විශ්වාසය දැරීමේ නිදහස ප්‍රකාශ කිරීමට හැකි බව සහතික කිරීම.

2. ආගම හෝ විශ්වාසය ප්‍රකාශ කිරීම සාමය උල්ලංඝනය කිරීමක් හෝ එයට තර්ජනයක් නොවන බව සහතික කිරීම.

ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සමඟ පැහැදිලිවම ඡේදනය වන ආකාරයෙන් ආරක්ෂාවට ඇති තර්ජන ආමන්ත්‍රණය කරන නීතිමය විධිවිධාන දණ්ඩ නීති සංග්‍රහය, 2007 අංක 56 දරන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත, 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත (OSA) වැනි ශ්‍රී ලාංකික ප්‍රඥප්ති කිහිපයක දක්නට ලැබේ.

### 2.1 දණ්ඩ නීති සංග්‍රහය

දණ්ඩ නීති සංග්‍රහයේ 290 වන වගන්තියට අනුව, යම් පුද්ගල පන්තියක ආගමට අපහාස කිරීමේ අරමණින් හෝ යම් පුද්ගල පන්තියක් එවැනි ක්‍රියාවක් තම ආගමට කරන අපහාසයක් ලෙස සැලකීමට ඉඩ ඇති බව දැනගෙන, යම් පුද්ගල පන්තියක් විසින් පූජනීය ලෙස සලකන යම් ආගමික ස්ථානයක් හෝ වස්තුවක් විනාශ කිරීම, හානි කිරීම හෝ අපවිත්‍ර කිරීම වරදක් ලෙස සැලකේ.[47] ආගමික රැස්වීමකට බාධා කිරීම 291 වන වගන්තියෙන් වරදක් ලෙස අර්ථකථනය කරන අතර, ආගමික වන්දනාමාන සිදු කිරීමේ හෝ ආගමික උත්සවවල නීත්‍යානුකූලව නියැලී සිටින සභාවකට ස්වේච්ඡාවෙන් බාධා කිරීම සඳහා ලබා දෙන දඬුවම් නියම කරයි.[48] 292 වන වගන්තිය භූමදාන භූමිවලට අනවසරයෙන් ඇතුළුවීම සහ එහිදී යම් පුද්ගලයෙකුගේ ආගමට අපහාස කිරීමේ චේතනාව හෝ දැනුවත්බව තිබීම අපරාධයක් කොට සැලකේ. අවමංගල්‍ය උත්සව පැවැත්වීමට රැස්ව සිටින පුද්ගලයින්ට බාධා කිරීම මෙම විෂය පථයට අයත් වේ.[49]

46 එම, 27(11) ව්‍යවස්ථාව

47 ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය (1883 අංක 2 දරන ආඥා පනත), 290 වගන්තිය

48 එම., 291 වගන්තිය

49 එම., 292 වගන්තිය

## 2.2 පුරාවස්තු ආඥාපනත

පුරාවස්තු ආඥාපනත 'ශ්‍රී ලංකාවේ පුරාවස්තු සහ ශ්‍රී ලංකාව තුළ ඇති ඓතිහාසික හෝ පුරාවිද්‍යාත්මක වැදගත්කමක් ඇති ස්ථාන සහ ගොඩනැගිලි වඩා හොඳින් සංරක්ෂණය කිරීම'[50] සඳහා විධිවිධාන සැලැස්වීම අරමුණු කරගනී. විශේෂයෙන් 15 අ වගන්තිය මගින් පුරාවස්තු සොරකම් කිරීම ආඥාපනත යටතේ වරදක් ලෙස හඳුනාගෙන ඇති අතර 15 ආ වගන්තිය මගින් ඕනෑම පුරාවස්තුවක් හිතාමතාම විනාශ කිරීම, හානි කිරීම, විකෘති කිරීම හෝ කඩා දැමීම හෝ එහි ඕනෑම කොටසකට හිතාමතා හානි කිරීම වරදක් බවට දක්වයි.[51] 15 ඇ වගන්තිය යටතේ, මෙම ආඥාපනත යටතේ වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින පුද්ගලයෙකු ඇප මත නිදහස් නොකරන බව සැලකිය යුතු කරුණකි.[52]

මෙම නීති සම්පාදනය ද ආගමික වැදගත්කමක් ඇති ස්ථාන සහ ගොඩනැගිලි ආරක්ෂා කරන බව පෙනී යන අතර එම නිසා ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහසෙහි ආරක්ෂාව සඳහා දායක වන බව පෙනෙන්නට තිබුණද, නීති සම්පාදනයේ විධිවිධාන භාවිතා කර ඇති ආකාරය දෙස සමීපව බැලීමේදී එය අයුතු ලෙස භාවිත වීමේ හැකියාව පෙන්නුම් කරයි [ජනවාර්ගික-ජාතිකවාදය පිළිබඳ රටාවක් ඉදිරියට ගෙන යාම සඳහා පුරාවස්තු පනත භාවිතා කිරීම පිළිබඳ 2 වන පරිච්ඡේදයේ 2 වන වගන්තිය]

## 2.3 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 2(1)(ඌ) වගන්තිය, යම් පුද්ගලයෙකු විවිධ ප්‍රජාවන් හෝ වාර්ගික හෝ ආගමික කණ්ඩායම් අතර ප්‍රචණ්ඩ ක්‍රියා, ආගමික, වාර්ගික හෝ වාර්ගික අසමගිය හෝ වෛරය හෝ සතුරුකම පිළිබඳ හැඟීම් ඇති කරන විට හෝ ඇති කිරීමට අදහස් කරන විට, ඔවුන් වරදකට වරදකරුවන් වන බවට විධිවිධාන සලසයි.

වරද කොතරම් පුළුල් ලෙස නම් කර ඇත්ද යන්න සම්බන්ධයෙන් මෙම වගන්තියම[53] විවේචනයට ලක්ව ඇතත්, සුළුතර ප්‍රජාවන් ඉලක්ක කර ගැනීම සඳහා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යොදාගෙන ඇති ආකාරය සහ අනවශ්‍ය ලෙස දීර්ඝ කාලයක් සහ/හෝ අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනීමට[54] පහසුකම් සැලසීම සහ රඳවා තබා ගැනීම සහ වධහිංසා පැමිණවීමෙන් පාපොච්චාරණ ලබා ගැනීමට ඉඩ සැලසීම වැනි මානව හිමිකම් සම්බන්ධයෙන් වන සහතික වීම් උල්ලංඝනය කරන, පනතේ අනෙකුත් ප්‍රධාන අංගවලින් එය වෙන් කළ නොහැකි ආකාරය සැලකිල්ලට ගනිමින් ද පනත අධ්‍යනය කළ යුතුය.[55]

ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සම්බන්ධයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත භාවිතා කිරීමේ බලපෑම, පාස්කු ප්‍රහාරවලින් පසුව සිදු වූ අත්අඩංගුවට ගැනීම් රාශියකට අදාළව වඩාත් පැහැදිලිව දැකගත හැකි විය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පිළිබඳ 2022 වාර්තාවක, හියුමන් රයිට්ස් වොච්

50 පුරාවස්තු ආඥා පනත (සංශෝධිත)

51 පුරාවස්තු ආඥා පනත (සංශෝධිත), 15අ සහ 15ආ වගන්ති

52 පුරාවස්තු ආඥා පනත (සංශෝධිත), 15ඇ වගන්තිය

53 ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) 1979 අංක 48 දරන පනත, 2(1)(ඌ) වගන්තිය

54 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ශ්‍රී ලංකාවේ වෛරී ප්‍රකාශ සඳහා වගවීමට මුහුණ දීම: නීති රාමුව පිළිබඳ විවේචනයක්, (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2018 සැප්තැම්බර් 3), https://www.cpalanka.org/confronting-accountability-for-hate-speech-in-sri-lanka-a-critique-of-the-legal-framework/

55 "නීතිමය කළු කුහරයක - ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ප්‍රතිසංස්කරණය කිරීමට ශ්‍රී ලංකාව අසමත් වීම," හියුමන් රයිට්ස් වොච් (2022) පිටුව 2, මිමි ඇල්ෆොන්සස්, "මෑත කාලීන රඳවා තබා ගැනීම් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවලංගු කිරීම පිළිබඳ රජයේ ස්ථාවරය පිළිබඳව කනස්සල්ල මතු කරයි" සන්ඩේ ටයිම්ස්, 2024 දෙසැම්බර් 8, https:// www.sundaytimes.lk/241208/news/recent-detentions-raise-concerns-over-govt-stance-on-repealing-pta-580163.html

සංවිධානය මෙසේ පැහැදිලි කළේය.

“හියුමන් රයිට්ස් වොච් විසින් සමාලෝචනය කල අධිකරණ නඩුවලට අනුව, අත්අඩංගුවට ගැනීමෙන් පසු වසර 2කට වැඩි කාලයක් රඳවා තබාගෙන සිටින මෙම සැකකරුවන්ගෙන් සමහරෙක් ඔවුන් මුස්ලිම්වීම හැර වෙනත් පැහැදිලි හේතුවක් නොමැතිව අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගෙන ඇත.”[56]

මෙම අත්අඩංගුවට ගැනීම් අතර මරාගෙන මැරෙන බෝම්බකරුවෙකුට ආධාර කිරීම සහ අනුබල දීම සම්බන්ධයෙන් මුලදී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගත් නමුත් පසුව “වාර්ගික අසමගිය” ඇති කිරීම සම්බන්ධයෙන් අධි චෝදනා ලැබ සිටින නීතිඥ හෙජාස් හිස්බුල්ලා ද විය.[57]

මෙම අංශයට සම්බන්ධ අනෙකුත් ප්‍රමුඛ අත්අඩංගුවට ගැනීම් අතරට තම කවි එකතුව හරහා “ආගමික අන්තවාදය” ප්‍රවර්ධනය කිරීම සහ තම සිසුන්[58] අතර අන්තවාදය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට පත් කවියෙකු වන අහ්නාෆ් ජසීම්, සහ ෂරියා නීතිය පිළිබඳ ප්‍රකාශයක් මත පදනම්ව වාර්ගික අසමගිය ඇති කිරීම සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටි අසාත් සාලි අත්අඩංගුවට පත්වීම ඇතුළත් විය. සාලි ඇත්ත වශයෙන්ම එවැනි ප්‍රකාශයක් නොකළ බව පසුව මහාධිකරණය අනාවරණය කර ගත්තේය.[59] මෙම අවස්ථා තුනෙහි දී ම, සිදු වූ අත්අඩංගුවට ගැනීම් සඳහා ප්‍රමාණවත් විශ්වාසදායක සාක්ෂි නොතිබුණි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වෙනුවට ත්‍රස්ත විරෝධී පනතක් 2023 මාර්තු මාසයේදී ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලදි. එය 2023 සැප්තැම්බර් මාසයේදී ඉල්ලා අස්කර ගෙන නැවත ගැසට් පත්‍රයේ පළ කරන ලද අතර 2024 ජනවාරි මාසයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි. ත්‍රස්තවාදය වටා ඇති ප්‍රශ්න නියාමනය කිරීම සඳහා 'වඩාත් මානුෂීය' නීති සම්පාදනයක් ලෙස මෙය යෝජනා කර තිබුණද, ත්‍රස්තවාදය පිළිබඳ එහි පුළුල් අර්ථ දැක්වීම, අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබා ගැනීම්වලට එරෙහිව ආරක්ෂාවක් නොමැතිකම, නඩු විභාගයකට පෙර අනවශ්‍ය ලෙස දිගු කාලයක් රඳවා තබා ගැනීමට අවසර ලබාදිය හැකිබව, රැඳවුම් ස්ථානවලට ප්‍රවේශ වීමේ සීමාවන් යනාදිය සම්බන්ධයෙන් ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත දැඩිව විවේචනයට ලක් විය.[60] එය ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල යැයි සැලකීම සඳහා සංශෝධන කිහිපයක් අවශ්‍ය බව 2024 පෙබරවාරි මාසයේදී විශේෂ තීරණයක් මගින් ප්‍රකාශ කරන ලදි.

## 2.4 2007 අංක 56 දරන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත

සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනතේ 3(1) වගන්තියේ සඳහන් වන්නේ “කිසිදු පුද්ගලයෙකු යුද්ධය පැතිරවීමට හෝ වෙනස් කොට සැලකීම, සතුරුකම හෝ ප්‍රචණ්ඩත්වයට පෙළඹවීමක්

56 හියුමන් රයිට්ස් වොච් “නීතිමය කළු කුහරයක - ශ්‍රී ලංකාව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ප්‍රතිසංස්කරණය කිරීමට අපොහොසත් වීම” 40,41

57 එම, 42

58 එම, 1; “ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මාස 18 ක් රඳවාගෙන සිටි කවියෙකු වන අහ්නාෆ් නිදොස් කොට නිදහස් කරන ලදී”, නිව්ස්වයර්, 2023 දෙසැම්බර් 12, https://www.newswire.lk/2023/12/12/poet-ahnaf-detained-for-18-months-under-pta-acquitted/

59 “නීතිමය කළු කුහරයක - ශ්‍රී ලංකාව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ප්‍රතිසංස්කරණය කිරීමට අපොහොසත් වීම.” 38

60 ඕස්ට්‍රේලියානු රජය, විදේශ කටයුතු සහ වෙළඳ දෙපාර්තමේන්තුව, රටේ තොරතුරු වාර්තාව - ශ්‍රී ලංකාව (2024 මැයි 2) වගන්තිය 4.42 https://www.dfat.gov.au/sites/default/files/country-information-report-sri-lanka.pdf එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරියගේ ප්‍රකාශිකා: රවීනා ශම්දාසානි, “ත්‍රස්ත විරෝධී පනත සංශෝධනය කිරීමට ශ්‍රී ලංකාවට කැඳවීම”, මාධ්‍ය දැනුවත් කිරීමේ සටහන් - මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය, 2024 ජනවාරි 19, ප්‍රවේශ වූයේ 2025 මාර්තු 26 https://www.ohchr.org/en/press-briefing-notes/2024/01/call-sri-lanka-revise-anti-terrorism-bill

වන ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය වෙනුවෙන් පෙනී සිටීමට කටයුතු නොකළ යුතු" බවයි.

වෙනස් කොට සැලකීම, සතුරුකම සහ ප්‍රචණ්ඩත්වයට එරෙහිව රැකවරණය සඳහා දායක වන බව පෙනෙන සරල පාඨයක් මෙම නීතියේ ඇතුළත් බවක් පෙනෙන්නට තිබුනද, මෙම විධිවිධානය මානව හිමිකම් අනවශ්‍ය ලෙස සීමා කරන ආකාරයෙන් භාවිතා කර ඇත.[61] සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත මගින්, ශ්‍රී ලංකාවේ දේශීය නීති මගින් තවමත් හඳුනාගෙන නොමැති සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ ඇතුළත් මානව හිමිකම් බලාත්මක කිරීමට අදහස් කර ඇති බැවින්[62], එහි විධිවිධාන එලෙස භාවිතා කිරීම නීතිය බරපතල ලෙස අවභාවිත කිරීමක් වේ. එබැවින්, ක්‍රියාත්මක වීම හරහා එම නීතිය, සහ ඇත්ත වශයෙන්ම අපහාස නීතියක් ලෙස යොදාගැනෙමින් සුළු ජාතීන් ඉලක්ක කරන 'මර්දනය කිරීමේ මෙවලමක්' ලෙස භාවිත වන නීතියක් වශයෙන් ප්‍රසිද්ධිය ලබා ගෙන ඇත.[63]

මෙම වගන්තිය යටතේ සිදු කරන ලද අත්අඩංගුවට ගැනීම් පිළිබඳ කෙටියෙන් සලකා බැලීමේදී ඉහත කරුණු තවත් පැහැදිලි වේ. [විකට නිළි නතාෂා එදිරිසූරිය, යූ ටියුබ්කරුවකු වන බෲනෝ දිවාකර සහ එවැන්ජලිකල් දේවගැති ජෙරොම් ප්‍රනාන්දු සම්බන්ධ මෑත කාලීන නඩුවලදී සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය භාවිතය සම්බන්ධයෙන් 2 වන පරිච්ඡේදයේ 3 වන කොටස බලන්න.]

සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය වැරදි ලෙස අදාළ කරගැනීම සම්බන්ධයෙන් කරුණු පෙන්වා දෙමින් මානව හිමිකම් කණ්ඩායම් අවධාරණය කර ඇත්තේ, යොදාගත් භාෂාව 'කම්පනය ඇති කරවන, අප්‍රසන්න හෝ කැළඹිලි සහිත වුවත්, එය රාජ්‍යය විසින් ආරක්ෂා කළ යුතු' බවත් එවැනි කියමන් සහ 'වෙනස්කොට සැලකීමට, සතුරු වීමට හෝ ප්‍රචණ්ඩත්වය සිදු කිරීමට අන් අයව පෙළඹවීමේ අභිප්‍රාය' පෙන්වන කියමන් අතර වෙනස හඳුනාගත යුතු බවත්ය.[64]

ත්‍රිකුණාමලයේ අනුස්මරණ උත්සවයක නියැලුනු සහ පොලිස් නිලධාරියෙකුට පහරදීම් සිදු කළ බවට චූදිත පුද්ගලයින් හතර දෙනෙකු අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීමට අදාළව 3 වන වගන්තිය වැරදි ලෙස අදාළ කර ගැනීම සම්බන්ධයෙන් 2024 මැයි දිනැති ලිපියකින් පොලිස්පතිවරයා අමතමින් මානව හිමිකම් කොමිසම ද මෙම වගන්තිය "පුරුද්දක් වශයෙන් වැරදි ලෙස භාවිතා කරන්නට ගෙන ඇති" බව පිළිගෙන ඇත. රැඳවියන්ට ඇප ලබා දී ඇති බව පිළිගත් මානව හිමිකම් කොමිසම, එලෙස ඇප ලබා ගත හැකි වූයේ පසුව සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි 3 වන වගන්තිය නඩු කටයුතුවලින් ඉවත් කිරීම හේතුවෙන් පමණක් බව තවදුරටත් පෙන්වා දුන්නේය.[65]

නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්ට මෙම නීතිය අසාධාරණ ලෙස භාවිතා කළ හැකි වීමට හේතු වූ ලක්ෂණ දෙකක් ආචාර්ය ගෙහාන් ගුණතිලක විසින් හඳුනාගෙන ඇත. පළමුව, 3 වන වගන්තියේ විවිධ ආකාරයේ පෙළඹවීම් තුනක් (වෙනස් කොට සැලකීමට පෙළඹවීම, සතුරුකමට පෙළඹවීම සහ ප්‍රචණ්ඩත්වයට පෙළඹවීම)

---

61 ගෙහාන් ගුණතිලක, "ශ්‍රී ලංකාවේ මානව හිමිකම් නීතියක් මර්දනයේ මෙවලමක් වූයේ කෙසේද," හිමාල් දකුණු ආසියානු, 2023 පෙබරවාරි 07, https://www.himalmag.com/politics/iccpr-human-rights-law-repression-blasphemy-sri-anka

62 2007 අංක 56 දරන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත

63 ගෙහාන් ගුණතිලක, "ශ්‍රී ලංකාවේ මානව හිමිකම් නීතියක් මර්දනයේ මෙවලමක් වූයේ කෙසේද."

64 ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් දකුණු ආසියානු කලාපීය කාර්යාලය (@amnestysasia), "...ඊයේ සවස විකට නිළි නතාෂා එදිරිසූරිය අත්අඩංගුවට ගැනීම ගැන කනස්සල්ලට පත්ව සිටී. ප්‍රකාශනයේ නිදහස පිළිබඳ අයිතියට ගැඹුරින් අපහාසාත්මක විය හැකි ආකාරයේ තොරතුරු ඇතුළුව සියලු ආකාරයේ තොරතුරු සහ අදහස් අදාළ වේ...", ට්විටර්, 2024 ඔක්තෝබර් 22, https://twitter.com/amnestysasia/status/1663080845890969600.

65 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම පොලිස්පතිවරයාට, 2024 මැයි 20, ලිපිය. https://www.hrcsl.lk/wp-content/uploads/2024/05/HRCSL-Letter-to-IGP-on-20-05-2024.pdf

ඇතුළත් වුවද, එම විවිධ වූ වරදවල් තුනටම අදාළව පනවා ඇති දඬුවම එකක් බව ඔහු අවධාරණය කරයි. මෙහි දී එක් එක් ආකාරයේ පෙළඹවීම් සඳහා සඳහා ගැලපෙන දඬුවම් පැනවීම සඳහා රාජ්‍යයට තිබූ අවස්ථාව ප්‍රයෝජනයට ගෙන නොමැත. උදාහරණයක් ලෙස, විකාශන බලපත්‍රයක් අවලංගු කිරීම හෝ සමාජ මාධ්‍ය ගිණුමක් සීමා කිරීම, වෙනස් කොට සැලකීමකට හෝ සතුරුකමට පෙළඹවීමට එරෙහි සුදුසු දඬුවමක් විය හැකි බව ඔහු පැහැදිලි කරයි.[66]

දෙවනුව, 3(4) වගන්තියේ වරද ගොඩනගා ඇති ආකාරය කෙරෙහි ආචාර්ය ගුණතිලක අවධානය යොමු කරන අතර එහි දැක්වෙන්නේ වරදක් "දත හැකි සහ ඇප දිය නොහැකි විය යුතු අතර, එවැනි වරදක් සම්බන්ධයෙන් සැක කරන හෝ චෝදනා ලැබ සිටින කිසිදු පුද්ගලයෙකු සුවිශේෂී අවස්ථාවන්හිදී මහාධිකරණය විසින් හැර, ඇප මත මුදා නොහැරිය යුතුය" යනුවෙනි.[67] මෙම වරදට අත්අඩංගුවට ගැනීම සඳහා වරෙන්තුවක් අවශ්‍ය නොවීම සහ ඇප මත මුදා හැරීමට නොහැකි වීම යන සාධක දෙකෙහි ඒකාබද්ධ බලපෑම, අදාළ සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා හේතු වනු පමණක් නොව, සුදුසු සාක්ෂි ප්‍රමාණයක් තිබිමකින්, නඩු පැවරීමක් හෝ වරදකරු කිරීමකින් තොරව රඳවා තබා ගත හැකි භයානක යථාර්ථයක් බවට පරිවර්තනය කරයි.[68]

2019 අගෝස්තු මාසයේදී, වෛරී කථනය පිළිබඳ නීතිය ක්‍රියාත්මක කිරීමේ ගැටලුවට ප්‍රතිචාර වශයෙන්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම තමන්ගේම විශ්ලේෂණයක් සහ මාර්ගෝපදේශයක් සකස් කළේය.[69] ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විසින් රබාත් ක්‍රියාකාරී සැලැස්ම ඉස්මතු කර දක්වමින් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනතේ 3 වන වගන්තියේ විෂයපථය තීරණය කිරීම සඳහා මෙම පරීක්ෂණය යොදා ගත යුතු බවට නිර්දේශ කරයි.[70] එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ (OHCHR)[71] මුලපිරීමක් වන රබාත් ක්‍රියාකාරී සැලැස්ම, සමාජීය හා දේශපාලන සන්දර්භය, කථිකයාගේ තත්ත්වය, ප්‍රේක්ෂකයින් පෙළඹවීමේ අභිප්‍රාය, කතාවේ අන්තර්ගතය සහ ස්වරූපය, එහි ව්‍යාප්තියේ ප්‍රමාණය සහ හානියක් වියහැකි බව සැලකිල්ලට ගනිමින් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනතේ 20 වන වගන්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉහළ සීමාවක් යෝජනා කරයි. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම සිය නිර්දේශ අතර සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනතේ 3 වන වගන්තිය[72] ප්‍රකාශනයේ නිදහස සමග සමතුලිත කළ යුතු බව ද පවසන අතරම 3 වන වගන්තියට අදාළව රාජ්‍ය බැඳීම් දක්වා සිටී.[73] ශ්‍රේෂ්ඨාධිකරණය මෙම මාර්ගෝපදේශ අනුමත කර ඇත. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ මාර්ගෝපදේශවල ප්‍රතිඵලයක් ලෙස, පොලිස් නීති අංශයේ

---

66 ගෙහාන් ගුණතිලක, "ශ්‍රී ලංකාවේ මානව හිමිකම් නීතියක් මර්දනයේ මෙවලමක් වූයේ කෙසේද?"

67 2007 අංක 56 දරන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත, 3(4) වගන්තිය

68 ගෙහාන් ගුණතිලක, "ශ්‍රී ලංකාවේ මානව හිමිකම් නීතියක් මර්දනයේ මෙවලමක් වූයේ කෙසේද."

69 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම, 2007 අංක 56 දරන ICCPR පනතේ 3 වන වගන්තියේ විෂය පථය පිළිබඳ නීතිමය විශ්ලේෂණය සහ සහායක නිර්දේශ, (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම, 2019 අගෝස්තු), ), https ://www.hrcsl.lk/wp-content/uploads/2020/02/ICCPR-Act-s.-3-Guidelines-English.pdf. ප්‍රවේශ වූයේ 2024 ඔක්තෝබර් 1 දින ය.

70 එම

71 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්, ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය ඇති කිරීම තහනම් කිරීම පිළිබඳ විශේෂඥ වැඩමුළු පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයාගේ වාර්තාව, (එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්, 2013 ජනවාරි 11) ප්‍රවේශ වූයේ 2024 අගෝස්තු 24, https://ohchr.org/sites/default/files/Rabat_draft_outcome.pdf.

72 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, 2007 අංක 56 දරන ICCPR පනතේ 3 වන වගන්තියේ විෂය පථය පිළිබඳ නීතිමය විශ්ලේෂණය සහ ඊට අදාළ නිර්දේශ." (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම, 2019 අගෝස්තු), https://www.hrcsl.lk/wp-content/uploads/2020/02/ICCPR-Act-s.-3-Guidelines-English.pdf. ප්‍රවේශ වූයේ 2024 ඔක්තෝබර් 1.

73 SC (F.R) අයදුම්පත අංක 135/2020

අධ්‍යක්ෂකගේ උපදෙස් මත පමණක් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනතේ 3 වන වගන්තිය යටතේ පරීක්ෂණ පවත්වන ලෙස සියලුම ස්ථාන භාර නිලධාරීන් හට නියෝග කරමින් සහ පොලිස් නිලධාරියෙකු විසින් පනත අනිසි ලෙස භාවිතා කිරීම විනය ක්‍රියා පටිපාටියකට තුඩු දිය හැකි බවට ද විධිවිධාන සලසමින් චක්‍රලේඛයක් නිකුත් කර ඇත.[74]

නටාෂා එදිරිසූරිය සම්බන්ධයෙන් වන ඇප නියෝගයේදී (2023 ජුලි 5) මහාධිකරණ විනිසුරුවරිය, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් නිකුත් කරන ලද මාර්ගෝපදේශය පිළිබඳව පැහැදිලිව සඳහන් නොකළද, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත පිටුපස ඇති අරමුණ ලෙස පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කරන ලද අරමුණ ද, ප්‍රකාශනයේ නිදහස සමග 3 වන වගන්තියේ අර්ථ නිරූපණය ද සැලකිල්ලට ගත් අතර රබාත් ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති අවශ්‍යතාවලට එරෙහිව සිදු වූ සිද්ධිය ඇගයීමට ලක් කළාය. "හුදෙක් යම් ජාතිකත්වයක, ආගමක හෝ කණ්ඩායමක හැඟීම් රිදවන ප්‍රකාශයක් සිදු කිරීමෙන් පමණක් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනතේ 3 වන වගන්තිය යටතේ පමණක් නොව දණ්ඩ නීති සංග්‍රහයේ 291(අ) වගන්තිය යටතේ වුව ද පියවර ගැනීමට ඉඩ ලබා නොදෙන බව" නිගමනය කරන ලදී.[75]

## 2.5 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත බලාත්මක කිරීම 2024 දී සිදු වූ ප්‍රධාන, නමුත් මතභේදාත්මක, ව්‍යවස්ථාදායක කටයුත්තකි. මෙම පනතට එරෙහිව එල්ල වූ විවේචන අතර ප්‍රමුඛතම විවේචනය වූයේ භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස උල්ලංඝනය කරමින්, විසම්මුතිය මැඩපැවැත්වීමට දායක වෙමින් සහ අදාළ සියලු පාර්ශවයන්ට භයානක බලපෑමක් ඇති කරමින්, එහි විධිවිධානවල ප්‍රකාශනය සඳහා අසාධාරණ සීමා කිරීමක් ඇතුළත් වූ ආකාරය යි.[76] පනත සම්මත කරන ලද ඉක්මන් ස්වභාවය, පනත කෙටුම්පත් කිරීම වටා පැවති රහස්‍යභාවය, සහ පනත් කෙටුම්පත සරල බහුතරයකින් සම්මත කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියම කරන ලද සියලුම අවශ්‍යතාවලට අනුකූල වීමට අපොහොසත් වීම හේතුවෙන්, නීතියේ ආධිපත්‍යය සහ බලතල වෙන් කිරීම කෙරෙහි ඉන් බරපතල බලපෑමක් එල්ල වූ අතර මෙම නීතිය සම්මත කරගැනීමට රජය පෙළඹවූ හේතු කවරේදැයි යන්න ගැන සැක ඉස්මතු කළේය.[77]

පනතේ 16 වන වගන්තිය, ආගමික හැඟීම් අවුස්සන අරමුණින් යම් පන්තියක ආගමික විශ්වාසයන්ට අපහාස කරන හෝ අපහාස කිරීමට උත්සාහ කරන අසත්‍ය ප්‍රකාශයක් මාර්ගගතව සන්නිවේදනය කිරීම වරදක් ලෙස ඉතා පුළුල්ව අර්ථ දක්වා ඇත.[78] ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහසට අදාළව මේ පනත සම්බන්ධයෙන් ඇති අනෙකුත් ගැටළුවලට, දණ්ඩ නීති සංග්‍රහයේ දැනටමත් විධිවිධාන සලසා ඇති වැරදි සඳහා මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත මගින් විධිවිධාන සලසා තිබීම ඇතුළත් වේ. උදාහරණයක් ලෙස, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනතේ 15 වන වගන්තියට අනුව ආගමික

74 චක්‍රලේඛ අංක RTM 541

75 නටාෂා එදිරිසූරිය ඇප තීන්දුව, කොළඹ මහාධිකරණ නඩු අංකය: HCEBA/1335/2023

76 සුමුදු චාමර, "ද ඔන්ලයින් (අන්)සේෆ්ටි බිල්", ද මෝනිං, 2023 ඔක්තෝබර් 05, ගෙහාන් ගුණතිලක සහ එර්මිසා ටෙගල් උපුටා දක්වමින් https://www.themorning.lk/articles/jRwvUbaNAi5mzPn5kz1m; විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2024 අංක 09 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත පිළිබඳ ප්‍රකාශය, පෙබරවාරි 07 2024 https://www.cpalanka.org/statement-on-the-online-safety-act-no-09-of-2024/

77 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2024 අංක 09 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත පිළිබඳ ප්‍රකාශය.

78 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත, 16 වන වගන්තිය

වන්දනාමානවල හෝ ආගමික උත්සවවල නීත්‍යානුකූලව නියැලී සිටින ඕනෑම සමූහයකට අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම මගින් ස්වේච්ඡාවෙන් බාධා කිරීම වරදක් වේ. එවැනි වරදකට අනුරූප දඬුවම වසර තුනක් නොඉක්මවන සිර දඬුවමක්, රුපියල් ලක්ෂ තුනක් නොඉක්මවන දඩයක් හෝ එම සිර දඬුවම සහ දඩය යන දෙකම විය යුතුය. මෙම විධිවිධානය 'ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත' වරදකරුවෙකුට අදාළ වන බව සැලකිය යුතුය.[79]

එක් නීතියක දැනටමත් ඇතුළත් යමක් අනවශ්‍ය ලෙස නැවත දැක්වීමක් කිරීම සහ ඒ හේතුවෙන් අදාළ නීතියේ ඇතිවිය හැකි අවිනිශ්චිතතාවයට අමතරව ඇති තවත් ගැටළුවක් වන්නේ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත මගින් විධි විධාන සපයා ඇති වැරදි සඳහා වැඩි දඬුවම් තිබීමයි. ඉතා සමාන වැරදිවලට විවිධ නීති යටතේ විවිධ දඬුවම් පවතින විට, සැකකරුට එරෙහිව චෝදනා ගොනු කළ යුත්තේ කුමන නීතිය යටතේද යන්න තීරණය කිරීම පොලිසියේ සහ නඩු පැවරීමේ ක්‍රියාවලියට සම්බන්ධ අනෙකුත් අදාළ පාර්ශවකරුවන්ගේ අභිමතයට යටත් වන බව එර්මිසා ටීගල් පෙන්වා දෙයි.[80]

පනතේ විධිවිධාන බාහිර සාධක සැලකිල්ලට ගැනීමෙන් තොරව කියවිය යුතු නැති බවත්, ඒ වෙනුවට, ශ්‍රී ලංකාව මෑත කාලීනව මීට සමාන පනත් සහ නීතිමය විධිවිධාන ක්‍රියාත්මක කළ සන්දර්භය තුළ මෙය තේරුම් ගත යුතු බවත් පනත පිළිබඳ විචාරකයින් පැහැදිලි කර තිබේ. ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල වන බව නීති පාඨමය වශයෙන් පෙනෙන්නට තිබෙන නීතිමය විධිවිධාන, විශේෂිත කණ්ඩායම් සහ පුද්ගලයින් සම්බන්ධයෙන් තෝරා බේරා භාවිතා කර තිබීම හෝ විධිවිධානය යටතේ චෝදනා එල්ල වූවන්ගේ අයිතිවාසිකම් අඩු කරන ආකාරයෙන් බලාත්මක කර තිබීම මෙසේ කීමට හේතුව වේ.[81]

කෙසේ වෙතත්, 2024 නොවැම්බර් මාසයේ පාර්ලිමේන්තු මැතිවරණයට පෙර, රජය මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත සංශෝධනය කිරීමේ සිය අභිප්‍රාය නිවේදනය කළේය.[82]

## 2.6 වෙනත් නීතිමය උපකරණ

ඉහත සාකච්ඡාවට ගත් විවිධ ව්‍යවස්ථාදායක උපකරණ ආරක්ෂාව පිළිබඳ කාරණා සාකච්ඡා කරන අතර, ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සමග පැහැදිලි ආකාරයකින් එවා අන්තර්ඡේදනය වේ. ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්න සහ සාමයට ඇති බාධාවන් විසඳීම සඳහා ඇති අනෙකුත් නීතිමය උපකරණ, ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස ක්‍රියාත්මක කිරීම සමගින් ව්‍යංගයෙන් අන්තර්ඡේදනය වනවාක් විය හැකිය.

"සාපරාධී බිය ගැන්වීම" වරදක් ලෙස දක්වා ඇති දණ්ඩ නීති සංග්‍රහයේ 483 වන වගන්තිය, සාමය කඩ කිරීමක්[83] ආමන්ත්‍රණය කරන 1865 අංක 16 දරන පොලිස් ආඥා පනතේ (සංශෝධිත) 79(2) වගන්තිය, පරිගණකයක් භාවිතා කිරීම හරහා ජාතික ආරක්ෂාවට සහ මහජන සාමයට[84] එරෙහි වැරදි ආවරණය කරන

79 2024 අංක 9 දරන මාර්ගගත ආරක්ෂණ පනත, 15 වන වගන්තිය

80 සුමුදු චාමර, "මාර්ගගත ක්‍රමවල (අ)සුරක්ෂිතතා පනත් කෙටුම්පත"

81 එම.

82 "මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතතා පනත් කෙටුම්පත: රජය නිල ස්ථාවරය ප්‍රකාශ කරයි", Newswire, 2024 නොවැම්බර් 06 https://www.newswire.lk/2024/11/06/online-safety-bill-govt-announces-stance/

83 දණ්ඩනීති සංග්‍රහය 483 වගන්තිය

84 1865 අංක 16 දරන පොලිස් ආඥාපනත (සංශෝධනය කරන ලද), 79(2) කොටස

2007 අංක 24 දරන පරිගණක අපරාධ පනතේ[85] 6(1) වගන්තිය, 1947 අංක 25 දරන මහජන ආරක්ෂක ආඥා පනත[86] යටතේ පනවනු ලැබිය හැකි හදිසි නීති රෙගුලාසි මෙන්ම 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ (සංශෝධිත) 81 වන වගන්තිය සහ සාමය කඩවීමක් සිදුවිය හැකි අවස්ථාවක ගත හැකි පියවර විස්තර කරන 1970 අංක 44 දරන ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතේ (සංශෝධිත)[87] 66(1) වගන්තිය, ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්න සම්බන්ධයෙන් ඇති නීති, අයිතිය බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීමට ඉඩ දීමෙන් මෙන්ම, ආගම හෝ විශ්වාසය ප්‍රකාශනයේ මුවාවෙන් ආරක්ෂාවට කිසිදු තර්ජනයක් එල්ල නොවන බව සහතික කිරීමෙන් ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස[88] සමග මෙවැනි නීති ව්‍යංගයෙන් සම්බන්ධ විය හැකි ආකාරය පිළිබඳ උදාහරණ කිහිපයක් සපයයි.

## 3. ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක දැරීමේ නිදහස සහ ප්‍රකාශනයේ නිදහස

ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස කිහිප ආකාරයකින් ප්‍රකාශනයේ නිදහසට අදාළ වනවා සේම ඒ සමග අන්තර්ජේදනය වේ. පළමුව, කෙනෙකුගේ ආගම ප්‍රකාශ කිරීමේ අයිතිය අර්ථවත් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රකාශනයේ නිදහස අවශ්‍ය වේ. දෙවනුව, ශ්‍රී ලංකාවේ නීතිය යටතේ, බොහෝවිට ආගමට අපහාසයක් ලෙස අර්ථ දැක්විය හැකි ප්‍රකාශනවලින් ආගමික හැඟීම්වලට ආරක්ෂාව සැපයේ. තෙවනුව, වෙනස්කොට සැළකීමට සහ ප්‍රචණ්ඩත්වයට පෙළඹවීම වැළැක්වීම සහ ඉන් ආරක්ෂා කිරීම සඳහා, ආගමක හෝ එහි අනුගාමිකයින්ගේ ප්‍රකාශනයේ නිදහස සීමා කළ හැකිය.

ඇතැම්විට අයිතීන් එකිනෙක ඌනපූරණය සිදු කරන අතර තවත් විටෙක එකිනෙක සමග ආතතියෙන් පවතින බැවින් ඉහත සඳහන් සියලු අවස්ථාවන්වල අයිතිවාසිකම් අතර අන්තර්ක්‍රියා කිරීමක් සහ අයිතිවාසිකම් සමතුලිත කිරීමක් ඇතුළත් වේ. ජාත්‍යන්තර මානව හිමිකම් රාමුවට සහ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් රාමුවට අනුව, යම් යම් සීමිත හේතු මත ප්‍රකාශනයේ නිදහස මෙන්ම ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස යන දෙකම සීමා කිරීමට අවසර ඇති බව මේ සම්බන්ධයෙන් විශේෂයෙන් සිහිපත් කළ යුතුය. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15(7) වගන්තියට අනුව, ප්‍රකාශනයේ නිදහස සහ ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස "ජාතික ආරක්ෂාව, මහජන සාමය සහ මහජන සෞඛ්‍ය හෝ සදාචාරය ආරක්ෂා කිරීම, හෝ අන් අයගේ අයිතිවාසිකම් සහ නිදහස සඳහා නිසි පිළිගැනීම සහ ගෞරවය ලබා ගැනීමේ අරමුණින් හෝ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පොදු සුභසාධනයේ සාධාරණ අවශ්‍යතා සපුරාලීම සඳහා නීතියෙන් නියම කළ හැකි පරිදි" සීමා කිරීම්වලට යටත් විය හැකිය.[89] ඊට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15(2) වගන්තියට අනුව, ප්‍රකාශනයේ නිදහස, වාර්ගික හා ආගමික සහජීවනය පිළිබඳ හෝ වෙනත් දේ අතර, අපහාස කිරීම හෝ වරදකට පෙළඹවීම සම්බන්ධයෙන් නීතියෙන් නියම කර ඇති සීමාවන්ට යටත් විය යුතුය.[90]

---

85 පරිගණක අපරාධ පනත් කෙටුම්පත අංක 24, 2007, අධිකරණ 6(1)

86 මහජන ආරක්ෂක නියෝගය අංක 25, 1947

87 අපරාධ ක්‍රියාමාර්ග පනත් කෙටුම්පත අංක 15, 1979 (සංශෝධිත), අධිකරණ

88 ප්‍රාථමික නියෝග අධිකරණ ක්‍රියාපටිපාටි පනත් කෙටුම්පත අංක 44, 1970 (සංශෝධනයන් සහිතව), අධිකරණ 66(1)

89 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15(7) ව්‍යවස්ථාව

90 එම, 15(2) ව්‍යවස්ථාව

## 3.1 ආගම ප්‍රකාශ කිරීම

“වන්දනාමාන, පිළිපැදීම, ප්‍රගුණ කිරීම හා ඉගැන්වීම හරහා තමන්ගේ ආගම හෝ විශ්වාසය ප්‍රකාශ කිරීමට ඇති අයිතිය”[91] තුළ ප්‍රකාශනයේ නිදහස ක්‍රියාත්මක කිරීමේ හැකියාව අන්තර්ගත වේ. කෙසේ වෙතත්, ව්‍යවස්ථාදායක වර්ධනයන් සහ අධිකරණ මතය මෙම හැකියාව මත සීමා පනවා ඇත. ශබ්ද මට්ටම් සීමා කිරීම, එනම් ශබ්දය සහ කාලසීමාව සාමාන්‍ය ජනතාවට කරදරයක් ලෙස සැලකිය හැකි නම්, එය ආගම ප්‍රකාශ කිරීම පාලනයට යටත් කර ඇති එක් අවස්ථාවකි. උදාහරණයක් ලෙස පොලිස් ආඥා පනතේ[92] 80 වන වගන්තිය, මහජනතාවට බලපෑම් කළ හැකි ශබ්ද ප්‍රතිදානය පිළිබඳ රෙගුලාසි දක්වා ඇති අතර, ශබ්දය අධික යැයි හෝ එසේ නොමැතිනම් මහජනතාවට කරදරයක් ඇති කිරීමට ඉඩ ඇතැයි සැළකෙන විට ශබ්දය අඩු කිරීම සඳහා විධිවිධාන සපයයි.[93] මෙම සම්බන්ධය, “ආගමික පිළිවෙතක් මත පදනම් වූ ඇතැමුන්ට දැනෙන පහසුවක් හෝ වාසියක්, පොදු මහජනතාවට හෝ අවට දේපළවල වාසය කරන හෝ පදිංචිව සිටින ජනතාවට කරදරයක් ඇති කරන පොදු හිරිහැරයක් සඳහා නිදහසට කරුණක් විය නොහැක.” යනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ අගවිනිසුරු සරත් සිල්වා පැහැදිලි කළ ශබ්ද දූෂණ නඩුවේදී (ආෂික් එදිරිව බන්දුල සහ වෙනත් අය) පැහැදිලිව ආමන්ත්‍රණය කරන ලදී. එලෙසම, පෙ.ව. 5 සිට පෙ.ව. 6 දක්වා පන්සලක ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය සම්බන්ධයෙන් 2016 දී නියෝගයක් නිකුත් කරන ලදී.[94]

## 3.2 ආගමික හැඟීම්වලට ආරක්ෂාව ලබා දීම

ශ්‍රී ලංකාව තුළ, නීතිමය රාමුව ආගමික හැඟීම්වලට විශේෂ ආරක්ෂාවක් ලබා දෙයි, මන්ද එය යම් ආගමකට අපහාසයක් ලෙස අර්ථ දැක්විය හැකි ප්‍රකාශන භාවිතය වරදක් ලෙස සලකයි.

උදාහරණයක් ලෙස, දණ්ඩ නීති සංග්‍රහයේ 290අ වගන්තිය, කිසියම් පුද්ගල පන්තියක ආගමට අපහාස කිරීමේ අරමුණින් පූජනීය ස්ථාන සම්බන්ධයෙන් කරන ක්‍රියාවන් අපරාධයක් ලෙස සලකයි.[95] 291අ වගන්තියට අනුව, හිතාමතාම පුද්ගලයෙකුගේ ආගමික හැඟීම්වලට හානි කිරීමේ අරමුණින්, පුද්ගලයෙකුගේ කනට ඇසෙන පරිදි කිසියම් වචනයක් ප්‍රකාශ කිරීම හෝ ශබ්දයක් නිකුත් කිරීම, පුද්ගලයෙකු ඇස් ඉදිරිපිට යම් අභිනයක් කිරීම හෝ පුද්ගලයෙකුගේ ඇස් ඉදිරිපිට යම් වස්තුවක් තැබීම වරදක් ලෙස සැලකේ.[96] අවසාන වශයෙන්, “යම්කිසි පුද්ගල පන්තියක ආගමික හැඟීම් කෝපයට පත් කිරීමට හිතාමතාම සහ ද්වේෂ සහගත චේතනාවෙන් එම පන්තියේ ආගමට හෝ ආගමික විශ්වාසයන්ට අපහාස කරන හෝ අපහාස කිරීමට උත්සාහ කරන කවරෙකු වුවද' 291ආ වගන්තිය වරදකට වරදකරු කරයි.” මෙය කතා කරන ලද වචන, ලිඛිත වචන හෝ දෘශ්‍ය නිරූපණයන් හරහා විය හැකිය.[97] [2024 මාර්තු මාසයේදී පූජ්‍ය ඥානසාර හිමියන් සම්බන්ධ නඩුවේදී දණ්ඩ නීති සංග්‍රහයේ 291 (ආ) භාවිතය පිළිබඳ 2 වන පරිච්ඡේදයේ 3 වන වගන්තිය බලන්න] මෙම විධිවිධාන

91 එම, 14(ඊ) ව්‍යවස්ථාව

92 පොලිස් නියෝගය අංක 16, 1865 (සංශෝධිත), අධිකරණ 80

93 අෂික් සහ බණ්ඩුල සහ අනෙකුත් වරදකරුවන් (ශබ්ද දූෂණ නඩුව) - ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් නඩු අංකය SC FR 38/2005

94 ශබ්ද දූෂණ නඩුව - මහේස්ත්‍රාත් අධිකරණය නඩු අංකය MC 64172/6/1

95 දණ්ඩ නීති සංග්‍රහය, 290 අ වගන්තිය

96 එම පනත, 291 අ වගන්තිය

97 එම පනත, 291 ආ වගන්තිය

"දේවාපහාසය පිළිබඳ තත්ත්වාකාර තහනමක්" ලෙස විවේචනය කර ඇත.[98]

දණ්ඩ නීති සංග්‍රහයට අමතරව, 1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල නීතියේ (සංශෝධිත) 15 වන වගන්තියේ සඳහන් වන්නේ, ඕනෑම පුවත්පතක, මහජන සදාචාරයට හානි කිරීම සඳහා නිර්මාණය කරන ලද ඕනෑම ආගම් විරෝධී කරුණක්, මහජන සදාචාරයට හානි කිරීමට බලාපොරොත්තු ඕනෑම දැන්වීමක්, යම් අශෝභන හෝ අසභ්‍ය ප්‍රකාශයක් හෝ කරුණක් ප්‍රකාශයට පත් කරන හෝ ප්‍රකාශයට පත් කිරීමට හේතු වන සෑම පුද්ගලයෙකුම වරදකට වරදකරු විය යුතු බවයි. ඕනෑම ආගමකට, ඕනෑම ආගමක නිර්මාතෘවරයෙකුට හෝ ඕනෑම ආගමක අනුගාමිකයින් විසින් ගරු කරනු ලබන ඕනෑම දෙවියෙකුට හෝ සාන්තුවරයෙකුට අපහාස කිරීමට අදහස් කරන ඕනෑම කාරණයක් ලෙස අර්ථ දැක්වේ. 'අදාළ සියලු තත්වයන් සැලකිල්ලට ගෙන, අදාළ ප්‍රකාශය හෝ කාරණය කියවිය හැකි හෝ දැකිය හැකි පුද්ගලයින්ව අපරිශුද්ධ කිරීමට සහ දූෂිත කිරීමට ඉඩ ඇති ඕනෑම ප්‍රකාශයක් හෝ කාරණයක්' 'ආගම් විරෝධී කරුණක්' ලෙස අර්ථ දැක්වේ.[99]

## 3.3 වෙනස්කොට සැලකීමෙන් සහ ප්‍රචණ්ඩත්වයට පෙළඹවීමෙන් ආරක්ෂා කිරීම සඳහා ප්‍රකාශනයේ නිදහස සීමා කිරීම

පැහැදිලිවම ආගමට අදාළව, වෙනස් කොට සැලකීමෙන් සහ ප්‍රචණ්ඩත්වයට පෙළඹවීමෙන් ආරක්ෂා කිරීම සඳහා ප්‍රකාශනයේ නිදහස සීමා කිරීමේ අවශ්‍යතාවය, නීති මෙවලම් කිහිපයක ම සඳහන් කරයි.

පෙර සඳහන් කළ පරිදි, විවිධ ප්‍රජාවන් හෝ වාර්ගික හෝ ආගමික කණ්ඩායම් අතර ප්‍රචණ්ඩ ක්‍රියා හෝ ආගමික, ජාතික හෝ වාර්ගික අසමගිය හෝ වෛරය හෝ සතුරුකම පිළිබඳ හැඟීම් ඇති කරන හෝ ඇති කිරීමට අදහස් කරන ඕනෑම පුද්ගලයෙකු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි 2(1)(ඌ) වගන්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබේ. මෙය පවසන ලද වචන හෝ සංඥා, දෘශ්‍ය නිරූපණයන් හෝ වෙනත් ක්‍රම මගින් කියවීමට අදහස් කරන ලද වචන විය හැකිය.[100]

එම පනතේම 14(2)(අ)(ii) වගන්තියට අනුව, ප්‍රචණ්ඩත්වයට පෙළඹවීම සම්බන්ධ හෝ ආගමික, ජාතික හෝ වාර්ගික අසමගිය හෝ විවිධ ප්‍රජාවන් හෝ වාර්ගික/ආගමික කණ්ඩායම් අතර වෛරය හෝ සතුරුකම පිළිබඳ හැඟීම් ඇති කිරීමට ඉඩ ඇති ඕනෑම කරුණක් කිසිදු පුද්ගලයෙකු ඔවුන්ට නිසි අධිකාරියකින් ලිඛිත අනුමැතියක් ලැබී ඇතිනම් මිස, කිසිදු පුවත්පතක මුද්‍රණය කිරීම හෝ ප්‍රකාශයට පත් කිරීම නොකළ යුතුය.[101] සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනතේ 3(1) වගන්තියේ සඳහන් වන්නේ කිසිදු පුද්ගලයෙකු යුද්ධය ව්‍යාප්ත නොකළ යුතු බවත්, වෙනස්කොට සැලකීම, සතුරුකම හෝ ප්‍රචණ්ඩත්වයට පෙළඹවීමක් වන ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය වෙනුවෙන් පෙනී නොසිටිය යුතු බවත් ය.[102]

එමෙන්ම, වෙනස්කොට සැලකීම, සතුරුකම සහ ප්‍රචණ්ඩත්වයට පෙළඹවීම සහ ඒ වෙනුවෙන් පෙනී සිටීම තහනම් කිරීම සම්බන්ධයෙන් සම්මත කර ඇති නීතිවලට ද, එවැනි අරමුණක් සඳහා ආගමට අදාළව

98 සුමුදු චාමර, 'නීති ආගම නියාමනය කළ යුතු සීමාව කොච්චරද? ', The Morning, 2021 දෙසැම්බර් 13, ගේහාන් ගුණතිලකගේ උපුටා දැක්වීමක් සමග https://www.themorning.lk/articles/178996

99 ශ්‍රී ලංකා මාධ්‍ය සභා පනත (අංක 5, 1973), අධිකරණ 15

100 තාවකාලිකව ක්‍රියාත්මක කිරීමට නියමිත ත්‍රස්තවාදය වළක්වා ගැනීමේ පනත අංක 48, 1979, අධිකරණ 2(1)(h)

101 එම, අධිකරණ 14(2)(a)(ii)

102 පුරවැසි හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සංධානය, ව්‍යාපෘතිය 3(1)

ප්‍රකාශනයේ නිදහස මත වන සීමාවන් ඇතුළත් ය.[103]

ඉහත හේතූන් මත ප්‍රකාශනයේ නිදහස මත සීමාවන් පැනවිය හැකි වුවද, එසේ පනවන සීමා, අවශ්‍ය ඒවා වියයුතු අතර, අතිශයින් පුළුල් නොවන, සහ ප්‍රමාණානුකූල ඒවා විය යුතුය.[104]

## 3.4 ආගම විකෘති කිරීම වැළැක්වීම සඳහා ප්‍රකාශනයේ නිදහස සීමා කිරීම

ආගම විකෘති කිරීම නියාමනය කරන නීති හඳුන්වා දීමේ අරමුණක් ඇති බව ප්‍රකාශ සහ වාර්තා තුළ දක්වා ඇතත්, එවැන්නකදී නීති සම්පාදන විෂයපථය සත්‍යවශයෙන්ම කුමක් වේද යන්න පිළිබඳව තවමත් පැහැදිලි බවක් නොමැත.

2023 මැයි මාසයේදී, එවකට බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය විදුර වික්‍රමනායක මහතා කියා සිටියේ, පුද්ගලයන් ආගමට අපහාස කළ බවට සැලකෙන අවස්ථා සාකච්ඡා කිරීමේ සන්දර්භය තුළ, ආගමික නිදහස සහ කරුණු විකෘති කිරීම පිළිබඳ නව නීති හඳුන්වා දීමට නියමිතව තිබූ බවයි. 2023 ජුනි 26 වන දින ගනු ලැබූ කැබිනට් තීරණය පිළිබඳ පැවැත්වූ මාධ්‍ය හමුවකදී, ආගමික[105] නිදහස ආරක්ෂා කිරීම සහ ආගමික ඉගැන්වීම්වලට අපහාස කිරීම වැළැක්වීම සඳහා නීති සම්පාදනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන, ආගමික නායකයින්, නීති විශේෂඥයින්, සිවිල් සමාජ ක්‍රියාකාරීන් සහ මාධ්‍ය වලින් සමන්විත කමිටුවක් පත් කිරීම අනුමත කරන ලදී.[106] 2024 ජනවාරි මාසයේදී, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය ප්‍රකාශ කළේ, "ප්‍රජාවන් අතර අසමගිය ඇති කළ හැකි, ආගමික ඉගැන්වීම් සහ පිළිවෙත් පක්ෂ විසින් හිතාමතාම විකෘති කිරීම වැළැක්වීම සඳහා" නීතියක් පාර්ලිමේන්තුවට හඳුන්වා දීමට නියමිත බවයි.[107] 2024 මැයි 22 වන දින ජාතික උරුමයන් සුරැකීම උදෙසා ක්‍රියාත්මකවීම පණිස වන පාර්ලිමේන්තු සංසදයේදී, "බෞද්ධ දර්ශනය විකෘති කිරීම, බුදුන් වහන්සේගේ චරිතය පිළිබඳ මිථ්‍යාවන් ප්‍රචාරය කිරීම මෙන්ම භික්ෂූන් වහන්සේලාට අපහාස කරන ප්‍රචාරයන් වැළැක්වීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමට" සංසදය බලාපොරොත්තු වන බව වාර්තා විය.[108] සියදිවි නසාගැනීම නැවත ඉපදීමට වේගවත් මාර්ගයක් ලෙස ප්‍රකාශ කර ඇතැයි චෝදනා ලැබූ 'ආගමික ඉගැන්වීම්' අනුගමනය කරමින් සියදිවි නසා ගැනීම් 7 ක් සිදු කර ඇති බවට මාධ්‍ය වාර්තා කළ සන්දර්භයක් තුළ එවැනි නීති හඳුන්වාදීම සමහරුන් විසින් දිරිමත් කර ඇත. [2 වන පරිච්ඡේදය, 5 වන කොටස බලන්න][109] 2024 දෙසැම්බර් මාසයේදී, ආගමික ඉගැන්වීම් සහ පිළිවෙත් විකෘති කිරීම ආවරණය සඳහා බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතේ 42 සහ 43 වගන්ති

103 උදාහරණයක් ලෙස 1991 අංක 25 දරන විදුලි සංදේශ පනතේ 69 වගන්තිය (සංශෝධිත) යටතේ මහජන හදිසි තත්වයන් හෝ මහජන ආරක්ෂාව හා සාමය පිළිබඳ අවශ්‍යතාවයන් නිසා රජය විසින් දුරකථන භාවිතය සීමා කිරීම හෝ තහනම් කිරීමේ බලය පිළිබඳව සලකිය හැක.

104 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව (HRC), පොදු අදහස අංක 34: ව්‍යාපෘතිය 19 (අදහස් හා ප්‍රකාශන නිදහස), CCPR/C/GC/34, 2011 සැප්තැම්බර් 12 https://www.refworld.org/legal/general/hrc/2011/en/83764

105 "ආගමික නිදහස හා විස්තෘති කරුණු පිළිබඳව නව පනතක් ගෙන එනු ඇත - අමාත්‍යවරයා", Ada Derana, 2023 මැයි 28 https://www.adaderana.lk/news.php?nid=90860

106 2023.06.26 දින කැබිනට් මණ්ඩලය විසින් ගත් තීරණ පිළිබඳ මාධ්‍ය සාකච්ඡාව https://www.cabinetoffice.gov.lk/cab/index.php?option=com_content&view=article&id=16&Itemid=49&lang=en&dID=12074

107 සඟන් තෙන්නකෝන්, "ආගම විකෘති කිරීම: රජය නව නීති සකස් කිරීමකට උත්සාහ කරයි", The Morning, 2024 ජනවාරි 08 https://www.themorning.lk/articles/b0iLnVccWmwV12IjSweD

108 "ජාතික උරුමය ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාත්මක වීමේ අරමුණු ඇති කෝකස්ය, බෞද්ධ දර්ශනය විකෘති වීම, සංඝ සමාජය බිඳ වැටීම සහ ශ්‍රී ලංකා ඉතිහාසය විකෘති වීම වැළැක්වීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම පිළිබඳ අවධානය යොමු කරයි", parliament.lk, 2024 මැයි 31

109 සඟන් තෙන්නකෝන්, "ආගම විකෘති කිරීම: රජය නව නීති සකස් කිරීමකට උත්සාහ කරයි."

සංශෝධනය කිරීමට නියමිත බව ප්‍රවෘත්ති වාර්තාවල සඳහන් විය.[110]

පනත් කෙටුම්පතක් නිර්මාණය කෙරෙන තුරු, යෝජිත නීති පිළිබඳව ඇගයීමට නොහැකි වුවද, යෝජිත ස්වභාවයේ ඕනෑම නීති සම්පාදනයක් තුළින් ප්‍රකාශනයේ නිදහස උල්ලංඝනය කිරීමේ විශාල අවදානමක් ඇති බැවින් එය ඉතා ප්‍රවේශමෙන් සිදු කළ යුතුය.

## 3.5 ආගමට හරවා ගැනීම සහ ප්‍රචාරණය

ආගමට හරවා ගැනීම "යමෙකුගේ ආගමික හෝ දේශපාලන විශ්වාසයන් හෝ ජීවන රටාව ඔබේ ආගමික හෝ දේශපාලන විශ්වාසයන් හෝ ජීවන රටාවට අනුව වෙනස් කිරීමට පෙළඹවීමට උත්සාහ කිරීම" යනුවෙන් අර්ථ දක්වා ඇත.[111] මීට අදාළව, ප්‍රචාරණය යනු 'ආගමෙහි මූලධර්ම පැහැදිලි කිරීමෙන්' කෙනෙකුගේ ආගම සම්ප්‍රේෂණය කිරීම හෝ ව්‍යාප්ත කිරීමයි.[112] එවැනි ක්‍රියාකාරකම්වල යෙදීමේ හැකියාව සහ ඒවා ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ විෂයපථයට අයත් වේද යන්න තවමත් ඉතා විවාදාත්මක හා මතභේදාත්මක ප්‍රශ්නයකි. [2 වන පරිච්ඡේදය, 3 වන කොටස බලන්න]

ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහසට වන්දනාමාන කිරීම, පිළිපැදීම, ප්‍රගුණ කිරීම සහ ඉගැන්වීම හරහා තම ආගම හෝ විශ්වාසය ප්‍රකාශ කිරීමේ අයිතිය ඇතුළත් වේ.[113] සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 18 වගන්තියට අදාළව පළ කර ඇති පොදු අදහස් අංක 22හි සඳහන් වන්නේ ආගම හෝ විශ්වාසය ප්‍රගුණ කිරීම සහ ඉගැන්වීම යන්නට "ආගමික කණ්ඩායම් තම මූලික කටයුතු කරගෙන යෑමේදී ඊට අවශ්‍යවන ක්‍රියාවන් ඇතුළත් වන" බව යි.[114] සෙමනේරි සහ ආගමික පාසල් පිහිටුවීම මෙන්ම ආගමික ග්‍රන්ථ සහ ප්‍රකාශන සකස් කිරීමට සහ බෙදා හැරීමට ඇති නිදහස මෙම ක්‍රියාවන්ට උදාහරණ ලෙස පැහැදිලිව දක්වා ඇත.[115]

ශ්‍රී ලංකාවේ නීතිය පැහැදිලිවම පෙන්වා දෙන්නේ ආගමක් හෝ විශ්වාසයක් ප්‍රචාරය කිරීමේ අයිතියක් නොපවතින බවය. උදාහරණයක් ලෙස ජෙහෝවාගේ සාක්ෂිකාර නඩු විභාගයේදී ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළේ, ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට ඔවුන්ගේ ආගම හෝ විශ්වාසයන් ප්‍රචාරය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආරක්ෂාව ලැබූ අයිතියක් නොපවතින බවය. මෙම සන්දර්භයෙන් අධිකරණය ශ්‍රේෂ්ඨාධිකරණ තීරණ අංක 2/2001 සහ 19/2003 ද උපුටා දැක්වීය.[116] ජෙහෝවාගේ සාක්ෂිකාර නඩුවේ තීන්දුවෙන් පැහැදිලි කර දුන් තවත් කරුණක් නම්, ඔවුන්ගේ මහජන සේවයේ කොටසක් ලෙස දොරින් දොරට යද්දී ජෙහෝවාගේ සාක්ෂිකරුවන් සහ මහජනයා අතර ඇතිවිය හැකි සංවාද, 'ඉගැන්වීම' වශයෙන් ආගමික නිදහස යටතේ ආරක්ෂා කරදී ඇති ප්‍රකාශනය යන්නට ඇතුළත් නොවන බවයි.[117]

---

110 එම.

111 ආගමට හරවා ගැනීම - "Proselytise", Cambridge Dictionary

112 Rev. Stanislaus v Madhya Pradesh (AIR SC 1977 908, පිටුව 911) – S.C.F.R අංක 241/14 (යෙහෝවාගේ සාක්ෂීන් නඩුව) හිදී උපුටා දැක්වීමක් ලෙස

113 පුරවැසි හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සංධානය, ව්‍යාපෘතිය 18(1); ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 1978, 14(ඊ) ව්‍යවස්ථාව

114 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව (HRC), CCPR පොදු අදහස අංක 22, 4වන උපපෙළ: 18 වගන්තිය (සිතුම්, අභිමත හෝ ආගම පිළිබඳ නිදහස)

115 පුරවැසි හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සංධානය, 18(2)

116 S.C.F.R අංක 241/14 (යෙහෝවාගේ සාක්ෂි නඩුව)

117 එම නඩු විභාගය, පිටුව 35

කෙසේ වෙතත්, මෙම තීන්දුව ලබාදීමේදී අධිකරණය විශේෂ කරුණක් ද සඳහන් කර තිබේ. ආගම හෝ විශ්වාස ප්‍රචාරය කිරීම පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාදායක අයිතියක් නොමැති වුවද, එවැනි ක්‍රියා නීතිවිරෝධී හෝ අපරාධ නොවන බව, විශේෂයෙන්ම මෙම නඩුවේ පෙත්සම්කරුගේ ක්‍රියාකාරකම් නීති විරෝධී නොවන බව අධිකරණය පැහැදිලි කළේය.[118] බලපෑම් කර ආගම මාරුකරවීම අපරාධයක් ලෙස සැළකීම සඳහා පනතක් හඳුන්වාදීමට උත්සාහ ගත් නමුත් එය සාර්ථක වුයේ නැත.[119]

ශ්‍රී ලංකාවේ නීති රාමුව තුළ ආගම සහ විශ්වාස ප්‍රචාරය කිරීමේ අයිතියක් නොමැති බව පැහැදිලි වුවද, ආචාර්ය ගුණතිලක ආගම ප්‍රචාරය කිරීමේ නිදහස, ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස යටතේ සැලකීමට පක්ෂව යෝජනාවක් ඉදිරිපත් කර ඇත. ඔහු පැහැදිලි කරන්නේ, මෙම අයිතිය පිළිගතහොත්, එම අයිතිය ක්‍රියාත්මක කිරීම මත නීතියෙන් අවසර ඇති සීමා පැනවීමට හැකිවනු ඇති බවයි.[120] එසේම, මෙම අයිතිය පිළිගැනීමට අපොහොසත්වීම තුළ ගොඩනැගෙන නීති රාමුව, ආගම ප්‍රචාරය මත රඳා පවතින්නට සිදුව ඇති අළුත් සහ සාම්ප්‍රදායික නොවන ආගම්වලට වඩා සාම්ප්‍රදායික හා දැනටමත් ස්ථාපිත ආගම්වලට වාසිදායක වු එකක් වනු ඇති බව ඔහු අවධාරණය කරයි.[121]

# 4. ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහසට බලපාන වෙනත් නීති සම්පාදන/ප්‍රතිපත්ති

## 4.1 රාජ්‍ය/ බහුතර ආගම පුළුල් ප්‍රජාව මත පැටවීම

පුළුල් ප්‍රජාව හෝ සාමාන්‍ය මහජනතාව මත රාජ්‍ය හෝ බහුතර ආගම පැටවීම, රාජ්‍ය ආගමක් ස්ථාපිත කිරීම සහ බහුතර ආගමට සම්බන්ධ චාරිත්‍ර වාරිත්‍ර සහ සීමාවන් පිළිපැදීම අනිවාර්ය කිරීම ඇතුළු ආකාර කිහිපයකින් සිදුවිය හැකිය.

ශ්‍රී ලංකාවේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන ව්‍යවස්ථාවෙන් බුද්ධාගමට ප්‍රමුඛ ස්ථානය ලබා දිය යුතු බව නියම කරයි. එය මෙසේ පවසයි, "එහෙයින්, 10 වැනි ව්‍යවස්ථාවෙන් සහ 14 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ (ඉ) ඡේදයෙන් සියළුම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන අතර බුද්ධශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේ ය."[122]

බුද්ධාගමට "ප්‍රමුඛස්ථානය" ලබා දීමෙන්, රාජ්‍යය පැහැදිලිවම එක් ආගමක් අනෙක් සියලු ආගම්වලට වඩා ඉහළින් තබා ප්‍රමුඛත්වය ලබා දෙයි. මෙම ප්‍රමුඛතාවයේ පුළුල් ස්වභාවය, එහි ව්‍යාප්තිය ක්ෂේත්‍ර කිහිපයකට ගලා යාමට ද ඉඩ සලසයි. එසේ තිබියදීත්, සියලු ආගම්වලට සමානාත්මතාවය සහ ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සහතික කරලීම රාජ්‍යයේ වගකීමක් කිරීම සඳහා ද මෙම විධිවිධානය කටයුතු කරන බව සැලකිය යුතු කරුණකි. මීට අමතරව, නිල රාජ්‍ය ආගම ලෙස ආගමක් නියම කිරීමකින් තොරව

118 එම නඩු විභාගය

119 "අනීතික ආගමික පරිවර්තනවලට එරෙහි නව නීති", The Morning, 2021 පෙබරවාරි 18 https://www.themorning.lk/articles/120252

120 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 1978, 15(7) ව්‍යවස්ථාව

121 ගෙහාන් ගුණතිලක, "ආගමික නිදහසෙහි ඇතුළත්ද, ආගම ප්‍රචාරය කිරීමේ නිදහස?", (Minor Matters, 2022 සැප්තැම්බර් 26) https://forbdashboard.minormatters.org/resource/does-the-freedom-of-religion-include-the-freedom-to-propagate/

122 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 1978, 9 ව්‍යවස්ථාව

ආගමකට 'ප්‍රමුඛස්ථානය' ලබා දීමේ නිරර්ථක භාවය ද මෙහි ලා සැලකිල්ලට ගත යුතු වේ.[123]

## 4.2 අධ්‍යාපනය

සිතීමේ, හෘදය සාක්ෂියේ සහ ආගමික නිදහස මෙන්ම, ආගම ප්‍රකාශ කිරීමේ නිදහස සක්‍රීය කිරීම සඳහා අධ්‍යාපනය උපකාරී කරගත හැකිය. සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි 18(4) වගන්තියට අනුව, තම දරුවන්ට තමන්ගේ (දෙමව්පියන්ගේ/භාරකරුගේ) විශ්වාසයන්ට අනුකූල වන ආගමික හා සදාචාරාත්මක අධ්‍යාපනයක් ලැබෙන බව සහතික කරගන්නට දෙමාපියන්ට සහ නීතිමය භාරකරුවන්ට ඇති නිදහසට රාජ්‍ය විසින් ගරු කළ යුතුය.[124]

රජයේ පාසලක සෑම සිසුවෙකුම නිරතවන පාසල් අධ්‍යයන කටයුතුවල කොටසක් ලෙස[125] තම දෙමාපියන්ගේ ආගම පිළිබඳ උපදෙස් ලබා ගත යුතු බව සඳහන් කරමින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ආඥා පනතේ 35 වන වගන්තියෙන් ආගමික ඉගෙනුම්/උපදෙස් සඳහා විධිවිධාන සලසයි. කෙසේ වෙතත්, තම දෙමව්පියන්ගේ ආගමට අදාළ ඉගැන්වීම්[126], වන්දනාමාන හෝ සැමරුම්වලට පැමිණීමෙන් ශිෂ්‍යයා නිදහස් කරන ලෙස දෙමව්පියන් ස්වේච්ඡාවෙන් පාසලේ විදුහල්පතිවරයාගෙන් ලිඛිත ඉල්ලීමක් කර ඇත්නම්, එලෙස පැමිණීම අවශ්‍ය නොවේ, නොහොත්, පැමිණීමට අවසර නැත.[127]

අනෙක් අතට, ශිෂ්‍යයෙකුට පාසල් පරිශ්‍රයේ දී ශිෂ්‍යයාගේ දෙමව්පියන්ගේ ආගම නොවන ආගමකට අදාළ උපදෙස්, වන්දනාමාන කිරීම හෝ සැමරුම් සඳහා සහභාගී වීමට අනිවාර්ය කළ නොහැක, නොහොත් අවසර දෙනු නොලැබේ.[128] 35(1)(අ) වගන්තියට අනුව, යම් ආගමකට අයත් මව්පියන් සහිත සිසුන් 15ක් හෝ ඊට වඩා අඩු සංඛ්‍යාවක් පමණක් රජයේ පාසලක සිටීනම්, එම ආගම පිළිබඳ පාසලේදී ඉගෙනුම්/උපදෙස් ලබාදීම අවශ්‍ය නොවේ.[129]

ශිෂ්‍යයෙකු පාසලකට ඇතුළත් කර ගැනීමේදී ආගමට යම් බලපෑමක් ඇති කළ හැකි නම්, එසේ ඇති කළ හැකි බලපෑම සලකා බැලීමේදී ආගමක් ඇදහීමේ සහ අධ්‍යාපනයට ඇති නිදහස තවත් ආකාරයකින් අන්තර්ඡේදනය විය හැකිය.

මේ සම්බන්ධයෙන් අධ්‍යාපන ආඥා පනතේ සඳහන් වන්නේ, කිසිදු අයදුම්කරුවෙකුට එම අයදුම්කරුගේ හෝ ඔහුගේ/ඇයගේ දෙමව්පියන්ගේ ආගම හේතුවෙන් කිසිදු උපකෘත පාසලකට ඇතුළත් කරගැනීම ප්‍රතික්ෂේප නොකළ යුතු බවයි.[130] 2025 වර්ෂය සඳහා රජයේ පාසල්වල පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමට අදාළ උපදෙස්. යන අධ්‍යාපන අමාත්‍යාංශයේ නිවේදනයේ සඳහන් වන්නේ, රජයට පවරා ඇති පාසල්වල පුරප්පාඩු

---

123 රොහාන් එදිරිසිංහ, (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීති විශේෂඥ), යනිත්‍රා කුමාරගුරු විසින් 2024 දෙසැම්බර් 28 දින, කොළඹදී පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවක්. (මෙහිදී සාකච්ඡා වී ඇත්තේ, බාහිර උදාහරණයක් මත ඇති වූ කරුණක් ලෙස)

124 පුරවැසි හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සංධානය, ව්‍යාපෘතිය 18(4)

125 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥාපනත, 35(1) වගන්තිය

126 35(4) වගන්තිය අනුව, එම අංශයෙහි විස්තරිත අවස්ථාවන්වලදී, සිසුන්ගේ මව්පියන්ගෙ ආගම පිළිබඳව තීරණය කරන්නේ, සිසුවාගේ පියා විසින් ආගම පිළිබඳව කරන ප්‍රකාශනයක් මතය. එවන් ප්‍රකාශනයක් නොමැතිවූ විට, සිසුවාගේ මව විසින් කළ ආගම පිළිබඳ ප්‍රකාශනයක් සලකා බැලිය හැක. එසේ නොමැති අනෙකුත් අවස්ථාවලදී, සිසුවා සම්බන්ධයෙන් නීතිමය හෝ සැබෑ පාලන බලයක් ඇති පුද්ගලයෙකු විසින් සිසුවාගේ ආගම ලෙස ප්‍රකාශ කරන ලද ආගම, එම සිසුවාගේ මව්පියන්ගේ ආගම ලෙස සලකනු ලැබේ.

127 එම, 35(1)(ඛ) වගන්තිය

128 එම, 35(2) වගන්තිය

129 එම, 35(1)(අ) වගන්තිය

130 එම, 34 වගන්තිය

පිරවීමේදී, “පාසල රජයට පවරා දෙන අවස්ථාවේ විවිධ ආගම්වලට අයත් දරුවන්ගේ අනුපාතය සැලකිල්ලට ගන්නා” බවයි. එලෙස, පාසලේ ඇති පුරප්පාඩු සංඛ්‍යාව එකම ආකාරයකින්, විවිධ ආගම් සහ කාණ්ඩ අතර බෙදා හැරෙනු ඇත.[131]

## 4.3 පුරවැසියන් නොවන අය

සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි 18 වන වගන්තියේ සඳහන් වන්නේ “සිතීමේ, හෘද සාක්ෂියේ සහ ආගම ඇදහීමේ නිදහස සෑම කෙනෙකුටම තිබිය යුතුය” යන්නයි. සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි 27 වන වගන්තියේ සඳහන් වන්නේ වාර්ගික, ආගමික හෝ භාෂාමය සුළුතරයන් සිටින තැන, මෙම සුළුතරයන්ට අයත් පුද්ගලයින්ට තමන්ගේම ආගම ප්‍රකාශ කිරීමට සහ පිළිපැදීමට ඇති අයිතිය ප්‍රතික්ෂේප නොකළ යුතු බවයි.[132] මෙම වගන්තිය යටතේ අයිතිවාසිකම් ආරක්ෂා කර ඇති පුද්ගලයින්ට රටක ජාතිකයන් නොවන අය, පුරවැසියන් නොවන අය සහ ස්ථිර පදිංචිකරුවන් නොවන අය ඇතුළත් වන බව 27 වන වගන්තියට අංක 23 දරන පොදු අදහස් දැක්වීම පැහැදිලිව පැහැදිලි කරයි.[133] විදේශීය ශ්‍රමිකයින් සහ රාජ්‍යයකට පැමිණෙන සංචාරකයින් පවා මෙම වගන්තිය යටතේ ලැබෙන ආරක්ෂාවෙන් ප්‍රතිලාභ ලබනු ඇත.[134]

ඉහත වගන්ති පුළුල් ලෙස අදාළ වන අතර, වඩාත් නිශ්චිතව, 1951 සරණාගත සම්මුතිය ද සරණාගතයෙකු යන අර්ථ දැක්වීමට අයත් වන අයගේ ආගමක් ඇදහීමේ නිදහස සඳහා ආරක්ෂාව ද සපයයි. 4 වන වගන්තියට අනුව, රාජ්‍යයන් තම භූමිය තුළ සිටින සරණාගතයින්ට ඔවුන්ගේ ආගම ඇදහීමට ඇති නිදහස සහ ඔවුන්ගේ දරුවන්ගේ ආගමික අධ්‍යාපනයට අදාළ නිදහස සම්බන්ධයෙන් 'අවම වශයෙන් තමන්ගේ ජාතිකයන්ට ලබා දී ඇති පරිදි හිතකර සැලකිල්ලක්' ලබා දෙන බවට සහතික විය යුතුය.[135] කෙසේ වෙතත්, ශ්‍රී ලංකාව 1951 සරණාගත සම්මුතියට එකඟ වී නොමැත.

සෑම පුද්ගලයෙකුටම සිතීමේ, හෘද සාක්ෂියේ සහ ආගමක් ඇදහීමේ නිදහස තිබිය යුතු බව ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10වන වගන්තියේ සඳහන් වේ.[136] කෙසේ වෙතත්, ඇතුළත්භාවයෙන් අඩු යෙදුම් භාවිතා කරමින් 12(2) වගන්තියෙන් සඳහන් කරන්නේ කිසිදු පුරවැසියෙකුට ආගම වැනි හේතු මත වෙනස් කොට සැලකීම සිදු නොකළ යුතු බව යි.[137] 14(ඉ) වගන්තිය ද මීට සමාන වූ සීමාකාරී ආකාරයකින් ප්‍රකාශ කර ඇත්තේ, සෑම පුරවැසියෙකුට ම තම ආගම හෝ විශ්වාසය වන්දනාමාන කිරීම, අනුගමනය කිරීම, පිළිපැදීම සහ ඉගැන්වීම තුළින් ප්‍රකාශ කිරීමේ නිදහස තිබෙන බවයි.[138] ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සඳහා ලබා දෙන ආරක්ෂාව එවැනි ආකාරයකින් රටක පුරවැසියන්ට සීමා කිරීමෙන්, රාජ්‍යයේ බලප්‍රදේශය තුළ සිටින විදේශ ශ්‍රමිකයින්, සරණාගතයින්, සංචාරකයින්, අමුත්තන් සහ පුරවැසියන් නොවන

131 අධ්‍යාපන අමාත්‍යාංශය, දරුවන් රාජ්‍ය පාසල්වල පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සම්බන්ධ උපදෙස් - 2025 වසර සඳහා නිකුත් කරන ලද දැන්වීම, 3.2 ඡේදය

132 පුරවැසි හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය, 18 වගන්තිය

133 එම, 27 වගන්තිය

134 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව (HRC), CCPR සාමාන්‍ය අදහස අංක 23, අනුවාද 5.1 සහ 5.2: වගන්තිය 27 (සුළුතර කණ්ඩායම්වල අයිතීන්), CCPR/C/21/Rev.1/Add.5, 1994 අප්‍රේල් 8 https://www.refworld.org/legal/general/hrc/1994/en/26900

135 සරණාගතයින්ගේ තත්වයට අදාළ සංධානය, ව්‍යාපෘතිය 4, 1951 ජූලි 28, 189 UNTS 137 (“ශරණාගත සංධානය”)

136 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 1978, ව්‍යාපෘතිය 10

137 එම ව්‍යවස්ථාව, ව්‍යාපෘතිය 12(2)

138 එම ව්‍යවස්ථාව, ව්‍යාපෘතිය 14(ඒ)

වෙනත් අය ව්‍යවස්ථානුකූලව ලබා දී ඇති ආරක්ෂාවේ විෂය පථයට අයත් නොවන බව අන්‍යාකාරයකින් අර්ථ ගැන්වේ.

## 4.4 පූජනීය ස්ථාන සහ ඇදහිල්ල පදනම් කරගත් සංවිධාන පිහිටුවීම, නඩත්තු කිරීම සහ නියාමනය කිරීම

### පූජනීය ස්ථාන

පූජනීය ස්ථාන පිහිටුවීම, නඩත්තු කිරීම සහ භාවිතා කිරීමේ හැකියාව, එනම් විශේෂයෙන්ම කෙනෙකුගේ ආගම ප්‍රධාන වශයෙන් සාමූහිකව, ප්‍රකාශ කිරීමේ නිදහස, ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස[139] සක්‍රීය කිරීම සඳහා මූලික වේ. එවැනි ස්ථාන පිහිටුවීම සහ නඩත්තු කිරීමේ අයිතිය, ඒ අනුව, ආගම හෝ විශ්වාසය මත පදනම් වූ[140] සියලු ආකාරයේ නොඉවසීම සහ වෙනස්කම් කිරීම් තුරන් කිරීම පිළිබඳ 1981 ප්‍රකාශනයේ 6 වන වගන්තියේ මෙන්ම "සියලු ආකාරයේ ආගමික නොඉවසීම තුරන් කිරීම" පිළිබඳ මහාසභා යෝජනාවේ 55/97හි[141] පැහැදිලිව පිළිගෙන ඇත. 2005/40 මානව හිමිකම් යෝජනාව ද එම අයිතිය පිළිග න්නා අතර ආගම සහ විශ්වාසය ප්‍රකාශ කිරීමේ අයිතියට අනුකූල වන ආකාරයෙන් ලියාපදිංචි කිරීමේ පිළිවෙත් සමාලෝචනය කරන ලෙස රාජ්‍යයන්ගෙන් ඉල්ලා සිටී.[142]

ශ්‍රී ලංකාවේ, සියලුම ආගම්වලට අදාළ කරුණු බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වේ.[143] මෙම අමාත්‍යාංශය විසින් 2008, 2011 සහ 2022 දී නිකුත් කරන ලද චක්‍රලේඛ තුනක, නව ආගමික වන්දනාමාන ස්ථාන ඉදිකිරීම සඳහා අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍ය බව නියම කර ඇත.[144] නවතම චක්‍රලේඛය 2022 අප්‍රේල් මාසයේදී හඳුන්වා දෙන ලද අතර, එය, පෙර චක්‍රලේඛ අභිබවා ගොස්, සියලුම ආගමික මධ්‍යස්ථාන, පූජනීය ස්ථාන, යාඥා මධ්‍යස්ථාන හෝ සාමූහික වන්දනාමානයේ යෙදෙන ඕනෑම ආයතනයකට අදාළ වේ. එකම ව්‍යතිරේකය වන්නේ පාර්ලිමේන්තුව යටතේ සංස්ථාගත කර ඇති ආයතන පමණි.[145] නීතිමය පදනමක් නොමැති වුවද, ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සහ ඒ ආශ්‍රිත ප්‍රතිලාභ වටා ඇති අපැහැදිලි බව හේතුවෙන් චක්‍රලේඛයේ පරාමිතීන් අපැහැදිලි වේ.[146] ඒ සඳහා නීතිමය විධි නියෝගයක් නොතිබුණත්, අවශ්‍යතාවයන් සපුරා නොමැති විට සංවිධානවලට දඬුවම් නොලැබුණත්, එවැනි නියම කිරීමකින් පැන නගින සැලකිය යුතු බලපෑම් තවමත් පවතී.[147]

139 පොදු අදහස් අංක 22හි විවරණය පවසන්නේ, "නමස්කාරය" යන සංකල්පයෙහි අර්ථය වෙයි එවැනි ක්‍රියාවන් සඳහා අත්‍යවශ්‍ය වන විවිධ චාරිත්‍රයන් ද, ඒ අතර උපුටා දැක්වෙන්නේ නමස්කාරස්ථාන ඉදිකිරීම ද වේ.

140 එක්සත් ජාතීන්ගේ මහ මණ්ඩලය, සෑම ආගම් ව්‍යාජවීමක් සහ භේදභාවයක් වුවද මකාදමන ප්‍රකාශය, ව්‍යාපෘතිය 6(ක), G.A. Res. 36/55, U.N. GAOR, 36වන සැසිවාරය, Supp. 51 (1981)

141 එක්සත් ජාතීන්ගේ විධානය, විශාදය සහිත ආගමික ව්‍යාජතා සම්පූර්ණයෙන්ම මකාදමන 55/97 විධානය, 2001 මාර්තු 1

142 උසස් මානව හිමිකම් කොමසාරිස් කාර්යාලය, මානව හිමිකම් විධානය 2005/40, වගන්තිය 4(ක) සහ (ඞ). දැක්විය හැකි තවත් එක් වගන්තියක් වන්නේ මහ මණ්ඩලයේ විධානය A/RES/77/221 යි - වගන්තිය 14(එෆ්)

143 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය අංක 2187/27; බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ වෙබ්අඩවිය https://mbs.gov.lk/web (2025 ජනවාරි 7 දින පිවිසුණු වේලාව)

144 ව්‍යාරිටේ රිසර්ච්, "වික්කොනවී යන ආගම් පිළිගැනීම්: ශ්‍රී ලංකාවේ ආගමික නමස්කාර අයිතියෙහි හිස්භාවයන් සම්බන්ධව විසඳුම් සෙවීම," 2024 ජුලි, පිටු 29-30 https://www.veriteresearch.org/wp-content/uploads/2024/07/20240507_VeriteLegal_FadingBeliefs.pdf

145 NCEASL අවධානය කුළුණු කණ්ඩායම (ශ්‍රී ලංකාවේ ආගමික නිදහස පිළිබඳ තත්ත්වය), ජෝවිටා අරුලනාන්දම් සමඟ 2024 දෙසැම්බර් 12, කොළඹදී පැවති සාකච්ඡාවකදී

146 ලක්ෂාන් ඩයස් (මානව හිමිකම් නීතීඥයා), ජෝවිටා අරුලනාන්දම් විසින් 2024 ඔක්තෝබර් 10 දින, කොළඹදී සිදුකළ සම්මුඛ සාකච්ඡාවකදී

147 වෙරිටේ රිසර්ච්, "වියැකී යන ආගම් පිළිගැනීම්: ශ්‍රී ලංකාවේ ආගමික නමස්කාර අයිතියෙහි හිස්භාවයන් සම්බන්ධව විසඳුම් සෙවීම", පිටු 12

කුඩා හෝ එතරම් ප්‍රසිද්ධ නැති ආගමික කණ්ඩායම් ලියාපදිංචි කිරීමට යෑමේදී ඒවා පිළිබඳ නොදැන සිටීම හා හුරුපුරුදුකමක් නොමැතිකම ඇතැම් විට ලියාපදිංචි කිරීමේදී දුෂ්කරතාවන්ට සහ ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීමට ලක්වීම සඳහා හේතු වේ.[148] එවැනි ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීම්, එවැනි ආගමික ස්ථානයක ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය කරන පරිපාලන කාර්යයන් සම්පූර්ණ කරගැනීමට බාධාවක් විය හැකිය.[149] ඊට අමතරව, පූජනීය ස්ථානයක් ලියාපදිංචි නොකිරීම සුළු ජාතීන්ගේ ආගමික පිළිවෙත් ඉලක්ක කර ගැනීම සඳහා ආයුධයක් ලෙස යොදාගෙන ඇති අවස්ථා නිරීක්ෂණය වී ඇත. [2 වන පරිච්ඡේදය, 4.1 වගන්තිය බලන්න][150]

## රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම

2005/40 මානව හිමිකම් යෝජනාව මගින් ජාත්‍යන්තර මානව හිමිකම් නීතියට අනුකූලව ආගමික, පුණ්‍යායතන සහ මානුෂීය ආයතන පිහිටුවීමට සහ පවත්වාගෙන යාමට නිදහස සහතික කරන ලෙස රාජ්‍යයන්ගෙන් ඉල්ලා සිටී.[151] මෙම අවශ්‍යතාවය ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස පිළිබඳ A/RES/77/221 මහාසභා යෝජනාවේ ද පිළිගෙන ඇත.[152]

2024 ජනවාරි මාසයේදී, රාජ්‍ය නොවන සංවිධාන (ලියාපදිංචි කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ) පනතක් සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. මෙම පනත බලාත්මක වුවහොත්, දැනට ක්‍රියාත්මක වන 1980 ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන පනත වෙනුවට මෙම නව පනත ආදේශ කරනු ඇත. භරයාත්මකව ගත් කළ, යෝජිත නීතිය ඇතැම් ව්‍යතිරේක සහිතව අනිවාර්ය ලියාපදිංචිය හඳුන්වා දීමට උත්සාහ කරන අතර, විරුද්ධ වීම සහ විරෝධය දැක්වීම සඳහා ලැබිය හැකි ප්‍රතිවිපාක ද සහිතව රජයේ ප්‍රතිපත්ති සහ න්‍යාය පත්‍රයට අනුකූල වීම නියම කරයි.[153] මෙවැනි සාධක සැලකිල්ලට ගනිමින්, එර්මිසා ටීගල් යෝජිත පනත විස්තර කළේ එය "රාජ්‍ය නොවන සංවිධානවලට වර්තමානයේදී සිදුවන පීඩාකාරී සැලකීම සඳහා නීතිමය සුජාතභාවයක් හඳුන්වා දෙන බවක් පෙනෙන" පනතක් යනුවෙනි.[154]

ක්‍රියාපටිපාටිමය වශයෙන් ගත් කළ ද, කෙටුම්පත මුල් අවස්ථාවේදී සංසරණය වූ ඉතා සීමිත හා අවිධිමත් ආකාරය, ඒ අවස්ථාවේ එය ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පැවතීම, නීතිය සම්බන්ධයෙන් අර්ථවත් ලෙස අදහස් විමසීමට උත්සාහයක් ගෙන නොමැතිකම සහ නව නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා කිසිදු තාර්කිකත්වයක් හෝ සාධාරණීකරණයක් ප්‍රකාශ කිරීමට අපොහොසත් වීම හේතුවෙන් පනත දැඩි විවේචනයට ලක්ව ඇත. මූල්‍ය අපරාධ පිළිබඳ කරුණු විසඳීම සඳහා විශේෂඥතාවයෙන් සමන්විත වෙනම නීති රාමුවක් සහ පද්ධතියක් දැනටමත් පවතින බැවින්, මූල්‍ය අපරාධ වැළැක්වීමේ අවශ්‍යතාවය නව නීතිය සඳහා මූලික තාර්කිකත්වය විය නොහැකි බව තර්ක කරනු ලබයි.[155] යෝජිත නීතියේ නිල කෙටුම්පතක් බෙදා හරිනු නොලැබිණි.[156]

---

148 එම කෘතිය, පිටු 6 සහ 12

149 එම කෘතිය, පිටු 12 (උදාහරණයක් ලෙස බැංකු ගිණුම් විවෘත කිරීම සඳහන් කරමින්)

150 එම කෘතිය, පිටු 7

151 උසස් මානව හිමිකම් කොමසාරිස් කාර්යාලය, මානව හිමිකම් විධානය 2005/40, වගන්තිය 4(ඊ)

152 A/RES/77/221, 'ආගම හෝ ආගමික විශ්වාස නිදහස, 14(අයි) ඡේදය, 2022 දෙසැම්බර් 15

153 එර්මිසා ටීගල්, "රාජ්‍යය, ස්වයංසම්පන්න සංවිධාන ක්‍රියාකාරකම් පාලනය සඳහා නීතියක් යෝජනා කරයි," Groundviews, 2024 මැයි 14 https://groundviews.org/2024/05/14/government-proposes-a-law-to-control-ngo-activity/

154 එම සාකච්ඡාව

155 එම සාකච්ඡාව

156 භවානි ෆොන්සේකා, සම්මුඛ සාකච්ඡාව

## 4.5 පුරාවස්තු සහ ඉඩම් ආශ්‍රිත නීතිමය රාමුව

පුරාවස්තු, පුරාවිද්‍යාත්මක ස්ථාන සහ ඉඩම් හිමිකාරිත්වය පාලනය කරන නීතිමය රාමුව, ප්‍රජාව සඳහා ආගමික වැදගත්කමක් ඇති ස්ථාන සහ ව්‍යුහයන් වෙත ප්‍රවේශ වීම, ප්‍රයෝජනයට ගැනීම සහ හිමිකාරිත්වය සම්බන්ධයෙන්, ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස ක්‍රියාත්මක කිරීම සඳහා සැලකිය යුතු වැදගත්කමක් දරයි. පූජනීය ස්ථාන සම්බන්ධයෙන් ඇතුළුව දශක ගණනාවක් තිස්සේ පවතින විවිධ ඉඩම් ආරවුල් සහ ගැටුම් හේතුවෙන් එය ශ්‍රී ලංකාව තුළ විශේෂයෙන් වැදගත් වේ.

### පුරාවස්තු ආඥා පනත

2.2 කොටස යටතේ සාකච්ඡා කරන ලද විධිවිධානවලට අමතරව, පුරාවස්තු ආඥාපනතෙහි (සංශෝධිත) ආගමික ස්ථාන පවතින ඉඩම් සහ සංස්කෘතික වැදගත්කමක් ඇති ප්‍රදේශවලට අදාළව ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහසට අදාළ වෙනත් විධිවිධාන කිහිපයක් ඇත.

නිදසුනක් වශයෙන්, පනතෙහි 6වැනි වගන්තියට අනුව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ[157] කැණීම් බලපත්‍රයක් යටතේ මිස පුරාවස්තු අනාවරණය කර ගැනීම සඳහා කැණීමක් සිදු නොකළ යුතුය. 8 වන වගන්තියට අනුව, එවැනි බලපත්‍රයක් ලබා දිය යුත්තේ ඉඩමේ හිමිකරු කැණීමට කැමැත්ත පළ කර ඇති බවට සහ, ප්‍රමාණවත් වන්දි සඳහා විධිවිධාන සලසා ඇත්තේ නම් මිස, ඒ අවට පදිංචිකරුවන්ට හෝ ආගමික අරමුණු සඳහා භාවිතා කරන ඕනෑම ස්ථානයකට කිසිදු හානියක් හෝ අපහසුතාවයක් සිදු නොවන බවට, අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමකට පත්වන විට පමණි.[158] තවද, එවැනි කැණීමකදී සිදුවන පාඩුව හෝ හානිය සඳහා රජය වගකිව යුතු නොවන බව 13 වන වගන්තියේ සඳහන් වේ.[159]

තවද, රජයේ ඉඩමක පිහිටා නොමැති ඕනෑම පෞරාණික ස්මාරකයක් විනාශ වීමේ හෝ ඉවත් වීමේ අවදානමට ලක්ව ඇති බවත්, නොසලකා හැරීමෙන් හෝ අවිචාරී ලෙස සැලකීමෙන් හානි සිදුවන බවත්, එවැනි ස්මාරකයක් ආරක්ෂා කිරීම මහජන යහපතට හේතු වන බවත් අමාත්‍යවරයාට පෙනී යන විට, 18 වන වගන්තිය යටතේ 'ආරක්ෂිත ස්මාරක'[160] ප්‍රකාශ කිරීම සඳහා පනතෙන් විධිවිධාන සපයයි. රජයේ ඉඩමක ඇති ඕනෑම ආරක්ෂිත ස්මාරකයක්/පෞරාණික ස්මාරකයක් හිතාමතාම විනාශ කිරීම, හානිකිරීම, විකෘති කිරීම හෝ කඩා දැමීම, හෝ එවැනි ස්මාරකයක් වන්දනා මාන කරන හෝ පූජනීය ලෙස සලකන පුද්ගලයින්ගේ පන්තියේ ආගමික සංවේදීතාවන්ට පීඩා කරන හෝ අපහාස කරන හෝ පීඩා කිරීමට හෝ අපහාස කිරීමට ඉඩ ඇති ක්‍රියාවක නිරත වීම 31 වන වගන්තිය වරදක් ලෙස සලකයි. එවැනි වරදක් සඳහා දඬුවම රුපියල් 50,000 ත් රුපියල් 250,000 ත් අතර දඩයක්, වසර 2 සිට 5 දක්වා සිර දඬුවමක් හෝ එම දඩය සහ සිර දඬුවම යන දෙකම ලෙස නියම කර ඇත.[161]

ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස ප්‍රවර්ධනය කෙරෙන බවක් පෙන්නුම් කරන මෙම විධිවිධාන, නීතිය සහ ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස අතර ඇති සම්බන්ධතාවය සත්‍ය වශයෙන්ම අවබෝධ කර ගැනීමට උපයෝගී කරගෙන ඇති ආකාරය පිළිබඳව ද විමසා බැලිය යුතුය. අවාසනාවකට මෙන්, එවැනි විමසීමකින් හෙළි වන්නේ, ආගම ඇදහීමේ නිදහස ආරක්ෂා කරන නියායෙන්

157 පුරාවිද්‍යා ආඥාපනත (සංශෝධිත), වගන්තිය 6

158 එම ආඥාපනත, වගන්තිය 8

159 එම ආඥාපනත, වගන්තිය 13

160 එම ආඥාපනත, වගන්තිය 18

161 එම ආඥාපනත, වගන්තිය 31

ප්‍රකාශිත වුවද, මෙම විධිවිධාන වාර්ගික ජාතිකවාදී න්‍යාය පත්‍ර ප්‍රවර්ධනය කිරීම සහ සුළුතර ප්‍රජාවන්ට අගතියක් ඇති කිරීම ඉලක්ක කරගත් ආකාරයකින් භාවිතා කර ඇති බවයි. [2 වන පරිච්ඡේදය, 2 වන කොටස] උදාහරණයක් ලෙස, අම්පාර (නැගෙනහිර) මුල්ලිකුලම් මලෙයි හි, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් පුරාවස්තු පනතේ 15 සහ 16 වගන්ති යටතේ මුල්ලිකුලම් මලයි පුරාවිද්‍යාත්මක ස්ථානයක් ලෙස ප්‍රකාශ කිරීම, කලාපයේ මුස්ලිම් ජනතාවට ඔවුන්ගේ කෘෂිකාර්මික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා භූමිය භාවිතා කිරීමෙන් වළක්වනු පිණිස යොදා ගන්නා ලදී.[162] වවුනියාවේ (උතුර) (වඩ්ඩමන පබ්බතය විහාරය නමින් බෞද්ධ විහාරස්ථානයක් ලෙස මතභේදයට තුඩු දී ඇති) වෙඩුක්කුනාරි ආති ලිංගේෂ්වරාර් කෝවිල සම්බන්ධයෙන් ගත් කළ, අදාළ විහාරස්ථානය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් පුරාවිද්‍යා ස්මාරකයක් ගැසට් කරන ලදී. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සිදු කළ ක්ෂේත්‍ර සංචාරයකදී වාර්තා කර ඇත්තේ බෞද්ධ නටබුන් පමණක් වන අතර, කිසිදු හින්දු ස්මාරකයක් ඇතැයි පිළිගෙන නොමැත. ඉන්පසු දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද නිවේදනයක සඳහන් වී ඇත්තේ, පන්සල ඇතුළු ප්‍රදේශයට ඇතුළු වීමට ප්‍රදේශවාසීන්ට අවසර නැති බවත්, ප්‍රදේශවාසීන් එසේ ඇතුළු වීමට උත්සාහ කළහොත් අත්අඩංගුවට ගැනීමට සිදුවනු ඇති බවත්, වෙඩුක්කුනාරි මලයි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පාලනය යටතට පත් වනු ඇති බවත් ය.[163] පුරාවස්තු පනත පදනම් කරගනිමින් විහාරස්ථානයේ භාරකාර මණ්ඩලයට එරෙහිව වවුනියාව දිස්ත්‍රික් අධිකරණයේ නඩුවක් ද පනවන ලදී.[164]

පුරාවස්තු පනත මගින් ජනවාර්ගික-ජාතිකවාදී න්‍යාය පත්‍රය ප්‍රවර්ධනය, පනත භාවිතයෙන් තෝරා බේරා ආරක්ෂාව ලබා දෙන ආකාරය තුළින් ද දැකගත හැකිය. කුරුන්තූර්මලෙයි ආති ශිවන් අයියනාර් කෝවිල පිහිටා ඇති මුලතිව් (උතුර) හි කුරුන්තූර් කන්දේ, බෞද්ධයන් විසින් පුරාවිද්‍යා භූමියේ සීමාවන් තුළ තිබූ ගස් පුළුස්සා කපා දැමූ අවස්ථාවේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හෝ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.[165] එමෙන්ම, වෙඩුක්කුනාරි ආති ලිංගේෂ්වරාර් කෝවිල සම්බන්ධයෙන්, පුරාවස්තු පනතේ පදනම මත විහාරස්ථානයේ භාරකාර මණ්ඩලයට එරෙහිව නඩු පවරා තිබියදීත්, එහි දෙවිවරුන් උදුරා දමා කෝවිල විනාශ කළ අවස්ථාවේ එවැනි ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.[166]

## 1946 අංක 13 දරන නගර සහ ග්‍රාම නිර්මාණ ආඥා පනත

නගර සහ ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2) වගන්තියට අනුව, අමාත්‍යවරයාට ඕනෑම නගරයක් හෝ ප්‍රදේශයක් නාගරික සංවර්ධන ප්‍රදේශයක්[167] ලෙස ප්‍රකාශ කළ හැකි අතර, එම නගරය/ප්‍රදේශය භාවිතා කිරීම සඳහා සීමාවන් පැනවිය හැකිය.[168]

162 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ශ්‍රී ලංකාවේ භූමි ගැටලු සම්බන්ධ අන්තරාගතික ප්‍රවණතා, (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, අගෝස්තු 2024), https://www.cpalanka.org/the-intersectional-trends-of-land-conflicts-in-sri-lanka/#:~:text=15%20years%20after%20the%20end,to%20a%20post%2Dconflict%20society, පිටු 14-15

163 එම කෘතිය, පිටු 57-58

164 එම කෘතිය, පිටු 58; නඩු අංක B/2084/19. වුදුක්කුනාරි මලායි සම්බන්ධ සියලු නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳ පුළුල් සමාලෝචනයක් සඳහා කරුණාකර වාර්තාව බලන්න.

165 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ශ්‍රී ලංකාවේ භූමි ගැටලු සම්බන්ධ අන්තරාගතික ප්‍රවණතා, පිටු 41,42

166 එම කෘතිය, පිටු 58-59

167 නගර හා ග්‍රාමීය සැලසුම් ආඥාපත අංක 13 1946, වගන්තිය 6(2)

168 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ශ්‍රී ලංකාවේ භූමි ගැටලු සම්බන්ධ අන්තරාගතික ප්‍රවණතා, පිටු 70

ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය නාගරික සංවර්ධන ප්‍රදේශ[169] ගැසට් කිරීම සඳහා පමණක් විධිවිධාන සලසා තිබියදීත්, ඇතැම් අවස්ථාවලදී 'පූජනීය ප්‍රදේශ. ගැසට් කිරීමට පදනමක් ලෙස එය භාවිතා කර ඇත. උතුරු හා නැගෙනහිර බෞද්ධ විහාරස්ථාන ඉදිකිරීමට පහසුකම් සැලසීමේ මෙවලමක් ලෙස මෙම නීතිය (වැරදි ලෙස) භාවිතා කර ඇත.[170]

## අනෙකුත් ඉඩම් නීති

ඉහත නීති, ඉඩම් අත්පත් කර ගැනීම් පාලනය කරන වඩාත් පොදු නීති රාමුවක් මගින් ඌනපූරණය වන අතර, එය ආයාචනය සහ බල අසමතුලිතතාවය සඳහා ඇති පුළුල් ඉඩකඩ හේතුවෙන්, ජනවාර්ගික ජාතිකවාදය සහ ආගමික ආරෝපණය කිරීම වැනි බාහිර න්‍යායපත්‍ර මුදුන්පත් කරගැනීමට යෑමේදී එය අයුතු ලෙස භාවිතා වේ. 1950 අංක 9 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනත, අධි ආරක්ෂිත කලාප ප්‍රකාශ කිරීම සඳහා විධිවිධාන සලසන හදිසි නීති රෙගුලාසි, මහවැලි අධිකාරී පනත සහ 2005 අංක 38 දරන සංචාරක පනත මේ සඳහා උදාහරණ කිහිපයකි.[171]

ආගමික ස්ථාන ආශ්‍රිත ඉඩම් සහ පුරාවිද්‍යාත්මක කරුණු සම්බන්ධ ආරවුල්වලදී, ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සහ/හෝ ඉඩම් අයිතිය උල්ලංඝණය වූ පුද්ගලයන්ට පක්ෂව අධිකරණ තීන්දු දුන් අවස්ථාවලදී පවා, අධිකරණ පද්ධතිය හරහා යුක්තිය පසිඳලීමට ගත් උත්සාහයන් කිහිපයක්ම නිෂ්ඵල වුනු බව ඔප්පු වී තිබීම විශේෂත්වයකි.[172] භවානී ෆොන්සේකා සමග කළ සම්මුඛ සාකච්ඡාවක පැහැදිලි කළ පරිදි, උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල ප්‍රාදේශීය අධිකරණ ජනවාර්ගික ජාතිකවාදී ව්‍යාපාරය නවතා දැමීමට උත්සාහ කරන කල, අධිකරණය තම කාර්යභාරය ඉටු කරන අවස්ථාවලදී පවා එම තීන්දු ක්‍රියාත්මක කරගැනීම තවමත් ගැටළුවක් ව පවතී. අධිකරණ නියෝග නොසලකා හැරීම අධිකරණයට අපහාස කිරීමක් වනු ඇත නමුත් මෙය ක්‍රියාත්මක කරන්නේ කවුරුන්ද යන ප්‍රශ්නය තවමත් පවතී. එය රාජ්‍ය යාන්ත්‍රණය මත ස්වභාවිකව රඳා පැවතීම සහ රාජ්‍ය යාන්ත්‍රණය බෞද්ධ පූජක පක්ෂය සහ හමුදාව සමග ඉතා සමීපව කටයුතු කිරීම යන කරුණු දෙකම හේතුවෙන් බලාත්මක කිරීමේ දුෂ්කරතාවය දිගින් දිගටම පවතී. ඒ නිසා, "වෙනත් බලවේග විසින් මෙහෙයවනු නොලබන බව සහතික වීම සඳහා සෑම ක්‍රියාකරුවෙකුම තමන්ට පැවරුනු කොටස ඉටු කළ යුතුය. අධිකරණය එක් ක්‍රියාකරුවෙකි. අධිකරණයට පමණක් මුළු බැසගත් මෙම ගැටලුව විසඳිය නොහැක"[173]

## 4.6 පුද්ගලික නීති

ශ්‍රී ලංකාවේ සංකීර්ණ නීති රාමුව, රටේ සාමාන්‍ය නීතියට අමතරව, උඩරට නීතිය, තේසවලාමේ නීතිය සහ මුස්ලිම් නීතිය වැනි විශේෂ ජනවාර්ගික-සංස්කෘතික සහ ආගමික පුද්ගල නීති සඳහා සහජීවනයෙන් ක්‍රියාත්මක වීමේ ඉඩ සලසයි. සහජීවනයට ඉඩ සලසයි. ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස, මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත වැනි ප්‍රඥප්ති හරහා බලාත්මක කරවන මුස්ලිම් නීතිය පිළිගැනීම, ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහසේ දියුණුවට සෘජුවම දායක වේ.

---

169 උදාහරණයක් ලෙස, ඉහත වාර්තාවේ සඳහන් මුහුදු මහා විහාරය අවස්ථාව බලන්න

170 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ශ්‍රී ලංකාවේ භූමි ගැටලු සම්බන්ධ අන්තරාගතික ප්‍රවණතා, පිටු 69

171 ඉහත වාර්තාවේ පළාත් දේපළ ලබා ගැනීම සම්බන්ධ නීතිමය නියමයන් පිළිබඳ වැඩි විස්තර සඳහා බලන්න

172 උදාහරණයක් ලෙස, ඉහත වාර්තාවේ සටහන් කර ඇති මණිකාමඩු මයකල්ලි කන්ද, මුල්ලිකුලම් මලායි සහ කුරුණතුමලයි ආති ශිවන් අයනාර් පල්ලිය බලන්න

173 භවානි ෆොන්සේකා, සම්මුඛ සාකච්ඡාව

කෙසේ වෙතත්, මෙම පුද්ගලික නීති අනෙකුත් මූලික අයිතීන් සහ අයිතිවාසිකම් උල්ලංඝනය කරන අවස්ථාවන්හිදී ඒවා සංශෝධනය කිරීම සහතික කිරීම පිළිබඳව නිසි සැලකිල්ලක් දැක්විය යුතුය. එසේ වන්නේ විශේෂයෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 16 වන වගන්තියේ පුද්ගලික නීති බලාත්මක කිරීමට ඉඩ සලසමින් "පවතින සියලුම ලිඛිත නීති සහ ලිඛිත නොවන නීති වලංගු විය යුතු අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ විධිවිධාන සමඟ කිසිදු අනනුකූලතාවයක් නොතකා ක්‍රියාත්මක විය යුතුය" යනුවෙන් සඳහන් කර තිබීම හේතුවෙනි.[174] [3 වන පරිච්ඡේදය, 3.3 කොටස බලන්න]

## 5. ස්ත්‍රීපුරුෂ සමාජභාවය සහ ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස

ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සහ ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතාවය අතර ආතතියක් තිබේද යන්න සාකච්ඡාවලදී සලකා බලා ඇත. කාන්තාවන්ට සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවී සුළුතරයන්ට එරෙහිව ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස භාවිතා කර ඇති අවස්ථා බොහොමයක් තිබේ. ගබ්සා නීතිය, සමලිංගිකත්වය සාපරාධී බවින් තොර කිරීම සහ මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත වටා ඇති කරුණු ඒ සඳහා උදාහරණ වේ.[175]

ශ්‍රී ලංකාවේ, ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීමට නීතිමය වර්ධනයන් කිහිපයක් 2024 දී සිදු විය. 2024 ජුනි 20 වන දින පාර්ලිමේන්තුවේදී සම්මත කරන ලද 2024 අංක 37 දරන කාන්තාවන් සවිබලගැන්වීමේ පනත එවැනි එක් උදාහරණයකි. කාන්තාවන්ගේ අභිවෘද්ධිය සහ සවි බලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිසමක්, කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් ඔම්බුඩ්ස්වරුන් පත් කිරීම සහ කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා යාන්ත්‍රණයන් සැපයීම සඳහා විධිවිධාන සලසමින් මෙම පනත කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා විධිවිධාන සපයයි.[176]

වෙනමම, ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතාව පිළිබඳ පනත් කෙටුම්පතක් ද 2024 අප්‍රේල් 17 වන දින ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද අතර එය 2024 මැයි 9 වන දින කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යවරිය විසින් ඉදිරිපත් කරන ලදී. මෙම පනත් කෙටුම්පත පහත සඳහන් අරමුණු ප්‍රවර්ධනය කිරීම සඳහා විය: ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතා මූලධර්ම ස්ථාපිත කිරීම සහ ඒවාට පහසුකම් සැලසීම; සියලුම පුද්ගලයින් ස්ත්‍රීපුරුෂභාවය හෝ ස්ත්‍රීපුරුෂ සමාජභාව අනන්‍යතාවය මත වෙනස්කොට සලකනු ලැබීමකින් තොරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති මූලික අයිතිවාසිකම් සහ නිදහස භුක්ති විඳින බව සහතික කිරීම; ස්ත්‍රීපුරුෂ සමාජභාව අසමානතාවය සහ ස්ත්‍රීපුරුෂ සමාජභාව මත පදනම් ව වෙනස්කොට සැලකීමේ පද්ධතිමය හා ව්‍යුහාත්මක හේතු හඳුනා ගැනීම සහ තුරන් කිරීම සඳහා පහසුකම් සැලසීම; අවාසි, ආන්තිකකරණය, ස්ත්‍රීපුරුෂභාවය නිසා ඇතිවන වෙනස්කම් කිරීම, අපකීර්තිය, වර්ගීකරණය, ඒකාකෘතිකරණය, පක්ෂපාතකම සහ ප්‍රචණ්ඩත්වයට විසඳුම් සෙවීමට පියවර ගැනීම මෙන්ම ව්‍යුහාත්මක වෙනසක් හරහා පිරිමින්, කාන්තාවන් සහ විවිධ ස්ත්‍රීපුරුෂ සමාජභාව අනන්‍යතා ඇති පුද්ගලයින්ට අනුග්‍රහය දැක්වීමට පහසුකම් සැලසීම; ස්ත්‍රීපුරුෂභාව

174 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථාව, 1978, අබණ්ඩ 16

175 නීති විශේෂඥවරයෙක් වන යනිත්‍රා කුමාරගුරු විසින් සිදුකළ සම්මුඛ සාකච්ඡාව, 2025 පෙබරවාරි 18, කොළඹ

176 කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත, අංක 37/2024

හෝ ස්ත්‍රීපුරුෂ සමාජභාව අනන්‍යතාවය නොසලකා මානව ගරුත්වය ආරක්ෂා කිරීම, සමාන අවස්ථා සහ ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතාවය පිළිබඳ ප්‍රතිඵල අත්කර ගැනීමට හැකි පරිසරයක් සැපයීම; ස්ත්‍රීපුරුෂ සමාජභාවසමානාත්මතාවයේ මූලධර්ම ස්ථාපිත කිරීම සහ රාජ්‍ය ආයතන, ව්‍යාපාර, සිවිල් සමාජ සංවිධාන, රැකියා සහ අනෙකුත් නීතිමය ආයතනවල සහ පුද්ගලයින්ගේ චර්යාවන්හිදී එවැනි මූලධර්මවලට අනුකූල වීම සහතික කිරීම.[177] පනත් කෙටුම්පතේ 3 වන වගන්තියේ ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතාවයට ඇති අයිතිය පැහැදිලිව දක්වා ඇත.[178]

පැහැදිලි සහ ගැටලු රහිත අන්තර්ගතයක් ඇති බවක් පෙනුනද, මෙම පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙත්සම් දෙකක් (SC SD අංක 54/2024 සහ SC SD 55/2024) මගින් අභියෝගයට ලක් කරන ලද අතර එය සමස්තයක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බව තීරණය විය.[179] එවැනි තීරණයකින් අදහස් වන්නේ, එවකට එම පනත් කෙටුම්පත නීතියක් බවට පත් කළ හැක්කේ මුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක (නොපැමිණි අය ඇතුළුව) අනුමැතිය සහ ජනමත විචාරණයකදී රටේ ජනතාවගේ අනුමැතිය ලබා ගැනීමෙන් පමණක් බවයි.[180]

පනත් කෙටුම්පතේ යෝජනා කළ කිසිදු විධිවිධානයක ආගම ගැන පැහැදිලිව සඳහන් කර නොමැති අතර, පනත් කෙටුම්පතට එරෙහිව අධිකරණය විසින් ලබා දුන් තීන්දුවේදී, අධිකරණය ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස පිළිබඳ විශේෂයෙන් සලකා බලා තිබීම සැලකිය යුතු කරුණකි.

මෙම පනත් කෙටුම්පත නීතියක් ලෙස පනවනු ලැබුවහොත්, ශාසන, කන්‍යාරාම, භික්ෂු විශ්වවිද්‍යාල, පිරිවෙන්, පල්ලි සහ මුස්ලිම් පල්ලි වැනි ආගමික ආයතන විසින්, සිය වන්දනාමාන කටයුතුවලට[181] සේවාකරුවන් වියහැකි පුද්ගලයින් මෙම ආයතනවලට ඇතුළත් කර ගැනීමේදී ස්ත්‍රීපුරුෂ සමාජභාවය හෝ ස්ත්‍රීපුරුෂ භාවය මත පදනම්ව තෝරා ගැනීම හෝ සීමා කිරීම මෙම නීතිය මඟින් වළක්වනු ඇති බව පෙත්සම්කරුවන්ගේ තර්කයක් විය. බෞද්ධ උපසම්පදාව පිළිබඳ නියමයන් අනුව, කාන්තාවක හෝ පුරුෂයෙකු ලෙසද හැඳින්විය නොහැකි පුද්ගලයෙකු සඳහා සහ කාන්තාවන් සඳහා උපසම්පදාව ලබාදීමට අවසරය ලැබිය නොහැකි බව ඉදිරිපත් කරන ලදී.[182]

මෙම ගැටලුව සලකා බැලීමේදී, විනිසුරු සූරසේන මහතා පනත් කෙටුම්පතේ 'පෞද්ගලික ආයතනයක් යන්නෙහි අර්ථ දැක්වීම වෙත යොමු විය. පනත් කෙටුම්පතේ 29 වන වගන්තියට අනුව, පෞද්ගලික ආයතනයක් යනු "ඕනෑම ලිඛිත නීතියක් යටතේ ස්ථාපිත, පිළිගත් හෝ බලපත්‍රලාභී ආයතනයක් ලෙස අර්ථ දක්වා ඇති අතර එයට උසස් අධ්‍යාපන ආයතනයක්, විශ්ව විද්‍යාලයක් සහ වෘත්තීය ආයතනයක් සහ රජය විසින් සම්පූර්ණයෙන්ම අරමුදල් සපයන ආයතන හැර වෙනත් වෘත්තීය හෝ තාක්ෂණික අධ්‍යාපනය ලබා දෙන ආයතනයක් ඇතුළත් වේ."[183] බෞද්ධ විශ්ව විද්‍යාල, පිරිවෙන් සහ වෙනත් සමාන ආයතන මෙම නිර්වචනය යටතට වැටෙන බවත්, පනත් කෙටුම්පතේ නියමයන්ට අනුව ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතා මූලධර්මවලට

177 ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතා පනත් කෙටුම්පත, වගන්තිය 2 (2024 අප්‍රේල් 17 දින රාජ්‍ය ගැසට් පත්‍රයේ ප්‍රකාශිත)

178 එම පනත් කෙටුම්පත, වගන්තිය 3

179 ඉහත නඩු අංක SC SD 54/2024 සහ SC SD 55/2024 (ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතා පනත් කෙටුම්පත් නඩුව)

180 එම නඩු, පිටු 41, 45

181 එම නඩු, පිටු 21

182 එම

183 SC SD 54/2024 සහ SC SD 55/2024 (ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතා පනත් කෙටුම්පත් නඩුව), පිටු 22, කෙටුම්පතේ වගන්තිය 29 උපුටා ගැනීම

අනුකූල විය යුතු බවත් නිරීක්ෂණය විය.[184] එබැවින්, ඕනෑම ස්ත්‍රීපුරුෂ භාවයක් හෝ ස්ත්‍රීපුරුෂ සමාජභාවයක් සහිත පුද්ගලයකු ආගමික ආයතනවලට ඇතුළත් කරගැනීමෙන් බැහැර කිරීම, ස්ථාපිත ආගමික පිළිවෙත් පිළිපැදීමට අනුව සිදු වුවද ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතා පනත් කෙටුම්පත උල්ලංඝනය කිරීමක් ලෙස සැලකීමට ඉඩ තිබේ.

මීට අමතරව, ස්ත්‍රීපුරුෂ භාවය හෝ ස්ත්‍රීපුරුෂ සමාජභාවය මත පදනම්ව මෙම ආයතනවලට ඇතුළත් කරගැනීම සීමා කිරීමේ පිළිවෙත නීති සම්පාදනයේ[185] දී ග්‍රහණය කරගෙන තිබුණද, ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතා පනත් කෙටුම්පත නීතියක් ලෙස සම්මත වුවහොත් මෙම සීමාවන් ක්‍රියාත්මක නොවනු ඇති බව විනිසුරු සූරසේන මහතා සඳහන් කළේය. මෙයට හේතුව වූයේ, වෙනත් ලිඛිත නීතියක් සමඟ කිසියම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතා පනත් කෙටුම්පතේ විධිවිධාන බලපැවැත්වෙන බවට සඳහන් වන පනත් කෙටුම්පතෙහි 28 වන වගන්තිය මගින් පනත් කෙටුම්පතේ විධිවිධානවලට ප්‍රමුඛතාවය ලබා දී තිබීමයි.[186]

පනත් කෙටුම්පත නීතියක් ලෙස සම්මත වුවහොත්, එයට ඇතුළත් විය හැකි සමරිසිභාවය සාපරාධී බවින් තොර කිරීම සහ සමරිසි විවාහ නීතිගත කිරීම සම්බන්ධයෙන් ආගම ප්‍රශ්නගත වීම කෙරෙහි ද මෙම තීන්දුව සුවිශේෂී සැලකිල්ලක් දැක්වීය.[187] උදාහරණයක් ලෙස සමරිසි විවාහ සම්බන්ධයෙන්, තීන්දුවේ 29 වන පිටුවේ පහත පරිදි සඳහන් වේ.

"මේ අනුව, මෙම පනත් කෙටුම්පත නීතියක් බවට පත් වූ විට, මෙම පනත් කෙටුම්පතේ අර්ථ දැක්වීම් සහ විධිවිධාන හරහා ඕනෑම උනන්දුවක් දක්වන පාර්ශවයකට සමරිසි විවාහ සඳහා නීතිමය තත්ත්වය ඉල්ලා සිටීමට හැකි බව පැහැදිලිය. මෙය අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ අපගේ සංස්කෘතිය අපේක්ෂා නොකළ දෙයකි.

සංස්කෘතිය සහ ආගම යන දෙකම මේ රටේ ජනතාවගේ භාවිතයේ කොටසක් සහ අංගයක් වන බැවින් මේ රටේ පිළිපදින සියලුම ආගම් මෙම සංස්කෘතියෙන් බැහැර වී නැත. පොදුවේ ගත් කළ සංස්කෘතිය සහ ආගම පිළිපැදීම රටේ නීතියට පටහැනි විය නොහැක."[188]

ඉහත විස්තර කර ඇති ආකාරයට, ආගම් විසින් අනුගමනය කරන නීති, රීති සහ පිළිවෙත් උල්ලංඝනය කිරීමෙන්, ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතා පනත් කෙටුම්පත ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි සිතීමේ, හෘද සාක්ෂියේ සහ ආගම ඇදහීමේ නිදහස පිළිබඳව වන 10 වන ව්‍යවස්ථාව මෙන්ම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(ඉ) ව්‍යවස්ථාවේ ආගමක් ඇදහීම ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝනය වන බවට තීරණය විය.[189] ඊට අමතරව, ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතා පනත් කෙටුම්පත මගින් නිෂේධනය කරන නීති,

---

184 එම නඩුව, පිටු 22

185 විනිශ්චයයේ සලකා බැලූ එක් උදාහරණයක් වූයේ 1979 අංක 64 දරණ පිරිවෙන් අධ්‍යාපන පනතේ 2 වගන්තිය යි. එහි සඳහන් වන්නේ "පිරිවෙන් අධ්‍යාපනයේ අරමුණ වන්නේ අ) භික්ෂූන්ට සහ බ) වයස අවුරුදු 14ට වැඩි, පිරිවෙන් තුළ දක්වන අධ්‍යාපන පාඨමාලාව අනුගමනය කිරීමට සහ බුද්ධාගමික පරිසරයක අධ්‍යාපනය ලබන්නට කැමති පිරිමි පෞද්ගලික ශිෂ්‍යයන්ට අධ්‍යාපන පහසුකම් සපයන බවයි."

186 ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතා පනත් කෙටුම්පත, වගන්තිය 3, වගන්තිය 28

187 ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතා පනත් කෙටුම්පත් නඩුව, පිටු 29, 32. එසේ වුවද, ඉහළ අධිකරණ විශේෂ විනිශ්චය අංක 13/2023 (දණ්ඩනීති සංග්‍රහ සංශෝධන පනත) යටතේ සමලිංගික කටයුතු අපරාධ හෝ නීතිවිරෝධී බව ඉවත් කිරීම සම්බන්ධයෙන් අයදුම්කරුවන් විසින් කළ තර්කය "සමලිංගික ක්‍රියාකාරකම් බුද්ධාගමික විරුද්ධ වන අතර එබැවින් ව්‍යවස්ථාවේ අතිරේක අංශ 9 කිළිටු කරන බව" ඉහළ අධිකරණ මණ්ඩලය විසින් යෝග්‍යතාවය නොමැතිකම හේතු ලෙස දක්වමින් ප්‍රතික්ෂේප කර තිබීම මෙහිදී අවධානයට ගත යුතුය.

188 ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතා පනත් කෙටුම්පත් නඩුව, පිටු 29

189 එම නඩුව, පිටු 23

රීති සහ පිළිවෙත් බුද්ධාගමට අයත් වූ විට, ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතා පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන වගන්තියට පටහැනි බව ද තීරණය විය.[190]

190 එම නඩුව, පිටු 22

# ලකුණු රැස් කිරීම සහ RAG ශ්‍රේණිගත කිරීම

සෑම උප දර්ශකයක්ම 1-10 පරිමාණයකින් ශ්‍රේණිගත කර ඇත. එකතු කරන ලද ලකුණු වල සාමාන්‍යය එක් එක් ප්‍රධාන දර්ශකය සඳහා ලකුණු තීරණය කරයි [වැඩිදුර විස්තර සඳහා 'දර්ශක සහ ලකුණු රැස් කිරීම/පර්යේෂණ ක්‍රමවේදය' පිළිබඳ 2 වන කොටස බලන්න].

පහතින් දිස්වන ලකුණු ලබා දීම සිදු කර ඇත්තේ ශ්‍රී ලංකාවේ වත්මන් ව්‍යවස්ථාදායක රාමුව මත පදනම්ව වන අතර, එහිදී නීතිය බලාත්මක කිරීමේ යාන්ත්‍රණ හෝ රාජ්‍ය යාන්ත්‍රණ හෝ මගින් ක්‍රියාත්මක කිරීම සැලකිල්ලට ගෙන නැත.

| සුචකය | | ලකුණ | තර්කය | RAG ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|---|
| **සුචකය 1: ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස (FoRB) සඳහා සහය දක්වන මූලික නීතිමය රාමුවක්** | | | | |
| 1. | ශ්‍රී ලංකාව ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස පිළිබඳ අදාළ ජාත්‍යන්තර උපකරණ අපරානුමත කර දේශීය වශයෙන් එවැනි වගකීම් ක්‍රියාත්මක කිරීමට හැකි නීති සම්පාදනය කර තිබේද? | 7 | ශ්‍රී ලංකාව සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය අපරානුමත කර ඇත. 2007 සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත, එය ක්‍රියාවට නැංවීම හැකි කරවන නීතිය ලෙස බලාත්මක කර ඇත. පනතේ 3 වන වගන්තිය අදාළ කරගත හැකි විෂය පථය පුළුල් යැයි විවේචනයට ලක්ව ඇත. ශ්‍රී ලංකාව ද සියලු ආකාරයේ වාර්ගික වෙනස්කොට සැලකීම් තුරන් කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට එකඟ වී ඇත. | |
| 2. | ශ්‍රී ලංකාව සිය ජාත්‍යන්තර කැපවීම්වලට අනුකූලව, ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සඳහා ව්‍යවස්ථාමය ආරක්ෂාවක් ලබා දී තිබේද? | 7 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආගම ප්‍රකාශ කිරීමේ නිදහස ඇතුළුව ආගමක් ඇදහීමේ නිදහස ස්ථාපනය කර ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විධිවිධාන, ඇතැම් විට විෂය පථයෙන් ජාත්‍යන්තර කැපවීම්වලට වඩා පටු වන අතර එමගින් ආගමක් ඇදහීමේ නිදහසට අඩු ආරක්ෂාවක් සපයයි. ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස පිළිබඳ සීමාවන් පිළිගන්නා නමුත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව වේ | |

| සුචකය 2: ආරක්ෂාව පිළිබඳ කාරණා සම්බන්ධයෙන් ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහසට සහය වන නීති | | | |
|---|---|---|---|
| 1. සාමයට සිදුවන ඕනෑම බාධාවකින් සහ ආරක්ෂාවට එල්ල වන තර්ජනවලින් ආරක්ෂා වෙමින්, සාමකාමී ලෙස ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යවස්ථාදායක රාමුව විධිවිධාන සපයයිද? | 5 | දණ්ඩ නීති සංග්‍රහය, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත සහ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත යන පනත්වල විධිවිධාන සියල්ලම සාමයට බාධා කිරීම් සහ ආරක්ෂාවට ඇති තර්ජනවලට එරෙහිව ආරක්ෂාව සපයන බව පෙනේ. කෙසේ වෙතත්, මෙම විධිවිධාන සකස් කර ඇති පුළුල් ආකාරය, සුළු ජාතීන් ඉලක්ක කර ගැනීම සඳහා ඒවා උපයෝජනය කිරීම සහ භාවිත කිරීමට ඒවා විවෘත කරයි. | |
| 2. ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායක රාමුව ආගමික ස්ථාන සඳහා ප්‍රමාණවත් ආරක්ෂාවක් සපයන්නේද? | 7 | නීතිමය ආරක්ෂාව දණ්ඩ නීති සංග්‍රහය හරහා ආගමික ස්ථානවලටත්, අදාළ වැදගත්කමක් ඇති අවස්ථාවන්හිදී පුරාවස්තු ආඥා පනත හරහා [මෙම විධිවිධාන ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම 2 වන පරිච්ඡේදය යටතේ සලකා බැලේ] ද ලබා දේ. | |
| **සුචකය 3: ප්‍රකාශන නිදහස සම්බන්ධයෙන් ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහසට (*FoRB*) සහය වන නීති** | | | |
| 1. ව්‍යවස්ථාදායක රාමුව විසින් වාර්ගික-ආගමික කණ්ඩායම්වල ආගමික ප්‍රකාශනයට/ආගම ප්‍රකාශ කිරීමට ඉඩ සලසන්නේද? | 9 | නීති සම්පාදනය අතින් දැනට ඇති එකම සැලකිය යුතු සීමාව වන්නේ ශබ්ද දූෂණය නියාමනය කරන නීති ය: එය ජාත්‍යන්තර ප්‍රමිතීන් යටතේ පිළිගත් සීමාවන්ට අනුකූලව අවසර ලැබිය හැකි සීමාවකි. | |
| 2. ව්‍යවස්ථාදායක රාමුව ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස පිළිබඳ අවශ්‍යතා ප්‍රකාශනයේ නිදහස සමඟ තුලනය වේ ද? | 6 | ආගම සහ ආගමික හැඟීම් ආරක්ෂා කිරීම සඳහා ආගමේ පදනම මත ප්‍රකාශනය සඳහා පුළුල් සීමාවන් ඇත. සීමා කිරීම්වල පුළුල් ස්වභාවය අවශ්‍යතාවය සහ සමානුපාතිකත්වය පිළිබඳ අවශ්‍ය පරීක්ෂණ සපුරාලන්නේ නැති, පමණ ඉක්මවූ වාරණයකට හේතු විය හැක. | |
| **සුචකය 4: ආගමකට හැරවීම පිළිබඳ කාරණා සම්බන්ධයෙන් ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහසට සහය වන නීති** | | | |
| 1. ව්‍යවස්ථාදායක රාමුව ආගමට හරවා ගැනීම සම්බන්ධයෙන් ආරක්ෂාව ලබා දෙනවාද /ආගම ප්‍රචාරය කිරීමට ඇති අයිතිය හඳුනා ගන්නවාද? | 4 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අයිතියක් ලෙස පිළිගෙන නොමැත. මෙම ස්ථාවරයට අධිකරණය විසින් අනුබල ලබා දී ඇත. | |

| | | | |
|---|---|---|---|
| 2. ව්‍යවස්ථාදායක රාමුව ප්‍රචාරණය තහනම් කිරීමෙන් වැළකී සිටිනවාද? | 5 | ආගමකට හැරවීමට එරෙහි නීති සම්පාදනය සඳහා ගත් උත්සාහයන් අසාර්ථක වී ඇත. ප්‍රචාරය කිරීමේ හැකියාව සඳහා ආරක්ෂාවක් නොමැති වුවද, එවැනි ක්‍රියාකාරකම් ද නීති විරෝධී නොවන බව අධිකරණය විසින් අනුමත කර ඇත. | |
| **සූචකය 5: ආගමට හෝ විශ්වාසයට වෙනස්කොට සැලකීමක් සිදු කරන වෙනත් නීති නොමැති වීම** | | | |
| 1. ව්‍යවස්ථාදායක රාමුව එහි ජනගහනය මත රාජ්‍ය/බහුතර ආගමක් පැනවීමෙන් වළකිනවාද? | 4 | බුද්ධාගමට ව්‍යවස්ථාපිතව ප්‍රමුඛස්ථානය ලබා දී තිබේ. | |
| 2. ව්‍යවස්ථාදායක රාමුව අධ්‍යාපනය සම්බන්ධයෙන් ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමට ඇති නිදහස සම්බන්ධ අවශ්‍යතා ආමන්ත්‍රණය කරන්නේ කෙසේද? | 6 | දෙමව්පියන්ගේ ආගම පිළිබඳ පාසලේදී උපදෙස් ලබා ගැනීමේ අයිතිය ලබා දී ඇත. රජයේ පාසල්වලට ඇතුළත් කර ගැනීමේදී, පාසල රජයට පවරන අවස්ථාවේ විවිධ ආගම්වලට අයත් දරුවන්ගේ අනුපාතය සැලකිල්ලට ගනු ඇත. | |
| 3. රටක පුරවැසියන් නොවන අයට ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමට ඇති නිදහසේ ආරක්ෂාවෙන් ප්‍රතිලාභ ලැබේද? | 4 | සමහර ව්‍යවස්ථාපිත සහතික කිරීම් පුරවැසියන්ට පමණක් ලබා දී ඇති අතර, ඉන් ආරක්ෂාව සීමා කර ඇත. සරණාගතයින්ට විධිමත් ආරක්ෂාවක් ලබා නොදේ. ශ්‍රී ලංකාව 1951 සරණාගත සම්මුතියට එකඟ වී නොමැත. | |
| **සූචකය 6: පූජනීය ස්ථාන සහ ඇදහිලි පදනම් කරගත් සංවිධාන පිහිටුවීම සහ නඩත්තු කිරීම** | | | |
| 1. ව්‍යවස්ථාදායක රාමුව පූජනීය ස්ථාන පිහිටුවීම සහ නඩත්තු කිරීම සඳහා පහසුකම් සලසයිද? | 4 | පූජනීය ස්ථාන පිහිටුවීම සහ නඩත්තු කිරීම සඳහා ඇති බාධා අතරට අනිවාර්ය ලියාපදිංචිය නියෝග කරන චක්‍රලේඛයක් තිබීම, ලියාපදිංචිය ලබා ගැනීමේ දුෂ්කරතා සහ ලියාපදිංචියක් නොමැතිකම එකී පූජනීය ස්ථාන ඉලක්ක කර ගැනීමට භාවිතා කිරීම ඇතුළත් වේ. | |
| 2. ඇදහිලි පදනම් කරගත් සංවිධාන පිහිටුවීම සහ පවත්වාගෙන යාම සඳහා නීතිය පහසුකම් සලසයිද? | 4 | යෝජිත රාජ්‍ය නොවන සංවිධාන නීතියෙන් අනිවාර්ය ලියාපදිංචිය සහ රජයේ ප්‍රතිපත්තියට දැඩි ලෙස අනුකූල වීම සඳහා නියම කරන අතර එමගින් විරුද්ධ මත අධෛර්යමත් වේ. මෙම නීතිය සම්බන්ධයෙන් අර්ථවත් අදහස් විමසීම් කිසිවක් සිදු කර නොමැත. නිල කෙටුම්පතක් බෙදා හැර නොමැති බැවින් ඇදහිලි පදනම් කරගත් සංවිධාන කෙරෙහි ඇති බලපෑම තීරණය කිරීම දුෂ්කර ය. | |



## 2 වන පරිච්ඡේදය

# සමාජ දේශපාලනය සහ ආණ්ඩුකරණය

ආණ්ඩුවට සහ දේශපාලන ක්‍රියාකාරීන්ට බලපාන ප්‍රධාන ප්‍රවණතා සහ රටා

## සොයාගත් ප්‍රධාන කරුණු

- රාජ්‍ය අනුග්‍රහය අඩු වී ඇතත්, උතුරු හා නැගෙනහිර මතභේදයට තුඩු දුන් ආගමික ස්ථානවල හා සම්බන්ධ තත්වයන් පෙන්නුම් කරන්නේ බෞද්ධ උරුමයන්ට ප්‍රමුඛත්වය දෙන අතරම අනෙක් ආගම් අවතක්සේරු කරන ප්‍රවණතා අඛණ්ඩව පවතින බව ය.
- ආගමික කණ්ඩායම් සහ පූජනීය ස්ථාන සම්බන්ධයෙන් නීති සහ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය බහුතරයට පක්ෂපාතී බවක් දැක්වීමට නැඹුරු වන අතර, බොහෝ ගැටුම්වලදී බෞද්ධ අවශ්‍යතාවලට ප්‍රමුඛත්වය දෙන අතර සුළු ජාතීන් සම්බන්ධ ගැටුම්වලදී එහි බහුතර ප්‍රජාවට වැඩි සැලකිල්ලක් ලබා දෙයි.
- සමාජ-දේශපාලනික මට්ටමින් බෞද්ධ දැඩි මතධාරී කණ්ඩායම් සම්බන්ධ සිදුවීම් වාර්තා වී නොමැති වුවද, මුස්ලිම් විරෝධී සහ ක්‍රිස්තියානි විරෝධී හැඟීම් ප්‍රවර්ධනය කරන හින්දු දැඩි මතධාරී සංවිධාන හා සම්බන්ධ සිදුවීම්වල වැඩිවීමක් දක්නට ලැබේ.
- සංවිධානාත්මක ව්‍යාපාර සහ රාජ්‍ය පියවරවල තීව්‍රතාවය ලිහිල් වී ඇතත්, ඇතැම් ප්‍රදේශවල නිරන්තර රාජ්‍ය පක්ෂග්‍රාහීත්වය සහ දිගින් දිගටම පවතින සීමාකිරීම් මුස්ලිම් ප්‍රජාවේ කොටස් කොන් කිරීමට ලක් කරයි.
- 2024 මැතිවරණ ආගමික කණ්ඩායම් ඉලක්ක කරගත් හානිකර කතාවල සැලකිය යුතු අඩුවීමක් පිළිබිඹු කරන අතර, දේශපාලනික සහ සංකේතාත්මක අභිනයන් වඩාත් ඇතුළත් කරගන්නසුළු සහ පිළිගන්නාසුළු සංස්කෘතියක් සඳහා යම් විවෘතභාවයක් පෙන්නුම් කරයි.

රාජ්‍යත්වය සහ රජය සමග බුදුදහම සම්බන්ධ කිරීම තුළ එහි උත්තරීතරභාවය තීරණය වී ඇති අතර, එය ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස පිළිබඳ බලපෑම් සහිතව රජයට සහ දේශපාලන ක්‍රියාකරුවන්ට බලපෑම් කරයි. වාර්ගික-ජාතිකවාදී ව්‍යාපෘති සඳහා රාජ්‍ය අනුග්‍රහය ලිහිල් කිරීම සහ 2024 පරිපාලනය විසින් කරන ලද සමහර ඉලක්කගත මැදිහත්වීම් සමග ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස වැඩිදියුණු වී ඇති අතර, ගැටළු සහගත භාවිතයන් තවමත් පවතී.

## 1. ආගමික උරුම ආරක්ෂා කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බුද්ධාගමට "ප්‍රමුඛස්ථානය" ලබා දෙන අතර, එය රාජ්‍යත්වය සහ රජය සමඟ නිල වශයෙන් පිළිගනී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් රාජ්‍යයට "බුද්ධශාසනය ආරක්ෂා කර පෝෂණය කිරීමට" ද නියෝග කර ඇත. [1 වන පරිච්ඡේදය, 4.1 වගන්තිය බලන්න] මෙය විහාරස්ථාන, නෂ්ටාවශේෂ, විහාර ඉඩම් සහ ගිහි බැතිමතුන්ට අදාළ බෞද්ධ පිළිවෙත් සහ මතවාද ආරක්ෂා කිරීම දක්වා විහිදේ.[191]

අනුප්‍රාප්තික රජයන් මෙම නියෝගය පිළිපදිමින් බුද්ධාගම "ශ්‍රේෂ්ඨත්වය"[192] සමඟ සම්බන්ධ කර ඇති අතර මෙම හැඟීම ජාතික, සමාජීය සහ පෞද්ගලික මට්ටම්වලට විනිවිද ගොස් ඇත. උරුම ස්ථාන සංරක්ෂණය

191 වෙරිටේ රිසර්ච්, අදෘශ්‍යය විශ්වාස: ශ්‍රී ලංකාවේ ආගමික උපාස්නාවේ අයිතියේ හිස්තල සම්බන්ධයෙන් පිළිතුරු සෙවීම, (වෙරිටේ රිසර්ච්, ජූලි 2024), පිටුව 22, https://www.veriteresearch.org/wp-content/uploads/2024/07/20240507_VeriteLegal_FadingBeliefs.pdf

192 Nazila Ghanea, ධර්මය හෝ විශ්වාසය යටතේ වෛරය පිළිබඳ වාර්තාව: ආගමික නිදහස පිළිබඳ විශේෂ වාර්තාකරුගේ වාර්තාව, (එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සභාව, අප්‍රේල් 2024), පිටු 5, https://documents.un.org/doc/undoc/gen/g23/267/05/pdf/g2326705.pdf

හා කළමනාකරණය සඳහා රාජ්‍යයේ ප්‍රවේශය හරහා මෙම ස්ථාවරය අනාවරණය කරයි.

2023 සහ 2024 වසරවලදී, අනුරාධපුර පූජා භූමි සංවර්ධන සැලැස්මේ කටයුතු කඩිනම් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. මෙම ස්ථානය ශ්‍රී ලංකාවේ උතුරු-මැද පළාතේ පිහිටා ඇති යුනෙස්කෝ ලෝක උරුම ස්ථාන හතරෙන් එකකි. ජූලි මාසයේදී, නගර ප්‍රවේශයේ[193] අනාගත ඉදිකිරීම් තහනම් කරමින්, ස්ථානය ආරක්ෂා කිරීමට නව පියවර ගන්නා බව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ප්‍රකාශ කළ අතර, ජනාධිපතිතුමා, සංචාරයක නිරත වූ යුනෙස්කෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ පුරාවිද්‍යාත්මක කැණීම්වලදී සහයෝගීතාවය පිළිබඳව සාකච්ඡා කළ බව වාර්තා වේ.[194]

ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රජාවට ද ඇතුළුව මෙම ස්ථානවල විශ්වීය හා ජාතික වැදගත්කම සැලකිල්ලට ගෙන, මෙයට අවධානය යොමු කිරීම අවශ්‍ය වන අතර එය සාදරයෙන් පිළිගත යුතුය. කෙසේ වෙතත්, අධ්‍යයනවලින් ඇඟවෙන්නේ උරුම ස්ථාන ආරක්ෂා කිරීම සඳහා වන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ (DoA) මෙහෙයුම්, 'ශ්‍රී ලංකාවේ සමස්ත පුරාවිද්‍යාත්මක උරුමය ආරක්ෂා කිරීමේ' කාර්යය පැවරී තිබියදීත්, සිංහල-බෞද්ධ බහුතරයට සම්බන්ධ ස්ථානවලට ප්‍රමුඛත්වය දෙන බවයි.

මුරුගන් දෙවියන්ට වන්දනාමාන කරන හින්දු කෝවිලක නටබුන් පිහිටා ඇති පුරාණ ජනාවාසයක් ලෙස විස්තර කෙරෙන ත්‍රිකුණාමලයේ (නැගෙනහිර) කන්දසාමි කන්ද වැනි ස්ථානවලට දක්වන සැලකීමෙන් මෙය පැහැදිලි වේ. 2013 දී රජය කන්දසාමි කන්ද ආරක්ෂිත 'පුරාවිද්‍යාත්මක ස්ථානයක්' ලෙස ප්‍රකාශයට පත් කළද, පුරාණ සෙල්ලිපි විකෘති වී, නටබුන් පිළිසකර නොකර පවතින එම ස්ථානය ආරක්ෂා කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව වාර්තා වේ.[195]

තවත් ප්‍රසිද්ධ පූජනීය ස්ථාන ද අසාධාරණ ලෙස සැලකීම සම්බන්ධයෙන් පැමිණිලි කර ඇත. ත්‍රිකුණාමලයේ පිහිටා ඇති තිරුකෝනේශ්වරම් ද ක්‍රි.පූ. 205 දක්වා දිවෙන ඉතිහාසයක් ඇති හින්දු බැතිමතුන්ගේ වැදගත් ස්ථානයක් ලෙස සැලකේ.[196] දේශීය හා ජාත්‍යන්තර සංචාරකයින් යන දෙපිරිසටම ප්‍රධාන ආකර්ෂණයක් වුවද, එම ස්ථානයේ ආරක්ෂාව සහ පරිශුද්ධභාවයට හානි කරමින් කෝවිලට ආසන්නව නව මාර්ග සහ වෙළඳ ස්ථාන විවෘත කිරීම ඇතුළු සංවර්ධනයන් සිදුවන බව කෝවිලේ පරිපාලනය සහ ප්‍රදේශයේ දේශපාලන නියෝජිතයින්, ඉස්මතු කර ඇත.[197]

තොරතුරු දැනගැනීමේ අයිතිය (RTI) යටතේ කරන ලද ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව අවධාරණය කළේ එය "ආගම, වාර්ගිකත්වය හෝ වෙනත් විශේෂතා මත පදනම්ව කැ!ම් සිදු නොකරන බවයි...". "වාර්ෂිකව වෙන් කරන ලද මුදල... ප්‍රමාණවත් නොවීම..." යන කාරණය සැලකිල්ලට ගෙන "කැණීම්

193 කෙනෝලි පෙරේරා, "අනුරාධපුර ශාක්‍ය භූමිය: නගරයට පිවිසුමේ නව ඉදිකිරීම් තහනමක්," The Morning, 2024 ජූලි 21, https://www.themorning.lk/articles/skKfP5lgC5za6U99Tqck

194 ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය - ප්‍රංශය, "ජනාධිපති රනිල් වික්‍රමසිංහය පැරීසියේ UNESCO අධ්‍යක්ෂ ජනරාල්වරිය වන ඕඩ්රි අසොලේ සමග පැවති හමුවකදී ශ්‍රී ලංකාව සහ UNESCO අතර සහයෝගය පිළිබඳ සාකච්ඡා කරයි," 2023 ජූනි 26, https://www.srilankaembassy.fr/en/page/953-president-ranil-wickremesinghe-discusses-sri-lankas-cooperation-unesco-meeting

195 නීතිමය විකල්ප සඳහා මධ්‍යස්ථානය, ශ්‍රී ලංකාවේ ඉඩම් ගැටුම්වල අන්තර්කේන්ද්‍රීය ප්‍රවණතා, (අගෝස්තු 2024), පිටු 53-54, https://www.cpalanka.org/the-intersectional-trends-of-land-conflicts-in-sri-lanka ඕක්ලන්ඩ් විශ්වවිද්‍යාලය, ත්‍රිකුණාමලය අවධානමකට යටත්ව ඇත: ශ්‍රී ලංකාවේ දෙමළ ජනපදය අරමුණු කර ගත් භූමි අල්ලා ගැනීම්, (සැප්තැම්බර් 12, 2024), පිටු 16, https://www.oaklandinstitute.org/trincomalee-under-siege-land-grabs-target-tamil-homeland-sri-lanka ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි එවන්ජේලිකල් සංගමය (NCEASL), හින්දුන්ට එරෙහි වද හා භීෂණ ක්‍රියා සිදුවීම් 2024, ප්‍රකාශයට නොගෙන ඇති වාර්තාවක්, දෙසැම්බර් 2024

196 "ඊලමයේ පංච (පස්) ඉශ්වරම්," Tamil Nation, 1999 ඔක්තෝබර් 16, https://tamilnation.org/heritage/eelam/fiveishwarams#Koneshwaram

197 ඩී.බී.එස්. ජෙයරාජ්, "මුරුගේසෙන් තිරුවෙල්වම් සහ කෝනේශ්වරම් කලාපය," ඩේලි මිරර්, 2022 නොවැම්බර් 19, https://sangam.org/murugeysen-tiruchelvam-and-koneswaram-issue/

සිදු කරනු ලබන්නේ... බාහිර ප්‍රතිපාදනවලින්" බව ද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ප්‍රකාශ කළේය.[198] 2023 මැයි මාසයේදී එවකට ජනාධිපති වික්‍රමසිංහ මහතා කැණීම් සිදු කිරීම සඳහා බෞද්ධ භික්ෂූන්ගෙන් අරමුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විවේචනය කළේය.[199] බාහිර අරමුදල් සපයන්නන්ගේ අභිප්‍රායන් ජාතික පුරාවිද්‍යාත්මක වටිනාකම සහ සංරක්ෂණය කෙරෙහි පමණක්ම කේන්ද්‍රගත නොවිය හැකි බැවින්, අරමුදල් ක්‍රියාවලීන් විධිමත් කිරීම සලකා බැලීම මෙම සන්දර්භය තුළ වැදගත් වේ.

උරුම කළමනාකරණය වටා පිහිටුවා ඇති කමිටුවල ද පැහැදිලි පක්ෂග්‍රාහීත්වයක් දක්නට ලැබේ. මාර්තු මාසයේදී එවකට බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය විදුර වික්‍රමනායක මහතා පුරාවස්තු සහ පුරාවිද්‍යාත්මක උරුමයන් සොයා ගැනීම සහ සංරක්ෂණය කිරීම කළමනාකරණය කිරීම අරමුණු කරගත් නව පනත් කෙටුම්පතක් සකස් කිරීමට සැලසුම් කරන බව නිවේදනය කළේය.[200] පනත් කෙටුම්පත පිළිබඳව වන වාර්තා කිරීම්වලින් ඇඟවෙන්නේ බෞද්ධ ආගමික නායකත්වය සමග පමණක් සාකච්ඡා කළ බවයි. උරුමය පිළිබඳ සාකච්ඡාවලදී ආගමික සුළුතරයන් බැහැර කිරීම අලුත් දෙයක් නොවේ. 2020 දී, එවකට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා නැගෙනහිර පළාතේ 'උරුම කළමනාකරණය' සඳහා සාමාජිකයින් 11 දෙනෙකුගෙන් යුත් කාර්ය සාධක බලකායක් පත් කළ අතර, පළාතේ බහුතරය දෙමළ හෝ මුස්ලිම් ප්‍රජාව නියෝජනය කළ ද, කාර්ය සාධක බලකායට මුලිකවම කිසිදු දෙමළ හෝ මුස්ලිම් ජාතිකයෙකු ඇතුළත් නොවීය.[201] ජාතික උරුමය පිළිබඳ සාකච්ඡාවලට අනන්‍යතා දේශපාලනය, ජනවිකාස සහ ඉඩම් පාලනයට[202] බලපෑම් කළ හැකි ප්‍රතිපත්ති සකස් කිරීමේ හැකියාව ඇති බැවින්, මෙම බැහැර කිරීමේ රටාව කණගාටුදායක වේ.

## 2. උරුමය පිළිබඳ විසංවාදවලදී ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස

සුළුතරය නියෝජනය කරන ආගමික ස්ථාන පැහැදිලිවම නොසලකා හැරීමට සහ උරුමයන් පිළිබඳ සාකච්ඡාවලදී සුළුතර කණ්ඩායම් බැහැර කිරීමට අමතරව, මතභේදයට තුඩු දී ඇති ආගමික ස්ථාන ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සම්බන්ධයෙන් වඩා උග්‍ර උත්සුකයන් මතු කරයි. උතුරු හා නැගෙනහිර පළාත්වල ස්ථානයන්හි ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස උල්ලංඝනය කරන සිද්ධීන්ට අවිධිමත් තත්ත්වයන් යටතේ බෞද්ධ සංකේත පැනවීම, ආගමික සංකේත සහ ස්ථාන කෙලෙසීම සහ වන්දනාමාන කිරීම් සීමා කිරීම ඇතුළත් වී ඇත.

මෙහි ආරවුල්, ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස උල්ලංඝනය කරන අතරම, උතුරු-නැගෙනහිර ගැටුම්-උරුමය පිළිබඳ ගැටළු සහ ප්‍රාදේශීය ස්වයං පාලනය විමධ්‍යගත කිරීම සඳහා වන

198 කතෘ විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් (RTI) ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සපයන ලද තොරතුරු. 2022 දෙසැම්බර් 3

199 "ශ්‍රී ලංකා ජනාධිපතිවරයා භික්ෂූන්ගෙන් අරමුදල් ලබාගැනීම පිළිබඳ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට වරද සටහන් කරයි," EconomyNext, 2023 මැයි 12, https://economynext.com/sri-lanka-president-raps-archeological-dept-for-obtaining-funds-from-monks-120425/

200 "පුරාවිද්‍යා උරුමය ආරක්ෂා කිරීම සඳහා නව පනත් ක්‍රියාවලියක් යෝජනා කරයි," Daily News, 2024 මාර්තු 4, https://www.dailynews.lk/2024/03/04/admin-catagories/breaking-news/430450/new-act-proposed-to-preserve-archaeological-heritage/

201 ඔක්ලන්ඩ් ආයතනය, ත්‍රිකුණාමලය අවධානමට ලක්වෙයි: ශ්‍රී ලංකාවේ දමිළ ස්වදේශ භූමිය ඉලක්ක කරගත් ඉඩම් අල්ලා ගැනීම්, පිටු 14-15

202 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ශ්‍රී ලංකාවේ ඉඩම් ගැටුම්වල අන්තර්කේන්ද්‍රීය ප්‍රවණතා, පිටුව 83

නොවිසඳුණු ඉල්ලීම්වල සන්දර්භය තුළ ද පවතී. හින්දු භක්තිකයන්ට වැදගත් වන ස්ථානවල බෞද්ධ සංකේත පැනවීම 'දෙමළ නිජබිමක්'[203] පිළිබඳ ප්‍රකාශයන්ට ප්‍රතිරෝධයක් වශයෙන් පුළුල් ලෙස සැලකේ.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් 2023 දී පුරාවිද්‍යාත්මක ස්ථාන හඳුනා ගැනීම සම්බන්ධයෙන් පුවත් වාර්තාවක ප්‍රකාශයට පත් කළ තොරතුරුවල, නැගෙනහිර පළාත කෙරෙහි අලුත් අවධානයක් යොමු කිරීමක් පිළිබඳ ඇඟවුම් කරයි. 2023 දී, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් අම්පාර සහ මඩකලපුවෙහි (නැගෙනහිර) පුරාවිද්‍යාත්මක ස්ථාන 996 ක් හඳුනා ගත් අතර, එහි වෙබ් අඩවියේ සංඛ්‍යාලේඛන අනුරාධපුර, පොළොන්නරුව (උතුරු-මැද), ගාල්ල (නිරිතදිග) සහ මහනුවර (මධ්‍යම) හි පුරාවිද්‍යාත්මක ස්ථාන 329 ක සමස්තයක් දැක්වීය. වාර්තාවට අනුව, කොළඹදී මාධ්‍ය වෙත අදහස් දක්වමින් අමාත්‍ය වික්‍රමනායක මහතා යෝජනා කළේ, 'ඉතිහාසය' 'මකා දැමිය නොහැකි' බවත්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ක්‍රියාමාර්ග සංරක්ෂණය කෙරෙහි කේන්ද්‍රගත වූ බවත්ය.[204]

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත් වන සහ අසමාන ලෙස බලාත්මක කර හැසිරවූ බවට පුළුල් ලෙස සැලකෙන පුරාවස්තු පනත මෙම රටාව තවදුරටත් ප්‍රවර්ධනය කර ඇත [පරිච්ඡේදය 1, වගන්තිය 2.2 සහ වගන්තිය 4.5]. මෙම වසර තුළ කරන ලද පර්යේෂණ මගින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව -අනෙකුත් රාජ්‍ය දෙපාර්තමේන්තු සහ හමුදාව සමඟ එක්ව සිංහල-බෞද්ධ වාර්ගික ජාතිකවාදය දිගටම පවත්වාගෙන යාමට දායක වන බව පෙනෙන අවස්ථා ගණනාවක් ඉස්මතු කරයි.[205]

මුලතිව් (උතුර) හි කුරුන්තූර්මලෙයි ආති ශිවන් අයියනාර් කෝවිල පිහිටා ඇති, මතභේදයට තුඩු දුන් ස්ථානයේ සිදුවෙමින් පවතින ඉදිකිරීම් කටයුතු, මතභේදයට තුඩු දුන් ආගමික ස්ථානවල නව බෞද්ධ සංකේතවාදයක් පැනවීම හුවා දක්වයි.

පුරාවිද්‍යාත්මක ස්ථානයක් ලෙස 1933 දී ප්‍රථම වරට ගැසට් කරන ලද මෙම ස්ථානය, හින්දු චාරිත්‍ර හා පිළිවෙත් සමඟ පරම්පරා ගණනාවක් සම්බන්ධ වී ඇති බව වටහාගෙන ඇත. 2018 දී බෞද්ධ භික්ෂූන් විසින් බෞද්ධ ස්තූපයක් ස්ථාපනය කිරීමට ගත් උත්සාහයකින් පසුව, හින්දු ස්ථානයක් ලෙස ප්‍රදේශයේ වැදගත්කම අධිකරණය විසින් ද අවධාරණය කළ අතර, කෝලාහල වැළැක්වීම සඳහා පොලිසියට බලය පවරන ලදී. 2020 දී, බෞද්ධ ආරාමයක් වන 'කුරුන්දි විහාරය' පවතින බව සඳහන් වූ සමීක්ෂණයක්, එම ස්ථානයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම්වල[206] ආරම්භය සනිටුහන් කළේය. 'කුරුන්දි විහාරය' ලෙස වටහාගෙන ඇති නටබුන් මත ඉක්මනින්ම නව ස්තූපයක් ඉදිකිරීමට කටයුතු කළ අතර, එය ප්‍රතිසංස්කරණය කිරීමක් යැයි කියන ලදී. නව ඉදිකිරීම් ඉවත් කළ යුතු යැයි 2022 ජූලි මාසයේදී සිදු කළ නියෝගය ද ඇතුළුව නව ඉදිකිරීම් අවහිර කරන අධිකරණ නියෝග ගණනාවක් තිබියදීත් - මෙම කාර්යය දිගටම සිදු වේ.[207]

කරුණු මත පදනම්ව කැණීම් සිදු කිරීමට ගන්නා උත්සාහයන් වැදගත් සහ පිළිගත හැකි වුවත්, සැලකිලිමත් අන්දමින් සිදුකෙරෙන කැණීම් උත්සාහයන් දුර්වල කරමින් සහ සාමූහික ජනවාර්ගික ආගමික ඉතිහාසයේ

203 හරිඳු දසනායක සහ රාජනි ගමගේ, "කුරුන්දි සංවාදය සහ සංස්කෘතික (සහ අවශ්‍යතාවය පිළිබඳ) දේශපාලනය සිතියම්ගත කිරීම", Daily FT, 2024 ජූලි 22, https://www.ft.lk/columns/Mapping-the-Kurundi-discourse-and-politics-of-culture-and-expediency/4-750898

204 නෙත්මි රාජවාසම්, "නැගෙනහිර ප්‍රදේශයේ පුරාවිද්‍යා උද්ඛේශණ යළි ආරම්භ කිරීමට ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව තීරණය කරයි-අමාත්‍ය", EconomyNext, 2024 මාර්තු 18, https://economynext.com/sri-lanka-archaeology-dept-to-continue-excavations-in-the-east-minister-154506/

205 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ශ්‍රී ලංකාවේ ඉඩම් ගැටුම්වල අන්තර්කේන්ද්‍රීය ප්‍රවණතා, පිටුව 61

206 එම කෘතිය, පිටු 41-42

207 එම කෘතිය

පිළිගත හැකි පැවැත්ම නොසලකා හරිමින්, මෙම ස්ථානය 'සිංහල-බෞද්ධ' ලෙස ප්‍රකාශ කිරීමට කඩිමුඩියේ දරන උත්සාහය පිළිබඳව උත්සුකයන් ඉස් මතු වී තිබේ.[208]

හින්දු උරුමයට ඇති සම්බන්ධතා මකා දැමීම සහ වන්දනාමාන කිරීම අවහිර කිරීම ඇතුළු මෙම උත්සාහයන් ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස තවදුරටත් උල්ලංඝනය කිරීමට ද හේතු වී තිබේ. අවධාරණය කර ඇති පරිදි [1 වන පරිච්ඡේදය, 4.5 වන කොටස], කෝවිලේ හින්දු පිළිම ඉවත් කරන ලද බවත්, ප්‍රදේශයට බාධා නොකරන ලෙස ඉල්ලා සිටින රෙගුලාසි නොතකමින් ගස් පුළුස්සා දැමීම සහ කැපීම සිදු වූ බවත් මෙම වසර තුළ වාර්තා විය.[209]

තවද, බෞද්ධ සහ හින්දු ප්‍රජාවන් යන දෙපාර්ශ්වයම එම ස්ථානයට[210] පැමිණ චාරිත්‍ර ඉටු කරන අතර, ප්‍රජාවන්ට සැලකීම වෙනස් වේ. 2024 ජූනි මාසයේදී, අනුරාධපුරයේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා සහ සිංහල බැතිමතුන් ඇතුළු 200 කට අධික පිරිසක් එම ස්ථානයට පැමිණ, එතරම් බාධාවකින් තොරව සහ පොලිස් ආරක්ෂාවක් සහිතව එහි වන්දනාමාන[211] කළ නමුත් එම පැමිණෙන හින්දු ප්‍රජාව ආවේක්ෂණයට ලක්වන බව වාර්තා කර තිබේ.[212]

අවධාරණය කර ඇති පරිදි [1 වන පරිච්ඡේදය, 4.5 කොටස], 2018 දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමට හේතු වූ වවුනියාවේ වෙඩුක්කුනාරි ආති ලිංගේෂ්වරර දේවාලය අවට සංවර්ධනයන්හි ද, මතභේදයට තුඩු දුන් ස්ථානවල ආගමික වන්දනාමාන සඳහා පැනවූ සීමාවන් පැහැදිලිව දක්නට ලැබේ. ආතතීන්ගෙන් පිරුණු මෙම ස්ථානයේ මාර්තු මාසයේදී පැවති හින්දු බැතිමතුන්ගේ ශිවරාත්‍රි[213] සැමරුමට උසාවි නියෝගයක් මඟින් අවසර ලබා දී තිබුන ද, පොලිසිය ඊට බාධා කරන ලදී. මෙම කෝලාහලයේ ප්‍රතිඵලයක් ලෙස ආගමික සංකේත කෙලෙසීම, පොලිස් අත්අඩංගුවේ සිටියදී අයුතු ලෙස සැලකූ බවට වාර්තා වූ බැතිමතුන් අටදෙනෙකු අත්අඩංගුවට ගැනීම (පසුව චෝදනාවකින් තොරව නිදහස් කිරීම) සහ එක් බැතිමතෙකුට පහරදීමක් සිදු විය.[214]

ජූලි මාසයේදී, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් උරුම ස්ථානයක් ලෙස ද නම් කරන ලද මුලතිව්, කරයිතුරෙයිපත්තු හි නීරාවියාඩි පිල්ලෙයාර් දේවාලය පිහිටි ස්ථානයේ බලධාරීහු වාර්ෂික හින්දු උත්සවයක් වැළැක්වීමට උත්සාහ කළහ. ඕනෑම නව කැණීමක්, ඉදිකිරීමක් හෝ ස්ථාපනයක් තහනම් බවට අධිකරණ නියෝගයක් ලබාගත් පොලිසිය, බැතිමතුන් ශිව ලිංගයක් (ආගමික සංකේතයක්) ස්ථාපනය කිරීමට උත්සාහ කරන බවට චෝදනා කළේය. උත්සවය කඩාකප්පල් කිරීමේ උත්සාහයක් ලෙස විදුලිය විසන්ධි වූ බවත් පොලිසිය, හමුදාව සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අසල්වැසි පන්සලේ බෞද්ධ භික්ෂුව සමඟ හින්දු පූජකවරුන්ට[215] කලහකාරී ලෙස කතා කළ බවත් කෝවිලේ පරිපාලනය සහ බැතිමත්හු කියා සිටියහ.

208 මහාචාර්ය මහේන්ද්‍රන් තිරුවරන්ගන් (යාපනය විශ්වවිද්‍යාලය), ජෝවිටා අරුලනාන්දම් විසින් 2024 නොවැම්බර් 21 දින දුරස්ථව සිදු කරන ලද සම්මුඛ සාකච්ඡාවක්.

209 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ශ්‍රී ලංකාවේ ඉඩම් ගැටුම්වල අන්තර්කේන්ද්‍රීය ප්‍රවණතා, පිටු 41-42

210 හරින්ද්‍ර දසනායක සහ රජනි ගාමගේ, "කුරුන්දි කතාන්තරය හා සංස්කෘතික දේශපාලනය (සහ පහසුව)," Daily FT, ජූලි 22, 2024, https://www.ft.lk/columns/Mapping-the-Kurundi-discourse-and-politics-of-culture-and-expediency/4-750898

211 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ශ්‍රී ලංකාවේ ඉඩම් ගැටුම්වල අන්තර්කේන්ද්‍රීය ප්‍රවණතා, පිටු 41-42

212 "කුරුන්තුර්මලේදී උපස්ථාන කරන අතරතුර ශ්‍රී ලංකා පොලිසිය විසින් දෙමළ භක්තිකයන් මත නිරීක්ෂණ පැනවෙයි," Tamil Guardian, 2024 ජූනි 24, https://www.tamilguardian.com/content/tamil-devotees-subjected-surveillance-sri-lankan-police-during-worship-kurunthurmalai

213 ශිව දේවන් වහන්සේට අරපරිසමෙන් කැපවීමක් ලෙස පැවැත්වෙන උත්සවයක් වන අතර, භක්තයන් රාත්‍රිය පුරා අවධිව සිටිමින් විශේෂ පූජා සහ භක්ති ආචාර විධි ඉටු කරති.

214 NCEASL, හින්දු භක්තිකයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ බිය ගැන්වීම් සිදුවීම් 2024

215 එම

එලෙසම, නැගෙනහිර ප්‍රදේශයේදී, කන්දසාමි කන්දේ මුරුගන් දෙවියන්ගේ දේවාලයේ පෙබරවාරි මාසයේ පැවැත්වෙන මාසික පොංගල් උත්සවයට හින්දු බැතිමතුන් සහභාගී වීම පොලිසිය සහ සොල්දාදුවන් විසින් අවහිර කරන ලදී (1 කොටස). මෙම ස්ථානය දැන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ තබා ඇති බැවින්, බැතිමතුන්ට කෝවිලට යාම සඳහා කන්ද නැගීමට අවසර නොමැති අතර විනාශ වූ සහ කැඩුණු පිළිම පිහිටා ඇති කන්ද පාමුල පමණක් වන්දනාමාන කිරීමට අවසර ඇත.[216]

උතුරු හා නැගෙනහිර බෞද්ධ සංකේතවාදය අධිස්ථාපනය කරන අනෙකුත් ප්‍රධාන ප්‍රවණතා අතරට නව බෞද්ධ විහාරස්ථාන ව්‍යාප්ත වීම ඇතුළත් වේ. මුස්ලිම් බහුතරයක් වෙසෙන අම්පාර (නැගෙනහිර) පොතුවිල් හි, 1950 ගණන්වල පිහිටුවන ලද මුහුදු මහා විහාරය විශාල ව්‍යාපෘතියක් දක්වා ව්‍යාප්ත වී ඇත. දැන් අවම වශයෙන් අක්කර 72 ක භූමි ප්‍රමාණයක් ආවරණය කරමින්, එය අවම වශයෙන් මුස්ලිම් ගොවීන් 300 ක ජීවනෝපායට බලපායි. පෙබරවාරි මාසයේදී, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මුහුදු මහා විහාරය ඇතුළු විහාරස්ථාන 11 ක් 'පූජනීය ස්ථාන' ලෙස නම් කිරීමත් සමගින් මෙම ව්‍යාපෘතිය තවදුරටත් විධිමත් කරන ලදී.[217]

අනන්‍යතා දේශපාලනය සඳහා විය හැකි බලපෑම් සහිතව, අනෙකුත් පුළුල් ව්‍යාපෘති, ජනවිකාස වෙනස්කම් පිළිබඳ බියක් ඇති කිරීමට මග පාදා තිබේ. මෑත වසරවලදී, දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවන් දෙපිරිසටම නිවහන වන ත්‍රිකුණාමලයේ කුච්චවේලි කොට්ඨාශයේ, බෞද්ධ විහාර 32ක් ඉදිකිරීම සිදුවී ඇති අතර, ඒ සඳහා පෞද්ගලික ඉඩම් අක්කර 2506.5 කට වැඩි ප්‍රමාණයක් අත්පත් කරගෙන ඇතැයි චෝදනා කෙරෙන බව වාර්තා වේ.[218]

යුද්ධයේදී සහ පශ්චාත් යුධ සමයේදී හමුදාව විසින් අත්පත් කරගත් ප්‍රදේශවල බෞද්ධ ගොඩනැගිලි නිර්මාණය වී ඇති අතර, ඒවා විධිමත් කිරීමට දැන් උත්සාහ කරමින් පවතී. කිලිනොච්චි (උතුර) හි තායියිඩ්ඩි හි බෞද්ධ විහාරස්ථානයක්[219] පෞද්ගලික ඉඩම් ආක්‍රමණය කරමින් දෙමළ ඉඩම් හිමියන්ගේ ජීවනෝපායන්ට අඛණ්ඩව බලපෑම් කරයි. මාර්තු මාසයේදී, ජාතික ආරක්ෂාව පිළිබඳ ශ්‍රී ලංකාවේ අධීක්ෂණ කාරක සභාව, ඇතැම් විට විරෝධතා වළක්වා ගැනීමට සහ පන්සල පිහිටුවීම විධිමත් කිරීමට ගත් පැහැදිලි උත්සාහයක් ලෙස, පෞද්ගලික ඉඩම බෞද්ධ විහාරයට පැවරීමට පළාත් පාලන ආයතනයට නියෝගයක් නිකුත් කළේය.

උතුරේ සහ නැගෙනහිර ප්‍රදේශවල හමුදාව යොදවා සිටීම ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සඳහා පුළුල් බලපෑම් කර ඇත්තේ ආගමික ස්ථාන ඇතුළුව ඉඩම්වලට ප්‍රවේශය සීමා කරමිනි. කෙසේ වෙතත්, පෙබරවාරි මාසයේදී ධනාත්මක පියවරක් ලෙස, යාපනය අධිආරක්ෂිත කලාපය[220] තුළ පිහිටි ආගමික ස්ථාන හතක් නැරඹීමට බැතිමතුන්ට කොන්දේසි සහිතව ප්‍රවේශය ලබා දෙන ලදී.

යාපනය විශ්වවිද්‍යාලයේ කිළිනොච්චි විද්‍යාපීඨයේ නිර්මාණය කර ඇති විශාල බෞද්ධ විහාරස්ථානයක් වන "සරසවයි විහාරය" වෙනත් ජාතික-ආගමික කණ්ඩායම් සඳහා වැදගත් ප්‍රදේශවල බෞද්ධ සංකේතයක් බලකොට ස්ථාපිත කිරීමේ රටාව පෙන්වා දෙන්නකි. වෙනත් ආගම්වල ආගමික ස්ථාන හා සංසන්දනය කලහොත්, මෙම බෞද්ධ විහාරය විශාල පරිමාණයකින් යුක්ත වන අතර එය පිටතින් ආධාර ලබා ගනිමින්,

216 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ශ්‍රී ලංකාවේ ඉඩම් ගැටුම්වල අන්තර්කේන්ද්‍රීය ප්‍රවණතා, පිටු 53-54

217 එම පිටු 16-17

218 එම., පිටු 46-49

219 එම., පිටු 27-28

220 යාපනය අර්ධද්වීපය සහ දූපත් විශාල භූමි ප්‍රදේශ හමුදා පීඩනය යටතේ පවතී.

විරුද්ධතාවයන් මැද ඉදිකළ බව වාර්තා වේ. මෙම වසර තුළ තවත් සැලකිල්ලට ලක්විය යුතු සංවර්ධනයක් වශයෙන්, සිංහල හා දෙමළ භාෂා භාවිතා කරන ශිෂ්‍යයන්ට විහාරයේ පූජා සඳහා යාමට සෘජුව හෝ වක්‍රව බලකරනු ලැබූ බව වාර්තා වී ඇත. මෙය ඔවුන්ගේ ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස උල්ලංඝනයකි.[221]

උතුරු නැගෙනහිරින් පිටත සිදුවීම් මෑතකදී ලේඛනගත කර නොමැති වුවද, ඊට සමාන ආකාරයේ මතභේදාත්මක සිදුවීම් මෑත වසරවලදී සිදුවී ඇත. කෑගල්ල (සබරගමුව) හි දෙවනගල පර්වතය සහ මාතලේ (මධ්‍යම)[222] හි දඹුල්ල කයිරියා මුස්ලිම් පල්ලිය අවට සිදුවීම් මෙම රටාව හුවා දක්වයි.

සිවිල් සමාජ නායකයින් සමඟ කළ සම්මුඛ සාකච්ඡාවලදී, බොහෝ දෙනෙක් යම් සැකයකින් යුතුව ප්‍රකාශ කළ ශුභවාදී අදහස වූයේ මෙම රටාවල වෙනසක් නොවුනද මෙම වසරේ දේශපාලන පරිපාලනය විසින් ඒවා අනුමත නොකළ බවයි.[223] 2023 ජුනි මාසයේදී, එවකට ජනාධිපති වික්‍රමසිංහ මහතා උතුරු හා නැගෙනහිර ඉඩම් අත්පත් කර ගැනීමට අදාළ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රවේශය විවේචනය කළ අතර, එය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ[224] ඉල්ලා අස්වීමට හේතු විය. පාර්ලිමේන්තු මැතිවරණයට පෙර යාපනයේ පැවති රැලියකදී, ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා රාජ්‍ය ආයතන[225] විසින් අත්පත් කරගත් ඉඩම් ආපසු ලබා දෙන බවට පොරොන්දු විය. තීරණාත්මක ජයග්‍රහණයකින් පසු, දශක තුනකට ආසන්න කාලයකට පසු යාපනයේ කට්කෝලම් හි හමුදා කඳවුරක් වසා දැමීම නිවේදනය සිදු කරන ලද නමුත්,[226] එම ඉඩම තවමත් ආපසු ලබා දී නොමැති බව වාර්තාවලින් පෙනී යයි. 'නීතියේ ආධිපත්‍ය ආරක්ෂා කිරීම සඳහා රජයේ කැපවීම සිවිල් සමාජය ද පෙන්වා දෙන අතර එහිදී ඔවුන් යෝජනා කරන්නේ 'බියෙන් හෝ අනුග්‍රහයෙන්' තොරව එය බලාත්මක කළහොත්, එය උරුම ස්ථාන වටා ඇති ගැටළු විසඳීමට උපකාරී විය යුතු බවයි.[227]

කෙසේ වෙතත්, උරුම ස්ථාන ආශ්‍රිත දුක්ගැනවිලි විසඳීම පැතිකඩ සහිත කර්තව්‍යයකි. තම උරුමයට එල්ල වන තර්ජන සම්බන්ධයෙන් හින්දු ප්‍රජාවගේ කනස්සල්ල පැහැදිලි වන අතර, බෞද්ධ ප්‍රජාවගේ අදහස් සහ අනුබෝධයන් ද වැදගත් වේ.

සම්මුඛ සාකච්ඡාවකදී, පූජ්‍ය කළුපහන පියරතන හිමියන්, නව බෞද්ධ සංකේතවාදය ආරෝපණය කරන්නා වූ ව්‍යාපෘතිවලට තම විරෝධය ප්‍රකාශ කරමින්, ඓතිහාසික බෞද්ධ ස්ථාන ආරක්ෂා කිරීම සඳහා බෞද්ධයින්ට

221 ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය (NCEASL), සෑම විශ්වාසයන්ට අයත් සමානය/වෙනත් ආගමික ප්‍රජාවන්ට එරෙහිව සිදුකළ ප්‍රචණ්ඩත්ව සහ බියජනක ක්‍රියා - 2024, වාර්තාව, 2024 දෙසැම්බර්.

222 භවනී ෆොන්සේකා, ශ්‍රී ලංකාවේ තරඟකාරී ආගමික ස්ථාන පිළිබඳ කෙටි විමසුමක්, (මයිනර් මැටර්ස්, නොවැම්බර් 2023), පිටු 18-19, https://minormatters.org/wp-content/uploads/2024/08/A-Brief-Examination-of-Contested-Religious-Sites-in-Sri-Lanka.pdf

223 ආචාර්ය ජෙහාන් පෙරේරා (අධ්‍යක්ෂ, ජාතික සාම කවුන්සිලය), මොහමඩ් හිෂාම් (සමාජ සේවකයෙකු/සමාජ සක්‍රියකරු), ආචාර්ය වින්‍යා ආරියරත්න (සභාපති, සර්වෝදය ශ්‍රමදාන සංවිධානය), මානව හිමිකම් නීතීඥයෙකු සහ සක්‍රියකරු, හිල්මි අහමඩ් (උපසභාපති, ශ්‍රී ලංකා මුස්ලිම් සභාව) - ජෝවිටා අරුලනන්දම් මගින් 2024 ඔක්තෝබර් මාසයේදී කොළඹ සහ දුරස්ථව මූලාකෘති ගත් සම්මුඛ සාකච්ඡා.

224 දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ධුරයෙන් ආචාර්ය අනුර මනතුංග ඉල්ලා අස්වෙයි," අද දෙරණ, 2023 ජුනි 12. https://www.adaderana.lk/news/91211/prof-anura-manatunga-steps-down-as-dg-of-archeology-dept

225 මීරා ශ්‍රීනිවාසන්, "ශ්‍රී ලංකා ජනාධිපති අනුර දිසානායක රාජ්‍ය ආයතන විසින් අල්ලපු දෙමළ භූමි ආපසු ලබාදෙන බව පොරොන්දු වේ," The Hindu, 2024 නොවැම්බර් 10, https://www.thehindu.com/news/international/sri-lanka-president-anura-dissanayake-promises-return-of-tamils-land-grabbed-by-state-agencies/article68852893.ece

226 "උතුරේ කට්කොලම් හමුදා කඳවුරේ ඉඩම විසුරුවයි," ඩේලි මිරර්, නොවැම්බර් 21, 2024, https://www.dailymirror.lk/print/front-page/Katkolam-Army-Camp-land-in-North-disbanded/238-296466

227 ආචාර්ය ජෙහාන් පෙරේරා, හිල්මි අහමඩ්, මානව හිමිකම් නීතීඥයෙකු සහ සක්‍රියකරු, මොහමඩ් හිෂාම්, ආචාර්ය වින්‍යා ආරියරත්න, සහ ගල්කන්දෙ ධම්මානන්ද ස්වාමීන්වහන්සේ (ස්ථාපක/අධ්‍යක්ෂ, වල්පොල රාහුල ආයතනය) - ජෝවිටා අරුලනන්දම් මගින් 2024 නොවැම්බර් 26, කොළඹ දී සිදුකළ සම්මුඛ සාකච්ඡා.

සහයෝගය සහතික කිරීමේදී දෙමළ ප්‍රජාව සතු වගකීම ගැන සඳහන් කළේය. උතුරු හා නැගෙනහිර[228] බෞද්ධ ස්මාරක විනාශ කිරීම පිළිබඳ වූ පැරණි බිය තුළ මුල් බැසගත් "බෞද්ධ ප්‍රජාවේ සැකය" ඔහු ඉස්මතු කළේය. ඒ හා සමානව, ජාතික සාම මණ්ඩලය (NPC) විසින් 2024 දී කරන ලද සමීක්ෂණයකින් හඳුනා ගත්තේ බෞද්ධයින්ගෙන් 60% ක් ඔවුන්ගේ පුරාණ ආගමික උරුමයන්[229] සහ නටබුන් ආරක්ෂා කිරීමේදී තම ප්‍රජාව යම් බාධකවලට මුහුණ දෙන බව විශ්වාස කරන බවයි. උතුරු හා නැගෙනහිර කැණීම්වල ස්වභාවය සාකච්ඡා කරමින්, ආචාර්ය තිරුවරන්ගන් දෙමළ ජනතාවගේ සහයෝගය ලබා ගැනීම සඳහා ඒවා විශ්වාසදායක බව පෙනෙන්නට තිබීමේ අවශ්‍යතාවය අවධාරණය කළේය. ප්‍රජාවේ විශේෂඥයින් සම්බන්ධ කර ගනිමින්, ප්‍රාදේශීයකරණය කරන ලද උතුරු හා නැගෙනහිර උරුම කළමනාකරණය සහ සංරක්ෂණය සඳහා වන සැබෑ උත්සාහයන් ප්‍රතිරෝධයට මුහුණ දීමේ ඉඩක් නොමැති බව ඔහුගේ අදහස විය.[230]

## 3. බුද්ධාගම සහ නීතිය හා සාමය

මතභේදයට තුඩු දී ඇති ආගමික ස්ථානවල ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස උල්ලංඝනය වන සිද්ධීන්වල රටාව බෞද්ධ අවශ්‍යතා සහ බෞද්ධ පූජක පක්ෂය කෙරෙහි වැඩි ගෞරවයක් පෙන්නුම් කරයි. බෞද්ධ අවශ්‍යතා,[231] මතභේදයට තුඩු දී ඇති ස්ථානවල ක්ෂේත්‍රයෙන් පිටත, නීතිය ක්‍රියාත්මක කිරීමේ කාරණා කෙරෙහි ද බලපායි.

1 වන පරිච්ඡේදයේ සාකච්ඡා කර ඇති පරිදි, ශ්‍රී ලංකාව තුළ ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සහ ඇදහිලි ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම අරමුණු කරගන්නා මෙවලම් පරාසයක් ඇත. කෙසේ වෙතත්, එය දේශපාලන විරුද්ධවාදීන් ඉලක්ක කර ගැනීමට, ප්‍රකාශනයේ නිදහසට බාධා කිරීමට හෝ ප්‍රදර්ශනශීලී ලෙස බෞද්ධ අවශ්‍යතා ආරක්ෂා කිරීමට යොදාගැනීමේ කනස්සලු සහගත ප්‍රවණතාවක් තිබී ඇත. මෑත වසරවලදී, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය වැඩි වශයෙන් ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස බලපෑමට ලක්වන කාරණා සඳහා භාවිතා කර ඇති නමුත් ඒ ව්‍යාජ-අපහාස[232] නීතියක් ලෙස ය. [1 පරිච්ඡේදය, 2.4 කොටස]

2023 මැයි මාසයේදී, නතාෂා එදිරිසූරිය නම් නැගී එන කාන්තා විකට රංගන ශිල්පිනියක් බුදුදහමට අපහාස කළා යැයි චෝදනාව මත සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය යටතේ සිර භාරයට ගන්නා ලදී. 2023 ජූලි මාසයේදී ඇයට ඇප ලබා දුන් අතර, 2024 ජූනි මාසයේදී ධනාත්මක වර්ධනයක් ලෙස, නඩු විභාගය පවත්වා ගෙනයාමට සහ වෛරී ප්‍රකාශ සම්බන්ධයෙන් ඇයට චෝදනා කිරීමට ප්‍රමාණවත් සාක්ෂි නොමැතිකම දක්වමින් නඩුව නිෂ්ප්‍රභ කරන අවස්ථාවේ ඇයව නිදහස් කරන ලදී. විකට රංගන ශිල්පිනිගේ වැඩසටහන විකාශනය කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් බෲනෝ දිවාකරගේ නඩුව

228 පූජ්‍ය කලුපහන පියරතන හිමියන් (යහපත් ශ්‍රී ලංකාවක් සඳහා සංඝයෝගයේ සම්මුඛය), ජෝව්ටා අරුලනන්දම් මගින් 2024 ඔක්තෝබර් 25, කොළඹ දී සම්මුඛ සාකච්ඡාවක්.

229 ජාතික සාම කවුන්සිලය (NPC), ආගමික නිදහස පිළිබඳ සමීක්ෂණය 2024, අමුත්තා වූ වාර්තාවක්, NPC, 2024 දෙසැම්බර්, පිටු 13-16.

230 ආචාර්ය මහේන්ද්‍රන් තිරුවරංගන්, සම්මුඛ සාකච්ඡාවක්.

231 ශ්‍රීන් සරූර්, කාන්තා ශරීරවලට යුද්ධයක් ප්‍රකාශ කිරීම, (මයිනර් මැටර්ස්, ජූලි 2023), පිටුව 5, https://www.minormatters.org/storage/app/uploads/public/659/e16/ef8/659e16ef8d894655383751.pdf; ගෙහාන් ගුණතිලකෙ, "ශ්‍රී ලංකාවේ මානව හිමිකම් නීතිය අන්‍යෝන්‍ය පීඩන උපකරණයක් වූ ආකාරය," Himal South Asian, පෙබරවාරි 7, 2023. https://www.himalmag.com/politics/iccpr-human-rights-law-repression-blasphemy-sri-anka?access-token=b1a1ccc9-6160-449b-9e03-3d3a1a634c04-1730528547394

232 "හාසය සඳහා හිමිකමක් නොමැත," ඩේයිලි FT, 2023 මැයි 30. https://www.ft.lk/ft_view__editorial/No-right-to-laugh/58-748881

ද එලෙසම නිෂ්ප්‍රභ කරන ලදී.[233]

වඩාත් සංකීර්ණ වන්නේ දේවගැති ජෙරොම් ප්‍රනාන්දුගේ සිද්ධියයි. 2023 මැයි මාසයේදී, දේවගැති ප්‍රනාන්දු මහතා විසින් සෙනඟ පිරුණු සභාවක් ඉදිරිපිට බුදුන් වහන්සේ, ඉස්ලාම් සහ හින්දු ආගම පිළිබඳව අපහාසාත්මක යැයි සැලකෙන ප්‍රකාශ[234] සිදු කරන ලදී. ඊට අමතරව, මූල්‍යමය විෂමාචාර චෝදනා ද දේවගැතිවරයාට එල්ල වේ. සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය යටතේ දෙසැම්බර් 2023 වැනි දින ඔහු අත්අඩංගුවට ගැනීමෙන් පසුව ක්‍රිස්තියානි එවැන්ජලිකල් සංධානය විසින් නිකුත් කළ නිවේදනයක ඔහුගේ අදහස් නිසි ලෙස ඇගයීමට ලක් කර නොමැති බව යෝජනා කරමින් චෝදනා ඉල්ලා අස්කර ගන්නා ලෙස බලධාරීන්ගෙන් ඉල්ලා සිටියේය. ඔහු 2024 ජනවාරි මාසයේදී ඇප මත නිදහස් විය.

ප්‍රධාන බෞද්ධ අවශ්‍යතා ඉලක්ක කර ගත් විට සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය භාවිතා කිරීමට සූදානමක් ඇතත්, විශේෂයෙන් කථිකයා බෞද්ධ පූජ්‍ය පක්ෂයේ ප්‍රමුඛ සාමාජිකයෙකු වන අවස්ථාවන්හිදී, අනෙකුත් ජනවාර්ගික ආගමික කණ්ඩායම්වල යහපත සඳහා ක්‍රියා කිරීමට බලධාරීන් පසුබට වී ඇත. අනුප්‍රාප්තික රජයන් බොදු බල සේනාවේ ලේකම් ඥානසාර හිමියන්ට දඬුවම් දීමෙන් වැළකී ඇත්තේ වෛරී ප්‍රකාශ කිරීම, සුළු ජාතීන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය උසිගැන්වීම සහ මුස්ලිම් විරෝධී කෝලාහල[235] ඇති කිරීම සම්බන්ධයෙන් උන්වහන්සේගේ භූමිකාව නොතකමිනි. ඥානසාර හිමියන් මැඩපැවැත්වීම සඳහා එතරම් උනන්දුවකින් තොරව ගත් උත්සාහයන්වලදී බොහෝ දුරට අත්අඩංගුවට ගැනීමේ වරෙන්තු මග හැරීම, අධිකරණ සිතාසි නොසලකා හැරීම සහ ජනාධිපති සමාව ලැබීම පවා සිදු විය.

කෙසේ වෙතත්, මාර්තු මාසයේදී, කුරුණෑගල (වයඹ) බෞද්ධ විහාරස්ථානයක පැවති මාධ්‍ය හමුවකදී කරන ලද මුස්ලිම් විරෝධී ප්‍රකාශ සම්බන්ධයෙන් කොළඹ මහාධිකරණය උන්වහන්සේට වසර හතරක බරපතල වැඩ සහිත සිර දඬුවමක් නියම කළේය. ආගමික හැඟීම් රිදවීම සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 291 (ආ) වගන්තිය යටතේ [බලන්න: 1 වන පරිච්ඡේදය, 3.2 වගන්තිය] උන්වහන්සේට එරෙහිව චෝදනා ගොනු කරන ලද අතර, උන්වහන්සේගේ ප්‍රකාශ "හිතාමතා කරන ලද සහ ද්වේෂ සහගත"[236] බව විනිසුරුවරයා සඳහන් කළේය.

සංශෝධිත පෙත්සම් විභාගයක් බලාපොරොත්තුවෙන් සිටියදී ජූලි මාසයේදී උන්වහන්සේ ඇප මත නිදහස් කළද, උන්වහන්සේ නඩුවට පෙනී සිටීමට අපොහොසත් වීමෙන් පසු දෙසැම්බර් මාසයේදී අත්අඩංගුවට ගැනීමේ වරෙන්තුවක් නිකුත් කරන ලදී. මෙම නඩුවේදී, නීතිය හා සාමයට බලපෑම් කිරීමේදී බෞද්ධ ධුරාවලියේ සෘජු මැදිහත්වීම ද පැහැදිලි වේ. 2019 දී, අධිකරණයට අපහාස කිරීම සහ ක්‍රියාකාරිකයෙකුට තර්ජනය කිරීම යන චෝදනා මත මෙම භික්ෂුව වරදකරු කරනු ලැබූ නමුත්, බෞද්ධ ධුරාවලියේ මහා නාහිමිවරුන්ගේ මැදිහත්වීමෙන් පසු ජනාධිපති සමාවක් මත නිදහස් කරන ලදී. 2024 දී ද, මහා නාහිමිවරු එවකට

233 "නටාෂා සහ බ්‍රෑනෝට එරෙහි චෝදනා අධිකරණය විසින් අවලංගු කරයි," නිවුස් ෆස්ට්, 2024 ජූනි 19. https://www.newsfirst.lk/2024/06/19/court-clears-natasha-bruno-of-controversial-statement-charges

234 ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය, "ජෙරෝම් ප්‍රනාන්දු පාදිලිතුමා අත්අඩංගුවට ගැනීම පිළිබඳ ප්‍රකාශය," 2023 දෙසැම්බර් 3. https://www.nceasl.org/post/statement-on-the-arrest-of-pastor-jerome-fernando

235 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA), "ඥානසාර හිමියන්ට ජනාධිපති සමාව පිළිබඳ CPA ප්‍රකාශය," 2019 මැයි 24. https://www.cpalanka.org/cpa-statement-on-the-presidential-pardon-of-gnanasara-thero/

236 "ඥානසාර හිමියන්ගේ ඇප අයදුම ප්‍රතික්ෂේප වේ," ඩේලි FT, 2024 අප්‍රේල් 3. https://www.ft.lk/news/Gnanasara-Thera-s-bail-application-denied%C2%A0/56-760240

ජනාධිපති වික්‍රමසිංහ වෙත සමාව[237] ඉල්ලා ලිපියක් යැවූහ. සමාවක් ලබා නොදුන්නද, එය උන්වහන්සේගේ ඇප අයදුම්කිරීමට බලපෑම් කිරීමට උපකාරී වන්නට ඇති බවට ඉඟි තිබේ.[238]

බුද්ධාගමට අපහාස කළේ යැයි සලකන පුද්ගලයින්ට එරෙහිව සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය තෝරා බේරා භාවිතා කර ඇති අතර එය සිංහල-බෞද්ධයන් පිළිබඳ රාජ්‍ය ආඛ්‍යාන හෝ පුළුල් මහජන හැඟීම්වලට අනුකූල නොවන සිදුවීම් සහ ක්‍රියාකාරකම් සඳහා ද අදාළ කරගෙන ඇත. ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සඳහා සීමාවන් පැනවී ඇති, යුද්ධයට සම්බන්ධ දෙමළ ගුණානුස්මරණ උත්සවවලට සළකන ලද ආකාරයෙන්ද මෙම ප්‍රවේශය පැහැදිලි වේ.

මැයි මාසයේදී, 2009 යුද්ධයේ අවසානය සනිටුහන් කරමින් ශ්‍රී ලංකාව පුරා උත්සව අවස්ථා පැවැත්වේ. යුද්ධය අවසන් වූයේ මුලතිව් (උතුර) හි අවසන් එල්ටීටීඊ බලකොටුවට එල්ල කළ හමුදා ප්‍රහාරයකින් වන අතර, දෙමළ උත්සවවලින් ද අවසාන මාසවලදී මිය ගිය බවට විශ්වාස කෙරෙන දෙමළ සිවිල් වැසියන් 40,000 ක් සිහිපත් කරයි.[239] මෙම ආඛ්‍යානය පිළිබඳ අපහසුතාවයට පත්වන අනුප්‍රාප්තික රජයන්, මෙම අනුස්මරණ උත්සව සඳහා විවිධ මට්ටම්වලින් සීමාවන් පනවා ඇත.

කෙසේ වෙතත්, වැඩි වශයෙන් සිංහල-බෞද්ධයන් විසින් සමරන මීට සමාන අනුස්මරණ අවස්ථා එවැනි සීමාවන්ට මුහුණ දී නොමැත. 1971 දකුණේ කැරැල්ලේදී රජය විසින් ඝාතනය කරන ලද අයවලුන් අනුස්මරණය කරන 'මහ විරු සැමරුම' එවැනි එක් අවස්ථාවකි. 2024 දී ද "53 වන අප්‍රේල් විරු සැමරුම" කිසිදු සිදුවීමක් වාර්තා නොවී පැවැත්විණ. මාසයකට පසු ත්‍රිකුණාමලයේදී, හින්දු කෝවිලක චාරිත්‍ර පැවැත්වීමෙන් නියෝගයක් කඩ කළා යැයි චෝදනාව මත යුද සංවත්සරයේ අවසානය සිහිකරමින් සිටි දෙමළ ජාතිකයන් හතර දෙනෙකු සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය යටතේ අත්අඩංගුවට ගන්නා ලදී. වාර්තා වන පරිදි, අත්අඩංගුවට ගත් අය බිය ගැන්වීම්වලට සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය පදනම් කරගත් නින්දාවට ලක් වී ඇති අතර, අපේක්ෂිත ක්‍රියාපටිපාටිය පිළිපැදීමට ද පොලිසිය අසමත් ව ඇත.[240]

ධනාත්මක පියවරක් ලෙස, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව (HRCSL), සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත "වැරදි ලෙස අදාළ කරගැනීම"[241] සම්බන්ධයෙන් කනස්සල්ල පළ කළේ එම සැමරුම ජාතික හෝ ආගමික වෛරය වෙනුවෙන් පෙනී නොසිටින බව තීරණය කරමින් [1 පරිච්ඡේදය, 2.4 කොටස]. මෙම සන්දර්භය තුළ, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය (OHCHR) "වින්දිතයින්ගේ පූර්ණ සහභාගීත්වයෙන් යුත් නව මුලපිරීම් සඳහා වැදගත් පදනමක් විය හැකිය"[242] යනුවෙන් ඇගයීමට ලක් කරන එවකට ජනාධිපති වික්‍රමසිංහ විසින් පිහිටුවන ලද අනුස්මරණය

237 වීරගති තණබාලසිංහම්, "ඥානසාර හිමියන්ට සමාවක්ථී මහා නායක හිමිවරුන් ජනාධිපතිවරයාගේ අවධානයට යොමු කරති," The Morning, 2024 මැයි 26. https://www.themorning.lk/articles/u4FXbKHQ4RgrvO0MxR8s

238 ආචාර්ය අමීර් අලි, "මහා නායක හිමිවරුන් නින්දා ලැබූ උත්තේජකයා නිදහස් කරති," Financial Times, 2024 අගෝස්තු 3. https://www.ft.lk/columns/Prelates-loosen-condemned-provocateur/4-765095

239 එක්සත් ජාතීන්ගේ ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකාවේ වගකීම සම්බන්ධ ලේකම් ජෙනරාල්ගේ විශේෂඥ මණ්ඩලයේ වාර්තාව, (එක්සත් ජාතීන්ගේ ලේකම් මණ්ඩලය, 2011 මාර්තු), https://www.securitycouncilreport.org/atf/cf/%7B65BFCF9B-6D27-4E9C-8CD3-CF6E4FF96FF9%7D/POC%20Rep%20on%20Account%20in%20Sri%20Lanka.pdf

240 ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය (NCEASL), හින්දු ආගම්වන්තයින්ට එරෙහි වංචනික සහ බිය පැතිරීමේ සිදුවීම් 202

241 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, "ත්‍රිකුණාමළයේ සිදුකළ ජාත්‍යන්තර පුරවැසි හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ පනතේ 3 වන වගන්තිය වැරදි ලෙස අදාළ කිරීම පිළිබඳව," 2024 මැයි 21, https://www.hrcsl.lk/wp-content/uploads/2024/05/HRCSL-Press-Notice-21052024.pdf

242 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය පිළිබඳ සම්පූර්ණ වාර්තාව, (මානව හිමිකම් කවුන්සිලය, පස්වනොවැනි වාරය, 2024 අගෝස්තු), https://www.ohchr.org/en/documents/reports/ahrc5719-situation-human-rights-sri-lanka-comprehensive-report-united-nations, පිටුව 10

පිළිබඳ විශේෂඥ කමිටුව විසින් ජුනි මාසයේදී නිකුත් කරන ලද වාර්තාව ද වැදගත් වේ.

දෙමළ සැමරුම් සම්බන්ධයෙන් රාජ්‍යයේ පවතින පීඩනෝන්මාදය ඒවාට සමාන යැයි වැරදියට හඳුනා ගන්නා ලද හින්දු ආගමික උත්සව සඳහා සීමාවන් පැනවීමට ද හේතු වී ඇත. හින්දු බැතිමතුන් විසින් පවත්වනු ලබන කාර්තිකයි විලකීඩු (නොවැම්බර් දීපාවලි උත්සවය) රාජ්‍ය බලධාරීන් විසින් නොවැම්බර් මාසයේ සිදුවන මාවීරාර් නාල් හා සම්බන්ධ සැමරුම් ලෙස වරදවා වටහාගෙන තිබේ. 1989 දී එල්ටීටීඊය විසින් හඳුන්වා දුන් මාවීරාර් නාල්, ඩයස්පෝරාවේ[243] සහ ශ්‍රී ලංකාවේ දෙමළ කණ්ඩායම් විසින් අඛණ්ඩව සමරනු ලබන අතර, සමහර උත්සවවලදී එල්ටීටීඊයට සම්බන්ධ උපකරණ සහ රූප ප්‍රදර්ශනය කරයි. කාර්තිකයි විලකීඩු සඳහා වන සීමාවන් සැලකිය යුතු ලෙස ලිහිල් වී ඇති නමුත්, සමීප සෝදිසි කිරීම් සහ යම් බිය ගැන්වීම් පිළිබඳ වාර්තාවීම් තවමත් පවතී.[244]

## 4. කලාපීය බහුතරවාදය, නීතිය ක්‍රියාත්මක කිරීම සහ ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස

ජාතික මට්ටමේ බොහෝ ගැටුම්වලදී බලධාරීන් ප්‍රධාන ධාරාවේ බෞද්ධ අවශ්‍යතා [නැගී එන බෞද්ධ දේශකයින්/නිකායන් සඳහා රජයේ සහ ප්‍රජාවේ ප්‍රතිචාර සඳහා 3 වන පරිච්ඡේදය, 5 වන පරිච්ඡේදය සහ 4 වන පරිච්ඡේදය, 1.1 වගන්තිය බලන්න] සඳහා වැඩි ගෞරවයක් ලබාදෙන අතර, ප්‍රජා මට්ටමින් ද මීට සමාන රටා නිරීක්ෂණය කෙරේ. කෙසේ වෙතත්, සුළුතර කණ්ඩායම් අතර ගැටුම් ඇති වූ විට, බලධාරීන් සංඛ්‍යාත්මකව විශාල ප්‍රජාවට පක්ෂග්‍රාහී බවක් පෙන්නුම් කරන බව දිස්වේ. ප්‍රදේශයේ පළාත් පාලන ආයතන බහුතරයෙන් පැවත එමට ඇති ඉඩකඩ ද සලකා බලා මෙය සිදු වේ.

ආගමික සිද්ධස්ථානවලට අදාළ නීති ක්‍රියාත්මක කිරීම, ප්‍රජා ආරවුල් හැසිරවීම සහ සම්පත් වෙන් කිරීමේදී අනිසි අනුග්‍රහය මෙම ගතිකත්වය පිළිබිඹු කරයි. ඊට අමතරව, ඉදිකිරීම් සහ ශබ්ද දූෂණය පිළිබඳ රෙගුලාසි ඇතුළු අනෙකුත් රෙගුලාසි අසමාන ලෙස ක්‍රියාත්මක වන අතර, ප්‍රජාව තුළ සුළුතර කණ්ඩායම් ඉලක්ක කර ගනී.

### 4.1 ලියාපදිංචි කිරීමට බල කිරීම

පූජනීය ස්ථාන ලියාපදිංචි කිරීමට සහ ඒවා ක්‍රියාත්මක කිරීම පාලනයට චක්‍රලේඛ ගණනාවක් හරහා උත්සාහ කර ඇති නමුත් ශ්‍රී ලංකාවේ නීතියට මෙය අවශ්‍ය නොවේ. [1 වන පරිච්ඡේදය, 4.4 කොටස] 2022 අප්‍රේල් මාසයේ නවතම චක්‍රලේඛය අපැහැදිලි වන අතර, ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සහ ඒ ආශ්‍රිත ප්‍රතිලාභ[245] වටා ඇති අපැහැදිලි බව හේතුවෙන් [1 වන පරිච්ඡේදය, 4.4 කොටස], රජයේ ආයතනවලින් ලබාදෙන අදහස් ද ඒකාකාරී නොවේ.

ජාත්‍යන්තර ආගමික නිදහස පිළිබඳ එක්සත් ජනපද කොමිසමේ 2024 වාර්තාවකට අනුව, බුද්ධ ශාසන

243 ඩී.බී.එස්. ජෙයරාජ්, "මහ වීර දිනයේ (Maveerar Naal) උපත හා වර්ධනය," DBS Jeyaraj.com" 2024 නොවැම්බර් 25, https://dbsjeyaraj.com/dbsj/?p=83174

244 ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය, වවුනියාවේ ආගමික විශ්වාසය හෝ ආගමික නිදහස පිළිබඳ භූ දර්ශනය 2023-2024, (Minor Matters, 2024 දෙසැම්බර්), https://minormatters.org/wp-content/uploads/2024/12/FoRB-Landscape-in-Vavuniya-2023-24.pdf, පිටුව 5

245 ලක්ෂාන් ඩයස් (මානව හිමිකම් නීතිඥයෙක්), සම්මුඛ සම්මුඛ සාකච්ඡාවක්: ජොව්ටා අරුලනන්දම් විසින්, 2024 ඔක්තෝබර් 10, කොළඹ

අමාත්‍යාංශයේ ඇති ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුව, දැනටමත් පවතින දේවස්ථාන ජාතික වශයෙන් ලියාපදිංචි කිරීම අවශ්‍ය නොවන නමුත් එසේ කරන දේවස්ථානවලට "වැඩි ආරක්ෂාවක්"[246] ලැබිය හැකි බව යෝජනා කරමින් ප්‍රකාශයක් සිදු කර ඇති බවට වාර්තා වේ. කෙසේ වෙතත්, 2024 මාර්තු මාසයේදී, අමාත්‍ය වික්‍රමනායක යෝජනා කළේ ඇදහිල්ල කුමක් වුවද සියලුම ආගමික ආයතන ලියාපදිංචි කළ යුතු බවයි. ජෙහෝවාගේ සාක්ෂිකාර පල්ලිය සහ අවසන් යුගයේ ශුද්ධයන්ගේ යේසුස් ක්‍රිස්තුස් පල්ලිය පිළිබඳව වෙනම සඳහන් කරමින්, ලියාපදිංචි නොකළ පූජනීය ස්ථාන[247] වැටලීමට සැලසුම් කරන බව ඔහු නිවේදනය කළේය. ලියාපදිංචිය අනිවාර්යය යැයි නියම කළ නොහැකි බලධාරීන්, ස්වේච්ඡාවෙන් ලියාපදිංචිවීමට කණ්ඩායම්වලට බලපෑම් කිරීමට උත්සාහ කරන බව වටහා ගත හැකිය.[248]

ප්‍රජා ප්‍රජාවගේ තල්ලුව සහ හැඟීම් මගින් බොහෝ දුරට අභිප්‍රේරණය වූ පළාත් පාලන ආයතන මෙම නොපැහැදිලි ලෙස අර්ථ දක්වා ඇති ප්‍රකාශ සුළුතරය නියෝජනය කරන ආගමික ස්ථානවල ක්‍රියාකාරීත්වයට බාධා කිරීම සඳහා භාවිතා කර ඇත.

2024 වසර තුළ, කොළඹ, හම්බන්තොට, මහනුවර, කුරුණෑගල සහ ගාල්ල දිස්ත්‍රික්කවල අවම වශයෙන් පල්ලි 5 ක් සම්බන්ධ ලියාපදිංචියට අදාළ සිදුවීම් කිහිපයක් ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය විසින් වාර්තා කරන ලදී. ලියාපදිංචිය අධීක්ෂණය සම්බන්ධ කාරණාවලදී ඇතුළුව බලධාරීන්ගේ පාර්ශවයෙන් අනුකූලතාවක් සහ අවබෝධයක් නොමැතිකම මෙම සිදුවීම්වලින් පෙන්නුම් කෙරේ.

ජූලි මාසයේදී, කුරුණෑගල (වයඹ) දේවස්ථානයක් "නව ආගමික ස්ථානයක් ඉදිකිරීම සහ පවතින ආගමික ස්ථානයක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා" ඉල්ලුම් කරන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා සිදු කළ ඉල්ලීමකට අනුකූල විය. කෙසේ වෙතත්, අයදුම්පත යවන ලද ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුව යෝජනා කළේ එවැනි කාරණා ආමන්ත්‍රණය කිරීමට ඔවුන්ට බලයක් නොමැති බවයි.

ලියාපදිංචියේදී ඉල්ලා සිටින ලිපිලේඛන ප්‍රමාණයත් සමගින් තමන්ට ඊට අනුකූලතාවය දැක්වීමට නොහැකි වී ඇති බව ඇතැම් ආගමික කණ්ඩායම් අවධානයට ගෙනැවිත් තිබේ. මඩකලපුවේ (නැගෙනහිර) මෑතකදී සිදුකළ පර්යේෂණයකින් හෙළි වී ඇති අන්දමට යුද සමයේ ඉඩම් ඔප්පු වැනි වැදගත් ලේඛන නැතිවී යාම ආර්යම්පති ගම්මානය වැනි ස්ථානවල අවධානයට විත් ඇති බවයි. එම ගම්මානය සායිව ආගමික ස්ථාන 54ක් ඇති ගම්මානයක් වන අතර ඒවායින් සමහරක් ලියාපදිංචි කර නොමැත.[249]

සම්මුඛ සාකච්ඡාවකදී නීතිඥ ලක්ෂාන් ඩයස් මහතා ප්‍රකාශ කළේ, මේ දක්වා චක්‍රලේඛය ක්‍රියාත්මක වීම ඒකාකාරී අන්දමින් සිදුව නොමැති බවත්, ඇතැම් ආයතන අනෙක් ඒවාට වඩා වැඩි පරීක්ෂාවකට ලක්ව ඇති බවත් ය. ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය අනවශ්‍ය නියාමනයකින් බර වී ඇති බව වැටහෙන අතර ලියාපදිංචියේදී එය ප්‍රජා විරෝධතා සඳහා අවස්ථාව සැපයීම ජනප්‍රියතාවයෙන් අඩු කණ්ඩායම්වලට අවාසිදායක විය හැකිය.[250]

246 ඇමරිකා ජාත්‍යන්තර ආගමික නිදහස් පිළිබඳ කොමිසම, ශ්‍රී ලංකාවේ අඛණ්ඩව සීඝ්‍රව සිදුවන ආගමික සංඛ්‍යාතයන්ට හිමි අවකාශය අඩුවීම, (වොෂිංටන්, ඩී.සී., 2024), https://www.uscirf.gov/sites/default/files/2024-06/2024%20Sri%20Lanka%20Country%20Update.pdf, පිටුව 3

247 එම

248 ලක්ෂාන් ඩයස්, සම්මුඛ සාකච්ඡාව

249 ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය, මඩකලපුවේ ආගමික විශ්වාසය හෝ ආගමික නිදහස පිළිබඳ භූ දර්ශනය 2023-2024, (Minor Matters, 2024 දෙසැම්බර්), https://minormatters.org/report_policy_briefs/the-landscape-of-freedom-of-religion-or-belief-in-batticaloa-2023-2024/, පිටුව 9

250 ලක්ෂාන් ඩයස්, සම්මුඛ සාකච්ඡාව

හින්දු ආගමික ස්ථාන ලියාපදිංචි කිරීම සඳහා ඇති පීඩනයේ පරිමාව පිළිබඳ මිශ්‍ර පින්තූරයක් සම්මුඛ සාකච්ඡාවලදී පලවූ අදහස්වලින් හෙළි විය. ඇතැමුන්ට පළාත් පාලන ආයතනවලින් එල්ල වන පීඩනය සීමිත බව හැඟුණේ හින්දු කෝවිල් බොහෝ දුරට බලධාරීන් පැවත එන ප්‍රජාව සිටින ප්‍රදේශවල පිහිටා තිබූ බැවිනි. හින්දු ස්ථාන එවැන්පලිකල් පල්ලිවලට සමාන පරීක්ෂාවකට මුහුණ දෙන බව තවත් සමහරු නිරීක්ෂණය කළ නමුත් මෙම පීඩනය අඩු බලපෑමක් ඇති බවට සැලකෙන ස්ථානවලට කේන්ද්‍රගත වන බව පෙනේ. රාජ්‍ය පරීක්ෂාව බොහෝ දුරට ඩයස්පෝරාවේ ඇතුළු මුදල්මය ගනුදෙනු නිරීක්ෂණය කිරීමේ උනන්දුව මත කේන්ද්‍රගත වන බව ද අවධාරණය විය. වවුනියාවේදී වාර්තා වන පරිදි, හින්දු පූජකවරු ශිව කෝවිල් සඳහා බලපත්‍ර ලබා ගැනීමේදී දීර්ඝ ප්‍රමාදයන්, වෙනස්කොට සැලකීම සහ "සෑම අදියරකදීම බාධක" පැවතීම ඉස්මතු කළ අතර, මෙම බාධක බෞද්ධ ආයතනවලට සමානව බලපාන්නේ නැති බව සඳහන් කළහ.[251]

මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව[252] යටතේ ක්‍රියාත්මක වන වක්ෆ් සභාවේ ලියාපදිංචි වීමට මුස්ලිම් පල්ලි දිරිමත් කර ඇති බැවින්, ලියාපදිංචි කිරීමේ ගැටළුව මුස්ලිම්වරුන්ට ඒ හා සමානව බලපාන්නේ නැති බව වටහාගෙන ඇත. 2024 අගෝස්තු වන විට, ආගමික හෝ පුණ්‍ය කටයුතු සඳහා කැප වූ දේපළ කළමනාකරණය කරන දෙපාර්තමේන්තුව සහ වක්ෆ් මණ්ඩලය, පාස්කු ඉරිදා ප්‍රහාර (ESA) වලින් අනතුරුව වසර පහක අත්හිටුවීමකින් පසු නව පල්ලි[253] ලියාපදිංචි කිරීම නැවත ආරම්භ කරන බව නිවේදනය කළේය.

සම්මුඛ සාකච්ඡාවලින්, ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ මිශ්‍ර අදහස් අනාවරණය විය. ඇතැමුන් විශ්වාස කළේ මෙම චක්‍රලේඛය ප්‍රධාන වශයෙන් අරමුණු කර ගත්තේ ස්වාධීන පල්ලි රාජ්‍ය නොවන සංවිධාන ලෙස ලියාපදිංචි කිරීම හෝ සහයෝගිතා පනත යටතේ නිවාස[254] පල්ලි බවට පරිවර්තනය කිරීම පිළිබඳ ගැටළු විසඳීමට බවයි. ලැබිය හැකි ප්‍රතිලාභ සලකා බලමින් තවත් සමහරු යෝජනා කළේ ලියාපදිංචි කිරීමෙන් වඩා හොඳ පිළිගැනීමක් ලබා දිය හැකි බවත්, වගවීම වැඩි දියුණු කළ හැකි බවත්, වංචා මැඩපැවැත්විය හැකි බවත්ය.[255] කෙසේ වෙතත්, මුල්‍ය, ගොඩනැගිලි සහ ශබ්ද දූෂණය ඇතුළු කරුණු සම්බන්ධයෙන් දැනටමත් පවතින රෙගුලාසි එම ගැටළු විසඳීමට[256] ප්‍රමාණවත් බවත්, හිඩැස් වැසීමට හඳුන්වා දෙන ඕනෑම නව නීතියක් සාධාරණ ලෙස ක්‍රියාත්මක කළ යුතු බවත් තවත් සමහරු තර්ක කරති.[257]

## 4.2 ආවේක්ෂණ සහ බිය ගැන්වීම්

ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලීම් ද සමග ආරක්ෂක ආවේක්ෂණ ද වාර්තා වී ඇත. මැයි මාසයේදී, මාතර (දකුණ) දේවස්ථානයක දේවමෙහෙයක් ප්‍රාදේශීය බලධාරීන් විසින් විසින් නිරීක්ෂණය කිරීමෙන්

251 ශ්‍රියානි තේවකුමාර (මානව හිමිකම් ආරක්ෂකයෙකු), සම්මුඛ සාකච්ඡාවක්: ජොව්ටා අරුලනන්දම් විසින්, 2024 නොවැම්බර් 20, දුරස්ථව; මානව හිමිකම් නීතිඥයෙකු සහ ක්‍රියාකාරීන්ගේ සම්මුඛ සාකච්ඡාව; ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය, වවුනියාවේ ආගමික විශ්වාසය හෝ ආගමික නිදහස පිළිබඳ භූ දර්ශනය 2023-2024, පිටුව 13

252 හිල්මි අහමද්, සම්මුඛ සාකච්ඡාව

253 මඩකලපුවේ ආගමික විශ්වාසය හෝ ආගමික නිදහස පිළිබඳ භූ දර්ශනය 2023-2024, පිටුව 9

254 පූජ්‍ය කලුපහණ පියරතන හිමියන්ගේ සම්මුඛ සාකච්ඡාව

255 රෝහන් ද සිල්වා (අධ්‍යක්ෂ, සමාජ හා ආගමය මධ්‍යස්ථානය) පියතුමා සමග සම්මුඛ සාකච්ඡාවක්: ජොව්ටා අරුලනන්දම් විසින්, 2024 නොවැම්බර් 27, කොළඹ

256 ශ්‍රී ලංකාවේ ආගමික නිදහස පිළිබඳ තත්ත්වය පිළිබඳ අධ්‍යයනයක්, NCEASL කණ්ඩායම් විමසුම, 2024 දෙසැම්බර් 12, කොළඹ
සහභාගී වූවන්: මහේෂ් ද මෙල්, මයික් ගේබ්‍රියෙල් සහ සැලෝම් ද සිල්වා

257 ලක්ෂාන් ඩයස්, සම්මුඛ සාකච්ඡාව

අනතුරුව, පොලිස් නිලධාරීන් පැමිණ පරීක්ෂණ සිදු කරමින් ආරක්ෂක අමාත්‍යාංශයට[258] තොරතුරු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිට තිබේ.

පොලිස් ආවේක්ෂණ සිද්ධි මගින් ද ප්‍රාදේශීය බලධාරීන් කෙරෙහි බෞද්ධ භික්ෂූන්ගේ දැඩි බලපෑම හෙළි කරයි. ගාල්ල, බලපිටිය ප්‍රදේශයේ පූජකවරයෙක් වාර්තා කළේ, බෞද්ධ භික්ෂුවක් එම ප්‍රදේශයේ බහුතර ජනගහණය බෞද්ධයින් වන බව උපුටා දක්වමින් තම නිවසේදී ආගමික ක්‍රියාකාරකම්වල නිරත වීමෙන් වළකින ලෙස තමාගෙන් ඉල්ලීමෙන් පසුව, ප්‍රාදේශීය බලධාරීන් පොලිස් ආවේක්ෂණ, වන්දනාකරුවන්ගේ සංඛ්‍යාව සීමා කිරීම සහ ලියාපදිංචි වීමට බල කිරීම යනාදී ක්‍රියාමාර්ග හරහා මැදිහත්වීම් කළ බව ය.[259]

මෙම රටාව අවධාරණය කරමින්, ක්‍රිස්තියානි ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයක වාර්තාවක්, පොලිසිය සහ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව (CID) ඇතුළු නීතිය ක්‍රියාත්මක කරන ආයතන සාමාජිකයින් පූජනීය ස්ථාන, ඇදහිල්ල පදනම් කරගත් රාජ්‍ය නොවන සංවිධාන, සහ දේවගැතිවරුන් සිටින ස්ථානවලට යාමත් සමග "ක්‍රිස්තියානි ප්‍රජාව ඉලක්ක කරගත් ආවේක්ෂණ සැලකිය යුතු ලෙස වැඩි වී ඇති බව" පෙන්වා දුන්නේය.[260]

## 4.3 සිවිල් සමාජය මත සීමා

පූජනීය ස්ථාන සමග, ඇදහිල්ල පදනම් කරගත් සංවිධාන ද පරීක්ෂාවට ලක් වී ඇත. නව රජය යටතේ වඩා හොඳ පරිසරයක් සඳහා බොහෝ දෙනෙක් බලාපොරොත්තු ප්‍රකාශ කළ අතර තත්වය වැඩිදියුණු වී ඇති බවට සම්මුඛ සාකච්ඡාවලින් පොදු එකඟතාවයක් හෙළි වුවත් සංවිධානවල අත්දැකීම් තරමක් වෙනස් විය.

ජාතික සාම මණ්ඩලයේ අන්තර් ආගමික කටයුතු පිළිබඳව අදහස් දක්වමින් ආචාර්ය ජෙහාන් පෙරේරා මහතා පැවසුවේ, ප්‍රාදේශීය බලධාරීන් බොහෝ දුරට සහයෝගය දක්වන බව තමාට පෙනී ගිය බවත්, ප්‍රජා ආරවුල් සඳහා ඔවුන්ගේ මැදිහත්වීමේ අවශ්‍යතාවය ද සමනය වන බව ඔවුන්ට හැඟෙන බැවින්, එවැනි මුලපිරීම් ඔවුන් සාදරයෙන් පිළිගන්නා බවයි.[261] සංවර්ධනයන් පිළිබඳව වඩාත් සැකයෙන් බලන වෙනත් සම්මුඛ සාකච්ඡාවලදී, ත්‍රස්ත විමර්ශන දෙපාර්තමේන්තුව (TID) වැනි ව්‍යුහයන් ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කළ අතර, උතුරු හා නැගෙනහිර මතභේදාත්මක ආගමික ස්ථානවල ආන්තීකරණයට ලක්වූ ප්‍රජාවන් නියෝජනය කරන සිවිල් සමාජය සෝදිසි කිරීම් සහ හිරිහැරවලට මුහුණ දුන් බව සඳහන් විය.[262] මෑත වසරවලදී රාජ්‍ය බලධාරීන්ගේ ආවේක්ෂණ සහ බිය ගැන්වීමේ සිදුවීම්වලට තමන් සෘජුවම මුහුණ දී නොමැති වුවද, ආගමක් ඇදහීමේ නිදහසට අදාළ ක්ෂේත්‍රයේ වැඩ සම්බන්ධයෙන් අකමැත්තක් දක්වන ප්‍රාදේශීය බලධාරීන්ගෙන් ඔවුන්ට ප්‍රතිරෝධයක් එල්ල වී ඇති බව ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංවිධානය වාර්තා කරයි.[263] මුස්ලිම් ඇදහිලි පදනම් කරගත් සංවිධානවල ක්‍රියාකාරිත්වය සාකච්ඡා කරමින්, මොහොමඩ් හිෂාම් සඳහන් කළේ පසුගිය වසර තුන තුළ ආවේක්ෂණ සිද්ධිවල අඩුවීමක් ඇති බවයි. මුස්ලිම්

---

258 ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය (NCEASL), ක්‍රිස්තියානුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්ව සහ භීෂණ ක්‍රියා 2024, ප්‍රකාශයට පත් නොකළ වාර්තාවක්, NCEASL, 2024 දෙසැම්බර්

259 එම

260 Open Doors – World Watch Research, ශ්‍රී ලංකාව පිළිබඳ සම්පූර්ණ රටා වාර්තාව, (Open Doors, මාර්තු 2024), පිටු 34-35 https://www.opendoors.org/research-reports/country-dossiers/WWL-2024-Sri-Lanka-Full-Country-Dossier.pdf

261 ආචාර්ය ජෙහාන් පෙරේරා, සම්මුඛ සාකච්ඡාව

262 මානව හිමිකම් නීතිඥයෙකු සහ ක්‍රියාකාරීන්ගේ සම්මුඛ සාකච්ඡාව

263 ශ්‍රී ලංකාවේ ආගමික නිදහස පිළිබඳ තත්ත්වය පිළිබඳ අධ්‍යයනයක්, NCEASL කණ්ඩායම් විමසුම

සංවිධාන ආවේක්ෂණ කිරීම සිදුවන්නේ පාස්තු ඉරුදින ප්‍රහාරයෙන් පසුව ඇති වූ නවතම සිදුවීමත් සමඟ මුස්ලිම් විරෝධී හැඟීම්වල හදිසි කැළඹීමක් පැවති සන්දර්භය තුළය. [7 වන කොටස බලන්න][264]

## 4.4 ආරවුල් හැසිරවීම

ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස පිළිබඳ කාරණා සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනවල ප්‍රතිචාරය පිළිබඳ ගැටළු තිබියදීත්, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය විසින් ප්‍රජා මට්ටමේ ආරවුල් ලේඛනගත කිරීමේදී හෙළිදරවු වූයේ, ඇතැම් ස්ථානවල බලධාරීන්ගේ ප්‍රතිචාරය එළදායී බවයි. මොරටුව, පුත්තලම, මන්නාරම සහ මාතර යන ස්ථානයන්හි අවම වශයෙන් ස්වාධීන පල්ලි පහක් සම්බන්ධ සිදුවීම්වලදී, පොලිසිය සහ පළාත් පාලන ආයතන කඩිනමින් සහ සුදුසු පරිදි ප්‍රතිචාර දක්වා ඇති බව පෙනේ.[265]

කතෝලික-ඉවැන්ජලිකල් ආතතීන් වාර්තා වන මන්නාරමෙහි (උතුර), කතෝලික ප්‍රජාවේ පිරිසක් ගල් ගසා ගිනිකෙළි දල්වමින් පල්ලියක දේව මෙහෙයකට බාධා කළහ. ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය සඳහන් කරන්නේ යුද්ධයෙන් පසු අසල්වැසි කතෝලිකයන්ට අපහසුතාවයක් ඇති කරමින් පල්ලියේ ඝෝෂාකාරී නමස්කාර පිළිවෙත් හේතුවෙන් නොසන්සුන්තාව ඇති වූ බවය. පොලිසිය මැදිහත් වී සාකච්ඡාවකට පහසුකම් සැලසූ අතර, පල්ලියේ දේව මෙහෙයන් අසල්වැසියන්ට අපහසුතාවයක් ඇති නොවන පරිදි දිගටම පැවැත්විය යුතු බවට එකඟතාවයකට පැමිණියේය. දැනට දේව මෙහෙයන් පවත්වනු ලබන අතර බලධාරීන් තත්ත්වය නිරීක්ෂණය කරමින් සිටී.[266] කෙසේ වෙතත්, ඉහත සාකච්ඡා කළ පරිදි, අනෙකුත් ප්‍රදේශවල ප්‍රාදේශීය බලධාරීන් ආරවුල් මෙහෙයවන්නේ බහුතරයකගේ හැඟීම් පරිදි ය.

ජුනි මාසයේදී, නුවරඑළියේ (මධ්‍යම) වතුයායක, නිවාස-පල්ලියක් (ගෘහ සභාවක්) ඉදිකිරීමට ගත් උත්සාහයන්ට එරෙහිව ගමේ ඇතිවූ විරෝධතාවක් හත් දෙනෙකු අත්අඩංගුවට ගැනීමට, පොලිසිය විසින් අසභ්‍ය භාෂාව භාවිතා කිරීම සහ දේවගැතිවරයාගේ 14 හැවිරිදි පුත්‍රයාට පොලිසිය විසින් පහර දීමේ සිද්ධියකට හේතු විය. ඉදිකිරීම් සඳහා වූ විරෝධය සාධාරණද යන්න සහ දේවගැතිවරයා ඉදිකිරීම් සඳහා අවශ්‍ය අනුමැතිය ඉල්ලා ඇතිද යන්න පැහැදිලි නැතත්, හැසිරීම සිද්ධිය හරහා පොලිසියේ දුර්වල අනාවරණය වේ.[267]

මාර්තු මාසයේදී, කළුතරදී, පල්ලියක බෞතීස්මය සඳහා භාවිතා කරන පොකුණ ඉදිකිරීමට එරෙහිව ගමේ මතු වූ විරෝධය හේතුවෙන් පොලිස් මැදිහත්වීමක් සිදු කිරීමටත් අධිකරණයේ අවසරය ලබා ගන්නා ලෙස දැනුම් දීමත් සිදුවිය. මෙම ඉල්ලීමට එකඟ වීමට කිසිදු අවශ්‍යතාවයක් නොමැති බව පූජකවරයාගේ නීතිඥවරයා විසින් උපදෙස් දෙන ලද නමුත් ඉදිකිරීම් අත්හිටුවා ඇති බව වාර්තා වේ.[268]

---

264 මොහමඩ් හිෂාම්, සම්මුඛ සාකච්ඡාව

265 ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය (NCEASL), ක්‍රිස්තියානුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්ව සහ හිංසණ ක්‍රියා 2024, ප්‍රකාශයට පත් නොකළ වාර්තාවක්, NCEASL, 2024 දෙසැම්බර්

266 එම

267 එම

268 එම

## 4.5 සම්පත් වෙන් කිරීම

ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සම්බන්ධ කාරණාවලදී ප්‍රාදේශීය බලධාරීන්ගේ කාර්යභාරය, ප්‍රජාවට සම්පත් වෙන් කිරීමේදී ද අනාවරණය වේ.

මඩකලපුවේ, කාත්තන්කුඩි හි සිදු කරන ලද පර්යේෂණයකට අනුව, ප්‍රධාන වශයෙන් මුස්ලිම් ජනතාව වාසය කරන ජනාකීර්ණ ප්‍රදේශයක් වන එම ප්‍රදේශය දැඩි ඉඩම් හිඟයක් අත්විඳිමින් සිටී. වාර්තා වන පරිදි, ප්‍රධාන වශයෙන් දෙමළ ජාතිකයන් වන රජයේ නිලධාරීන් විසින් ප්‍රතිපාදන වෙන් කිරීම අවහිර කරනු ලැබේ. 2024 අගෝස්තු මාසයේදී, සිවිල් ආයතන සහ වෘත්තිකයන්ගේ සංසදය මෙම ඉඩම් ගැටළු ඉස්මතු කරමින් ලිපියක් ඉදිරිපත් කළ අතර, මඩකලපුව ජනගහනයෙන් 27% ක් මුස්ලිම් ජනතාවගෙන් සමන්විත වුවද, ඔවුන්ට වෙන් කර ඇත්තේ දිස්ත්‍රික්කයේ සමස්ත ඉඩම් වලින් 1.46% ක් පමණක් බව සඳහන් කළේය.[269] උසස්වීම් ලබා නොදීම සහ ගුරුවරුන් ඇතුළු මුස්ලිම් රජයේ නිලධාරීන් හිතාමතාම දුෂ්කර ප්‍රදේශවලට මාරු කිරීම වැනි සිද්ධි මෙන්ම වාර්ගික හා ආගමික රේඛා[270] ඔස්සේ තීරණ ගන්නා බව පෙනෙන වෙනත් අවස්ථා ද මෙම පර්යේෂණය ඉස්මතු කරයි. ශ්‍රී ලංකාව පුරා මෙම ගැටලුව කෙතරම් පුළුල්ව පැතිරී ඇත්ද යන්න පැහැදිලි නැතත්, හින්දු භක්තිකයන්ගෙන් 22.1% ක් සහ මුස්ලිම්වරුන්ගෙන් 27.1% ක් රජයේ කාර්යාලවලින් සේවාවන් ලබා ගැනීමේදී තම ප්‍රජාවට බාධා ඇතැයි විශ්වාස කරන බවට හඳුනාගෙන ඇති 2024 ජාතික සාම මණ්ඩලයේ සභා සමීක්ෂණය මේ පිළිබඳව යම් අවබෝධයක් ලබා දෙයි.[271]

# 5. දැඩි මතධාරී දේශපාලන-ආගමික සංවිධාන

නීතිය ක්‍රියාත්මක කිරීමට බලපෑම් කිරීමේදී හෝ මෙහෙයවීමේදී ප්‍රජා හැඟීම් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන අතර, දැඩි මතධාරී දේශපාලන-ආගමික සංවිධාන ද ජනවාර්ගික-ආගමික ආඛ්‍යාන හැඩගස්වමින් රාජ්‍ය ක්‍රියාමාර්ගවලට බලපෑම් කර ඇත.

සාකච්ඡා කළ පරිදි (3 වන කොටස), බොදුබල සේනා වැනි කණ්ඩායම් මුස්ලිම් ජනතාවට සහ ඊට යම්තාක් දුරකට අඩුවෙන් කිතුනුවන්ට පහර දීම සඳහා මැරයන් පෙළඹවීම හේතුවෙන් ඔවුන්ගේ එම කාර්යභාරය සඳහා ඔවුන් කුප්‍රකට විය. මෙම වසර පුරා, රාවණා බලය සහ සිංහල රාවය වැනි බෞද්ධ දැඩි මතධාරී කණ්ඩායම් සමඟ බොදුබල සේනාව රට තුළ ක්‍රියාත්මක වන අතර, ඔවුන්ට සෘජුවම සම්බන්ධ ප්‍රචණ්ඩත්වය හෝ වෛරී ප්‍රකාශ පිළිබඳ වාර්තාගත සිදුවීම් නොමැත. කෙසේ වෙතත්, හින්දු සංවිධාන සමඟ සම්බන්ධ සිදුවීම් සංඛ්‍යාව වැඩි වී තිබේ.

'සිව සේනා' (ශිව හමුදාව) යනු, 2016 දී එක්සත් ජාතීන්ගේ හිටපු නිලධාරියෙකු වූ හින්දු ජාතිකවාදියෙකු බවට පත් වූ මාරවන්පුලව් සච්චිතානන්දන් විසින් ආරම්භ කරන ලද එවැනි සංවිධානයකි. ඉන්දියාවේ හින්දුත්ව කණ්ඩායම් සමඟ සම්බන්ධතා ඇති බවට වාර්තා වී ඇති මෙම සංවිධානය, උතුරු හා නැගෙනහිර පළාත්වල ක්‍රිස්තියානි විරෝධී සහ මුස්ලිම් විරෝධී හැඟීම් ප්‍රවර්ධනය කරමින් හින්දු හිතවාදී ආගමික න්‍යාය පත්‍රයක් ක්‍රියාත්මක කර ඇත.

269 මඩකලපුවේ ආගමික නිදහස හෝ විශ්වාසයේ නිදහස පිළිබඳ දෘෂ්‍යාවලිය 2023-2024, පිටුව 9

270 එම, පිටු 16-17

271 ජාතික සාම මණ්ඩලය (NPC), ආගමික නිදහස පිළිබඳ සමීක්ෂණය 2024, පිටුව 32

2024 දී, කැපී පෙනෙන සිදුවීමක් ලෙස අලුතින් පත් කරන ලද ක්‍රිස්තියානි කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකු හින්දු දෙවිවරුන්ගේ පින්තූර ඉවත් කිරීම නිසා තනතුරෙන් ඉවත් කරන ලෙස ඉල්ලා ජූලි මාසයේදී විරෝධතා පැවැත්වීම හේතුවෙන් ඔහුගේ ස්ථාන මාරුව සිදු විය. එම විරෝධතාවලදී "පෘතුගීසි බරගර් හමුදාවේ නටබුන්" ලෙස කිතුනුවන් හැඳින්වූ අතර "ශිව දේශය ක්‍රිස්තියානි ආගමේ දේශය බවට පත් කිරීම"[272] සඳහා හින්දු සම්ප්‍රදායන් විනාශ කෙරෙමින් තිබූ බවට බිය මතු කළේය. සම්මුඛ සාකච්ඡාවලින් ඉස්මතු වන්නේ, ක්‍රිස්තියානි විරෝධී හැඟීම් ප්‍රවර්ධනය කිරීම සඳහා, මෙම කණ්ඩායම එවැන්ජලිකල් කණ්ඩායම්[273] විසින් සිදු කරන ලද ආගමට හැරවීම් පිළිබඳ උත්සුකයන්ගෙන් අයුතු ප්‍රයෝජන ලබා ඇති බවයි. (3 වන පරිච්ඡේදය, 2 වන වගන්තිය) වසර ගණනාවක් පුරා ඔවුන් ක්‍රිස්තියානි රැස්වීම් කඩාකප්පල් කර ඇති අතර පාර්ලිමේන්තුවේ ක්‍රිස්තියානි දෙමළ මන්ත්‍රීවරුන්ගේ දායකත්වය ද හෑල්ලු කර ඇත.[274]

තවද, ජූලි මාසයේදී මන්නාරමේදී, කතෝලික මඩු අප ස්වාමිදූගේ උත්සවය[275] සාම්ප්‍රදායික හින්දු ආදි පූරම් උත්සවය විසින් ප්‍රතිස්ථාපනය කළ උත්සවයක් බව ශිව සේනා සමාජ මාධ්‍ය ව්‍යාපාරයක් කියා සිටියේය. මඩු උත්සවය සැමරීම හෙළා දකිමින්, එය වහාම නතර කර දෙමළ හින්දු භක්තිකයන්ට ඒ වෙනුවට ආදි පූරම්[276] සැමරීමට හැකිවන පරිදි "එය එහි සාම්ප්‍රදායික මූලයන් වෙත ආපසු භාර කරන" ලෙස ඔවුහු ඉල්ලා සිටියහ.[277]

මැයි මාසයේදී යාපනයේ නල්ලූර් හි සිව සේනායි සංවිධානයේ නායකත්වයෙන් යුත් උද්ඝෝෂණයක් හරහා ගව ඝාතනය සහ මස් ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් මුස්ලිම් ප්‍රජාව හෙළා දුටුවේය. සිව සේනාව පවසන පරිදි, ඔවුන්ට අනුව යාපනය - 'ශිව භූමිය ' (හින්දු ශිව දෙවියන්ගේ දේශය) වන හෙයින් ගව මස් කඩ සහ ගව ඝාතනය තහනම් කළ යුතුය. අනෙකුත් හින්දු නායකයින් සමග යාපනයේ නාග විහාරයේ ප්‍රධාන බෞද්ධ භික්ෂුවගේ සහභාගීත්වය හින්දු දැඩි මතධාරීන් සහ බෞද්ධ භික්ෂු කණ්ඩායම් අතර සහයෝගීතාවය හෙළි කළේය.[278]

2024 දී එම සහයෝගීතාවයේ තවත් උදාහරණයක් ලෙස, 'ශ්‍රී ලංකාවේ හින්දු සම්මේලනය' නමින් කණ්ඩායමක්, දැඩි මතධාරී බෞද්ධ භික්ෂුවක් වන ඥාණසාර[279] හිමියන්ට ජනාධිපති සමාව ඉල්ලා සිටීම සඳහා ප්‍රධාන බෞද්ධ නාහිමිවරුන් සමඟ එක් විය. වවුනියාවේ කරන ලද පර්යේෂණයකින් හෙළි වුයේ, වසර හතරකට පෙර සිංහල දේශපාලනඥයෙකු විසින් පිහිටුවන ලද හා අනුබල ලබන "හින්දු-බෞද්ධ සංගමය" වැනි සාමූහික කණ්ඩායම් පවතින බවයි. මතභේදයට තුඩු දුන් ආගමික ස්ථාන හා සම්බන්ධ ගැටලු ඇතුළුව ප්‍රදේශයේ ගැටුම්වලදී එවායේ බලපෑම පිළිබඳව ප්‍රදේශවාසීන් කනස්සල්ල පළ කර ඇත.[280]

272 ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය (NCEASL), ක්‍රිස්තියානුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්ව සහ හිංසන ක්‍රියා 2024

273 පූජ්‍ය කලුපහණ පියරතන හිමි, සම්මුඛ පරීක්ෂණය

274 ස්කන්ධා ගුණසේකර, "හින්දු ජාතිවාදයේ උත්සන්නතාවය දෙමළ ප්‍රජාව තුළ සන්සුන්කමක් ඇති කරයි," The Morning, 2023 අගෝස්තු 27, https://www.themorning.lk/articles/SX6ExzwZEokbdYLty8t0

275 ශ්‍රී ලංකාව පුරා සිටි දායකයින් දහස් ගණන් ආකර්ෂණය කරන, 1870 දශකයේ ආරම්භ වූ වැදගත්තම වාර්ෂික කතෝලික උත්සව වලින් එකකි.

276 දෙවි ආන්ඩල් නමැති විශිෂ්ට සන්තාව - ලක්ෂ්මී දේවියගේ අවතාරයක් යැයි විශ්වාස වන - අනුගමනය කරමින් ජුලි-අගෝස්තු කාලය ආරම්භ කිරීම සමරන සම්ප්‍රදායික හින්දු උත්සවයකි.

277 ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය (NCEASL), ක්‍රිස්තියානුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්ව සහ හිංසන ක්‍රියා 2024

278 ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය (NCEASL), මුස්ලිම්වරුන්ට එරෙහි ප්‍රචණ්ඩත්ව සහ හිංසන ක්‍රියා 2024

279 චතුරංග සමරවික්‍රම, "හින්දු සම්මේලනය පූජ්‍ය ඥානසාර හිමියන් සඳහා ජනාධිපති සමාවක් ඉල්ලා සිටී," Daily Mirror, 2024 මැයි 22, https://www.dailymirror.lk/breaking-news/Hindu-Federation-requests-Presidential-pardon-for-Ven-Gnanasara-Thera/108-283138

280 ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය, වවුනියාවෙහි ආගමික නිදහස හෝ විශ්වාසයේ නිදහස පිළිබඳ දෘශ්‍යාවලිය 2023-2024, (Minor Matters, දෙසැම්බර්, 2024), https://minormatters.org/report_policy_briefs/the-landscape-of-freedom-of-religion-or-belief-in-batticaloa-2023-2024/, පිටු 11-12

හින්දු අන්තවාදී කණ්ඩායම් බෙදීම් ඇති කිරීමට දරන උත්සාහයන් උතුරට පමණක් සීමා නොවේ. දෙමළ-හින්දු ආධිපත්‍යයක් සහිත මඩකලපුවේ කරන ලද පර්යේෂණවලින් පෙනී යන්නේ හින්දුත්වය ප්‍රවර්ධනය කරන, ඉන්දියාව පදනම් කරගත් රාෂ්ට්‍රීය ස්වයංසේවාක් සංගමය (RSS), විශ්ව හින්දු පරිෂද් සහ ශිවසේනා වැනි සංවිධානවලින් ආභාෂය ලැබූ දේශීය කණ්ඩායම් සිටින බවයි. වාර්තා වන පරිදි, තිරුවෙන්තුර් මුරුගන් කෝවිල ඔවුන්ගේ ක්‍රියාකාරකම් සඳහා මූලස්ථානය ලෙස කටයුතු කරයි. මෑත කාලීනව ජූනි මාසයේ, යාබද කතෝලික පල්ලියේ සාමාජිකයින් කෝවිලට යන මාර්ගයේ මංසන්ධියක මරියතුමියගේ ප්‍රතිමාවක් ස්ථාපනය කිරීමට උත්සාහ කළ අවස්ථාවේදී, ඔවුන්ට සංවිධානවලින් විරෝධතා එල්ල විය.[281]

සම්මුඛ සාකච්ඡාවකදී කුරුක්කල් දර්ශක පැවසුවේ, මතභේදාත්මක ස්ථාන සම්බන්ධ ගැටළු ඇතුළුව හින්දු ප්‍රජාවට බලපාන ප්‍රධාන ගැටළු රජය විසින් දුර්වල ලෙස හැසිරවීම හේතුවෙන් සිව සේනායි වැනි කණ්ඩායම් ඉන් අයුතු ප්‍රයෝජන ලබන රික්තයක් නිර්මාණය වී ඇති බවයි.[282] එහි මතුවීම පසුපස ඇති හේතු ලෙස භූ දේශපාලනය, ඉන්දියාවේ හින්දුකරණය පිළිබඳ ප්‍රවණතාවය සහ එහි මධ්‍යම රජයේ බලපෑම අනෙකුත් සම්මුඛ සාකච්ඡා මගින් ඉස්මතු කළේය.[283] තවද, යුද්ධය මුළුල්ලේ[284] පවා එක්සත්ව සිටි හින්දු සහ ක්‍රිස්තියානි ජනතාව අතර බෙදීම් ඇති කිරීමෙන්, ප්‍රධාන දෙමළ දේශපාලන පක්ෂ තුළ ගැටුම්වලට බලපෑම් කරමින් දෙමළ ප්‍රජාව දුර්වල කිරීමට ගන්නා දේශපාලන උපාය මාර්ගයක් ලෙස ද එය සැලකේ.[285]

සිදුවීම්වල ඉහළ යාමක් තිබියදීත්, මෙම කණ්ඩායම්වලට ඔවුන් බලාපොරොත්තු වූ තරම් ආකර්ෂණයක් නොතිබෙන්නට ඇත. වාර්ගික-ආගමික නොසන්සුන්තාවලින් ප්‍රතිලාභ ලබන කණ්ඩායම්, ආණ්ඩු වෙනස්වීම සහ නව දේශපාලන සංස්කෘතියක් පිළිබඳ පොරොන්දුව සමඟ පසුබෑමකට මුහුණ දී ඇත. [7 වන කොටස බලන්න] ආගමට වඩා වාර්ගික හා ජාතික භාෂා අනන්‍යතාවය මත පදනම් වූ අනාගාමික ජාතිකවාදය කෙරෙහි අවධානය යොමු කර ඇති දෙමළ ජාතිකවාදී පක්ෂ විසින් හින්දු ජාතිකවාදයට දක්වන ප්‍රතිරෝධය ද මීට උපකාරී වී ඇති බව වටහාගෙන ඇත.[286]

හින්දු මූලධර්මවාදී කණ්ඩායම්වල නැගීම සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය කුමක්ද යන්න දැනට පැහැදිලි නැත. එල්ටීටීඊ[287] සංවිධානයට සම්බන්ධ බවට ලැබූ චෝදනා හේතුවෙන් සේනායි නායකයා විමර්ශනයට ලක් කරන ලද බවට වාර්තා වී ඇති නමුත් මුස්ලිම් සහ ක්‍රිස්තියානි ජනතාවට එරෙහිව වෙනස්කම් කිරීමට පෙළඹවිය හැකි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඔවුන්ට කිසිදු සෘණාත්මක බලපෑමක් එල්ල වී නොමැත. රජයේ ප්‍රතිචාරය සාකච්ඡා කරමින් කුරුක්කල් දර්ශක, හින්දු මූලධර්මවාදයේ වර්ධනය සහ මතභේදාත්මක ආගමික ස්ථාන වැනි අනෙකුත් ප්‍රජා ගැටළු සම්බන්ධයෙන් රජය හින්දු නායකත්වය සමඟ සම්බන්ධ වීමේ අවශ්‍යතාවය අවධාරණය කළේය. [නිර්දේශ බලන්න].[288] නව රජය තම පොරොන්දු ඉටු කිරීමට අපොහොසත් වන බව

281 මඩකලපුවේ ආගමික නිදහස හෝ විශ්වාසයේ නිදහස පිළිබඳ දෘශ්‍යාවලිය 2023-2024, පිටුව 13

282 කුරුක්කල් ධර්ශක (ලේකම්, හින්දු පූජක සංගමය), ජෝවිටා අරුලනාන්දම් විසින් 2025 මාර්තු 1 දින දුරස්ථව මුලාකෘති ගත් සම්මුඛ සාකච්ඡාව.

283 ශ්‍රීන් සරූර් (ස්ත්‍රී ක්‍රියාකාරී ජාලයේ සම ආරම්භක), ජෝවිටා අරුලනාන්දම් විසින් 2024 ඔක්තෝබර් 15 දින දුරස්ථව සාකච්ඡාවක් කළාය; හිල්මි අහමඩ්, සාකච්ඡාව; ලක්ෂන් ඩයස්, සාකච්ඡාව; මානව හිමිකම් නීතිඥයා සහ ක්‍රියාකාරියා, සාකච්ඡාව; ශ්‍රියානි තෙවකුමාර්, සාකච්ඡාව.

284 ආදයාලම් මූලික විෂය පර්යේෂණ මධ්‍යස්ථානය, "මුල්ලිවයික්කාල් අවුරුදු 15ක් - ආගමික ගැටළු පිළිබඳ ප්‍රතිඥාපන," YouTube, 2024 ජූනි 20, https://www.youtube.com/watch?v=n6qogLSRVxw

285 ශ්‍රීන් සරූර්, සාකච්ඡාව; ලක්ෂන් ඩයස්, සාකච්ඡාව.

286 ආචාර්ය මහේන්ද්‍රන් තිරුවරන්ගන්, සාකච්ඡාව.

287 "LTTE ආරක්ෂක සංධානයට සම්බන්ධතාවයක් තිබුණා යැයි චෝදනා වන හින්දු අන්තවාදී නායකයාට TID අභියෝග කරයි," Tamil Guardian, 2024 ජූනි 21, https://www.tamilguardian.com/content/tid-interrogates-hindu-extremist-leader-over-alleged-links-ltte

288 කුරුක්කල් ධර්ශක, සාකච්ඡාව.

වටහා ගතහොත් එවැනි දැඩි මතධාරී කණ්ඩායම් අවස්ථා සොයනු ඇති බව ආචාර්ය තිරුවරන්ගන් සඳහන් කළේය.[289]

# 6. ඉස්ලාම් භීතිකාව සහ මුස්ලිම් විරෝධී හැඟීම

ආගමික සුළුතරයන් රාජ්‍යය හෝ දේශපාලන-ආගමික කණ්ඩායම් සම්බන්ධ ප්‍රචණ්ඩත්වය සහ බිය ගැන්වීම පිළිබඳ සිදුවීම්වලට මුහුණ දී ඇති අතර, ප්‍රකාශිතවම ප්‍රජාව ඉලක්ක කරගත් රජයේ ප්‍රතිපත්ති මගින් මුස්ලිම් විරෝධී මතවාදයන් තවදුරටත් පවත්වා ගෙන ගොස් ඇත.[290] ඊට අමතරව, ජනවිකාස වෙනස්කම් සහ සිංහල සහ දෙමළ ප්‍රජාවන් අතර ප්‍රමුඛත්වය අහිමි වීම පිළිබඳව බිය උපදවීමට අනුබල දෙන, ජනවාර්ගික ආගමික අනන්‍යතාවය කෙරෙහි හිතකර නොවන අවධාරණයක් සිදුකිරීම මුස්ලිම් විරෝධී ප්‍රතිපත්තිවලට ප්‍රජාවේ සහය ලැබීමට හේතු වී තිබේ. ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාව අතර, හතර දෙනෙකුගෙන් එක් අයෙකු තම ආගම ඇදහීමේ නිදහස ඇතැම් විට අභියෝගයට ලක් වී ඇති බවට විශ්වාස කරනා බව ජාතික සාම මණ්ඩලයේ 2024 අධ්‍යයනයෙන් හෙළි වීම සැලකිය යුතු කරුණකි.[291]

2012 සිට, පාස්කු ඉරුදින ප්‍රහාරයෙන් පසු මෑත කාලීන සිදුවීම් සමග මුස්ලිම් විරෝධී කථනයේ සහ ප්‍රචණ්ඩත්වයේ වැඩිවීමක් සිදුවී ඇත. සිවිල් වැසියන් 253 දෙනෙකු මිය ගොස් 500 දෙනෙකු තුවාල ලැබූ මෙම ප්‍රහාරයට, මුස්ලිම් බෝම්බකරුවන් සම්බන්ධ වූ අතර ජාතික තව්හීත් ජමාත් (NTJ) නම් මුස්ලිම් කණ්ඩායමක් චෝදනාවට ලක් විය. රට පුරා මුස්ලිම් පල්ලි සහ ව්‍යාපාර ප්‍රහාරයට ලක් වූ අතර සමාජ මාධ්‍යවල 'වෛරී ප්‍රකාශ' පළකිරීම් රැල්ලක් දක්නට ලැබුණි.[292]

අන්තවාදී බෞද්ධ සංවිධාන විසින් මෙහෙයවන ලද මුස්ලිම් විරෝධී ව්‍යාපාර සහ රාජ්‍ය ක්‍රියාමාර්ගවල තීව්‍රතාවය පහව ගොස් ඇතත්, මේ වසර තුළ සිදු වූ ඇතැම් සිදුවීම් හරහා, රාජ්‍ය අංශයේ කණ්ඩායම් තුළ පක්ෂග්‍රාහීත්වය තවමත් පවතින බවත් පාස්කු ඉරුදින ප්‍රහාරයෙන් පසු තවමත් සීමාකිරීම් පවතින බවත් පිළිබිඹු කරයි.

සමහර මුස්ලිම් කාන්තාවන් විසින් පිළිපදින ලද ඇඳුම් පැළඳුම් විලාශය හේතුවෙන් ඔවුන්ව ඉලක්ක කර ගනු ලැබූ අතර අධ්‍යාපනික හා රැකියා ආයතනවලදී වෙනස් කොට සැලකීමට සහ රාජ්‍ය සේවා ලබාදීම ප්‍රතික්ෂේප කිරීමටත් හේතු විය. පාස්කු ඉරුදින ප්‍රහාරයෙන් පසුව, රාජ්‍ය ආයතනවලට කාන්තා නිලධාරීන්ගේ ඇඳුම් පිළිබඳ උපදෙස් ලැබුන නමුත් මග පෙන්වීම පිළිබඳ ලැබුණු විවිධ අර්ථකථන මුස්ලිම් කාන්තාවන් කොටසකගේ සංස්කෘතික හා ආගමික ප්‍රකාශනය උල්ලංඝනය කරන සිදුවීම්වලට හේතු විය.[293]

පාස්කු ඉරුදින ප්‍රහාරයෙන් පසු පැනවූ සීමාකිරීම් ඉවත් කළද, මෙම වසර තුළ ද හිස් ආවරණ කේන්ද්‍ර කරගත් සිදුවීම් තුනක් අවම වශයෙන් සිදුවී ඇත. ජූනි මාසයේදී, විභාගය පැවැත්වුණු කාලය පුරාවටම තම කන් විවෘතව තැබිය යුතු බවට වන රීතියට අකීකරු වී යැයි චෝදනා එල්ල වීමෙන්, ත්‍රිකුණාමලයේ

---

289 ආචාර්ය මහේන්ද්‍රන් තිරුවරන්ගන්, සාකච්ඡාව.

290 Amnesty International, "ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාවට එරෙහි ප්‍රචණ්ඩත්වය හා විෂමතා අවසන් කළ යුතුය," 2021 ඔක්තෝබර් 18, https://www.amnesty.org/en/latest/news/2021/10/sri-lanka-authorities-must-end-violence-and-discrimination-against-muslims/

291 ජාතික සාම මණ්ඩලය (NPC), 2024 ආගමික නිදහස පිළිබඳ සමීක්ෂණය, පිටුව 10.

292 සුධා රාමචන්ද්‍රන්, "ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාවට එරෙහි ප්‍රචණ්ඩත්වය," The Diplomat, 2018 මාර්තු 13, https://thediplomat.com/2018/03/sri-lankas-anti-muslim-violence/

293 ශ්‍රීන් සරූර්, Waging War on Women's Bodies, පිටුව 15.

සහිරා විද්‍යාලයේ සිසුන් 70 දෙනෙකුගේ උසස් පෙළ විභාග ප්‍රතිඵල අත්හිටුවන ලදී.[294] ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සිද්ධිය සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනයෙන් හෙළි වන්නේ-සිසුන් පවසන පරිදි ඔවුන්ගේ කන්වල දෘශ්‍යතාවට බාධාවක් නොවී ඇති හිස් ආවරණ ඇත්ත වශයෙන්ම විභාග රීතිය[295] උල්ලංඝනය කර තිබේද යන්න තීරණය කිරීමේදී නිරීක්ෂකයින් අපක්ෂපාති නොවූ බවයි. පසුව, ප්‍රතිඵල ජූලි මාසයේදී නිකුත් කරන ලදී.

ජුනි මාසයේ සිදු වූ තවත් සිද්ධියකදී, කොළඹ (බටහිර) කොටහේන මහා විද්‍යාලයේ විභාග මධ්‍යස්ථානයේ විභාගයකට පෙනී සිටි මුස්ලිම් විදුහල්පතිනියන් 13 දෙනෙකුගේ විභාග ප්‍රතිඵල එම හේතුව නිසාම ප්‍රතික්ෂේප කරන ලදී.[296]

මැයි මාසයේදී පුත්තලම (වයඹ) පහලවි සිංහල විද්‍යාලයේ අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින සිසුන්ට ඔවුන්ගේ පරදා ඉවත් කර ඒ වෙනුවට ස්කාෆ් එකක් පැළඳීමට ඉල්ලා සිටි තවත් සිදුවීමක් ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය විසින් වාර්තා කරන ලදී. වාර්තා වන පරිදි, බලධාරීන් මුලින් සඳහන් කර තිබුණේ මුහුණ සහ කන් දෙකම පෙනෙන පරිදි විභාග මධ්‍යස්ථානය තුළ සිසුන්ට පරදා පැළඳිය හැකි බව වන අතර සිසුන් මෙම මාර්ගෝපදේශ පිළිපැද ඇති බව වැටහේ.[297]

ත්‍රිකුණාමලය සහ කොළඹදී ඇති වූ සිදුවීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව කඩිනම් හා ඵලදායී ලෙස ක්‍රියා කර ඇති බව පෙනේ. ත්‍රිකුණාමලය සිද්ධියේදී, නිරීක්ෂකයින් අපක්ෂපාතීව කටයුතු කර ඇති දැයි යන්න පිළිබඳව අභ්‍යන්තර පරීක්ෂණයක් පවත්වා "වැඩි අනුකූලතාවක් සහ නිශ්චිතභාවයක් සහතික කරනු පිණිස අදාළ විභාග රීතියේ අර්ථ නිරූපණය" සමාලෝචනය කරන ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විභාග දෙපාර්තමේන්තුවට නියෝග කළේය.[298]

මීට අමතරව, රාජ්‍ය බලධාරීන්ගේ ප්‍රයෝජනය පිණිස ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීම සඳහා මානව හිමිකම් කොමිසම අදහස් විමසීමේ ක්‍රියාවලියක නිරත වී ඇත.[299] මාර්ගෝපදේශවල අවශ්‍යතාවය පිළිබඳව අදහස් දක්වමින් මහාචාර්ය ෆර්සානා හනීෆා සම්මුඛ සාකච්ඡාවකදී කියා සිටියේ මෙම සිද්ධීන් පිළිබඳ විමර්ශනයේදී මාර්ගෝපදේශ මගින් විසඳා ගැනීමට බලාපොරොත්තු වන ප්‍රශ්න කිහිපයක් මතු වූ බවයි. අපැහැදිලි නීති නිකුත් කිරීම, අවිධිමත් බලාත්මක කිරීම සහ ක්‍රියාත්මක කිරීමේදී ඒකාකාරී නොවීම මේවාට ඇතුළත් වේ.[300]

අනෙකුත් ප්‍රදේශවල, පාස්කු ඉරුදින ප්‍රහාරයෙන් පසුව දිගින්දිගටම ඇතිවූ සීමාකිරීම් හේතුවෙන් මුස්ලිම් ජනතාව තවමත් පීඩාවට පත්ව සිටිති. ඉස්ලාමීය සාහිත්‍ය ආනයනය සඳහා දිගින්දිගටම සීමාකිරීම් පවතින බව සිවිල් සමාජය ඉස්මතු කරයි. මොහොමඩ් හිෂාම්ට අනුව, 2022 දී තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ

294 පමෝදි වරවිතා, "විභාගයකදී කන තැබීම වසා දැමීමේ නීතිය: ශිෂ්‍යයන් කිහිපදෙනෙකුගේ ප්‍රතිඵල මත තීරණයක් ගනී," The Morning, 2024 ජුනි 23, https://www.themorning.lk/articles/uge514dFEa88535OkVmi

295 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, "ආගමික නිදහස හෝ විශ්වාසය උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් අභියෝග කෙරෙන සිදුවීම් පිළිබඳව අතුරු උපදෙස්," 2024 ජූලි 18, https://www.hrcsl.lk/wp-content/uploads/2024/07/HRCSL-Interim-Directions-to-Department-of-Examinations.pdf

296 NCEASL, මුස්ලිම්වරුන්ට එරෙහි ප්‍රචණ්ඩත්ව සහ හිංසන ක්‍රියා 2024

297 එම.

298 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, "ආගමික විශ්වාසයේ නිදහසට එරෙහිව සිදුවූ හෙළිදරව්වක් සම්බන්ධ අතුරු උපදෙස්"

299 එම.

300 මහාචාර්ය ෆාර්සානා හනීෆා (කොමිෂන් සභිකාව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව), ජෝවිටා අරුලානන්දම් විසින් 2024 දෙසැම්බර් 5 දින පැවැත්වූ සම්මුඛ සාකච්ඡාව

අයදුම්පතකින් හෙළි වුයේ, ඉස්ලාමීය විද්වතුන්ගේ කමිටුවක් මුලිකවම අදාළ ප්‍රකාශන පරීක්ෂා කළද, ආගමික ග්‍රන්ථ හෝ කුර්ආන් පරිවර්තන ආනයනය කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය (MoD) අවසාන අනුමැතිය ලබා දිය යුතු බවයි.[301] වාර්තා වන පරිදි, අනෙකුත් කිසිදු ආගමික දෙපාර්තමේන්තුවක් මෙම ක්‍රියාවලියට යටත් නොවේ. මෙම වසරේදී, කුර්ආන් ඇතුළත් ඉස්ලාමීය ග්‍රන්ථයන්ගෙන් යුත් නැව් භාණ්ඩ තොගයක් මැයි මාසයේ සිට වරායේ රඳවාගෙන තිබණි. එය සැප්තැම්බර් මාසයේදී නිදහස් කරන ලද්දේ ඉස්ලාමීය දේවධර්මීය නායකත්වයක් වන සමස්ත ලංකා ජම්යතුල් උලමා (ACJU) හි මැදිහත්වීමෙන් පසුවය.[302]

අනෙකුත් අංශවල, මුස්ලිම් සංවිධාන සඳහා වන සීමාකිරීම් [4.3 වගන්තිය බලන්න] සැලකිය යුතු ලෙස ලිහිල් කර ඇති නමුත් ඇතැම් සීමාකිරීම් තවමත් පවතී. 2024 දී, පාස්කු ඉරුදින ප්‍රහාරය හා සම්බන්ධ අය ඇතුළුව පුද්ගලයින් 90 කට වැඩි පිරිසක් 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ රෙගුලාසි යටතේ නම් කරන ලද පුද්ගලයින්ගේ ලැයිස්තුවෙන් ඉවත් කරන ලදී.[303] කෙසේ වෙතත්, ඉවත් කිරීම සඳහා ක්‍රියාත්මක වන අඛණ්ඩ උත්සාහයන් පැවතියද, ඉස්ලාමීය ශිෂ්‍ය ව්‍යාපාරය තවමත් ලැයිස්තුගත කර ඇත. පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධ යැයි ඇඟවෙන ශිෂ්‍යයින් දෙදෙනා ස්වාධීනව ක්‍රියා කළ බව හේතුකොටගෙන, එම ලැයිස්තුගත කිරීම අසාධාරණය යැයි සැලකේ.[304] මානව හිමිකම් කණ්ඩායම් ද අවධාරණය කර ඇත්තේ පාස්කු ඉරුදින ප්‍රහාරය හා සම්බන්ධ හිටපු රැඳවියන් සහ ඔවුන්ගේ පවුල් ආවේක්ෂණය දිගින් දිගටම වාර්තා වන බවත්, එමගින් ආරක්ෂක අංශයේ අවධානයට ලක්වීමේ බිය හේතුවෙන් ප්‍රජාව තුළ ඔවුන් කොන් කිරීමට ලක් වන බවත්ය [ත්‍රස්තවාදය වැළක්වීමේ පනතේ භාවිතය පිළිබඳ 1 වන පරිච්ඡේදය, 2.3 වන වගන්තිය බලන්න].[305]

මෙම වසරේ වඩාත් ධනාත්මක පුවතක් ලෙස, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව නිවේදනය කළේ 2019 ප්‍රහාරයෙන් පසු වසා දැමූ ජාතික තව්හීද් ජමාත් පල්ලිය සහ කාත්තන්කුඩි හි ධාරුල් අතාර් පල්ලිය ඉක්මනින් මහජනතාවට අතට පත් කරන බවයි.[306] අනෙකුත් ධනාත්මක වර්ධනයන් අතරට සැක සහිත වත්කම් රැස් කිරීමට, සිංහල කාන්තාවන්ට නීති විරෝධී ලෙස වන්ධ්‍යාකරණ සැත්කම් සිදු කිරීමට සහ ත්‍රස්තවාදයට සම්බන්ධ බවට 2019 දී චෝදනාවලට මුහුණ දුන් වෛද්‍ය ශාෆි ෂිහාබ්දීන් වරදින් නිදහස් කිරීම ඇතුළත් වේ. ධනාත්මක වර්ධනයක් ලෙස, ප්‍රමාණවත් සාක්ෂි නොමැති වීම හේතුවෙන් නොවැම්බර් මාසයේදී නඩුව නිෂ්ප්‍රභා කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඔහු නිදොස් කොට නිදහස් කරන ලදී.[307]

---

301 මොහොමඩ් හිෂාම්, සම්මුඛ සාකච්ඡාව

302 NCEASL, මුස්ලිම් ජනතාවට එරෙහිව සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියා සහ භීෂණතා 2024

303 ආරක්ෂක අමාත්‍යාංශය, එක්සත් ජාතීන්ගේ පනත, අංක 45 (1968)։ එක්සත් ජාතීන්ගේ නියමයන් අංක 1 (2012) අනුව නියමනය 4(7) යටතේ නම් කල පුද්ගලයින්, කණ්ඩායම් සහ ආයතන ලැයිස්තුවට කරන සංශෝධනය, ජෙනරාල් කමල් ගුණරත්න, අංක 2387/02, (ශ්‍රී ලංකාව, 2024 ජුනි 3, සඳුදා), පිටු 3, https://fiusrilanka.gov.lk/docs/UNSCR/List/2387_02/2387_02_E.pdf

304 මොහොමඩ් හිෂාම්, සම්මුඛ පරීක්ෂණය

305 "ශ්‍රී ලංකාව: ව්‍යාජ ත්‍රස්තවාදී නඩු හරහා යටපත් කිරීමක්", Human Rights Watch, 2024 ජුලි 17, https://www.hrw.org/news/2024/07/17/sri-lanka-false-terrorism-cases-enable-repression

306 The Landscape of Freedom of Religion or Belief in Batticaloa 2023-2024, පිටු 10

307 "වෛද්‍ය ශාෆි මහතාට එරෙහි සියලු චෝදනා වලින් නීතිමයව නිදහස් කෙරේ", Daily FT, 2024 නොවැම්බර් 7, https://www.ft.lk/front-page/Court-exonerates-Dr-Shafi-of-all-charges/44-768942

# 7. ආගමික වාද සහ සංකේතකරණය

මුස්ලිම් ප්‍රජාව කොන් කිරීමට ලක් කරන ආකාරයේ ආකල්ප ඇතුළු වෛරී සහගත ආකල්ප දෛනික දේශපාලනික සහ සමාජීය සංවාද ඔස්සේ නොකඩවා පවත්වාගැනීම තුළින් එම ප්‍රජාව සම්බන්ධයෙන් “බැහැර කිරීම, සීමා පැනවීම හෝ රූපිකත්වය වෙනස් වීම” දක්වා එකී ආකල්ප යොමුවිය හැකිය.[308] 1920 ගණන්වල සිට, ශ්‍රී ලංකාව තුළ ද, දේශපාලනඥයින් විසින් මෙම හැඟීම් මැතිවරණ වාසි තකා උපයෝගී කරගැනීමත් සමඟ 'වාර්ගික කරුණු මත අනෙකා අභිබවා යාම්'[309] දේශපාලන සංවාදවලට බලපෑම් සිදු කෙරෙමින් පවතී. පාස්කු ඉරිදා ප්‍රහාරය සහ මුස්ලිම්වරුන්ට එරෙහි ප්‍රබල විරෝධතා රැල්ලක් මතින් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා ව බලයට ගෙන ආ 2019 ජනාධිපතිවරණයේ දී මෙය පැහැදිලි කාරණයක් විය. තමන් ව බලයට පත් කළ 'සිංහලයන්ගේ බහුතර ඡන්දය' පිළිගනිමින් ජනපති ගෝඨාභය රාජපක්ෂ බෞද්ධ පූජනීය ස්ථානයක් වන රුවන්වැලි සෑ පරිශ්‍රයේ දී දිවුරුම් දුන්නේය.[310] වාර්ගික-ආගමික බෙදීම් එහි ඉහළම විභවයෙන් දක්නට ලැබුණු,[311] මෙම මැතිවරණයට වඩා ධනාත්මක වෙනස්කම් කිහිපයක් ම 2024 වසරේ පැවති මැතිවරණවලදී දක්නට ලැබුණි.

ආර්ථික අර්බුදය තුළ රාජපක්ෂවරුන් ගේ භූමිකාව සහ මහජනතාව හමුවේ ඔවුන් සතුව පැවති වලංගුභාවය අහිමි වීම, ආගමික හැඟීම අවභාවිතා කරන අන්දමේ උපක්‍රම ඇතුළු වංචනික දේශපාලන ක්‍රමෝපායයන් දක්වා ද ඇදී ගියේයැයි සලකනු ලැබේ. මෙම තත්වය මෙන්ම, ආර්ථික දුෂ්කරතා සම්බන්ධයෙන් මහජනතාව දැක්වූ උනන්දුව සඳහා ප්‍රතිචාර දැක්වීමේ අවශ්‍යතාවය ද මෑතකාලීන මැතිවරණ ප්‍රචාරණයන්හි දී ආගමික වාද යොදාගැනීම අඩු වීමට හේතු වී ඇති බව වටහාගෙන ඇත.[312]

මෙම පර්යේෂණයේ කොටසක් ලෙස පැවති සම්මුඛ සාකච්ඡාවලට සහභාගී වූ බොහෝ දෙනෙකුට, ජාතිවාදී ප්‍රකාශ උදෙසා වූ අනුමැතිය අඩු කිරීමට අරගලයෙන්[313] යම් කාර්යභාරයක් ඉටු වූ බව ද දැනී තිබුණි. අරගලය දේශපාලනය කෙරෙන් දුරස්ථව පැවති අතර වාර්ගික සහ ආගමික බෙදීම් නොසලකා හරිමින් සියල්ලන් අන්තර්ගත කරගත් අවස්ථාවක් වශයෙන් සලකන ලදී.[314] තරුණයින්ගේ අදහස්වල සිදු වූ වෙනස් වීමක් ද මෙයට දායක වන්නට ඇති බව සාමාන්‍ය සමාජය විසින් සලකන ලදී.[315]

ප්‍රධාන අපේක්ෂකයින්ගේ ජනාධිපතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශ වලින් ද මෙම වෙනස සඳහා ප්‍රතිචාර දැක්වීමට තරමක උත්සාහයක් දක්වා තිබිණි. බෞද්ධ සිද්ධස්ථාන හා හින්දු උරුම සිද්ධස්ථානවල සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් උපුටා දක්වමින්, සියලු වන්දනීය ස්ථාන වල ආරක්ෂාව ගැන රනිල් වික්‍රමසිංහ පොරොන්දු

308 නාස්ලියා ෂනියා, ආගම හෝ විශ්වාසය මත ඇති වෛරය පිළිබඳව..., 4

309 ප්‍රදීප් පීරිස් සහ නිපුනිකා ලැකම්වසම්, සෙරෙනුවාත් වෙනස්වන පීලිවෙල: ශ්‍රී ලංකාවේ සන්සුන් සංධානය හා ජනතා මතය පිළිබඳ ප්‍රවණතා විශ්ලේෂණයක්, (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය - සමාජ සංඥා දර්ශකය, මාර්තු 2024), https://www.cpalanka.org/wp-content/uploads/2024/04/Shifting-Tides_A-Trend-Analysis-of-Public-Opinion-on-Reconciliation-and-Democracy-in-SL_FINAL_FF.pdf, 12

310 ”සිංහල බහුතරයම මට ජය ලබාදුන්නා: ගෝඨාභය“, ද මෝනින්ග්, නොවැම්බර් 18, 2019, https://www.themorning.lk/articles/51463

311 ආචාර්ය ජෙහාන් පෙරේරා, සම්මුඛ සම්මුඛ ව්‍යාකූලය

312 ආචාර්ය ජෙහාන් පෙරේරා, සම්මුඛ සාකච්ඡාව; ආචාර්ය විනයා ආරියරත්න, සම්මුඛ සාකච්ඡාව; පූජ්‍ය ගල්කන්දේ ධම්මානන්ද හිමි, සම්මුඛ සාකච්ඡාව

313 'අරගලය' යන්න සිංහලයේ අර්ථය 'සටන' ය. 2022 දී ආණ්ඩුව හා ආර්ථිකය පිළිබඳව පැවති ජනතා විරෝධතා අනුක්‍රමය.

314 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය- සමාජ සංඥා දර්ශකය, අරගලය පිළිබඳ සංක්ෂිප්ත විශ්ලේෂණයක්, (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, මැයි 2023), https://www.cpalanka.org/wp-content/uploads/2023/05/A-Brief-Analysis-of-the-Aragalaya_Final-Report.pdf, පි. 6-26

315 ආචාර්ය විනයා ආරියරත්නරී රෝහාන් ද සිල්වා පියතුමා, සම්මුඛ සාකච්ඡාව; පූජ්‍ය ගල්කන්දේ ධම්මානන්ද හිමි, සම්මුඛ සාකච්ඡාව

විය.[316] හිටපු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂගේ පුත්‍ර, නාමල් රාජපක්ෂ ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පවා සුපුරුදු පරිදි බුද්ධ ශාසනයේ ආරක්ෂාවට ප්‍රමුඛත්වයක් ලබා දී තිබුණ ද, 'ආගමික නිදහසට ගරු කිරීම. උදෙසා වෙන්වුණු තවත් කොටසක් ඉදිරිපත් කර තිබු .[317]

අනුර කුමාර දිසානායකගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ සාමාන්‍ය ආකාරයෙන් බුදු දහමට ලැබෙන ප්‍රමුඛ ස්ථානය පිළිබඳ කිසිදු සඳහනක් නොවූ අතර, 'ආරක්ෂාව, අන්‍යෝන්‍ය අවබෝධය, විශ්වාසය සහ වාර්ගික සහ ආගමික කණ්ඩායම් සතු අයිතිවාසිකම්' සඳහා එයින් පොරොන්දු විය.[318] ජනාධිපතිවරණයට පෙර පැවති සම්මුඛ සාකච්ඡාවකදී අනුර කුමාර දිසානායක ප්‍රකාශ කළේ "ජාතිවාදය හෝ ආගමික අන්තවාදී ගැටලු නොමැති රටක්" ගොඩනැගීම තමන්ගේ පරමාර්ථය බවයි.[319] පාර්ලිමේන්තුවේ සමාරම්භක අවස්ථාවේ දී, "ජාතිවාදී දේශපාලනය"[320] ඉහළ නැඟීම වළක්වන බවට පොරොන්දු වෙමින් ශ්‍රී ලංකාව තුළ ආගමික අන්තවාදයට එරෙහිව සටන් කිරීම උදෙසා කැප වන බව ඔහු විශේෂයෙන් සඳහන් කළේ ය.

මැතිවරණවලින් අනතුරුව, සුළුතර වාර්ගික-ආගමික කණ්ඩායම් නියෝජනය කරන දේශපාලනඥයන් මෙම වෙනස සැලකිල්ලට ගත් අතර ජනාධිපතිවරයාට ඔහුගේ "ජාතිවාදී හෝ ආගමික භක්තිමත් බව පිටිවහල් කර නොගනිමින් හිමි කර ගත් විශිෂ්ඨ ජය" වෙනුවෙන් සුබ පැතුම් පළ විය.[321]

මැතිවරණ කොමිසම විසින් පනවන ලද සීමා මගින් ද මෙම අඩුවීමට දායකත්වයක් ලැබී තිබෙන්නට පිළිවන. පසුගිය ආචාර ධර්ම සංග්‍රහවලින් ආගමික කණ්ඩායම් ඉලක්ක කරගනිමින් කරන වෛරී සහගත ප්‍රකාශවලට එරෙහිව පියවර ගෙන තිබුවත් අමතර පියවරක් ලෙස ප්‍රචාරක රැළි වලදී "ආගමික සංකේත යොදා ගැනීමෙන් වැළකීම"[322] ට කටයුතු කර තිබණි.

ජාතික මට්ටමේ දී ප්‍රචාරණ කටයුතුවල ස්වභාවයේ වෙනස් වීමක් නිරීක්ෂණය වූ නමුත් ප්‍රාදේශීය මට්ටමේ පැවති කුඩා ප්‍රමාණයේ රැස්වීම්වල මෙම තත්වය එලෙසම දක්නට නොලැබණි. මඩකලපුව (නැගෙනහිර), සමන්තුරෙයි හි පැවති, විදුතලයි පුලිකල් මක්කල් මුන්නායි යනුවෙන් නම් කළ දේශපාලන පක්ෂයක් විසින් සංවිධානය කළ ප්‍රචාරක රැළියක දී සිදු කළ මුස්ලිම්-විරෝධී ප්‍රකාශ පිළිබඳව ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංගමය (NCEASL), විසින් වාර්තා කරයි. හිටපු LTTE කමාන්ඩර්වරයෙකුව සිට පසුව දේශපාලනයට එක්වූ විනයාගමූර්ති මුරලිදරන් හෙවත් කරුණා අම්මාන් ගේ නායකත්වයෙන් පවත්වාගෙන යනු ලබන දෙමළ එක්සත් නිදහස් පෙරමුණ නියෝජනය කරන්නන් ද ඊට සමාන ප්‍රකාශ සිදු කළ බව වාර්තා වී ඇත.[323]

---

316 රනිල් වික්‍රමසිංහ, රටක් ජය ගත් අවුරුදු පහක් රනිල් සමඟ, පිවිසුම් දිනය - 2024 ඔක්තෝබර් 15

317 නාමල් රාජපක්ෂ, ඔබට සංවර්ධිත රටක් සඳහා, පි. 13-14 සහ 47, පිවිසුම් දිනය - 2024 ඔක්තෝබර් 22, https://namal2024.com/full-manifesto

318 ජාතික ජන බලවේගය (NPP Sri Lanka) මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශය, සපිරි ජාතියක්, සිරිමත් ජීවිතයක්, (NPP Sri Lanka, අගෝස්තු 2024), https://www.npp.lk/up/policies/en/npppolicystatement.pdf, පිවිසුම් දිනය - 2024 සැප්තැම්බර් 1

319 මීරා ශ්‍රීනිවාසන්, "ශ්‍රී ලංකාවේ ආර්ථිකය නිරාකරණය කිරීම, ජාතිවාදය මකා දැමීම ප්‍රමුඛතාවයක් බව JVP නායක අනුර කුමාර දිසානායක කියයි." ද හින්දු, 2024 සැප්තැම්බර් 3, https://www.thehindu.com/news/international/fixing-sri-lankas-economy-wiping-out-racism-top-priority-says-jvp-leader-anura-kumara-dissanayake/article68601908.ece

320 "දසවන පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරය සඳහා ජනාධිපති අනුර කුමාර දිසානායක පැවැත්වූ සම්පූර්ණ ආරම්භක දැක්ම" (ශ්‍රී ලංකාව, නොවැම්බර් 2024), https://www.presidentsoffice.gov.lk/the-full-speech-delivered-by-president-anura-kumara-dissanayake-at-the-inauguration-of-the-first-session-of-the-tenth-parliament/

321 මතිපරනන් සුමන්දිරන් (@MAsumanthiran), "@anuradisanayake තුමන්ට සුභ පතමි, ජාතිවාද හෝ ආගම්වාද භාවිතා නොකර ජය ගත් බව සතුටට කරුණකි", ට්විටර්, 2024 සැප්තැම්බර් 22, https://twitter.com/MASumanthiran/status/1837666232264544430

322 ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව, පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 8(8) වගන්තියට අනුව නිකුත් කළ හැසිරීම් ක්‍රමෝපදේශය, අංක 22403/21, (මැතිවරණ කොමිෂන් සභාව, සැප්තැම්බර් 2024), පි. 6, https://elections.gov.lk/web/wp-content/uploads/2024/10/GAZ_2403_21_E.PDF

323 ශ්‍රියානි තේවකුමාරි, සම්මුඛ සාකච්ඡාව NCEASL, මුස්ලිම්වරුන්ට එරෙහි වෛරීසංසක සහ ඕය උද්ඛමනය වූ සිදුවීම් - 2024

මැතිවරණයට පෙර, මැයි මාසයේ දී තමිල් මක්කල් විදුතලයි පුලිකල් හි නායකයා වන සිවනේසතුරයි චන්ද්‍රකාන්තන් හෙවත් පිල්ලෙයාන් 'Easter Padukolai' (පාස්කු සමූල ඝාතනය) යන තේමාවෙන් පොතක් ප්‍රකාශයට පත් කළේ ය. LTTEයෙන් බිඳී වෙන්වුණ කාණ්ඩයක හිටපු නායකයා මෙන්ම හිටපු රාජ්‍ය අමාත්‍යවරයෙකු ද වූ පිල්ලෙයාන් ගේ නම, පාස්කු ඉරිදා ප්‍රහාරයට සමීපව ඈඳී තිබුණි. මඩකලපුවේ දී කළ සොයාබැලීමකින් හෙළි වන්නේ මෙකී පොත මගින් ඉස්ලාම් දහමට නිගරු කරමින් හානිකර මතවාද පෝෂණය කිරීමත්, එය මැතිවරණයට පෙර කාල වකවානුව තුළ මුස්ලිම් විරෝධී අදහස් වර්ධනය කෙරෙන උත්සාහයක් වීමත් සම්බන්ධයෙන් ගැටලු ඇති බවයි.[324]

ප්‍රදේශය තුළ දෙමළ-මුස්ලිම් කලබල පැතිරවීම සම්බන්ධයෙන් මෙම හිටපු ඇමතිවරයා ප්‍රකට ය. අගෝස්තු මාසයේ දී, අම්පාරේ (නැගෙනහිර) වීරමුනෙයි සින්තයතිරයි පිල්ලයාර් විහාරස්ථානයේ ආරුක්කුවක් ඉදි කිරීම ට අදාළ ව මුස්ලිම්-හින්දු දෙපිරිස අතර එකඟතාවයක් නොතිබීමේ තත්වයක්, ඔහුගේ මැදිහත්වීම නිසා ජන කණ්ඩායම් දෙක අතර දුර දිග ගිය සතුරුකමක් දක්වා වර්ධනය වීම සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, එම කෝවිලේ උත්සවවලට සුපුරුදු පරිදි සහභාගී වූ මුස්ලිම්වරුන්ට එම සහභාගී වීමේ අවසරය නොලැබුණි.[325]

එයින් නොනැවතී, නොවැම්බර් මාසයේදී සමාජ මාධ්‍යවල පළ කළ සම්මුඛ සාකච්ඡාවක දී හිටපු ඇමතිවරයා මඩකලපුවේ මුස්ලිම් ප්‍රජාවට එරෙහිව භීතිය වපුරවමින් අපහාසාත්මක අයුරින් අදහස් දැක්වීය. ජන සමාජයේ ඇතැම් කාණ්ඩ මරාගෙන මැරෙන ත්‍රස්ත ප්‍රහාර සිදු කළ හැකි අන්දමේ විප්ලවකාරී මනසකින් යුක්ත බව ඔහු ප්‍රකාශ කළේ ය.[326] කෙසේ නමුත් ඔහුගේ ක්‍රමෝපායය ඔහුටම විරුද්ධ ව ක්‍රියා කර තිබූ බව පෙනී ගියේ නොවැම්බර් වල පැවති පාර්ලිමේන්තු මැතිවරණයෙන් එක් ආසනයක් වත් දිනා ගැනීමට හිටපු අමාත්‍යවරයා අසමත් වීමෙනි.

අනෙකුත් අවස්ථාවන් හි දී, දේශපාලන පක්ෂ විසින් ඔවුන්ගේ ප්‍රචාරණ කටයුතුවලදී වාර්ගික ආගමික කණ්ඩායම් පැහැදිලි ලෙස ඉලක්ක නොකළ නමුත් වාර්ගික ආගමික අනන්‍යතාවයන් කෙරෙහි අවධානය යොමු කර තිබුණි. උතුරේ, දෙමළ ජාතික පක්ෂ විසින් නිරන්තරයෙන් 'වාර්ගික හැඳිනුම' භාවිතා කරමින් සිය පාක්ෂිකයන්ට ඔවුන් ගේ දමිළ අනන්‍යතාවය සමඟ එකරාශි වීමටත්, එමෙන්ම 'සිංහල පක්ෂයක්'[327] සඳහා ඡන්දය භාවිතා කිරීමෙන් වැළකීමටත් බල කරනු ලැබූ බව පෙනේ. එසේම ජනාධිපති අපේක්ෂක රනිල් වික්‍රමසිංහ වෙනුවෙන් නැගෙනහිර ප්‍රදේශයේ පැවති ප්‍රචාරක රැළි වාර්ගික පාඨයන් යොදා ගනිමින් සංවිධානය වී තිබූ අතර, මුස්ලිම් සහ දමිළ ප්‍රජාව උදෙසා වෙන වෙනම පැවැත්වූ රැස්වීම් වල අනෙක් පාර්ශවය සම්බන්ධයෙන් නිශේධාත්මක අදහස් සුලබ ව පැවති බව වාර්තා වී ඇත.[328]

මැතිවරණයෙන් පරිබාහිර ව, නව ආණ්ඩුවේ පළමු පියවර හා සබැඳි ඉඟි සහ ප්‍රකාශ ද ඇතුළු සියල්ලෙන් ඉඟි කෙරුණේ වඩා පිළිගැනීමක් හිමිවන සහ සියල්ලන් අන්තර්ගත කරගන්නා ආකාරයේ දේශපාලන සංස්කෘතියක් ඇරඹෙමින් ඇති බවයි. නොවැම්බර් මාසයේ දී පාර්ලිමේන්තු ආරම්භක උත්සවය සුපුරුදු අන්දමට වඩා වෙනස් සරල ලෙස පැවැත්වුණු අතර, එහිදී බෞද්ධ ගාථා පාඨ ගායනයක් වන ජයමංගල ගාථා නොතිබීම මාධ්‍යයේ සැලකිල්ලට ලක් විණි.[329]

324 2023-2024 කාලසීමාවේ මඩකළපුව දිස්ත්‍රික්කයේ ආගමික නිදහස පිළිබඳ පරිසරය, පි. 6

325 NCEASL, මුස්ලිම්වරුන්ට එරෙහි වදහිංසන සහ බිය උද්ඛමනය වූ සිදුවීම් - 2024

326 එම

327 ආචාර්ය මහේන්ද්‍රන් තිරුවාරංගන්, සම්මුඛ සාකච්ඡාව

328 2023-2024 කාලසීමාවේ මඩකළපුව දිස්ත්‍රික්කයේ ආගමික නිදහස පිළිබඳ පරිසරය, පි. 18

329 පූජ්‍ය ගල්කන්දේ ධම්මානන්ද හිමි, සම්මුඛයේ ආචාර්ය මහේන්ද්‍රන් තිරුවාරංගන්, සම්මුඛ සාකච්ඡාව

## 8. ආගමක් ඇදහීමේ සහ විශ්වාස කිරීමේ නිදහස ප්‍රවර්ධනය උදෙසා රාජ්‍යයේ මැදිහත්වීම්

ඉහත විස්තර කළ පරිදි, කිසියම් ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස මෙන්ම විවිධ ප්‍රජාවන්හි ආගමික අදහස් හා අභිලාෂයන් ද ආරක්ෂා කිරීමට හෝ කඩ කිරීමට රාජ්‍යයේ ක්‍රියාකාරී වීම හෝ ක්‍රියාකාරී නොවීම දායක වී ඇත. ආගම් සහ ආගමික කණ්ඩායම්වලට බලපාන ගැටලු සඳහා විසඳුම් සැපයීමට, 'ආගම් වැරදි ලෙස අර්ථ නිරූපණය කිරීම' යනාදිය පදනම් කරගත් පනත් යෝජනා ගෙන ඒම ඇතුළු සැලසුම් සහගත උත්සාහයන් රාජ්‍යය විසින් දරා තිබේ. [1 වන පරිච්ඡේදය, 3.4 වන කොටස සහ 3 වන පරිච්ඡේදය, 5 වන කොටස]

මෙම වසර තුළ සිදුවූ අනෙකුත් සංවර්ධනයන් මගින් ද ආගමික ප්‍රජාවන්ට වන අකටයුතුකම්වලට පිළියම් යෙදීමට සහ ආගමික කණ්ඩායම්වලට එරෙහි ප්‍රචණ්ඩකාරී හා තර්ජනාත්මක සිදුවීම් කළමණාකරණය කිරීමට රාජ්‍යය විසින් සිදු කළ කැපවීම දැක්විය හැකිය. මෙහිදී සුවිශේෂී කරුණ වන්නේ, පාස්කු ඉරිදා ප්‍රහාරය සඳහා විශ්වසනීය විමර්ශනයක් වෙනුවෙන් කෙරෙන ඉල්ලීම් වෙතට ආණ්ඩුවෙන් ලැබෙන ප්‍රතිචාරය යි.

සිදුවීමට අදාළ විමර්ශනයන් හි ප්‍රගතියක් නොමැති වීම සලකමින් කතෝලික පල්ලිය විසින් ජාත්‍යන්තර විමර්ශනයක් ඉල්ලා සිටින අතරවාරයේ 2024 අප්‍රේල් මාසයේ දී මෙම ප්‍රහාරයේ පස් වන වර්ෂ පූර්ණය සපිරුණි. ප්‍රහාරය සිදු වුයේ ආණ්ඩුවේ වෙනසක් ඇති කරවීමේ අරමුණ සහිතව සැලසුම් කළ රහස් කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් වශයෙන් බව පුළුල් ව පිළිගැණෙන මතයකි. ප්‍රහාරය සම්බන්ධයෙන් සොයා බැලීමට පාර්ලිමේන්තුව තුළින් තෝරා පත් කළ කමිටුවක් මගින් සපයන ලද වාර්තාව මගින් ඇඟවුම් කළේ "ව්‍යසනකාරී වාතාවරණයක් නිර්මාණය කිරීමෙන් සහ අනිශ්චිතතාවයක් ඇති කර බිය ගැන්වීමෙන්" අනතුරුව "පාලන රෙජීමය වෙනස් කරගැනීමේ අවශ්‍යතාවය දක්වා යාම" අපේක්ෂා කළ පිරිස පිළිබඳව ය.[330]

ජනපති අනුර දිසානායක මහතා මේ බව පිළිගනිමින් පාස්කු ඉරිදා ප්‍රහාරයේ වින්දිතයන් සමග වූ හමුවක දී නවතම පරීක්ෂණයක් ආරම්භ කරන බවට පොරොන්දු වූ අතරම මෙරට දේශපාලනය "මෙතරම් දරුණු තත්වයකට ළඟා වී ඇත්නම්," එය වෙනස් කිරීමට කැපවෙන බව සඳහන් කළේ ය.[331]

රාජපක්ෂ සහ වික්‍රමසිංහ පාලන තන්ත්‍ර ද්විත්වයම යටතේ වරින් වර විමර්ශන ප්‍රමාද වූ අයුරු දුටු කතෝලික ප්‍රජාව ට දැන් නැවත වතාවක් නව ජනපතිවරයා වෙතින් ලැබෙන පොරොන්දුවලට ද සවන් දෙමින් සිටීමට සිදුව ඇත. සිත් තැවුල් පවතින නමුත්, ගරු රොහාන් සිල්වා පියතුමන් වැනි ප්‍රජාවේ නායකයන් "විමර්ශන නිවැරදි දිශාවට අනුකූලව සිදුවනු ඇති බවට" විශ්වාසය පළ කර ඇත.[332] දෙසැම්බර් මාසයේ දී මාධ්‍ය හමුවේ අදහස් දැක්වූ කතෝලික පල්ලියේ ප්‍රධානියා වන කාදිනල් මැල්කම් රංජිත් හිමිපාණන් ප්‍රකාශ කළේ "අපරාධකරුවන්ට නීතිය අනුව නිසි දඬුවම් හිමි වෙනු ඇතැයි බලාපොරොත්තු සහගතව" සිටින බවයි.[333]

330 ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, 2019 අප්‍රේල් 21 දින ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවල සිදුවූ ත්‍රස්තවාදී පහරදෑම් පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා සකස් කිරීම සඳහා පත්කළ පාර්ලිමේන්තු තේරීම් කමිටුවේ වාර්තාව, අංක 22403/21, (ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, 2029 ඔක්තෝබර් 23), පි. 1-5, https://www.parliament.lk/uploads/comreports/sc-april-attacks-report-en.pdf#page=1

331 "ජනාධිපතිතුමා පාස්කු ප්‍රහාරයෙන් පීඩාවට පත් වූ පිරිසට නීතියේ යටතේ යුක්තිය පොරොන්දු වේ", අද දෙරණ, 2024 ඔක්තෝබර් 6, http://www.adaderana.lk/news.php?nid=102485

332 පියතුමා රෝහාන් ද සිල්වා (අධ්‍යක්ෂ, සමාජය සහ ආගම් මධ්‍යස්ථානය) සමග සම්මුඛ ව්‍යාකූලය, සම්මුඛය කලේ ජෝවිටා අරුලනාන්දම්, 2024 නොවැම්බර් 27, කොළඹ

333 "පාස්කු ඉරිදා විමර්ශනය පිළිබඳව රජයට කාදිනල්තුමාගේ ප්‍රශංසාව", ඩේලි මිරර්, 2024 දෙසැම්බර් 19, https://www.dailymirror.lk/breaking-news/Cardinal-commends-Govt-over-Easter-Sunday-probe/108-298498

විමර්ශන මෙහෙයවූ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිපති ශානි අබේසේකර මහතා අපරාධ බුද්ධි තොරතුරු විශ්ලේෂණ හා වැළැක්වීම් අංශයේ අධ්‍යක්ෂවරයා ලෙස යළි තනතුරේ පිහිටුවීම තුළින් පාස්කු ඉරිදා ප්‍රහාරයට අදාළ විමර්ශනයේ ප්‍රධාන භූමිකාවක් පැවරීම ධනාත්මක වර්ධනයක් ලෙස කතෝලික ප්‍රජාව විසින් සලකනු ලබයි.[334]

ආගමික ප්‍රජාවන් උදෙසා රාජ්‍යයේ සහයෝගය හිමිවීමේ තවත් සලකුණක් ලෙස මෑතකදී හඳුන්වාදුන් ක්‍රියා පිළිවෙතක් නම් ඉස්ලාම් සහ ක්‍රිස්තියානි ආගම්වලට අයත් වන පූජා භූමි ඇතුළු වන්දනාමාන කරනු ලබන සියලු පූජනීය ස්ථාන වෙත රාජ්‍යය ආරක්ෂාව සැපයීමයි. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් අනතුරුව වඩාත් පුළුල් ලෙස ක්‍රියාවට නැංවෙන මෙම පියවර බෙහෙවින් අගය කෙරේ. මෙම වසරේදී ක්‍රිස්තියානි දින දර්ශනයට[335] අයත් වැදගත් දිනවල සියලු දේවස්ථාන වලට විශේෂ පොලිස් ආරක්ෂාව ලබා දීම නොකඩවා සිදු කෙරුණු අතර, රාමසාන් සමයේ මුස්ලිම් දේවස්ථාන වෙනුවෙන් ද මෙවැනිම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක විය.[336]

COVID-19 වසංගත කාල වකවානුව තුළ බලාත්මක කළ අනිවාර්ය ආදාහන ප්‍රතිපත්තිය හේතුවෙන් බලපෑමට ලක් වූ සියලුම ප්‍රජාවන් ගෙන් ආණ්ඩුව සමාව අයැද සිටි අතර, ඉතාමත් ප්‍රමාද වී සිදු කළ එම සමාව ගැනීම ප්‍රමාණවත් නොවුණත්, එමගින් ද මුස්ලිම් ප්‍රජාව කෙරෙහි සුහදතාවය ප්‍රකට කෙරිණි. එවකට ජනපති ව සිටි රනිල් වික්‍රමසිංහ වැඩි දුරටත් දැනුම් දුන්නේ භූමදානය, ආදාහනය හෝ වෛද්‍ය අධ්‍යයන ආයතන වලට මෘත ශරීර භාර දීම ට අවසර හිමිවෙන නීති සම්පාදනය කෙරෙමින් පවතින බවයි.[337] විශේෂඥ අදහස්වලට මෙන්ම මුස්ලිම්වරුන්ගේ ආගමික හැඟීම් වලට ද පටහැනි වෙමින් අනිවාර්ය ආදාහන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව ඇතිවූ මුස්ලිම් විරෝධී ආකල්ප වල ප්‍රතිඵලයක් වශයෙන් පිළිගැනුණි. වාර්තාගත අන්දමට, 2021 පෙබරවාරි මස භූමදානය කිරීමේ අවසරය ලැබීමට ප්‍රථමයෙන් COVID-19 වසංගතයේදී රෝගාතුර වී මිය ගිය මුස්ලිම්වරු 276 දෙනෙකුගේ සිරුරු ආදාහනය කර තිබිණි.[338] මීට අමතරව, නව අමාත්‍ය මණ්ඩලය තුළ මුස්ලිම් නියෝජනයක් රහිත වීම සම්බන්ධයෙන් නැගුණු විවේචන වලට ප්‍රතිචාර දැක්වීමක් ලෙස ප්‍රජාව සන්සුන් කිරීමට උත්සහ දරමින් රජය විසින් නියෝජ්‍ය කතානායක ධුරයට සහ නියෝජ්‍ය අමාත්‍ය ධුරයකට මුස්ලිම් නියෝජිතයන් පත් කෙරිණි.[339]

රට තුළ ඇතැම් සුළුතර ජන වාර්ගික-ආගමික කණ්ඩායම් සමඟ මතගැටුම් තිබියදී වුවද, ශ්‍රී ලංකාව සෑම විටම මෙරටට සංචාරය සඳහා පැමිණෙන බෞද්ධ නොවන ප්‍රජාවන් සාදරයෙන් මෙරටට පිළිගනු ලැබ තිබේ. [1 වන පරිච්ඡේදය, 4.3 වන කොටස] ජූලි මාසයේදී බෝරා ආගමික ප්‍රජාවට[340] අයත් සාමාජිකයන් 15,000 දෙනෙක් ඔවුන්ගේ අධ්‍යාත්මික සමුළුව හා වාර්ෂික සම්මේලනය වෙනුවෙන් දිවයින ට පැමිණියහ.[341] මෑත

334 “අත්දැකීම් සපිරූ විමර්ශක ශානි නැවත ශ්‍රී ලංකා පොලිසියට”, ඩේලි FT, 2024 ඔක්තෝබර් 11, https://www.ft.lk/front-page/Seasoned-investigator-Shani-returns-to-SL-Police/44-767819

335 “සුබ සිකුරාදා හා පාස්කු ඉරිදා සඳහා විශේෂ ආරක්ෂක සැලැස්මක්”, ඩේලි නිව්ස්, 2024 මාර්තු 27, https://www.dailynews.lk/2024/03/27/admin-catagories/breaking-news/468487/special-security-plan-for-good-friday-easter-sunday/

336 දර්ශන බාලසූරිය, “ඉදිරි ආගමික හා සංස්කෘතික අවස්ථාවන් සඳහා ආරක්ෂාව තර කරන්නැයි පොලිස්පතිතුමා උපදෙස් දෙයි”, ඩේලි මිරර්, 2024 අප්‍රේල් 10, https://www.dailymirror.lk/print/front-page/IGP-urges-heightened-security-for-upcoming-religious-and-cultural-events/238-280528

337 “කෝවිඩ් වසංගත සමයේ භූමදාන තහනම පිළිබඳව ජනාධිපතිතුමා සමාව ඉල්ලයි”, නියුස් ෆස්ට්, 2024 ජූනි 19, https://www.newsfirst.lk/2024/06/19/sri-lanka-president-apologizes-for-covid-burial-restrictions

338 “වසර තුනකට පසු රජය සමාව ඉදිරිපත් කරයි”, සිලෝන් ටුඩේ, 2024 ජූලි 24, https://ceylontoday.lk/2024/07/24/govt-extends-apology-after-three-years/

339 “පාර්ලිමේන්තු උප කථානායක ලෙස රිස්වී සාලි හිටපු මන්ත්‍රීවරයා තේරේ”, ඩේලි මිරර්, 2024 නොවැම්බර් 21, https://www.adaderana.lk/news.php?nid=103657; ජනාධිපති ලේකම් කාර්යාලය, “උප අමාත්‍යවරුන් නිල වශයෙන් දිවුරා සම්පත් වෙති”, 2024 නොවැම්බර් 21, https://www.presidentsoffice.gov.lk/deputy-ministers-officially-sworn-in/

340 මුස්ලිම් සමාජය අයත් ආගමික නිකායක්

341 “බෝරා සමාජයේ සාමාජිකයින් 15,000ක් ශ්‍රී ලංකාවේ රැස්වීමට සූදානම්”, ඩේලි මිරර්, 2024 ජූනි 26, https://www.dailymirror.lk/front-page/15-000-

වසර කිහිපය සලකන විට ශ්‍රී ලංකාව තුළ මෙය පැවැත්වුණේ හත්වන වරට වන අතර, නැවත නැවත සිදුවූ එම ඒකරාශි වීම් ඔවුන් මෙරටින් ලද ඉහළ පිළිගැනීමට සාක්ෂි දරයි.

මෙම පිළිගැනීම සංචාරක කර්මාන්තයේ උන්නතිය උදෙසා සිදු කෙරෙන්නක් වීමට බෙහෙවින් ඉඩ තිබුණද, එමඟින් විදෙස් සංචාරකයින්ගේ ආගමික අදහස් කෙරෙහි රාජ්‍යය සතු දැනුවත් භාවය පැහැදිලි වෙයි. කෙසේ නමුත් මෙම වෙසෙස් සැලකීම වෙනුවෙන් ඇතැම් විට රටේ දේශීය පුරවැසියන්ගේ වුවමනාවන් කැප කිරීමට සිදුවිය හැකිය. අම්පාර ප්‍රදේශයේ ජනප්‍රිය සංචාරක ගමනාන්තයක් වන, රළ මත නැඟී කරන පිහිනුම් ක්‍රීඩා සඳහා ප්‍රකට ආරුගම්බේ වෙරළෙහි මෑතකදී සිදුවූ ඊශ්‍රායල් සංචාරකයින් හා සබැඳි සිදුවීම් මෙයට නිදසුනකි.

ඔක්තෝබර් මාසයේදී, ඊශ්‍රායල් සංචාරකයින් වෙත ඇතිවීමට ඉඩ ඇති තර්ජනයක් පිළිබඳව ලැබුණු තොරතුරක් නිසා ආරක්ෂාව තර කරන ලද අතර සම්බන්ධීකාරක මෙහෙයුම් ඔස්සේ විදේශීය රාජතාන්ත්‍රික කාර්යාල මගින් සංචාරක අවවාද නිකුත් කිරීමත් සැකකරුවන් සය දෙනෙක් අත් අඩංගුවට ගැනීමත් සිදු විය. රජයේ නිලධාරීන් දැනුම් දුන්නේ ඔවුන්ගේ සොයාගැනීම් අනුව එය අන්තවාදී තත්වයක් නොව සංවිධානාත්මක අපරාධවලට සම්බන්ධ තත්වයක් යැයි පෙනීයන බවයි.[342]

ඊට පෙර වාර්තා වී තිබුණේ යුදෙව් සංචාරකයින් විසින් ආරුගම්බේ ප්‍රදේශයේ යාඥා කිරීමේ මධ්‍යස්ථාන ඉදි කරමින් සිටි බවයි. වන්දනාමාන කටයුතු සඳහා නව ස්ථාන පිහිටුවා ගැනීම සම්බන්ධයෙන් දේශීය ජනතාවට තදබල ලෙස බලපාන විධිමත් නියාමනයන් විදේශීය සංචාරකයින් සඳහා එතරම් දැඩිව බලපෑම් නොකරන බවක් මෙහිදී නිරීක්ෂණය විණි.[343] ආගම ඇදහීමට අදාළව විශේෂ සැලකිල්ලක්, අනුග්‍රහය දැක්වීමක් යුදෙව් සංචාරකයින්ට හිමිව ඇති බව පෙනෙන අතරම, ප්‍රදේශයේ වෙසෙන මුස්ලිම්වරුන් ඇතුළු බොහෝ ශ්‍රී ලාංකිකයන් විසින් ඊශ්‍රායලයේ සිදුවන යුධමය ක්‍රියාකාරකම් සහ ගාසා තීරයේ ජන සංහාරයට විරෝධය දක්වමින් හිඳින අවස්ථාවක ඔවුන්ගේ එම හැඟීම්වලට ගරු නොකිරීම ද කණගාටුවට කරුණක් විය.[344] බලපෑම් ඇති කරවනසුළු, ඊශ්‍රායල් සොල්දාදුවන් ගේ පින්තූර සහ හීබෘ කියමන් හා පාඨ මෙම පෙදෙසේ ඊශ්‍රායල් නවාතැන් හි බිත්තිවල අන්තර්ගත වූ බව වාර්තා මගින් විශේෂයෙන් සඳහන් කරයි.[345]

ශ්‍රී ලංකාවට පැමිණීම තෝරා ගනු ලබන විදෙස් ජාතීන් අයත් තවත් කාණ්ඩයක් නම් ආගමික ගැටුම්වලින් පීඩා විඳින්නන් ඇතුළු සරණක් බලාපොරොත්තුවෙන් සිටින අය සහ සරණාගතයන් වේ. පිටුවහල් කිරීම්, සතුරුකම් සහ ඔවුන්ට සහය දැක්වීමට ඇති නොකැමැත්ත වැනි හේතු නිසා, ශ්‍රී ලංකාව සෑම විටම ඔවුන් කෙරෙහි මිත්‍රශීලී පිළිගැනීමක් නොකළ ද, අනුප්‍රාප්තික ආණ්ඩු මගින් බොහෝ විට ඔවුන්ට තාවකාලිකව මෙරට නවාතැන් ගැනීමට ඉඩ දී තිබේ.[346] සරණාගතයන් සඳහා වන එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස් කාර්යාලයට

Bohra-community-members-set-to-gather-in-Sri-Lanka/238-285760

342 සුනිල් ජයසිරි, "අරුගම බේ සිද්ධිය අන්තවාදයක් නොව සංවිධානාත්මක අපරාධයක් ලෙස රජය පැහැදිලි කරයි", ඩේලි මිරර්, 2024 නොවැම්බර් 1, https://www.dailymirror.lk/breaking-news/Govt-clarifies-Arugam-Bay-incident-as-organized-crime-not-extremism/108-295001

343 ඩුලීප් ද චිකෙරා පූජකතුමා, "අරුගම බේ: සඟවා ඇති ජල ධාරා", ග්‍රවුන්ඩ්වීව්ස්, 2024 නොවැම්බර් 23, https://groundviews.org/2024/11/23/arugam-bay-hidden-currents/

344 එක්සත් ජාතීන්ගේ "පැලස්තීන ජනතාවගේ සහ අනුක්‍රමිකව අල්ලා ගත් අරාබි ජනතාවගේ මිනිස් අයිතීන්ට බලපාන ඉස්රායෙල් අධික්‍රමණ ක්‍රියාවලියන් පරීක්ෂා කිරීම සඳහා පත් කළ විශේෂ කමිටුව", ඉස්රායෙල් යුධ ක්‍රමය ගාසාහි වන්දිමය කටයුතු වලට (genocide) සමාන වන බවත්, ආහාර හිඟය යුධාංගයක් ලෙස භාවිතය ඇතුළත් බවත් වාර්තා කරයි, (එක්සත් ජාතීන්, 2024 නොවැම්බර් 14), https://www.ohchr.org/en/press-releases/2024/11/un-special-committee-finds-israels-warfare-methods-gaza-consistent-genocide; ඇම්නස්ටි ඉන්ටනැෂනල්, "ඇම්නස්ටි පරීක්ෂණය නිගමනය කරයි: ඉස්රායෙල් ගාසාහි පලස්තීන ජනතාවට එරෙහිව වන්දිමය ක්‍රියාවන් සිදු කරයි", 2024 දෙසැම්බර් 5, https://www.amnesty.org/en/latest/news/2024/12/amnesty-international-concludes-israel-is-committing-genocide-against-palestinians-in-gaza/

345 අමීන් ඉසදීන්, "ආරක්ෂක ඇඟවීම: දිස්වන්නේ ඉතා පොදු යැයි සිතන්න එපා", ඩේලි මිරර්, 2024 ඔක්තෝබර් 25, https://www.dailymirror.lk/opinion/Security-alert-More-to-it-than-meets-the-eye/172-294504

346 රුකි ප්‍රනාන්දු, "ආරක්ෂාවක් නැත: ශ්‍රී ලංකාවට රැඳී සිටින අවදානමක සරණාගතයන්ට සහ ආරක්ෂාව පතන අය වෙත කළ වගකීම් සපුරාලීමේදී අසාර්ථකයි",

අනුව, 2024 ජනවාරි 31 වනදා වන විට මෙරට තුළ ලියාපදිංචි සරණාගතයින් ගණන 311 ක් ද, ලියාපදිංචි වූ වාසස්ථානයක් අපේක්ෂිතව රැඳී සිටින්නන් ගණන 180 ක් ද වේ. මොවුන් අතරින් 105 දෙනෙක් රොහින්ග්‍යා සරණාගතයින් වන අතර සරණක් අපේක්ෂිත අයගෙන් බහුතරය අහමදියා මුස්ලිම් ප්‍රජාවට අයත් වේ. එනම් මේ සියල්ලන්ම ඔවුන්ගේ වාර්ගික-ආගමික අනන්‍යතාව මත පීඩාවන් ට ලක් කරනු ලැබූ අයයි.

මෙම වසර තුළ මෙම ජන කණ්ඩායම් වෙතට බලපාන අයුරින් සිදු කළ වැදගත් වෙනසක් නම් එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස් කාර්යාලය මගින් ශ්‍රී ලංකාව තුළ සිදු කෙරෙන මෙහෙයුම් නවතා දැමීම සිදු වනු ඇති බවට කළ නිවේදනයයි. එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස් කාර්යාලය දන්වන පරිදි, වාසස්ථානයක් අපේක්ෂිතව රැඳී සිටින, ලියාපදිංචි කළ 176 දෙනෙකු තෙවන රටක යළි පදිංචි කිරීමක් වෙනුවෙන් සලකා නොබැලෙන අතර බොහෝ විට 2024 දෙසැම්බර් මාසයෙන් පසුවද ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීමට ඔවුන්ට සිදු වනු ඇත. ඊට අමතරව, සරණාගත සහ සරණ අපේක්ෂිත යන දෙපිරිසටම ලැබෙමින් තිබූ මාසික ජීවනාධාර දීමනාව සහ අධ්‍යාපනික සහය තවදුරටත් ලබා නොදීමට කටයුතු කර ඇත.[347] දෙසැම්බර් මාසයේ දී රොහින්ග්‍යා ප්‍රජාවට අයිති කුඩා දරුවන් ද ඇතුළත් ව පුද්ගලයින් 116 ක පිරිසක් රැගත් බහු දින යාත්‍රාවක් මුලතිව් (උතුර) හි මුල්ලිවෙක්කාල් වෙරළට ගොඩ බැස ඇති අතර ඔවුන්ට යාමට අවැසි ව තිබුණු අවසන් ගමනාන්තය කුමක්දැයි යන්න නම් පැහැදිලි නැත.[348]

2024 ලෝක සරණාගත දිනය වෙනුවෙන් කළ ප්‍රකාශයක් මගින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව රජය වෙතින් ඉල්ලා සිටියේ සියලුම සරණාගතයන් සහ සරණක් බලාපොරොත්තුවෙන් රැඳී සිටින්නන් ගේ මානව හිමිකම් ආරක්ෂා වීම සහ ඉහළ නැංවීම තහවුරු කෙරෙන අන්දමේ පුළුල් ප්‍රතිපත්තියක් සකස් කරන ලෙසයි. එයින් ශ්‍රී ලංකාව වෙත සිහිපත් කරන ලද්දේ ජාත්‍යන්තර මානව හිමිකම් සම්මුති ගණනාවක් සඳහා ම තමන් නීතියෙන් බැඳී සිටින එවාට වගකිව යුතු පාර්ශ්වකරුවෙකු වන බවත් පීඩාවට පත් වුවන් රටින් පිට නොකිරීමේ ප්‍රතිපත්තියට එකඟ විය යුතු බවත් ය. 1951 සරණාගතයින්ගේ තත්වය හා සබැඳි ගිවිසුමට සහ එහි 1967 උප ගිවිසුමට අනුගත වෙමින් අවදානම් තත්වයක හිඳින්නන් වෙනත් ස්ථානයක වාසය සඳහා යොමු කරවීමෙන් වැළකීමට ඉන් රජය වෙතින් ඉල්ලා සිටින ලදී.[349]

මේ වන විට A ශ්‍රේණිය[350] වෙත උසස් කර ඇති ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ භූමිකාව ද කැපී පෙනේ. ඉහත සඳහන් අන්දමට මෙහිදී ඔවුන්ගේ මැදිහත් වීම තුළින් සහ මෙම පරිච්ඡේදය තුළ සාකච්ඡා වන අවස්ථාවන්ගෙන් පැහැදිලි වන පරිදිම ආගමක් ඇදහීමේ, විශ්වාස කිරීමේ නිදහස ප්‍රවර්ධනය කිරීමේදීත්, සිය ආගමික ප්‍රකාශනය හේතුවෙන් පීඩාවන්ට ඉලක්ක වෙන ප්‍රජාවන් ගේ ගැටලු වලට විසඳුම් සෙවීමේදීත් එය වැදගත් කාර්යයක් ඉටු කර ඇත. එම කාර්යක්ෂමතාව මගින් මෙම කාල සීමාව තුළ ස්වාධීන කමිටු සඳහා ද වඩා හොඳින් ක්‍රියා කළ හැකි සහයෝගී වටපිටාවක් ගොඩනැගෙන බව තහවුරු කරනු ලබයි.

2024 ජූනි 20, https://groundviews.org/2024/06/20/sri-lanka-falls-short-in-its-responsibilities-towards-refugees-and-asylum-seekers/#:~:text=In%20 2023%2C%20the%20number%20of,Bangladesh%20(about%201%20million)

347 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, "ලෝක සරණාගත දිනය 2024 සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මිනිස් හිමිකම් කොමිෂන් සභාවේ නිවේදනය", 2024 ජූනි 20, https://www.hrcsl.lk/wp-content/uploads/2024/06/HRCSL-Statement-on-World-Refugee-Day-2024.pdf

348 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, මුලතිව්හි රඳවා ඇති රෝහින්ග්‍යා සරණාගතයන්ගේ තත්වය සහ අදාළ අනෙකුත් ගැටලු පිළිබඳ වාර්තාව, (ශ්‍රී ලංකා මිනිස් හිමිකම් කොමිෂන් සභාව, 2025 ජනවාරි), https://www.hrcsl.lk/wp-content/uploads/2025/01/HRCSL-Report-on-Rohingya-Asylum-Seekers_January-2025.pdf

349 එම

350 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, "GANHRI අනුමාන කාරක සභාව ශ්‍රී ලංකා මිනිස් හිමිකම් කොමිෂන් සභාවට 'A' තත්ත්වය නැවත ලබාදීමට නිර්දේශ කරයි", 2024 මැයි 14, https://www.hrcsl.lk/ganhri-sub-committee-on-accreditation-recommends-that-hrcsl-be-reaccredited-with-a-status/

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආගම් හතර නියෝජනය කරන රාජ්‍ය ආයතන බුද්ධ ශාසන අමාත්‍යංශය යටතේ එකිනෙකින් වෙන්ව ක්‍රියාකාරී වෙමින් පවතී. ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි එවන්ජලික සංගමය වැනි ආගමික ඇදහීම් හා සබැඳි ආයතන අවධාරණය කරන්නේ ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුව විසින් කතෝලික පල්ලිය සහ ජාතික ක්‍රිස්තියානි කවුන්සිලය මගින් නියෝජනය කෙරෙන ප්‍රධාන ධාරාවේ දේවස්ථාන හඳුනාගන්නා නමුත් එයට එවන්ජලික පල්ලි සහ ස්වාධීන පල්ලි කෙරෙහි හැඳිනීමක් නොමැති බවයි. මෙම නොසලකා හැරීම හේතුවෙන් එකී දේවස්ථාන වලට මුහුණදීමට සිදුව ඇති ගැටලු කිහිපයක් ඔවුන් විසින් පෙන්වා දෙනු ලැබේ. නිදසුනක් ලෙස ක්‍රිස්තියානි ගුරු පත්වීම් සහ මිෂනාරි වීසා අනුමත කිරීම් යනාදී ප්‍රශ්න සම්බන්ධයෙන්, එය එවන්ජලික පිරිස් වලට අදාළ වන විට පවා ආණ්ඩුව විසින් ජාතික ක්‍රිස්තියානි කවුන්සිලයේ අනුමැතිය ඉල්ලා සිටියි. එහි ප්‍රතිඵලය වී ඇත්තේ අනුමැතිය ලැබීමට කල් ගත වීම හෝ ඊට බාධා වීමයි. අනු ශාඛා හෝ නිකායයන් ගණනාවක් පවතින අනෙකුත් ආගමික කණ්ඩායම් වෙත කොතෙක් දුරකට මෙම ගැටලුව පැතිරී ඇත්ද යන්න අපැහැදිලි කරුණකි.

නව අමාත්‍යවරයා ලෙස ඇමති විදුර වික්‍රමනායකගේ ස්ථානය භාර ගනු ලැබුවේ සමාජ විද්‍යා හා ජාතික භාෂාමය පසුබිමක් සහිත අධ්‍යාපනවේදියෙක් වන මහාචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි විසිනි. 2022- 2024 සැප්තැම්බර් කාල වකවානුව තුළ අමාත්‍ය ධුරය දැරූ වික්‍රමනායක මහතා උතුර සහ නැගෙනහිර ප්‍රදේශවල පුරාවිද්‍යා කැණීම් කටයුතු සිදු කිරීමට අදාළ ක්‍රියාකාරකම් ඇතුළුව බෞද්ධයන්ට පක්ෂපාතී වන අන්දමට ප්‍රතිපත්ති ගෙන ඒමේ සහ ක්‍රියාවට නැංවීමේ ප්‍රමුඛයෙක් ලෙස ප්‍රකට ය. ජ්‍යෙෂ්ඨ නායකත්වයේ සිදු වූ මෙම වෙනස මගින් කාලාන්තරයක් තිස්සේ විසඳුම් නොලැබී අමාත්‍යංශයේ අවධානයට ලක් වීම අවශ්‍යව පැවති ආගමක් ඇදහීමේ, විශ්වාස කිරීමේ නිදහස හා සබැඳි ගැටලු විසඳා ගැනීමට අවස්ථාව සැපයෙනු ඇත. [නිර්දේශ බලන්න]

# ලකුණු රැස් කිරීම සහ RAG ශ්‍රේණිගත කිරීම

සෑම උප දර්ශකයක්ම 1-10 පරිමාණයක් තුළ ශ්‍රේණිගත කර ඇත. එක් එක් ප්‍රධාන දර්ශකය සඳහා ලකුණු තීරණය කරනු ලබන්නේ එකතු කරන ලද ලකුණුවල සාමාන්‍ය අගයෙනි. [වැඩිදුර විස්තර සඳහා, 2 වන කොටසේ 'දර්ශක සහ ලකුණු කිරීම/පර්යේෂණ ක්‍රමවේදය' බලන්න]

| සුචකය | ලකුණු | තර්කය | RAG ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| **සුචකය 1: සංස්කෘතික හා උරුම ස්ථාන සංරක්ෂණය කිරීම සහ මතභේදාත්මක ස්ථානවල ආගමික නිදහස ආරක්ෂා කිරීම.** | | | |
| 1. සංස්කෘතික හා පෞරාණික උරුම ස්ථාන එක හා සමානව සංරක්ෂණය කර තිබේද? | 4 | සාක්ෂි [1 සහ 2 වන කොටස] මගින් පැහැදිලි වන්නේ බෞද්ධ උරුම ස්ථාන සඳහා ප්‍රමුඛතාවය ලැබෙන අතර බෞද්ධ නොවන ප්‍රජාවන් හා සම්බන්ධ ස්ථාන නොසලකා හැරෙන බවයි. පෞරාණික උරුම සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී ජනවාර්ගික-ආගමික නියෝජනය දුර්වල වීමෙන් ද මෙය පැහැදිලි වේ.<br><br>ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බුද්ධාගමට සහ 'බුද්ධ ශාසනයට' ප්‍රමුඛත්වය දී ඇති අතර බෞද්ධ උරුම ස්ථාන සංරක්ෂණය කිරීමේ වැදගත්කම පිළිබඳ එමගින් පැහැදිලි වේ. කෙසේ නමුත්, ශ්‍රී ලංකාවේ 'සම්පූර්ණ පුරාවිද්‍යාත්මක උරුමය' ආරක්ෂා කිරීමේ වගකීම විශේෂයෙන්ම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට පැවරී ඇති බැවින්, බෞද්ධ නොවන ස්ථාන නොසලකා හැරීම පිළිබඳ එයින් පැහැදිලි කිරීමක් සිදු නොවේ. | |
| 2. සංස්කෘතික හා පෞරාණික උරුම ස්ථාන ආරක්ෂා කිරීම සඳහා රජයේ නීති සහ රෙගුලාසි සමානව ක්‍රියාත්මක වේද? | 3 | විස්තර කර ඇති පරිදි [2 වන කොටස], පුරාවස්තු පනත අසමාන ලෙස බලාත්මක කර, වාර්ගික-ජාතිකවාදී න්‍යාය පත්‍රයකට සහාය දැක්වීම සඳහා එය භාවිත වන බව වටහාගෙන ඇත. අධිකරණ නියෝග වලට මෙන්ම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින්ම තහනම් කරන ලද රෙගුලාසි වලට ද විරුද්ධව කටයුතු කරමින් උරුම ස්ථාන ලෙස නම් කරන ලද ප්‍රදේශවල නව ව්‍යුහයන් ඉදිකිරීමට අවසර දීම මෙයට ඇතුළත් වේ. කෙසේ වෙතත්, සුළුතර ආගමික කණ්ඩායම් හි වැඳුම් පිදුම් කටයුතු අවහිර කිරීම සඳහා ද එකී රෙගුලාසිම භාවිතා කර ඇත.<br><br>කෙසේ නමුත්, මෙම වසර තුළ එම තත්වයේ යම් දියුණුවක් ඇති වී තිබේ. ප්‍රශ්නකාරී කටයුතු සඳහා ඉහළ නායකත්වයෙන් පැහැදිලි සහයෝගයක්, අනුබලයක් නොලැබීම සහ ඉඩම් නිදහස් කිරීම සම්බන්ධයෙන් නව ජනාධිපතිවරයා ගෙන් ලැබුණු වාචික පොරොන්දු ආදිය මෙයට ඇතුළත් වේ. | |

| | | | |
|---|---|---|---|
| 3. අක්‍රමවත් හෝ නීති විරෝධී තත්වයන් යටතේ අනිසි ලෙස ආගමික සංකේත ප්‍රදර්ශනය කරවීම ද ඇතුළුව අදාළ ආගමික ස්ථානවල ආගමික නිදහස උල්ලංඝනය කිරීම් පිළිබඳ සාක්ෂි තිබේද ? | 3 | උදාහරණ මගින් [2 වන කොටස] පෙනී යන්නේ, විශේෂයෙන් බෞද්ධ නොවන ප්‍රජාව වැඩි වශයෙන් වෙසෙන ප්‍රදේශවල සාමාන්‍ය නොවන ආකාරයට බෞද්ධ සංකේත ප්‍රදර්ශනය සිදුවන බවයි. සලකා බැලෙන අනෙක් ආගමික ස්ථානවල, සුළුතර ප්‍රජාවන්ගේ වන්දනාමාන කටයුතු සහ ආගමික ස්ථානවලට ප්‍රවේශ වීම අවහිර කිරීම සඳහා රෙගුලාසි භාවිතා කර ඇත.<br><br>උතුරේ සිදු වූ ධනාත්මක වෙනස් කමක් නම්, උතුරේ හමුදාව විසින් අත්පත් කරගෙන ඇති ඉඩම්වල පිහිටි කෝවිල්වලට හින්දු බැතිමතුන් හට, කොන්දේසි සහිත ව ප්‍රවේශ වීමේ අවසරය ලබා දීමයි. | |
| 4. යම් ප්‍රදේශයක ජනවාර්ගික සංයුතිය වෙනස් කිරීම සඳහා රජය විසින් මුල්‍යමය වෙනත් ආකාරයේ දිරිගැන්වීම් ලබා දී තිබේද? | 4 | ත්‍රිකුණාමලය, කුච්චවේලි කොට්ඨාශයේ බෞද්ධ විහාරස්ථාන 32 ක් ඉදිකිරීම වැනි ව්‍යාපෘති ජනගහන විකාශනයේ වෙනස්කම් වලට හේතුවක් වීම සම්බන්ධයෙන් ගැටලුවක් ඇත. සංවර්ධන කටයුතු සඳහා මෙය ගැටලුවක් වුවද, මෙම පර්යේෂණයට අදාළ සාක්ෂි මගින් ප්‍රදේශයේ ජනවාර්ගික සංයුතිය වෙනස් කිරීම සඳහා රජයෙන් දිරිගැන්වීම් ලැබෙන බවක් තහවුරු නොකරයි. | |
| **සුචකය 2: ආගමික නිදහස සහ වාර්ගික ආගමික ප්‍රජාවන් සඳහා වැදගත් වන නීති සහ රෙගුලාසි බලාත්මක කිරීම.** | | | |
| 1. ආගමික නිදහස සහ වාර්ගික ආගමික කණ්ඩායම්වල අවශ්‍යතාවන්ට ආරක්ෂාව හිමි වන නීති සමානව ක්‍රියාත්මක කර තිබේද? | 5 | මෑත කාලීන සිදුවීම් [3 වන වගන්තිය] මගින් පෙන්නුම් කරන්නේ ආගමික නිදහස ට අදාළ නීති අසමාන ලෙස ක්‍රියාත්මක කර ඇති බවයි. බෞද්ධ ආගමික කාරණා සම්බන්ධයෙන් ගැටලු ඇති වන විට පුරවැසි හා දේශපාලන අයිතිවාසිකම් සම්බන්ධ ජාත්‍යන්තර පොරොන්දුව (ICCPR) භාවිතා කිරීමට සූදානමක් ඇති නමුත් අනෙකුත් ජනවාර්ගික- ආගමික කණ්ඩායම්වල අවශ්‍යතා වෙනුවෙන් එසේ ක්‍රියා කිරීමට මැලිකමක් දැක්වීම එවැනි තත්වයකි. රාජ්‍යයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවන සිදුවීම් සහ ක්‍රියාකාරකම් සඳහා ද ICCPR වැරදි ලෙස භාවිත කර ඇත.<br><br>කෙසේ වෙතත්, 2024 දී ප්‍රහසන ශිල්පී නතාෂා එදිරිසූරියගේ සිදුවීමේ දී ඇයව නිදොස් කොට නිදහස් කිරීම පිළිගත හැකි වර්ධනයකි. නීතිය වැරදි ලෙස යොදවා ඇති අවස්ථා වලදී මැදිහත් වෙමින් මානව හිමිකම් කොමිසම ද ඵලදායී කාර්යභාරයක් ඉටු කර ඇත. | |

| | | | |
|---|---|---|---|
| 2. ආගමික ස්ථාන සහ ආගම් පදනම් කරගත් මානුෂීය සංවිධාන ඇතුළු ආයතන නිදහසේ ක්‍රියාත්මක වී තිබේද? | 6 | පූජනීය ආගමික ස්ථාන සම්බන්ධයෙන් නීති ක්‍රියාත්මක කිරීමේදී විශේෂයෙන් එවන්ජලික දේවස්ථාන වැනි සුළුතර කණ්ඩායම් සඳහා අසමාන හෝ වෙනස් ලෙස එම නීති බලපා ඇති බව ඇතැම් සිදුවීම් මගින් පෙනී යයි. [4.1 සහ 4.2 වන කාණ්ඩ].<br><br>ආගමික සංවිධාන මගින් වාර්තා කරන්නේ වඩා වෙනස් තත්වයකි. ආගමික සහජීවනය සම්බන්ධව සලකන විට ප්‍රාදේශීය බලධාරීන් ගෙන් ලැබෙන සහය සහ අවට සමාජයේ තත්වයේ වර්ධනය වීමක් වාර්තා වේ. නමුත් ආගමික නිදහස ට අදාළ ව කටයුතු කිරීමේදී යම් ආකාරයක තර්ජන හෝ බියගැන්වීම්, අධෛර්‍යමත් කිරීම් වලට මුහුණ දීමට සිදු වේ. [4.3 කොටස]. | |
| 3. ජනවාර්ගික-ආගමික කණ්ඩායම් අතර සම්පත් සමානව බෙදා හැර තිබේද? | 5 | නැගෙනහිර පළාතේ ඇතැම් ප්‍රදේශ සඳහා සම්පත් වෙන් කිරීමේදී පක්ෂග්‍රාහීත්වයක් පෙන්නුම් කරන බව පර්යේෂණවලින් පෙන්වා දී ඇත. 2024 උතුරු පළාත් සභා සමීක්ෂණ ප්‍රතිඵල මගින් මේ පිළිබඳව යම් අවබෝධයක් ලබා දී ඇතත් එම තත්වය ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රදේශ වල කෙතරම් දුරට දක්නට ලැබේද යන්න පැහැදිලි නැත [4.5 වන කොටස]. | |
| 4. ආගමික කණ්ඩායම් අතර ආරවුල් වලදී නීතිය එක හා සමානව ක්‍රියාත්මක වී තිබේද, බිය ගැන්වීම් සහ ප්‍රචණ්ඩත්වය සඳහා රාජ්‍ය මැදිහත්වීමක් ඇති බවට සාක්ෂි තිබේද? | 4 | පවතින දත්ත වලට අනුව, ප්‍රජාව තුළ ජනවාර්ගික ආගමික කණ්ඩායම් අතර ආරවුල් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමේදී මිශ්‍ර හැසිරීම් රටා පෙන්නුම් කරයි. සමහර සිදුවීම් මගින් පොලිසියේ ඵලදායී මැදිහත්වීම් සහ සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කිරීම හෙළි කරන අතර තව සමහර සිදුවීම් මගින් දුර්වල හැසිරීම් පෙන්වයි. [4.4 වන කොටස] | |

| සූචකය 3: ආගමික කණ්ඩායම් සහ අදේවවාදීන් ට වෙනස් කොට සැලකීම, අන්තවාදී අදහස්, බිය ගැන්වීම සහ ප්‍රචණ්ඩත්වය වැනි වැරදි සහගත හැසිරීම් පවත්වාගනීම සඳහා රාජ්‍ය ක්‍රියාකාරීන් හෝ දේශපාලනික කණ්ඩායම් වල සහභාගීත්වය | | | |
|---|---|---|---|
| 1. දැඩි මතධාරී දේශපාලන-ආගමික කණ්ඩායම් විසින් අනෙක් ආගම් නොඉවසීම සහ ආධානග්‍රාහීත්වය ප්‍රවර්ධනය කරන බවට සාක්ෂි තිබේද? | 6 | බෞද්ධ දැඩි මතධාරී කණ්ඩායම් හා සම්බන්ධ සිදුවීම් අඩු වී ඇති අතර, උතුරු හා නැගෙනහිර හින්දු දැඩි මතධාරී කණ්ඩායම් හා සම්බන්ධ සිදුවීම්වල සැලකිය යුතු වැඩිවීමක් දක්නට ලැබේ. සතුටුදායක ලෙස, හින්දු අනන්‍යතාවය වටා ඒකරාශී වීමට දමිළ දේශපාලන පක්ෂ වලින් එල්ල කළ දැඩි බලපෑම සහ දේශපාලන පරිසරය නිසා එම පක්ෂ කෙරෙහි ප්‍රජාව තුළ වූ ආකර්ෂණයේ අඩුවීමක් පෙනේ.<br><br>කෙසේ වෙතත්, රාජ්‍යයට හෝ බෞද්ධ අවශ්‍යතාවලට තර්ජනයක් වන ක්‍රියාකාරකම්වලට එරෙහිව බලධාරීන් මැදිහත් වී ඇති බවක් පෙනෙන්නට තිබුණද මුස්ලිම්වරුන්ට සහ ක්‍රිස්තියානීන්ට එරෙහිව සිදුවන එවැනිම ක්‍රියාකාරකම් වෙනුවෙන් කිසිදු පියවරක් ගෙන නොමැත. ප්‍රජාවට බලපාන එවැනි ගැටළු විසඳීම සඳහා රජය විසින් හින්දු නායකත්වය එලදායී ලෙස සම්බන්ධ කර නොගැනීම ද ගැටලුවක් වී ඇත. [5 වන කොටස]. | |
| 2. ආගමික ප්‍රකාශනය සහ සංස්කෘතික සලකුණු ප්‍රදර්ශනය කිරීම සඳහා සීමාවන් පනවා තිබේද? | 6 | මුස්ලිම්වරුන්ගේ ආගමික ප්‍රකාශනය ඉලක්ක කර ගනිමින් දැඩි මතධාරී කණ්ඩායම් සහ රජය විසින් මෙහෙයවන ලද ක්‍රමානුකූල ව්‍යාපාර සැලකිය යුතු ලෙස ලිහිල් වී ඇත. කෙසේ වෙතත්, හිස් ආවරණ කේන්ද්‍ර කරගත් සිදුවීම්වලින් හෙළි වන්නේ රාජ්‍ය අංශයේ ඇතැම් කොටස්වල මුල් බැසගත් පක්ෂග්‍රාහීත්වයන් පවතින බවයි. එමෙන්ම, මුස්ලිම් ප්‍රජාව කොන් කරනු ලබන, පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව හඳුන්වා දුන් සමහර පියවර තවමත් ක්‍රියාත්මක වේ. [6 වන කොටස]. | |
| 3. දේශපාලන ප්‍රචාරක කටයුතු සහ මැතිවරණවලදී ආගමික ප්‍රකාශ භාවිතා කර තිබේද? | 8 | මැතිවරණ ප්‍රචාරක කටයුතු අතරතුර, විශේෂයෙන් කලාපීය මට්ටමින් හානිකර ආගමික ප්‍රකාශ පිළිබඳ වාර්තා කිහිපයක් තිබුණද, පොදුවේ ඒවායේ සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබේ. එසේම, මැතිවරණ කොමිසම විසින් ඉදිරිපත් කරන ලද නව රෙගුලාසි ද සැලකිල්ලට ගත යුතු ය. [7 වන කොටස]. | |

| සුචකය 4: ආගමික ප්‍රජාවන්ගේ අවශ්‍යතා සඳහා සහාය වීම හෝ ආගමික නිදහස සම්බන්ධ කරුණු ආමන්ත්‍රණය කිරීම සඳහා රාජ්‍යය විසින් මුලිකත්වය ගැනීම් | | | |
|---|---|---|---|
| 1. ආගමික ප්‍රජාවන්ට වැදගත් වන මුලපිරීම් සහ ඉල්ලීම් සම්බන්ධයෙන් ප්‍රගතියක් තිබේද? | 5 | ජනවාර්ගික ආගමික කණ්ඩායම් විසින් ඉස්මතු කරන ලද ප්‍රධාන ගැටලු අතර, දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවන්ට බලපාන උතුරු හා නැගෙනහිර ගැටුම්කාරී ආගමික ස්ථාන සම්බන්ධ ගැටලු ද පවතී.<br>මෙම ප්‍රශ්න විසඳීමට පැහැදිලි උනන්දුවක් නොපෙන්වන නමුත්, පාස්කු ඉරිදා ප්‍රහාරය [8 වන කොටස] සම්බන්ධයෙන් විශ්වසනීය පරීක්ෂණයක් පැවැත්වීමේදී රජය යම් අවංකභාවයක් පෙන්නුම් කර ඇත. | |
| 2. ආගමික නිදහස ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ දෙපාර්තමේන්තු සහ ස්වාධීන කොමිෂන් සභා කෙතරම් හොඳින් ක්‍රියා කර තිබේද? | 5 | ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආගමික කණ්ඩායම් වෙත රජයේ යාන්ත්‍රණයන් හරහා නිල වශයෙන් පිළිගැනීම සහ සහයෝගය හිමි වුවද, කුඩා නිකායන් සඳහා රජයේ පිළිගැනීමක නොමැතිකම ගැටලුවක් වන අතර ඒ හේතුවෙන් ඔවුන් කොන් කිරීමට ද ලක් ව ඇත.<br>ඒ හැර, ජනපති විසින් පත් කරන මානව හිමිකම් කොමිසම වැනි ස්වාධීන කොමිෂන් සභා ආගමික නිදහස ට අදාළ කාරණා සම්බන්ධයෙන් ඵලදායී ලෙස මැදිහත් වී ඇති බව පෙනේ. [3, 6 සහ 8 වන කාණ්ඩ]. | |
| 3. ජනවාර්ගික ආගමික කණ්ඩායමක් ලෙස පැහැදිලිව හඳුනා ගන්නා විදේශිකයන් රාජ්‍යය මගින් කෙතරම් හොඳින් පිළිගෙන තිබේද? | 6 | පැහැදිලි ආගමික අනන්‍යතාවක් සහිත විදේශීය සංචාරකයින් පිළිගැනීමේදී ශ්‍රී ලංකාව බොහෝ දුරට හොඳින් කටයුතු කර ඇතත්, සරණාගතයින් සහ සරණක් අපේක්ෂාවෙන් පැමිණෙන්නන් පිළිබඳ සලකා බැලීමේදී එය ප්‍රමාණවත් නොවන අගයකි. [8 වන කොටස]. | |



## 3 වන පරිච්ඡේදය

# ප්‍රජාව සහ සංස්කෘතිය

ප්‍රජාවක් ලෙස, සහ පෞද්ගලික මට්ටමින් ආගමික නිදහස සම්බන්ධයෙන් දක්වන ප්‍රතිචාරය කෙරෙහි බලපාන සාමූහික සබඳකම්, ආගමික ක්‍රියාකාරකම් සහ විශ්වාසයන් වල ප්‍රවණතා

## සොයාගත් ප්‍රධාන කරුණු

- පූජනීය ස්ථාන වල කෙරෙන ක්‍රියාකාරකම් හෝ ආගමික කටයුතු කෙරෙහි ප්‍රජාව වෙතින් පැන නගින විරෝධී බව අසමානුපාතික අයුරින් එවන්ජලික හෝ ස්වාධීන දේවස්ථාන වෙතට පමණක් ඉලක්ක කෙරෙන බව පෙනී යයි. පරිවර්තනයට ලක්වීම කෙරෙහි වන මුල් බැසගත් බිය සහ බහුතර බලය පිළිබඳ හැඟීම මගින් මෙම ප්‍රතිරෝධය වර්ධනය වීම සිදුවේ.
- වෙනස් වීමට එරෙහි වීමට සංස්කෘතිකමය සහ සමාජයීය වශයෙන් ඇති නැඹුරුතාවය ද, එමෙන්ම ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ, ආගම ප්‍රචාරය කිරීම සම්බන්ධයෙන් පවතින සීමාවන් ද මගින් සිය ආගමික විශ්වාසය අනුව එම දහම අන් අය හා බෙදා ගැනීම අත්‍යවශ්‍ය වන ආගමික කණ්ඩායම් වෙත බලපෑම් කෙරේ.
- වෙනස් වීමට එරෙහි වීමට සංස්කෘතිකමය සහ සමාජයීය වශයෙන් ඇති නැඹුරුතාවය ද, එමෙන්ම ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ, ආගම ප්‍රචාරය කිරීම සම්බන්ධයෙන් පවතින සීමාවන් ද මගින් සිය ආගමික විශ්වාසය අනුව එම දහම අන් අය හා බෙදා ගැනීම අත්‍යවශ්‍ය වන ආගමික කණ්ඩායම් වෙත බලපෑම් කෙරේ.
- විවිධත්වය නොඉවසීම පෝෂණය කෙරෙන අන්දමේ අදහස් දැක්වීම ප්‍රධාන ධාරාවේ ආගමික ආයතන වලින් නොකඩවා සිදු වේ. LGBTQI+ සමාජභාවී පුද්ගලයින් කොන් කිරීමට ලක්වන යල් පැනගිය නීති ප්‍රතිසම්පාදනය කිරීමේදී ඊට එරෙහිව නැගෙන විරෝධය මෙයට උදාහරණයකි.
- මතභේදාත්මක ස්ව-නිර්මිත ධර්ම දේශකයන් ගේ පැවැත්ම ඔවුන් පාලනය කිරීම සඳහා නව නීති ගෙන ඒමේ අවශ්‍යතාවය ඇති කරන අතරම, එම ගැටලුකාරී තත්ව විසඳීමට මැදිහත්වීම්, විවාද සහ සාකච්ඡා සඳහා ඉල්ලීම් ද මතු කරයි.

වාර්ගික ආගමික කණ්ඩායම් අතර පවතින ඇඳිහිලි, ක්‍රියාකාරකම් මගින් ආගම් ඇදහීමේ සහ විශ්වාස කිරීමේ නිදහස සඳහා වන ප්‍රවේශය සකස් වීමත්, ප්‍රජා මට්ටමේදී මෙන්ම පෞද්ගලික මට්ටමෙන් ද සාමූහික සබඳකම් වලට බලපෑම් ඇතිවීමත් සිදු වේ.

මේ අතර අලුතෙන්ම ඇතිවූ සහ වර්ධනය වෙමින් පවතින ඇතැම් ප්‍රවණතා මගින් සතුරුකම් හට ගන්වමින් ආගම් ආගම් අතර සහ එකම ආගම තුළම අර්බුදකාරී තත්ව වලට මඟ පාදා තිබේ. එලෙසම, ගෝලීය ආගමික ධුරාවලි මගින් විවිධත්වයට වඩාත් ඉඩ සැලසෙන සහ සියල්ලන් අන්තර්ගත කර ගැනෙන ප්‍රවේශයන්හි අවශ්‍යතාවය පිළිබඳ සලකා බැලෙන වටපිටාවක එය නොතකමින් ප්‍රධාන ධාරාවේ ආගමික කණ්ඩායම් විසින් පූර්ව විනිශ්චයන් මත කටයුතු කරමින් ස්ත්‍රී පුරුෂ බව පිළිබඳ ගැටලුව වැනි කාරණා හමුවේ විවිධත්වයට ගරු නොකිරීම සහ අන් මත නොඉවසීම ප්‍රවර්ධනය කරනු ලබයි.

කෙසේ වෙතත්, ආගමික මූලධර්ම සංකලනය සහ ආගමික කණ්ඩායම් අතර සහයෝගීතාව පිළිබඳ සාක්ෂ්‍ය මගින් ආගමික සහජීවනය ඇති කිරීමට පවතින හැකියාව පෙන්වා දෙන අතරම, නව නීති ඇති කිරීමටත් වඩා, වාද විවාද හා සංවාද පැවැත්වීමට ඉඩ ලැබෙන සම්මේලන ආදියේදී ආගමික නිදහස සම්බන්ධ මතභේදාත්මක ප්‍රශ්න පිළිබඳ සාකච්ඡාවට ගැනීම සාර්ථක ලෙස සිදු කළ හැකි ය.

# 1. කලාපීය බහුතර බලය, සාමූහික සබඳතා සහ ආගමික නිදහස

2 වන පරිච්ඡේදයේ දී සාකච්ඡා කළ පරිදි ප්‍රාදේශීය බලධාරීන් බොහෝ විට අදාළ කලාපයේ බහුතර පිරිසට පක්ෂපාතීව කටයුතු කරන බැවින් එහි ප්‍රතිඵලයක් ලෙස සංඛ්‍යාත්මකව ශක්තිමත් නොවන ආගමික කණ්ඩායම් කොන් කිරීමට ලක් වන අන්දමේ සිදුවීම් වාර්තා වේ.ප්‍රජාව කෙරෙන් මතු වන විරෝධය සලකන විට, ආගමික ක්‍රියාකාරකම් හෝ වන්දනාමාන කරන ස්ථානයන්හි සිදුවන ක්‍රියාවන් හා සබැඳි ගැටලුකාරී තත්ව වලට අසමානුපාතික අයුරින් එවන්ජලික දේවස්ථාන හෝ ස්වාධීන දේවස්ථාන ඉලක්ක වී ඇති බව දත්ත මගින් පෙන්වා දෙයි. එකම වර්ගයකට අයත් වාර්ගික ආගමික කණ්ඩායමක පිරිස් වාසය කරන පෙදෙස් වල වඩාත් ම මෙසේ ගැටලු ඇතිවීමට ඉලක්කය වී ඇත්තේ එවන්ජලික දේවස්ථාන බව පෙනේ. එයට දකුණු ප්‍රදේශයේ, ජන කණ්ඩායමේ බහුතරය ලෙස බෞද්ධ ජනයා ජීවත් වන පෙදෙස් ද, නැගෙනහිර හින්දු හෝ කතෝලික ප්‍රජාව බහුතරය නියෝජනය කරන පෙදෙස් ද අයත් ය. (2 වන පරිච්ඡේදය, 4 වන කොටස බලන්න)

එවන්ජලික ප්‍රජාව අරමුණු කරගෙන මෙසේ සිදු කෙරෙන දෑ සඳහා බලපා ඇති සාධක සාකච්ඡා කරන ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි එවන්ජලික සංගමය දක්වන අදහස නම්, ප්‍රදේශයේ වෙසෙන ප්‍රජාව තුළ මෙම අනෙක් කොටස 'පිටස්තරයින්' වශයෙන් සැලකීම නිසාවෙන් ඔවුන්ට එරෙහිව එම විරෝධී බව හටගෙන ඇති බවයි. මේ අදහස ම සනාථ වන අයුරින් මඩකලපුව ප්‍රදේශයේ සිදු කළ සොයා බැලීම් මගින් අවධාරණය කෙරුණේ ආගමික කණ්ඩායම් වෙත එල්ල වන ප්‍රහාර සහ තර්ජනාත්මක සිදුවීම් වල යම් 'ප්‍රාදේශික වාදයක' රටාවක් පවතින බවයි.[351] මෙම සිදුවීම් වල ස්වභාවය මගින් ද හෙළි වූයේ සමාජයේ ප්‍රමුඛස්ථානය අහිමි වනු ඇතැයි යන බිය සහ ආගමික පරිවර්තන හේතුවෙන් සිය සාමාජිකයින් සංඛ්‍යාව අඩු වී යාම ගැන මුල් බැසගත් බිය මෙහිදී එක්ව ක්‍රියා කරන බවයි.

## 1.1 පූජනීය ස්ථානවල සිදුවන ක්‍රියාකාරකම් වලට විරුද්ධ වීම

සාකච්ඡා කළ පරිදිම (2 වන පරිච්ඡේදය, 4.1 වන කොටස), පොලීසිය සහ ප්‍රාදේශීය බලධාරීන්ගේ මැදිහත් වීමෙන් පූජනීය ස්ථාන වල ක්‍රියාකාරකම් සීමා කිරීමට සිදුවන ආකාරයේ සිදුවීම් වලින් වැඩි ප්‍රමාණයකට ප්‍රජාවේ සාමාජිකයන් සම්බන්ධ වී ඇත. ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි එවන්ජලික සංගමය විසින් සටහන් කරගන්නා ලද කළුතර, කොළඹ, හම්බන්තොට, කුරුණෑගල, මහනුවර සහ ගාල්ල යන ප්‍රදේශවල ක්‍රිස්තියානි ආගමික ආයතන හා සබැඳි සිදුවීම් වල ප්‍රධාන භූමිකාවක් ඉටු කර තිබුණේ ප්‍රජාවේ සාමාජිකයින් විසිනි.[352]

සටහන් කරගත් සිදුවීම් කිහිපයක දේවස්ථාන වලට එරෙහිව පැමිණිලි ඉදිරිපත් කර තිබුණේ ආසන්නතම අසල්වැසියන් විසිනි. අප්‍රේල් මාසයේ දී, කොළඹ (බස්නාහිර), කැලණියේ පිහිටි දේවස්ථානයකට එරෙහිව, එම දේවස්ථානයේ ක්‍රියාකාරීත්වය 'නීති විරෝධී' බව සඳහන් කරමින් පෙත්සමක් පොලීසිය වෙත ලැබුණේ දේවගැතිවරයාගේ අසල්වාසීන් ගෙනි. එම පෙත්සමේ පිටපත් කැලණිය බෞද්ධ විහාරස්ථානයට, කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සහ ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුවට යොමුකර තිබිණි. ඒ අනුව පොලීසිය විසින් දේවස්ථානය ලියාපදිංචි කරන ලෙස හෝ වෙනත් ස්ථානයකට මාරු කරන ලෙස උපදෙස් දෙනු ලැබිණි.[353]

---

351 ශ්‍රී ලංකාවේ ආගම් ආරක්ෂාව පිළිබඳ තත්වය පිළිබඳ අධ්‍යයනයක්, NCEASL කාණ්ඩ සාකච්ඡා කණ්ඩායම, 2024 දෙසැම්බර් 12, කොළඹ. සහභාගී වූ පාර්ශව: මහේෂ් ද මැල්, මයික් ගෙබ්‍රියෙල් සහ සලෝමි ද සිල්වා.

352 ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය (NCEASL), මඩකලපුවේ ආගම් විශ්වාස නිදහස පිළිබඳ භූ දසුනය 2023-2024, (Minor Matters, 2024 දෙසැම්බර්), https://minormatters.org/report_policy_briefs/the-landscape-of-freedom-of-religion-or-belief-in-batticaloa-2023-2024/, 21

353 එම

ජූලි මාසයේ දී, නුවර (මධ්‍යම), ගෙලිඔයේ දේවස්ථානයක් විවෘත කිරීමේ උත්සවයකදී එයට බාධා කරමින් බෞද්ධ භික්ෂූන් වහන්සේලා සහ ප්‍රදේශවාසීන් දේවගැතිවරයා හට 'බෞද්ධ ග්‍රාමයක්' තුළ එම ආගමික සේවා කටයුතු පවත්වාගෙන යා නොහැකි බව දැනුම් දී තිබිණි. පසුව පොලීසිය විසින් වහාම මෙම සිදුවීම සම්බන්ධව ආගමික ආයතනයට පැමිණි ආගන්තුකයින්ගේ තොරතුරු ද ඇතුළුව විස්තර ලබාගෙන තිබේ. පොලීසියට ඒ වෙනුවෙන් කිසිදු නිල පැමිණිල්ලක් ඉදිරිපත් ව නොතිබුණද, සිදුවීම පිළිබඳ අනතුරු අඟවමින් දුරකථන ඇමතුම් ගණනාවක් ලැබී තිබුණ බව දේවගැතිවරයාට පොලීසිය වෙතින් දැනගැනීමට හැකි විය.[354]

## 1.2 ආගමික කටයුතු වලට බාධා පැමිණවීම සහ හිංසනය

ප්‍රජාවේ සාමාජිකයින් විසින් මූලිකත්වය ගත් සිදුවීම් වලදී, චෝදනා එල්ල කළ කාරණය වූ, දේවස්ථානයන් හි 'නීති විරෝධී භාවය' සහ ලියාපදිංචි නොකිරීමේ ගැටලු යන කරුණු එම ආගමික ආයතන සහ ඒවායේ සාමාජිකයින් වෙතට එල්ල වෙන තර්ජන සහ කායික පහරදීම් සාධාරණීකරණය කිරීම සඳහා නිරන්තරයෙන් යොදා ගැනේ. ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි එවන්ජලික සංගමය විසින් කොළඹ, පුත්තලම, මන්නාරම, කුරුණෑගල සහ ගම්පහ යන නගර වල ක්‍රිස්තියානි ආගමික ආයතන, අවමව පහක වත් සිදු වූ එවැනි ශාරීරික ගැටුම් හෝ ප්‍රහාරයන් පිළිබඳ වාර්තා ලබාගෙන ඇත.[355]

ජූලි මාසයේදී, ගම්පහ (බස්නාහිර), වත්තල ආගමික සේවා සපයන දේවස්ථානයකට, ඝෝෂාකාරී සංගීතය සහ අසභ්‍ය වදන් භාවිතා කරමින් බාධා කරන ලද අසල්වාසීන් විසින් බල කළේ එම සේවාවන් නවතා දමන ලෙසයි. එමගින් ඇතිවූ ආරවුලේදී දේශකවරයා ගේ බිරිඳට පහරදීමක් සිදු විණි. මීට අමතරව, කුරුණෑගල, පොල්ගහවෙල පිහිටි දේවස්ථානයකට, එය ලියාපදිංචි කිරීමට හෝ නැතහොත් ආගමික සේවා සැපයීම නතර කිරීමට බලපෑම් කෙරෙමින් තිබියදීම ගල් මුල් ප්‍රහාරයක් එල්ල වීම ඇතුළු සිදුවීම් මාලාවකට මුහුණපෑමට සිදු විය. එහි එක් අවස්ථාවක දේශකවරයා සහ සභිකයන් පිරිස දේවස්ථානයට ඇතුළු වීම වළක්වමින් ගම්වාසීන් විසින් ඒ වෙත යන මාර්ගය අවහිර කෙරිණි. ගාල්ලේ (නිරිත දිග) බලපිටිය ප්‍රදේශයේ දේවස්ථානයක ට, පැවති විරෝධතා නිසා ඔක්තෝබර් මාසයේ එල්ල වීමට ඉඩ ඇති ප්‍රහාරයක් පිළිබඳ කටකතා පැතිරුණ අතර දේශකවරයා සහ ඔහුගේ පවුලට තාවකාලිකව නිවස හැර යාමට සිදු විය.[356]

## 1.3 පොදු සම්පත් පරිභෝජනයට ඉඩ ලබා නොදීම

එවන්ජලික ක්‍රිස්තියානි ක්‍රියාකාරකම් කෙරෙහි ප්‍රජාව තුළින් පැන නගින විරෝධතාවය ඔවුන් හට වෙනස් කොට සැලකීමට ද හේතු වී ඇත. ශ්‍රී ලංකාවේ මරණාධාර සමිති යනු කිසිවෙකු මිය ගිය විට එම ශෝක කාලය අතරතුර මූල්‍යමය ආධාර ද ඇතුළු ව අදාළ පවුලට අවැසි සහය ලබාදෙන වැදගත් ප්‍රජා මූලික සංවිධානයකි. මෙම මරණාධාර සමිති වලින් ලැබිය හැකි ප්‍රයෝජන, ක්‍රිස්තියානි භක්තිකයින් හෝ සමීප කාල වකවානුවක එම දහම වැළඳගත් බැතිමතුන් වෙත ලබා නොදීමට උත්සහ දරා ඇති අවස්ථා අවමයෙන් දෙකක් වත්, මාතලේ (මධ්‍යම) සහ කුරුණෑගල (වයඹ) යන නගර වලින් ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි සංගමය වෙත වාර්තා වී ඇත.

මාතලේ, මඩාටුගම පැවති මරණාධාර සමිති රැස්වීමකදී, ගම් වාසීන්ගේ විරෝධයට ලක් වුණ දේශකවරයෙකු

---

354 එම

355 එම

356 එම

සහ ඔහුගේ පවුල ට මරණයක දී ක්‍රිස්තියානි රීති අනුව අවසන් කටයුතු සිදු කරගැනීමට අවස්ථාව සහ සමාජයෙන් ඊට අවශ්‍ය සහය ලබාදීමට හැකි වුවත්, ඒ සඳහා ගම් වාසීන් ගෙන් විරෝධතාවක් එල්ල වුවහොත් එම අවසන් කටයුතු පොදු සුසාන භූමියට මාරු කෙරෙනු ඇති බව දන්වා තිබුණි. තවදුරටත් ගම්මානය තුළ කිසිවෙකු ක්‍රිස්තියානි දහම වැළඳ ගැනීමට කටයුතු කළහොත් සමාජයෙන් එසේ සහයක් නොලැබෙන බවට ඔවුහු අනතුරු ඇඟවූහ.[357]

රාජ්‍ය නොවන ක්‍රිස්තියානි සංවිධානයකින් සිදු කරන ලද පරයේෂණයකට අනුව, අලුතෙන් ක්‍රිස්තියානි දහම වැළඳ ගනු ලැබූ බැතිමතුන් හට ද ඔවුන්ගේ විශ්වාසය අතහැර පැරණි ආගමට නැවත පැමිණීමට බලපෑම් ඇති වේ. එවැනි බලපෑම් ලෙස ඔවුන්ගේ පවුලේ බෞද්ධ සාමාජිකයන් වෙත බෞද්ධ ආගමික සිරිත් විරිත් වලට අනුකූල ව අවසන් කටයුතු සිදු කර ගැනීමට ඉඩ නොලැබෙන බවට අනතුරු ඇඟවීම් සිදු කෙරේ. මෙයට අමතරව පෞද්ගලික මට්ටමින් පවුලේ උරුමය සම්බන්ධ අයිතිවාසිකම් අහිමි වීම හෝ අහෝසි කිරීම ද එලෙස නව ආගමකට එක් වූවන් ව නැවත මුල් ආගමට හැරෙන ලෙස එකඟ කරවාගැනීමේ ක්‍රමයක් වන බව වාර්තා වේ.[358]

අම්පාරේ (නැගෙනහිර) ප්‍රධාන වශයෙන් බෞද්ධයන් වෙසෙන කලාපයක් වන මහ ඔය ප්‍රදේශයේ මාර්තු මස සිදු වූ සිදුවීමකදී ද මෙම තත්වය පැහැදිලි විය. එම අවස්ථාවේ එහි සංචාරය කළ ක්‍රිස්තියානි ක්‍රියාකාරීන් 26 දෙනෙකුට පිටවීමට බල කෙරුණේ ආගම වෙනස් කර ඔවුන්ගේ ආගමට හරවා ගැනීම් සිදු විය හැකි බවට ලැබුණු පැමිණිලි හේතුවෙනි.[359]

## 2. ගැටලුකාරී ආගමික ප්‍රචාරණය

ශ්‍රී ලංකාව තුළ ආගමක් ඇදහීමේ සහ විශ්වාස කිරීමේ නිදහසට අදාළ ගැටලු සම්බන්ධයෙන් සලකා බැලීමේදී, ජනතාව වෙනත් ආගම් වැළඳගැනීම හරහා සමාජයේ වඩා ප්‍රබල ප්‍රධාන ආගමික කණ්ඩායම් වලට සිය බලවත් සමාජ තත්වය පහළ වැටීම පිළිබඳ කණස්සල්ලක් පවතින බැවින් ආගමික ප්‍රචාරණය[360] වඩාත් මතභේදයට තුඩු දෙන ගැටලුවක් වී ඇති අතර එබැවින් ජනයා වෙනත් ආගම් වලට හරවාගැනීම තහනමට ලක් කරන නීති සම්මත කරගැනීමට පවා උත්සහ දරා ඇත. [1 වන පරිච්ඡේදය, 3.5 වන කොටස බලන්න][361] "කිසියම් ආගමක් හෝ විශ්වාසයක් අනුගමනය කිරීම.. සඳහා වන නිදහස" වෙනුවෙන් ව්‍යවස්ථානුකූල ව ආරක්ෂාව හිමි වී තිබීම නොතකා, ශ්‍රී ලංකාව තුළ වෙනත් ආගම් වැළඳ ගැනීම් නිරන්තරයෙන් විරෝධයට ලක් වෙන අතර අකමැත්තෙන් නමුත් එසේ කිරීමට ඉඩ හැරීම ලැබිය හැකි හොඳම ප්‍රතිචාරය වේ. ආගම පරිවර්තනය කළ පුද්ගලයන් ට, එහිදී විවාදයට බඳුන් වන ආගම කුමක් වුව ද වෙනසක් නැතිව දෙමාපියන් සහ සමීපතම පවුලේ සාමාජිකයන් ඇතුළුව සියලු දෙනා සමඟ වන අන්තර් පුද්ගල සබඳතා තුළ ගැටුම් වලට මුහුණ පෑමට සිදු වේ.[362]

357 එම

358 Open Doors, ශ්‍රී ලංකා සම්පූර්ණ රටාදායක වාර්තාව - උදරකා Watch Research, (Open Doors, 2024 මාර්තු), https://www.opendoors.org/research-reports/country-dossiers/WWL-2024-Sri-Lanka-Full-Country-Dossier.pdf, පිටු 32-33

359 ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය (NCEASL), 2024 දී ක්‍රිස්තියානුවන්ට එරෙහි වද හා හිංසා ක්‍රියා සිදුවීම්

360 ගෙහාන් ගුණතිලකෙ, ආගම් නිදහසට ආගම් ප්‍රචාරය කිරීමේ නිදහසද ඇතුළත්ද?, (Minor Matters, 2022 සැප්තැම්බර්), https://forbdashboard.minormatters.org/resource/does-the-freedom-of-religion-include-the-freedom-to-propagate/

361 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 'බලහත්කාර ආගම පරිවර්තනය තහනම් කිරීමේ පනත් කෙටුම්පත' පිළිබඳ වාර්තාවක්, (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2007 අගෝස්තු), https://www.cpalanka.org/the-prohibition-of-forcible-conversion-of-religion-bill/

362 මැරී වරුගේස්, ආගමික පරිවර්තනය සහ සංස්කෘතික ව්‍යාකූලතාව, (International Journal for Religious Freedom, 2024 නොවැම්බර්), https://ijrf.org/

අනෙකුත් ආගම් වලින් හෝ ප්‍රධාන ධාරාවේ ක්‍රිස්තියානි ශාඛාවන්ගෙන් සාමාජිකයින් සිය දහමට බඳවා ගැනීමේදී එවන්ජලික ක්‍රිස්තියානි ධර්මයේ කැපී පෙනෙන කාර්ය භාරය එය කෙරෙහි වන අප්‍රසාදයට දායක වී ඇත. ජාතික සාම සභාව මගින් 2024 වසරේ සිදු කළ සමීක්ෂණයකට අනුව, 'වෙනත් ආගම් සඳහා බඳවා ගැනීම' ආගමික නිදහස උදෙසා බලපාන ප්‍රධාන බාධකය වශයෙන් හඳුනා ගෙන ඇත. [ආගමික ප්‍රචාරණය. සහ 'ආගම් වලට බඳවා ගැනීම' අතර වෙනස දැනගැනීමට, 1 වන පරිච්ඡේදය, 3.5 වන කොටස බලන්න]

බෞද්ධ, හින්දු සහ කතෝලික ප්‍රජාවන්ට අයත් වූ ප්‍රතිචාර දැක්වූවන් ගෙන් 50% කට වැඩි ප්‍රතිශතයක් මගින් මෙම ක්‍රියාකාරකම් සඳහා මූලිකවම වගකිව යුතු නිශ්චිත ක්‍රිස්තියානි ආගමික කණ්ඩායම් කීපයක් ඇති බව සඳහන් කළ අතර එකී කටයුතු සිදු කෙරෙන ආකාරය ඔවුන්ගේ ආගමට සෘණාත්මක ලෙස බලපාන බව ද පෙන්වා දී ඇත.[363]

මෙම අදහස හෙළි කළ සිදුවීමක් වවුනියාවේ (උතුර) පුවරසංකුලම් ප්‍රදේශයෙන් පසුගිය මාර්තුවේ වාර්තා විය. එහිදී ක්‍රිස්තියානි ආගමානුකූල ආශීර්වාද ලබාදීමේ උත්සවයක් සම්බන්ධව දන්වමින් අලවා තිබූ දැන්වීම් මතින්, 'දෙමළ එකමුතුව' යන නාමය යටතේ දැන්වීම් ඇලවීම සිදු වූ අතර එම නව දැන්වීමෙන් ක්‍රිස්තියානුවන් ට චෝදනා කර තිබුණේ ඔවුන් දෙමළ ජනතාව සිය ආගමට බඳවා ගනිමින් 'දමිළ ජාතිය විනාශ කරන' බව සඳහන් කරමිනි. තවද එම සටහන මගින් ක්‍රිස්තියානුවන් 'දමිළ නිජභූමියෙන් ඉවත් විය යුතු බවට' බල කර තිබිණි.[364]

ක්‍රිස්තියානි පූජකවරුන් විසින්, එවන්ජලික දේවස්ථාන සමග සම්බන්ධිත "ආක්‍රමණකාරී ආගම් ප්‍රචාරණය" හේතුවෙන් වඩා පුළුල් ක්‍රිස්තියානි-කතෝලික සමාජය කෙරෙහි ද සෘණාත්මක ප්‍රතිරූප ඇතිවීම පිළිබඳව සිය කණස්සල්ල පළ කර තිබේ.[365] මෙම ගැටලුවටම අදාළ වන ලෙස, වවුනියා ප්‍රදේශයේ මෑතකදී සිදු කළ අධ්‍යයනයකදී හෙළිදරව් වූයේ 'යෙහෝවා ගේ සාක්ෂිකරුවන්' නම් ක්‍රිස්තියානි නිකාය මගින්, කුලවාදය නිසා වෙනස් කොට සැලකීම් යනාදී වශයෙන් කොන් කළ, සීමා කළ සමාජ පසුබිම් වලට අයත් හින්දුවරුන් ක්‍රියාකාරී ලෙසම සිය ආගමට බඳවාගැනීමේ සිදුවීම් වාර්තා වන බවයි.[366] මෙම වාර්තා වලින් "සදාචාරවත් නොවන ලෙස ආගමට හරවා ගැනීම්",[367] පිළිබඳ ප්‍රශ්නය ද මතු කෙරෙන අතර, අනෙකුත් සියලු ප්‍රධාන ආගම් ද සමාජ සේවා කටයුතු වල නිරත වන නමුත් එම ආගම් වෙත යොමු නොවන ආකාරයේ සැකමුසු බවක් එවන්ජලික/ස්වාධීන දේවස්ථාන මගින් සපයන මූල්‍යමය සහය වෙත යොමු වීමට හේතුව ඉන් පැහැදිලි වේ.[368]

අධ්‍යාත්මික ප්‍රතිලාභ, මනෝ සමාජීය සහය, ආවාහ-විවාහ, කාන්තාවන් සඳහා වඩා උසස් ජීවන තත්වයක්, ආගම් සහ කුල මගින් පනවන ලද සීමාවන් හි ලිහිල් වීමක් සහ ආර්ථිකමය දිරිගැන්වීමක් යන කරුණු වෙනත් ආගමක් වැළඳ ගැනීමට බලපාන හේතු වලින් සමහරක් ලෙස දැක්වේ. මෙම අරමුණු වලින්

index.php/home/article/view/291/338#:~:text=The%20new%20movement%20was%20a,a%20whole%20(Brantley%202022);
Open Doors, ශ්‍රී ලංකා සම්පූර්ණ රටාදායක වාර්තාව - World Watch Research" පිටු 28-29

363 ජාතික සාම සභාපති මණ්ඩලය (NPC), ආගමික නිදහස පිළිබඳ සමීක්ෂණ වාර්තාව 2024, අප්‍රකාශිත වාර්තාවක්, NPC, 2024 දෙසැම්බර්, පිටු 19, 22

364 NCEASL, 2024 දී ක්‍රිස්තියානුවන්ට එරෙහි වද හා හිංසණ ක්‍රියා සිදුවීම්

365 ඇන්ටොලියා පාලෙර්මෝ, "ශ්‍රී ලංකාවේ සිසුන්ගේ ආගමික සංවාද අභියෝගය", Vatican News, 2024 මාර්තු 18, https://www.vaticannews.va/en/church/news/2024-03/sri-lanka-church-and-the-challenge-of-interreligious-dialogue.html

366 ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය, වාවුනියාවේ ආගමික නිදහස පිළිබඳ පර්යේෂණ වාර්තාව 2023-2024, (Minor Matters, 2024 දෙසැම්බර්), https://minormatters.org/report_policy_briefs/the-landscape-of-freedom-of-religion-or-belief-in-batticaloa-2023-2024/, පිටු 5-6

367 ශ්‍රී ලංකාවේ වංචා, බලපෑම් හෝ අනුචිත බලපෑම් මත සිදු වූ ආගමික පරිවර්තන පිළිබඳ අවධානය - විශේෂයෙන්ම මූල්‍ය ප්‍රතිලාභ භාවිතා වූ බවට පැවසුම්

368 සුමුදු චාමර, "ආගමික පරිවර්තනවලට එරෙහි පීඩනය: රජයේ හිංසණ ආගමික විශ්වාසවලට යටතේ තිබෙන භයානක භූමිකාව", The Morning, 2024 මාර්තු 14, https://www.themorning.lk/articles/PNej5DTVIhbbfZNvN0Qr

බොහොමයක් අධ්‍යාත්මික වැදගත්කමක් සහිත ඒවා නොවුණ ද, වෙසෙසින්ම ආර්ථික ලාභ වෙනුවෙන් වෙනත් ආගමකට බැඳීම 'සදාචාරවත් නොවන' ලෙස බොහෝ විට පිළිගැනේ.[369] මඩකලපුව ප්‍රදේශයේ දුප්පත් ප්‍රජාවන් වෙත ආධාර සහ සම්පත් සපයන අතරම ක්‍රිස්තියානි දහමට එම ප්‍රජාව හරවාගනු ලබන ක්‍රිස්තියානි ආගමික කණ්ඩායම් වලට එරෙහිව හින්දු පූජ්‍ය පක්ෂය විසින් එම ගැටලුව අධිකරණය වෙත ගෙන යාම දක්වාම තත්වය දුර දිග ගොස් ඇත.[370]

වෙනත් ආගමකට හැරීමේ කාරණයේදී මූල්‍යමය වශයෙන් කෙරෙන දිරි ගැන්වීම් හි කාර්‍ය පිළිබඳ අදහස් දක්වන සමහරු, දිළිඳු ජනයාගේ 'දුර්වලකම්' අනිසි ලෙස භාවිතය නොකළ යුතු බව[371] සිතන අතර අනෙක් අය පෙන්වා දුන්නේ යම් පුද්ගලයෙකු ඇය/ඔහු අදහන ආගම තෝරා ගැනීමේදී එම 'තීරණය' ට බාහිර අරමුණු වලින් බලපෑම් නොවිය යුතු බවයි.[372]

ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය සාමාජිකත්වය ලබාගෙන ඇති දේවගැතිවරුන් ව පිළිපැදීමට යොමු කරනු ලබන ඔවුන්ගේ ආචාර ධර්ම සංග්‍රහයේ, 'සමාජ ක්‍රියාකාරකම්' හෝ දිළින්දන්ට උපකාර කිරීම, එවන්ජලිකවාදය, එනම් සිය ආගමට හරවා ගැනීම සඳහා උපක්‍රමයක් වශයෙන් භාවිතා නොවිය යුතු බව පැහැදිලිවම දක්වයි.[373]

ලෝක එවැන්ජලික සංගමය ඇතුළු ක්‍රිස්තියානි ජාලයන් සඳහන් කරන පරිදි, "...දරිද්‍රතාවයේ සහ අවශ්‍යතාවයේ තත්ත්වයන් සුරාකෑමට ක්‍රිස්තියානි ප්‍රජාව තුළ ඉඩක් නොමැති අතර කිතුණුවන් තම සේවා ක්‍රියාවන්හි මූල්‍ය ප්‍රතිලාභ සහ වාසි ඇතුළු සෑම ආකාරයේම දීමනාවන් ප්‍රතික්ෂේප කළ යුතු අතර ඒවා පිරිනැමීමෙන් වැළකී සිටිය යුතුය."[374]

නමුත් ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය (NCEASL) පෙන්වා දෙන්නේ, ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස (FoRB) තුළ පණීවිඩ ව්‍යාප්තිය සහ එයට බැඳුනු අභිප්‍රේරණයන් විශේෂයෙන් ආත්මීය වන බැවින්, එවැනි කරුණු නීතිමයව නියාමනය කිරීම අපහසු බවයි. ඒ වෙනුවට ඔවුන් යෝජනා කරන්නේ FoRB පිළිබඳ නීතිමය ආරක්ෂාවන් හා දැනුවත් කිරීම සම්බන්ධයෙන් වැඩි සංවාද හා අවබෝධය ඇති කිරීමයි. එවැන්ජලික සංගමය විසින් සිදුකරන ආගමික පරිවර්තනය පිළිබඳ ප්‍රචාර පළ කරමින් සිටි බෞද්ධ නායක වූ කළුපහන පියරතන හිමි ද මෙම ගැටළු නීතිය මගින් විසඳිය යුතු නැති බව පෙන්වා දෙන ලදි. නමුත් අන්තර් ආගමික කමිටු වැනි මධ්‍යස්ථාන මඟින් රජයේ මැදිහත්වීම පිළිගත හැකි බවද සඳහන් කරන ලදි.[375]

---

369 ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය, මඩකලපුවේ ආගමික නිදහස පිළිබඳ පර්යේෂණ වාර්තාව 2023-2024; ශ්‍රියානි තේවකුමාර (මිනිස් අයිතිවාසිකම් ආරක්ෂක), ජෝවිටා අරුලානන්ඩම් විසින් 2024 නොවැම්බර් 20 දින දුරස්ථවින් පවත්වා ඇති සාකච්ඡාවක්; ආචාර්ය රොහාන් ද සිල්වා (අධ්‍යක්ෂ, සමාජ හා ආගම් මධ්‍යස්ථානය), ජෝවිටා අරුලානන්ඩම් විසින් 2024 නොවැම්බර් 27 දින කොළඹදී පවත්වා ඇති සාකච්ඡාවක්

370 මඩකලපුවේ ආගමික නිදහස පිළිබඳ පර්යේෂණ වාර්තාව 2023-2024, පිටු 8

371 පූජ්‍ය ගල්කන්දේ ධම්මනන්ද ස්වාමින්වහන්සේ (ස්ථාපක/අධ්‍යක්ෂ, වල්පොළ රාහුල ආයතනය), ජෝවිටා අරුලානන්ඩම් විසින් 2024 නොවැම්බර් 26 දින කොළඹ දී පවත්වා ඇති සාකච්ඡාව

372 ආචාර්ය මහේන්ද්‍රන් තිරුවරංගන් (ජාෆ්නා විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය), ජෝවිටා අරුලානන්ඩම් විසින් 2024 නොවැම්බර් 21 දින දුරස්ථවින් පවත්වා ඇති සාකච්ඡාව

373 ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය (NCEASL), ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානයේ ව්‍යාපාර ආචාරධර්ම සංග්‍රහය, ප්‍රකාශිත ලේඛනයක්, NCEASL, ප්‍රවේශය 2024 නොවැම්බර් 12

374 ශ්‍රී ලංකාවේ ආගමික නිදහස පිළිබඳ තත්ත්වය පිළිබඳ අධ්‍යයනයක්, NCEASL අවධානයක කණ්ඩායම, 2024 දෙසැම්බර් 12, කොළඹ පිවිසුම්කරුවන්: මහේෂ් ද මෙල්, මයික් ගේබ්‍රියල් සහ සැලෝම් ද සිල්වාර් ලෝක දෙවියානු සභාව, ආගමික අතර සම්බන්ධතා පිළිබඳ පන්තික සභාව, ලෝක එවැන්ජලික සංගමය, "බහු ආගමික ලෝකයක ක්‍රිස්තියානි සාක්ෂිය: හැසිරීම සඳහා නිර්දේශ", 2011 ජනවාරි

375 ශ්‍රී ලංකාවේ ආගමික නිදහස පිළිබඳ තත්ත්වය පිළිබඳ අධ්‍යයනයක්, NCEASL අවධානයක කණ්ඩායමරී පූජ්‍ය කළුපහන පියරතන හිමි (ආදර්ශමත් ශ්‍රී ලංකාවක් සඳහා සංඝයාවේ සම්පාදක), ජොවිටා අරුලනන්දම් විසින් සිදුකළ සම්මුඛ සාකච්ඡාව, 2024 ඔක්තෝබර් 25, කොළඹ

# 3. ආගමික ප්‍රවණතා සහ අන්තර්/අභ්‍යන්තර ආගම් සමූහ ගැටුම්

FoRB පිළිබඳ නීතිමය ආරක්ෂාවන් පිළිබඳ ආගමික දැනුවත් කිරීම ඉතා වැදගත් වන අතර, එය ආරක්ෂාවෙන් තොර ආගමික සමූහයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට උපකාරී වේ. ඒ වගේම, ආගමික සමූහයන්ටත් තම ආගමික උගන්වීම් සහ චර්යායන් සමාජය තුළ ඇති බලපෑම් සම්බන්ධයෙන් වගකිවයුතු වේ.

අලුත් සිදුවීම් සහ සංවර්ධන මගින්, අල්ප සංඛ්‍යාත්මක ජාතික ආගමික සමූහයන් අතර ඇති ආගමික ප්‍රවණතා සහ චර්යායන්, අන්තර් සහ අභ්‍යන්තර ආගමික ගැටුම්, අසහනය සහ කාන්තා පිරිස පාර්ශවයකට තල්ලු කිරීම වැනි අවිනිශ්චිත ප්‍රතිඵල ඇති කර ඇති බව පෙන්වා ඇත.

## 3.1 ක්‍රිස්තියානි නිකායන් අතර දැඩි උද්යෝගය

"ආක්‍රමණශීලී ආගමික පරිවර්තන" සහ "සදාචාරාත්මක නොවන පරිවර්තන" පිළිබඳ චෝදනාවලට අමතරව, සමහර ක්‍රිස්තියානි ප්‍රජා කොටස්වලින් සිදුකරන අවගැන්වීම් සහිත දේශනයන් නිසාද ක්‍රිස්තියානි ව්‍යාපාරය පිළිබඳ තවත් විවේචන ඇති වී ඇත.

ජාත්‍යන්තර මාර්ගෝපදේශයන් අනුව, අනිත් අයෙකුට තම ආගම පිළිබඳ අවබෝධයක් ලබාදීම "අනිත් අයගේ අයිතීන් සහ ආගමික සංවේදනාවන් උල්ලංඝනය නොකරමින්" සිදු කළ යුතුය. එම මාර්ගෝපදේශයන්හි සඳහන් වන්නේ, ආගමික නිදහස යනු "අනිත් ආගම් ගෞරව කිරීමේ සහ ඒවා වසල කිරීමෙන්, නින්දා කිරීමෙන් හෝ වැරදි ලෙස නිරූපණය කිරීමෙන් වළකින වගකීමක්ද වේ" යැයිය.[376] NCEASL පෙන්වා දෙන්නේ, පල්ලිය සමග සිදුකළ දැනුවත් කිරීම සහ සන්නිවේදනය හේතුවෙන්, බහු ආගමික සමාජයක ක්‍රිස්තියානි ආගම ආචරණය කිරීම සම්බන්ධයෙන් පරිනත මනෝභාවයක් ලබාගෙන ඇති බවය.

පල්ලි ක්‍රියාත්මක වීමේදී සංවේදී බව වැඩි වෙමින් පවතින බව පෙන්නුම් කරමින්, ශබ්ද දූෂණය සම්බන්ධ සිදුවීම් අඩු වී ඇති බව ඔවුන් පෙන්වා දෙන ලදි. නමුත් සමහර පල්ලි හොඳම පිළිවෙත් අනුගමනය නොකරන බවට ඔවුන් එකඟ විය.[377]

පාදිලිවරයා වන ජෙරොම් ප්‍රනාන්දු පූජකතුමා, අනෙකුත් ආගම්වලට අපහාස කරන බවට සැලකෙන ක්‍රියා සහ වචන භාවිතය සඳහා ජාතික අවධානය දිනා ගත්තේය. [2 පරිච්ඡේදය 3 කොටස බලන්න] ඔහුගේ කතාව ජාත්‍යන්තර නීතියෙන් ආරක්ෂා විය හැකි වුවත්, එය ක්‍රිස්තියානි ආගමිකයන් ඇතුළුව බොහෝ දෙනා විසින් අනුචණ සහ හානිකර ලෙස සලකනු ලැබේ.

2023 මැයි මාසයේ සිදුවීම්වලින් පසුව [2 පරිච්ඡේදය 3 කොටස බලන්න], 2024 දෙසැම්බර් මාසයේදී, ප්‍රනාන්දු පූජකතුමා සේවයක් මෙහෙයවූ අතර, එහිදී බෞද්ධ භික්ෂුවක් ලෙස සැරසී සිටි පුද්ගලයෙක්, ප්‍රනාන්දු පූජකතුමාගේ මාධ්‍ය මූලාශ්‍ර අනුව, ඔහුගේ ආශීර්වාද ලැබීමෙන් පසු රෝගයකින් සුවය ලැබීය. එම පුද්ගලයා ඇත්ත වශයෙන්ම බෞද්ධ භික්ෂුවක් නොවන බව බොහෝ දෙනා විසින් සලකනු ලැබීය. මෙම සිදුවීම සමාජ මාධ්‍ය ඔස්සේ පැතිර ගිය අතර, ප්‍රධාන පූජකවරුන් ඇතුළු බෞද්ධ ප්‍රජාවන් කෝපයට පත් කළේය. [4 පරිච්ඡේදය 1.3 කොටස බලන්න][378]

---

376 "බහු ආගමික ලෝකයක ක්‍රිස්තියානි සාක්ෂිය: හැසිරීම සඳහා නිර්දේශ", 2011 ජනවාරි

377 ශ්‍රී ලංකාවේ ආගමික නිදහසේ තත්ත්වය පිළිබඳ අධ්‍යයනය, NCEASL අවධාන කණ්ඩායම

378 පූජකතුමා ජෙරොම් විසින් බෞද්ධ භික්ෂුවකට ආශීර්වාද කිරීම (Chakra TV, 2024), https://www.youtube.com/watch?v=7BxQTxnSHSU

ආගමික කණ්ඩායම් අතර අසහනය සහ වෛරය ඇති කරමින්, මෙවැනි ක්‍රියා මගින් දැනටමත් ඉලක්කගත වී ඇති ක්‍රිස්තියානි ආගමික කොටසක අප්‍රසාදය වැඩි කිරීමේ අවදානමක් ඇත. නොවැම්බර් මාසයේදී, ප්‍රනාන්දු පූජකතුමා මධ්‍යම පළාතේ කන්දි, නාවලපිටියේ පල්ලියකට පැමිණීම ගම්වාසීන් විසින් විරුද්ධ වූ අතර, ඔවුහු පූජකතුමා පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ඉදිකරන බවක් පෙන්වමින් ආගමික ස්ථානයක් ඉදිකරමින් සිටින බවට චෝදනා කළහ.[379]

ඉස්මතු කරන ලද තවත් කරුණක් වන්නේ, සමහර එවැන්ජලික පල්ලි අතර, ක්‍රිස්තියානින් නොමැති සහ ඒ වෙනුවට දැඩි විරෝධයක් ඇති ප්‍රදේශවල යාච්ඤා මධ්‍යස්ථාන හෝ පල්ලි ස්ථාපිත කිරීමේ පිළිවෙතයි.[380] NCEASL විසින් ලබාදෙන උපදෙස් ද පල්ලිවලට අවවාද කර ඇත්තේ, ඔවුන්ගේ ක්‍රියාවන්හිදී 'ආසන්න සංස්කෘතික සහ මානව පරිසරය' සැලකිල්ලට ගැනීමටය.[381] මෙම ගතිකතාවන්ගේ සාක්ෂියක් ලෙස, ඔක්තෝබර් මාසයේදී, බස්නාහිර පළාතේ ගම්පහ, සීදුවේදී, ගමේ ක්‍රිස්තියානි යාච්ඤා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමේ සැලසුම්වලට ගම්වාසීන්ගේ විරෝධය ඇති විය. ගම්වාසීන් සහ පදිංචි බෞද්ධ භික්ෂුව පෙන්වා දුන්නේ, යාච්ඤා මධ්‍යස්ථානය වෙනත් තැනක ඉදිකිරීමට ඔවුන් විරුද්ධ නොවන බවත්, නමුත් ගමේ බෞද්ධ විහාරයට ඉතා සමීපව ස්ථාපිත කළහොත් ගැටුම් ඇති වීමට ඉඩ ඇති බවත්ය. දැනට, පූජකතුමා පොලිසියේ උපදෙස්වලට අනුකූලව කටයුතු කර ඇති බව අවබෝධ වන අතර, එම ස්ථානයේ සේවා පැවැත්වීම හෝ ඉදිකිරීම් කටයුතු සිදුකිරීමෙන් වැළකී සිට ඇත.

උතුරේ සමහර ක්‍රිස්තියානි කණ්ඩායම් අතර සංස්කෘතික දැනුවත්භාවය හා සංවේදීතාවය අඩුවීම දෙමළ ජනතාව අතර සබඳතා කෙරෙහි බලපා ඇත.[382] දෙමළ සබඳතා හා ආගමික ගැටලු කේන්ද්‍ර කරගත් මෑතකාලීන වාර්තා චිත්‍රපටයක, ප්‍රධාන පෙළේ ක්‍රිස්තියානි හා කතෝලික පූජකවරුන් එම ප්‍රදේශයේ 'ක්‍රිස්තියානි මූලධර්මවාදය' පිළිබඳව සාකච්ඡා කළහ. ඔවුන් පවසන්නේ ප්‍රදේශයේ ජීවත්වන හින්දු කණ්ඩායම් හරවා ගැනීමට උත්සාහ කරන ක්‍රිස්තියානි මූලධර්මවාදීන් අසමගියට හේතුවන බවත්, එය දෙමළ ජනතාවගේ එකමුතුකමට බලපාන බවත්ය.[383] නවකයන් ලෙස ක්‍රිස්තියානි බවට පත්වූවන් ඔවුන්ගේ 'අන්තවාදී උනන්දුව හා උද්යෝගය' සමග හින්දු භක්තිකයන් අවුස්සන බවට ද නිරීක්ෂණ පෙන්වා දී ඇත.[384] සම්මුඛ සාකච්ඡාවකදී, හින්දු නායක කුරුක්කල් දර්ශක අනතුරු ඇඟවූයේ එවැනි පිළිවෙත් කිසිදු සීමාවකින් තොරව ක්‍රියාත්මක කිරීම තවදුරටත් ගැටුම් හා පාලන ගැටලු ඇති කිරීමට හේතු විය හැකි බවයි.[385]

Sahan Tennekoon, "ආගම් විකෘති කිරීම: රජය නීති සංශෝධනය යෝජනා කරයි," The Morning" 2024 දෙසැම්බර් 27, https://www.themorning.lk/articles/VJZXpXsjgLVZ8W7euvW1

379 NCEASL, 2024 ක්‍රිස්තියානින්ට එරෙහි හිංසා සහ භීෂණ සිදුවීම්

380 පූජ්‍ය ගල්කන්දේ ධම්මානන්ද හිමි. සම්මුඛ සාකච්ඡාව

381 ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සංධානය (NCEASL), ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ධර්ම දූත සංගමය - ආචාර ධර්ම ප්‍රකාශය

382 NCEASL, 2024 ක්‍රිස්තියානින්ට එරෙහි හිංසා සහ භීෂණ සිදුවීම්

383 මුල්ලිවයිකාල් වසර 15 - ආගමික ගැටලු පිළිබඳ ප්‍රතිබිම්බ (ආදයාලම් ප්‍රතිපත්ති පර්යේෂණ මධ්‍යස්ථානය, 2024), https://www.youtube.com/watch?v=n6qogLSRVxw.

384 ඩී.බී.එස් ජයරාජ්, "'හින්දු' ජනාධිපති අපේක්ෂකයෙක් සහ 'හින්දු දෙමළ ඊලම්' සංකල්පය", ෆයිනෑන්ෂල් ටයිම්ස්, අප්‍රේල් 10, 2024. https://www.ft.lk/columns/A-Hindu-presidential-candidate-and-the-Hindu-Tamil-Eelam-concept/4- 760530

385 කුරුක්කල් දර්ශක (ලේකම්, හින්දු පූජක සංගමය), ජොව්ටා අරුලානන්තම් විසින් සම්මුඛ සාකච්ඡාව, මාර්තු 1, 2025,දුරස්ථව

## 3.2 හින්දුත්ව බලපෑම

අනෙකුත් ප්‍රජාවන්හි මතුවන ආගමික ප්‍රවණතා ද බෙදීම් සහ ආගම් අතර ගැටුම් සඳහා දායක වී ඇත. සාකච්ඡා කළ පරිදි, ක්‍රිස්තියානි විරෝධී හා මුස්ලිම් විරෝධී හැඟීම් ප්‍රවර්ධනය කරන හින්දු ජාතිකවාදී සංවිධාන සමග සම්බන්ධ ක්‍රියාකාරකම් වැඩි වී ඇත [2 වන පරිච්ඡේදය, 5 වන කොටස බලන්න] එසේම එය හින්දු ප්‍රජාව තුළ ද බෙදීම් ඇතිකිරීමට දිරිමත් කර ඇත.

හින්දුත්වයේ බලපෑම ශිව ආගමට තර්ජනයක් වන බව පෙනී යනු ලබයි. එම ශ්‍රී ලංකාවේ දෙමළ හින්දු භක්තිකයන් විසින් සියවස් ගණනාවක් තිස්සේ අනුගමනය කරන ලද හින්දු ආගමේ නිකායකි. මඩකලපුවේ, ඉන්දියාවේ රාෂ්ට්‍රීය ස්වයම්සේවක් සංඝ (RSS), ශිව් සේනා සහ විශ්ව හින්දු පරිෂද් වැනි හින්දුත්ව කණ්ඩායම් සමඟ පෙළගැසුණු කණ්ඩායම් සාම්ප්‍රදායික වන්දනා පිළිවෙත් බිඳ දැමීමට හේතුවන බවට සැලකෙන පුහුණු ක්‍රියාකාරකම්වල නිරත වන බව වාර්තා වී ඇත.[386]

සිවිල් සමාජය සහ ආගමික පූජකවරුන් ඔවුන්ගේ බලපෑම පවුල් තුළ බෙදීම් ඇතිකිරීමට දිරිමත් කර ඇති බව සඳහන් කර ඇත. තරුණයන් විශේෂයෙන් කෝවිල් ක්‍රියාකාරකම්වල නිරත වන අය මෙම ඉගැන්වීම් කෙරෙහි ආකර්ෂණය වී ඇති බව තේරුම් ගෙන ඇත.[387] ඔක්තෝබර් මාසයේදී, ශිව සේනායි යාපනයේ පෙළගැසුණු හින්දු තරුණයින් 70 දෙනෙකු පමණ සමග පෞද්ගලික රැස්වීමක කතා කළ අතර, අනෙකුත් 'විදේශීය' ආගම් විශේෂයෙන් හින්දු ප්‍රජාවට එරෙහිව ක්‍රිස්තියානි පල්ලියේ පහරදීම්වලට විරුද්ධව සංවිධානයේ ක්‍රියාකාරකම් ඉදිරියට ගෙන යාමට ඔවුන්ව උනන්දු කරන ලදි.[388]

## 3.3 මුස්ලිම් ප්‍රජාව තුළ අති සාම්ප්‍රදායිකත්වය

මුස්ලිම් ප්‍රජාව තුළ, සමහර නිකායන් අතර ඉගැන්වීම් සහ කුරාන අර්ථ නිරූපණයන් නොඉවසිලිමත්භාවය වර්ධනය කර ඇති බවත්, හානිකර යැයි පුළුල් ලෙස සැලකෙන සම්ප්‍රදායන් ප්‍රතිසංස්කරණය කිරීමට විරෝධය දැක්වීමට දායක වී ඇති බවත් තේරුම් ගෙන ඇත.

වහාබිවාදය[389] වැනි ව්‍යාපාර මූලධර්මවාදය, දැඩි බව සහ එහි මූලධර්මවලින් බැහැර වන බව පෙන්නුම් කරන පුද්ගලයින් සමාජයෙන් බැහැර කිරීම සමඟ බොහෝ දුරට සම්බන්ධ වී ඇත.[390] 2019 පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් (ESA) පසු ව්‍යාපාරය පිළිබඳ ජාතික උනන්දුව සහ විමර්ශනය වැඩි විය. එමට බොහෝ දුරට හේතු වූයේ ප්‍රහාරයට සම්බන්ධ කණ්ඩායම වන ජාතික තව්හීද් ජමාත් (NTJ) එයට සම්බන්ධ වීමයි.[391]

---

386 මඩකලපුවේ ආගමික නිදහස පිළිබඳ භූ දර්ශනය 2023-2024, 3-14; මයිනර් මැටර්ස්, මයිනර් මැටර්ස්, ශ්‍රී ලංකාවේ ආගමික නිදහසේ තත්ත්වය පිළිබඳ සමාලෝචනයක්, (මයිනර් මැටර්ස්, සැප්තැම්බර්, 2022), https://minormatters.org/wp-content/uploads/2024/08/A-Review-of-the-State-of-Religious-Freedom-in-Sri-Lanka-English.pdf, 36 & 37; ශ්‍රියානි තේවකුමාර්, සම්මුඛ සාකච්ඡාව

387 මුල්ලිවයිකාල් වසර 15 - ආගමික ගැටලු පිළිබඳ ප්‍රතිබිම්බර් මානව හිමිකම් නීතිඥ සහ ක්‍රියාකාරිකයා, ජොව්ටා අරුලානන්තම් විසින් සම්මුඛ සාකච්ඡාව, ඔක්තෝබර් 14, 2024, දුරස්ථවරී කුරුක්කල් දර්ශක, සම්මුඛ සාකච්ඡාව

388 NCEASL, ක්‍රිස්තියානි භක්තිකයන්ට එරෙහි ප්‍රචණ්ඩත්ව හා බිය ගැන්වීම් සිදුවීම් 2024

389 වහාබිවාදය යනු සෞදි අරාබියෙන් බිහිවූ සුන්නි ඉස්ලාම් ශාඛාවේ පුනරුත්ථාපන ව්‍යාපාරයකි. ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් සුන්නි ඉස්ලාම් අනුගමනය කරන බව තේරුම් ගෙන ඇත. වහාබිවාදීන් කුරානයේ අක්ෂරාර්ථ අර්ථ නිරූපණයට අනුගත වන බවත්, ජීවිතයේ සියලු අංශවල ෂරියා නීතිය ක්‍රියාත්මක කිරීමට උත්සාහ කරන බවත් තේරුම් ගෙන ඇත. මෙම දැඩිබව බොහෝ විට අනෙකුත් නිකායන් කෙරෙහි අසහනශීලීත්වය ඇති කරන බවත්, සමහර ගෝලයන් අතර අන්තවාදයට දායක වන බවත් සැලකේ.

390 ශ්සරූර්, කාන්තා ශරීර මත යුද්ධ කිරීම, (මයිනර් මැටර්ස්, ජූලි, 2023), https://www.minormatters.org/storage/app/uploads/public/659/e16/ef8/659e16ef8d894655383751.pdf, 2; ෂරීන් සරූර් (සම-නිර්මාතෘ, කාන්තා ක්‍රියාකාරී ජාලය), ජොව්ටා අරුලානන්තම් විසින් සම්මුඛ සාකච්ඡාව, ඔක්තෝබර් 15, 2024, දුරස්ථව

391 ඇලෙක්සැන්ඩ්‍රා අල්මර් සහ ඔමාර් රාජරත්නම්, "වහාබිවාදයට මුහුණ දීම: බෝම්බ ප්‍රහාරවලින් පසු ශ්‍රී ලංකාව සෞදි බලපෑම සීමා කරයි", රොයිටර්ස්, ජූලි 5, 2019, https://www.reuters.com/article/world/wahhabism-confronted-sri-lanka-curbs-saudi-influence-after-bombings-idUSKCN1U00LT/

කෙසේ වෙතත්, පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු රාජ්‍ය ආරක්ෂක පියවර සහ ඉස්ලාමීය ප්‍රජාව තුළ නිරීක්ෂණය වහාබ්වාදයේ දෘශ්‍යමානත්වය සහ බලපෑම අඩු කිරීමට දායක වී ඇති බව තේරුම් ගෙන ඇත. සෞදි අරාබියේ සිදුවීම්, එහිදී රජය වහාබ්වාදය ප්‍රවර්ධනය කිරීමෙන් ඉවත් වී කාන්තාවන් පිළිබඳ සීමා ලිහිල් කරමින් නවීකරණවාදය වැළඳ ගත් බවට දැක්වෙන සලකුණු ද මෙහිදී කාර්යභාරයක් ඉටු කර ඇති බව තේරුම් ගෙන ඇත.[392]

කෙසේ වෙතත්, මුස්ලිම් ප්‍රජාව තුළ අති සාම්ප්‍රදායිකත්වය වහාබ්වාදය ප්‍රවර්ධනය කරන නිකායන්ට පමණක් සීමා වී නොමැත. වහාබ්වාදයේ බලපෑම අඩු වී ඇති බව පෙනුණද, මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (MMDA) සහ මද්‍රසා අධ්‍යාපනය ප්‍රතිසංස්කරණය කිරීමට සහ සමහර ග්‍රාමීය ප්‍රජාවන් අතර තවමත් ක්‍රියාත්මක වන ස්ත්‍රී ලිංග විකෘති කිරීමේ[393] පිළිවෙත අහෝසි කිරීමට ප්‍රජාවේ සමහර කොටස්වලින් දිගටම පවතින විරෝධය මෙයින් පැහැදිලි වේ.[394]

දශක ගණනාවක් පුරා, මුස්ලිම් ප්‍රජාවේ කොටස් සහ ක්‍රියාකාරිකයින් MMDA පනත හේතුවෙන් මුස්ලිම් කාන්තාවන්, ගැහැණු ළමයින් සහ පවුල් විසින් අත්විඳින වෙනස්කම් හා හානි පිළිබඳව සැලකිලිමත් වී ඇත.[395] 1956 සිට, විවිධ රජයේ කමිටු විසින් යෝජනා කරන ලද ප්‍රතිසංස්කරණ ප්‍රජාව තුළින්ම ඇති වූ විරෝධතා හේතුවෙන් බොහෝ දුරට අඩපණ වී ඇත. 2023 මැයි මාසයේදී, MMDA පනත සංශෝධනය සඳහා වූ කෙටුම්පත් පනතක නිල නොවන අනුවාදයක් මහජනතාවට දැන ගැනීමට ලැබුණි. ඇතැම් ගැටලු පිළිබඳව විවාද තිබුණද, මෙම පනත සාමාන්‍යයෙන් ප්‍රගතිය සාක්ෂාත් කර ගැනීමේ මාර්ගයක් ලෙස සැලකුණි. කෙසේ වෙතත්, 2023 ජුනි මාසයේදී, මුස්ලිම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පනත ප්‍රතික්ෂේප කර, කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් තුරන් කිරීමේ සම්මුතිය (CEDAW) ඇතුළු ශ්‍රී ලංකාවේ දේශීය හා ජාත්‍යන්තර බැඳීම් උල්ලංඝනය කරන බව එක්සත් ජාතීන්ගේ විශේෂඥයින් ප්‍රකාශ කරන නව නිර්දේශ ඉදිරිපත් කළහ.[396]

ඉස්ලාමීය දේවධර්ම නායකත්වය වන සියලුම ලංකා ජමායත්තුල් උලමා (ACJU) MMDA පනත ප්‍රතිසංස්කරණය පිළිබඳ ප්‍රගතිය අඩපණ කිරීමේ කාර්යයක් ඉටු කර ඇති බව තේරුම් ගෙන ඇත්තේ, මුස්ලිම් ප්‍රජාවේ කොටස් පිරිමින් සහ කාන්තාවන් යන දෙපිරිසම අතර සැකය ද[397] මේ සඳහා දායක වී ඇත. ප්‍රතිසංස්කරණයට විරෝධය දැක්වූ කාන්තාවන් අතර, බොහෝ දෙනෙකුට වෙනස්කම් මොනවාද යන්න පිළිබඳ දැනුවත්භාවයක් නොමැති බවත්, ඒ පිළිබඳ අවබෝධයක් අඩු බවත්, එය ඔවුන් මත පටවා ඇති බව හැඟෙන බවත් තේරුම් ගෙන ඇත.[398]

---

392 මොහමඩ් ෆස්ලාන් (අන්‍යතා දේශපාලනය සහ අන්තවාදීකරණය පිළිබඳ අවධානය යොමු කළ අකාඩමිකයා), ජොවිටා අරුලානන්තම් විසින් සම්මුඛ සාකච්ඡාව, නොවැම්බර් 24, 2024, දුරස්ථවර් හියුමන් රයිට්ස් වොච්, "සෞදි අරාබිය: සෞදි කාන්තාවන් සඳහා වැදගත් ප්‍රගතීන්", අගෝස්තු 2, 2019 https://www.hrw.org/news/2019/08/02/saudi-arabia-important-advances-saudi-women

393 ලෝක සෞඛ්‍ය සංවිධානය, ස්ත්‍රී ලිංගේන්ද්‍රිය විකෘති කිරීම: ප්‍රධාන කරුණු, (ලෝක සෞඛ්‍ය සංවිධානය. පෙබරවාරි, 2024), https://www.who.int/news-room/fact-sheets/detail/female-genital-mutilation [ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රජාවන් අතර ස්ත්‍රී ලිංගේන්ද්‍රිය චර්මච්ඡේදනය/කැපීම ලෙස ද හැඳින්වේ]

394 ෂරීන් සරූර්, කාන්තා ශරීර මත යුද්ධ කිරීම, 28 මොහමඩ් ෆස්ලාන්, සම්මුඛ සාකච්ඡාවරි නබීලා ඉක්බාල් (නිර්මාතෘ / සම-අධ්‍යක්ෂ, සිස්ටර්හුඩ් ඉනිෂියේටිව්), ජොවිටා අරුලානන්තම් විසින් සම්මුඛ සාකච්ඡාව, නොවැම්බර් 25, 2024, දුරස්ථව

395 මුස්ලිම් පුද්ගල නීති ප්‍රතිසංස්කරණ ක්‍රියාකාරී කණ්ඩායම (MPLRAG), "ප්‍රකාශය: MMDA ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයේ නොමැති බවට අමාත්‍ය විජිත හේරත්ගේ අදහස් දිගුකාලීන වෙනස්කම් සඳහා වූ ඉල්ලීම් හඳුනා ගැනීමට අසමත්වේ", නොවැම්බර්7,2024, https://www.mmdasrilanka.org/statement-minister-vijitha-heraths-comments-that-mmda-reforms-are-not-on-the-agenda-fails-to-recognize-long-standing-demands-for-change/

396 එක්සත් ජනපද ජාත්‍යන්තර ආගමික නිදහස පිළිබඳ කොමිෂන් සභාව, ශ්‍රී ලංකාවේ ආගමික සුළුතර කණ්ඩායම් සඳහා අඩුවන අවකාශය, (වොෂිංටන්, DC, 2024), https://www.uscirf.gov/sites/default/files/2024-06/2024%20Sri%20Lanka%20Country%20Update.pdf, 4

397 ෂරීන් සරූර්, සම්මුඛ සාකච්ඡාවරි නබීලා ඉක්බාල්, සම්මුඛ සාකච්ඡාවරි මොහමඩ් ෆස්ලාන්, සම්මුඛ සාකච්ඡාව

398 නබීලා ඉක්බාල්, සම්මුඛ සාකච්ඡාව

ශ්‍රී ලංකාවෙන් පිටත ජීවත්වන මුස්ලිම් ප්‍රජාවේ කොටස් ශ්‍රී ලංකාවේ ප්‍රජාවන් කෙරෙහි බලපෑම් කර ප්‍රතිසංස්කරණවලට විරෝධය දැක්වීමට පෙළඹවීම පිළිබඳව ද සැලකිලිමත් වී ඇත. ශ්‍රී ලංකාවෙන් පිටත ආරම්භ වූ ප්‍රතිසංස්කරණ විරෝධී ව්‍යාපාර MMDA පනත ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය දුර්වල කරමින් අන්තර්ගතය ප්‍රචාරය කිරීම දිගටම කරගෙන යන අතර, ඒ සඳහා සම්බන්ධ සංවිධාන සහ ක්‍රියාකාරිකයින් වෙන් කර ඉලක්ක කර ඇත.[399] විදේශ ඇමති විජිත හේරත් නොවැම්බර් මාසයේ "මේ අවස්ථාවේ MMDA පනත සංශෝධනය කිරීමට තීරණයක් හෝ අවශ්‍යතාවක් නොමැත" යන ප්‍රකාශය ප්‍රතිසංස්කරණවාදීන් කලකිරීමට පත් කළද, කාන්තා අගමැතිවරියක් සිටින නව රජය ප්‍රතිසංස්කරණ සඳහා වඩා හොඳ පරිසරයක් ඇති කිරීමට සහාය වනු ඇති බවට සමහර විශ්වාසයක් පළ කර ඇත.[400]

## 4. වෙනස්කම් නොඉවසීම

සමහර ව්‍යාපාර සහ නිකායන්හි නිරීක්ෂණය කරන ලද ප්‍රවණතා සහ ආගමික භාවිතයන් සමගම, සියලු ආගම්වල ප්‍රධාන පෙළේ ආගමික ආයතන ද පක්ෂග්‍රාහී ස්ථාවරයන් අනුගමනය කර ඇත.

බොහෝ ආගමික ආයතන එම ආගමික විශ්වාසයන් හා නොගැලපෙන අය මත තම පෞද්ගලික ආගමික වටිනාකම් බලෙන් පැනවීම සම්බන්ධයෙන් වරදකරුවන් වන අතර, වෙනස්කම් ඉවසීමට අසමත් වෙති. LGBTIQ+ පුද්ගලයින්ට බලපාන පැරණි නීති ප්‍රතිසංස්කරණය කිරීමේ උත්සාහයන්ට විරෝධය දැක්වීමේදී ආගමික පූජකවරුන්ගේ කාර්යභාරය එම හෙළි කරයි.

ජූලි මාසයේදී, කතෝලික සභාවේ ප්‍රධානියා ඇතුළු ආගමික පූජක පිරිසක් ස්ත්‍රී පුරුෂ සමානාත්මතා පනත, කාන්තා සවිබල ගැන්වීමේ පනත සහ සමලිංගිකත්වය අපරාධීකරණය නොකිරීම සඳහා දණ්ඩ නීති සංග්‍රහයට යෝජිත සංශෝධනය ඇතුළු යෝජිත පනත්වලට විරෝධය පළ කළහ. "පිරිහෙන හා අසදාචාරාත්මක LGBTQ නීති, සභ්‍යත්ව සමාජය විනාශ කරයි" යන මැයෙන් පැවැත්වූ ඒකාබද්ධ මාධ්‍ය සාකච්ඡාවකදී, ඔවුන් සම්ප්‍රදායික පවුල් න්‍යෂ්ටිය පමණක් පිළිගත් ව්‍යුහයක් ලෙස අනුමත කළ අතර, සමලිංගිකත්වය අපරාධීකරණය නොකිරීම 'ශ්‍රී ලංකා ශිෂ්ටාචාරය හා සමාජය විනාශ කරනු ඇති' බවට අනතුරු ඇඟවූහ.[401] මෙම සන්දර්භයේදී සැලකිය යුතු කරුණක් නම් කාන්තා සවිබල ගැන්වීමේ පනතට එරෙහිව තීන්දුව ලබා දීමේදී අධිකරණය විසින් ආගමික නිදහස ද සැලකිල්ලට ගන්නා ලද බවයි. [1 වන පරිච්ඡේදය, 5 වන කොටස බලන්න]

සිවිල් සමාජය සහ සම්මුඛ සාකච්ඡාවලට භාජනය වූ ආගමික පූජකවරුන් හැඟුණේ ආගමික නායකයින් තම සාමාජිකයින් සාම්ප්‍රදායික පවුල් ව්‍යුහයන් කෙරෙහි නීති ප්‍රතිසංස්කරණවල දැනෙන බලපෑම පිළිබඳව බෙදා හදා ගන්නා සැලකිලිමත්වීම් ප්‍රකාශ කරන බවයි.[402] කෙසේ වෙතත්, මෙම සංවාදවලදී කතෝලික සභාවේ

399 එම

400 අජිත් සිරිවර්ධන, "මුස්ලිම් විවාහ හා දික්කසාද පනත වෙනස් නොකෙරේ: ඇමති", ඩේලි මිරර්, නොවැම්බර් 6, 2024. https://www.dailymirror.lk/breaking-news/Muslim-Marriage-and-Divorce-Act-will-not-be-changed- Minister/108-295360; මහාචාර්ය ෆර්සානා හනීෆා, (කොමසාරිස්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව), ජොවිටා අරුලානන්තම් විසින් සම්මුඛ සාකච්ඡාව, දෙසැම්බර් 5, 2024

401 යෝහාන් පෙරේරා, "ආගමික නායකයින් පනත් තුනක් ඉල්ලා අස් කර ගැනීමට කැඳවයි", ඩේලි මිරර්, ජූලි 26, 2024, https://www.dailymirror.lk/print/front-page/Religious-leaders-call-for-withdrawal-of-three-Bills/238-288110; "ශ්‍රී ලංකාවේ සමලිංගිකත්වය ප්‍රවර්ධනය කරන පනත්වලට ආගමික නායකයින් විරුද්ධ වෙති", ජූලි 26, 2024, https://www.ucanews.com/news/faith-leaders-oppose-bills-promoting-homosexuality-in-sri-lanka/105856a

402 පියතුමා රෝහාන් ද සිල්වා, සම්මුඛ සාකච්ඡාව; ශ්‍රී ලංකාවේ ආගමික නිදහස පිළිබඳ තත්ත්වය පිළිබඳ අධ්‍යයනය, NCEASL සාකච්ඡා කණ්ඩායම.

මුලස්ථානය වැනි ආගමික ආයතන විසින් ගන්නා ලද උදාර හා ඉවසිලිවන්ත ස්ථාවරය ද මතු කෙරිණි. 2023 දී සිදු කළ සම්මුඛ සාකච්ඡාවකදී, පාප් ෆ්‍රැන්සිස් සමලිංගික සබඳතා අපරාධීකරණය කරන නීති අවසන් කිරීම සඳහා ඇත්ත වශයෙන්ම කතෝලික සභාව තවත් දේ කළ යුතු බව ප්‍රකාශ කළේය.[403]

පසුගිය වසරේදී, ලිංගික නැඹුරුව හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය හා වෙනස්කම්වලින් ආරක්ෂා වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ ස්වාධීන විශේෂඥයා පැවසුවේ ආගමික විශ්වාසයන් නිතර LGBT පුද්ගලයින්ගේ අයිතිවාසිකම්වලට එරෙහිව පිහිටුවා ඇති බවත්, අභ්‍යන්තර ගැටුමක් පිළිබඳ හැඟීමක් ඇති කරන බවත්ය. "පක්ෂග්‍රාහීත්වයේ ප්‍රචණ්ඩ හා වෙනස්කම් කරන ස්ථාවරයන් ආගමික හෝ වෙනත් විශ්වාසයන්ගේ ජාත්‍යන්තර නීතිමය ආරක්ෂාවන්ට ඔබ්බෙන් පවතී" යන ඔහුගේ අදහස් මෙම අධ්‍යයනය සඳහා සිදු කරන ලද සම්මුඛ සාකච්ඡා කිහිපයක්ම තුළ ප්‍රතිරාවය වී ඇත.[404]

## 5. ස්වයංව නම්කරගත් ගුරුවරුන් සහ දේශකයන්

වැඩි ඉවසීමක් සඳහා වූ අවශ්‍යතාවය පිළිබඳ සාකච්ඡා, විශේෂයෙන් බෞද්ධාගම ඇතුළු ආගම් 'විකෘති' කරන බවට චෝදනා ලබන නව ආගමික ගුරුවරුන් සහ දේශකයන් මතුවීම වර්ධනය වී ඇත. [1 වන පරිච්ඡේදය, 3.4 කොටස බලන්න] ඇතැමුන් වැඩි පාලනයක් සහ නියාමනයක් ඉල්ලා ඇති අතර, අනෙක් අය ඉවසීම සහ වැඩිපුර සාකච්ඡාවන් ඉල්ලමින් තර්ක කර ඇත.

මෙම වසර තුළ, බෞද්ධ ධර්මය පදනම් කරගෙන දේශනා කළ නමුත් බුදු දහම විකෘති කරන බවට වාර්තා වූ ස්වයං ප්‍රකාශිත ගිහි දේශකයින් දෙදෙනෙකුගේ සිද්ධීන් පිළිබඳ වාර්තා වී ඇත. කනගාටුදායක ලෙස, එක් දේශකයෙකු ජනවාරි මාසයේ සිදු වූ සමූහ සියදිවි නසා ගැනීමකට සම්බන්ධ වී තිබුණි. ජූලි මාසයේදී, "ජාතික උරුමය සුරැකීම සඳහා ක්‍රියාත්මක වන පාර්ලිමේන්තු සංසදයක්" විසින් "ශ්‍රී ලංකා ඉතිහාසය මෙන්ම බුදු දහම ද විකෘති කරන" මධ්‍යස්ථාන 12ක් සහ "බෞද්ධ දහම විකෘති කරන" 85 දෙනෙකු සහ රටේ "ව්‍යාජ භික්ෂූන්" සිටින බවට චෝදනා කරන ලදි.[405]

මෑත සිදුවීම් මාධ්‍ය අවධානයට යොමු වීමට පෙර පවා විකල්ප දේශකයින්ගේ ක්‍රියාකාරකම් බෞද්ධ නායකත්වයේ සලකා බැලීම යටතේ දිගු කලක් තිස්සේ පැවති බව පෙනේ. මෙම කනස්සල්ලට විසඳුම් සැපයිය හැකි යම් යම් පනත් කෙටුම්පත් ඉදිරියට ගෙන යාම සම්බන්ධයෙන් රජය සමග අඛණ්ඩ සාකච්ඡා සහ සම්බන්ධතා පවත්වා ඇති බව පෙනේ [පරිච්ඡේදය 1, කොටස 3.4 බලන්න].[406] කෙසේ වෙතත්, මෑත කාලීන සිදුවීම් පිළිබඳව සැලකිලිමත් වූ බෞද්ධ ධුරාවලිය ශ්‍රී ලංකාවේ බෞද්ධ නිකාය තුනේම මහානායක

403 පියතුමා රෝහාන් ද සිල්වා, සම්මුඛ සාකච්ඡාව; එලිසබෙටා පැවොලේඩෝ, "පාප් වහන්සේ ෆ්‍රැන්සිස් පවසන්නේ සමලිංගිකත්වය අපරාධයක් නොවන බවයි", නිව් යෝර්ක් ටයිම්ස්, ජනවාරි 25, 2023, https://www.nytimes.com/2023/01/25/world/europe/pope-francis-homosexuality.html

404 වික්ටර් මැඩ්‍රිගල්-බොර්ලොස්, ආගමික නිදහස හෝ විශ්වාසය LGBT පුද්ගලයින් සඳහා සමානාත්මතාවය සමග නොගැලපෙන නොවේ, (විශේෂ ක්‍රියා පටිපාටි: එක්සත් ජාතීන්ගේ මානව හිමිකම්, මහකොමසාරිස් කාර්යාලය, පෙබරවාරි 5, 2024); https://www.ohchr.org/en/press-releases/2023/06/freedom-religion-or-belief-not-incompatible-equality-lgbt-persons-un-expert; මහාචාර්ය ෆර්සානා හනීෆා, සම්මුඛ සාකච්ඡාව; පියතුමා රෝහාන් ද සිල්වා, සම්මුඛ සාකච්ඡාවරී ශ්‍රී ලංකාවේ ආගමික නිදහස පිළිබඳ තත්ත්වය පිළිබඳ අධ්‍යයනය, NCEASL සාකච්ඡා කණ්ඩායම

482 මුක්ද්දසා අබ්දුල් වාහිඩ්, සම්මුඛ සාකච්ඡාවරි මොහොමඩ් ෆයිරූස්, සම්මුඛ සාකච්ඡාව.

ඊට අමතරව, බිය මත පදනම් වූ ප්‍රචාරක ව්‍යාපාර මගින් ප්‍රජාවට හානිකර යැයි සැලකෙන ප්‍රතිපත්තිවලට සහාය දුන්නා යැයි පවසමින් ඡන්ද දායකයින්ව ඇතැම් අපේක්ෂකයින් වෙත සහය දීම වළක්වාලීම සඳහා ප්‍රජාවන් තුළද උත්සාහයේ යෙදී සිටිනු නිරීක්ෂණය විය. ජනාධිපතිවරයාගේ සංධානය වන ජාතික ජනතා බලවේගයේ (NPP) මුස්ලිම් අපේක්ෂකයෙකු LGBTQ+ න්‍යාය පත්‍ර සහ MMDA වෙනස් කිරීම ප්‍රවර්ධනය කළා යැයි පවසමින් ප්‍රමාණවත් උපදෙස් නොමැතිවම චෝදනාවට ලක් කරන ලදි. [3 පරිච්ඡේදය 3.3 කොටස බලන්න][483]

එලෙසම, සැප්තැම්බර් මාසයේදී, මුහුණුපොත ඔස්සේ NPP සාමාජිකයින් විසින් කළා යැයි පැවසෙන ප්‍රකාශ උපුටා දක්වමින්, බුදුදහමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති ස්ථානය නැති කරනු ඇතැයි යන්න පිළිබඳ බියක් ඇති කළේය.[484] බෞද්ධයන්ගෙන් (90%) ක ප්‍රතිශතයක් සහ, රෝමානු කතෝලිකයින්ගෙන් (50%) ක ප්‍රතිශතයක් බුදුදහමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රමුඛත්වය අඛණ්ඩව ලබා දිය යුතු බවට එකඟ වන බව ප්‍රකාශ කෙරෙන NPC සමීක්ෂණය මගින් බුදුදහමට එරෙහිව තර්ජනයක් ඇතැයි යන සාධකයට යම් වටිනාකමක් එකතු කරනු ලබයි.[485]

## 6.2 මැතිවරණයෙන් පසු වෛරී ප්‍රවණතා

පශ්චාත් මැතිවරණ ප්‍රතිඵල සහ නව රජය විසින් ගත් ක්‍රියාමාර්ග ද දෙමළ ප්‍රජාව ඇතුළු ජනවාර්ගික-ආගමික සුළුතරයන් ඉලක්ක කරගත් හානිකර ප්‍රකාශ යළි මතු වීමට හේතුවක් විය.

ජනාධිපතිවරණයේ ප්‍රධාන අපේක්ෂකයෙකු වන සමගි ජන බලවේගයේ (SJB) සජිත් ප්‍රේමදාස, ශ්‍රී ලාංකික දෙමළ, මුස්ලිම් සහ මලයිග දමිළ ජනතාව බහුතරයක් වාසය කරන උතුරු, නැගෙනහිර සහ මධ්‍යම පළාත්වල ඡන්ද ප්‍රතිඵලවල ඉදිරියෙන්ම සිටියේය. ඔවුන් විසින් ජනතාව අතර ජනප්‍රිය අපේක්ෂකයා වන අනුර කුමාර දිසානායකට ඡන්දය නොදීම නිසා, ඔවුන්ගේ දේශපාලන දැනුවත්භාවය සහ පක්ෂපාතීත්වය ප්‍රශ්න කරමින් සමාජ මාධ්‍යය තුළ ඔවුන්ව සමච්චල් කිරීමට ලක් විය.[486] මෙහිදී ඔවුන් වෙත, "නුගතුන්", "හරක්", "බූරුවන්", "කොටි" (දෙමළ ජාතිකයින්ව ත්‍රස්තවාදීන්/LTTE ලෙස හැඳින්වීම), "දෙමළ හැවුත්තා" (දමිළ "බර්ගර් ජනතාව"), "වතුකර දෙමළු" (වතු දෙමළ - මලයිහා දෙමළ ප්‍රජාව වෙත යොමුවීම), සහ "තම්බි" (මුස්ලිම්වරුන් ඉලක්ක කරමින්) වැනි අපහාසාත්මක සහ වාර්ගික අපහාස පුළුල් ලෙස දක්නට ලැබුණි.[487]

විචාරකයින් නිරීක්ෂණය කරන්නේ, දිසානායකගේ ජයග්‍රහණයෙන් පසු සමාජ මාධ්‍යවල ඇති වූ උද්දාමය තුළ, සිංහල ඡන්ද දායකයින්ව සහ NPP ආධාරකරුවන්ව වඩාත් දැනුමැති සහ රටේ සුභසාධනය කෙරෙහි අවධානය යොමු කරන ජනතාව ලෙසත්, සුළුතර ඡන්ද දායකයින්ව නොදැනුවත් හෝ ආත්මාර්ථකාමී අය ලෙස ප්‍රතික්ෂේප කිරීම ද දක්නට ලැබුණු බවයි.[488]

ඇතැම් වෛරී ප්‍රකාශ දෙමළ සහ මුස්ලිම් දේශපාලනඥයින් වෙත ද එල්ල විය. මෙයට මඩකළපුව දිස්ත්‍රික්කයේ

483 හැෂ්ටැග් ජෙනරේෂන් සමාජ මාධ්‍යයේ අහිතකර කථනය පිළිබඳ මාසික වාර්තාව.

484 ජාතික සාම සභාව, ආගමික නිදහස පිළිබඳ 2024 සමීක්ෂණය, පිටුව 42.

485 නාලක ගුණවර්ධන, සම්මුඛ සාකච්ඡාවරී මුක්ද්දසා අබ්දුල් වාහිඩ්, සම්මුඛ සාකච්ඡාවරී හැෂ්ටැග් ජෙනරේෂන්, කේන්ද්‍රික කණ්ඩායම.

486 හැෂ්ටැග් ජෙනරේෂන්, සමාජ මාධ්‍යයේ අහිතකර කථනය පිළිබඳ මාසික වාර්තාව.

487 මුක්ද්දසා අබ්දුල් වාහිඩ්, සම්මුඛ සාකච්ඡාවරී දෙවක සෙනානයකේ, "ශ්‍රී ලංකාවේ ජනාධිපති මැතිවරණය ප්‍රදේශමය බෙදුම්කාරකය අසුරන ලදි," ද ඩිප්ලෝමට්, 2024 ඔක්තෝබර් 19, https://thediplomat.com/2024/10/sri-lankas-presidential-election-reflected-a-regional-divide/.

488 හැෂ්ටැග් ජෙනරේෂන් සමාජ මාධ්‍යයේ අහිතකර කථනය පිළිබඳ මාසික වාර්තාව.

මුස්ලිම්වරුන්ට එරෙහිව වෛරය ඇවිස්සීම වෙනුවෙන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ සිවනේෂතුරෙයි චන්ද්‍රකාන්තන් හෙවත් පිල්ලෙයාන් [2 පරිච්ඡේදය 7 කොටස] සහ උතුරේ ඇතැම් සිවිල් සමාජ සහ දේශපාලන කණ්ඩායම් විසින් "පොදු දෙමළ අපේක්ෂකයෙකු" ලෙස හඳුන්වා දුන් පී. ආරියනේත්තිරන් ද ඇතුළත් වේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන රිෂාඩ් බදියුදීන් සහ රවුෆ් හකීම් වැනි පුද්ගලයින් වෙත "තම්බියා" වැනි අපහාසාත්මක යෙදුම් යොදමින් වෛරී ප්‍රකාශවල ඉලක්ක බවට පත් කර ගන්නා ලදී.[489]

පාර්ලිමේන්තු මැතිවරණයේදී ජනාධිපතිවරයාගේ සංධානය වන NPP විසින් තුනෙන් දෙකක බහුතරයක් දිනාගත් අතර, එහිදී සුළුතර ඡන්ද ප්‍රකාශ වූ ආකාරයේ වෙනසක් දක්නට ලැබිණි. ශ්‍රී ලංකා ඉතිහාසයේ ප්‍රථම වරට, උතුරේ බහුතරයක් දෙනා විසින් වැඩි සිංහල-බෞද්ධ පදනමක් සහිත පක්ෂයකට තම ඡන්දය ප්‍රකාශ කරන ලදි. මලයිග දෙමළ ජනතාව බහුතරයක් වෙසෙන මධ්‍යම පළාත තුළ ද සැලකිය යුතු ජයග්‍රහණ ලබා ගැනීමට NPP සමත් විය.[490] කෙසේ වෙතත්, සුළුතර ඡන්ද රටාවේ වෙනස් වීම - එය දැන් බහුතරයගේ හැඟීම් සමඟ වඩාත් සමපාත වී ඇති - නිසා එම ප්‍රජාවන් තුළින්ම මුස්ලිම් ජාතිකයින්ට සහ දෙමළ ජාතිකයින්ට ඉලක්කගත ප්‍රහාර ඇති කරවන ලදි.

නොවැම්බර් මාසයේදී, උතුරු, නැගෙනහිර සහ මධ්‍යම පළාත්වල ඡන්ද දායකයින් විසින් සාම්ප්‍රදායික සුළුතර පක්ෂ පහළට ඇද දැමූ බවට චෝදනා කරමින් සමාජ මාධ්‍යවල ඔවුන්ට එරෙහිව වෛරී ප්‍රචාරක ව්‍යාපාර ක්‍රියාත්මක වනු දක්නට ලැබුණි. අනෙක් අතට, මාධ්‍ය විශේෂඥයින් නිරීක්ෂණය කරන්නේ, මුස්ලිම් ජාතිකයින් විශාල ප්‍රමාණයක් NPP සඳහා ඡන්දය ප්‍රකාශ කළ නමුත්, පසුව තම ප්‍රජාව වෙනුවෙන් අමාත්‍ය ධුරයක් ලබා ගැනීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් ද වෛරී ප්‍රකාශවලට මුහුණ දුන් බවයි.[491] මාර්ගගත මුස්ලිම් සමාජය තුළින් පැමිණි විවේචන ද සමඟ ඉන් පිටත සිටින මුස්ලිම්වරුන්ගේ සමච්චලයට භාජනය වීමටද සිදු විය. අලුතින් පත් කළ කැබිනට් මණ්ඩලයෙහි මුස්ලිම් නියෝජනයක් නොමැතිකම සමරමින් සමාජ මාධ්‍යය තුළ විවිධ අදහස් දක්නට ලැබුණු අතර, සමහරු එය ශ්‍රී ලංකාවේ ඉතිහාසයේ "පිරිසිදුම" කැබිනට් මණ්ඩලය ලෙසද ප්‍රකාශ කරන ලදී.[492]

මැතිවරණයෙන් පසු ගැටුම්කාරී වාතාවරණයක් ඇති කිරීම උදෙසා වැරදි තොරතුරු, කටකතා සහ සමහර ප්‍රචාරක ව්‍යාපාර ද විශාල භූමිකාවක් ඉටු කළේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බුදුදහමට ප්‍රමුඛත්වය ලබා දෙන වගන්ති ඉවත් කිරීම පිළිබඳ කටකතා මගින් NPP ට එරෙහිව වෛරී ප්‍රකාශ රැල්ලක් ඇති කළ අතර, බෞද්ධයන් ඔවුන්ට ලැබී ඇති ප්‍රමුඛත්වය අහිමි වීමේ බියකින් පසු වුහ.[493] එලෙසම, ජනාධිපති දිසානායක විසින් අත්සන් කරන ලදැයි පැවසෙන, මාවීරර් නාල්-මහවිරු දිනය සැමරුමට සීමාවන් නොමැති බව ප්‍රකාශ කරන ලිපියක් සමාජ මාධ්‍යවල සංසරණය වීම [2 පරිච්ඡේදය 3 කොටස බලන්න] සහ නුවර පෙරහැර[494] අවලංගු කිරීම පිළිබඳ කටකතා ද රජයට එරෙහි වෛරී ප්‍රකාශ සහ විවේචන ඇවිස්සීමට හේතු විය.[495]

---

489 ආර්.කේ. රාධාක්‍රිෂ්ණන්, "ශ්‍රී ලංකාව NPP පක්ෂයට ඉතිහාසමත් අධික බහුතරයක් ලබා දී දෙසනායකගේ අධිසංස්කරණ වැඩසටහනට සහය දක්වයි," ද හින්දු, 2024 නොවැම්බර් 15, https://frontline.thehindu.com/news/sri-lanka-election-2024-npp-victory-dissanayake-reforms-tamil-support-parliament-majority-economic-agenda/article68871257.ece.

490 හැෂ්ටැග් ජෙනරේෂන් සමාජ මාධ්‍යයේ අහිතකර කථනය පිළිබඳ මාසික වාර්තාව; මොහොමඩ් ෆයිරූස්, සම්මුඛ සාකච්ඡාව.

491 හැෂ්ටැග් ජෙනරේෂන්, සමාජ මාධ්‍යයේ අහිතකර කථනය පිළිබඳ මාසික වාර්තාව.

492 රම්කුමාර් රවීච්චන්ද්‍රසර්මා, සම්මුඛ සාකච්ඡාව.

493 බුද්ධ ශ්‍රද්ධා පූජාවක සංකේතයක් වන දෙස්සිම් දන්තධාතු පිළිබඳව ගෞරව දැක්වීම සඳහා පැවැත්වෙන බෞද්ධ කැලැන්ඩරයේ ප්‍රධාන උත්සවයකි.

494 මොහොමඩ් ෆයිරූස්, සම්මුඛ සාකච්ඡාව.

495 නාලක ගුණවර්ධන, ශ්‍රී ලංකා මාධ්‍ය පරිශීලක අධ්‍යයනය 2019: අප්‍රසන්න කාලයකදී පුවත් පරිභෝජනය, (අන්තර්ජාතික මාධ්‍ය සහාය ආයතනය, 2020 නොවැම්බර්), https://www.mediasupport.org/wp-content/uploads/2021/02/Sri-Lanka-Media-Audience-Study-2019-Low-Res.pdf, පිටු 23-24.

# 7. ජනවාර්ගික-ආගමික කණ්ඩායම් සහ උද්ගත වී ඇති ගැටලු පිළිබඳ මාධ්‍ය නිරූපණය

වර්තමානය වන විට සමාජ මාධ්‍යවල ජනප්‍රියත්වය වැඩි වී ඇති අතර, එය ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස (FoRB) සම්බන්ධ කාරණා පිළිබඳ දිශානතියේ ක්ෂණික හරස්කඩක් ලබා දීමට උපකාරී වුවද, තවමත් ශ්‍රී ලංකාව තුළ සාම්ප්‍රදායික මාධ්‍ය, ප්‍රවෘත්ති දර්ශකවල ප්‍රමුඛ ස්ථානයක් ගනී. 2019 දී කළ සමීක්ෂණයකින් හෙළි වූයේ 96%ක් පමණ ප්‍රවෘත්ති සඳහා නිතිපතා රූපවාහිනිය නරඹන බවයි.[496] එසේම 2024 මුද්‍රිත පුවත්පත් පාඨකයින් පිළිබඳ කළ සමීක්ෂණයකින් රැස් කරගත් තොරතුරු අනුව හෙළි වූයේ මුද්‍රිත මාධ්‍ය "වැඩිහිටි, වඩාත් උගත් සහ නාගරික පුද්ගලයින්" අතර විශේෂයෙන් ජනප්‍රියව පවතින බවයි.[497] සාම්ප්‍රදායික මාධ්‍ය සමග පොදු ජනතාවගේ ඇති සම්බන්ධය සහ පොදු ජන මනස කෙරෙහි ඉන් ඇති කරන බලපෑම පිළිබඳ සැලකිල්ලට ගෙන, ජනවාර්ගික-ආගමික කණ්ඩායම් සහ ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස (FoRB) සම්බන්ධ කාරණා පිළිබඳ මාධ්‍ය විසින් නිරූපණය කරන ආකාරය සමාලෝචනය කිරීම ඉතා ප්‍රයෝජනවත් වේ.

## 7.1 මාධ්‍ය හිමිකාරිත්වය, බහුජනහිතාය සහ අපක්ෂපාතීත්වය

සමාජ මාධ්‍යවල ජනවාර්ගික-ආගමික ප්‍රජාවන් ඉලක්ක කරගත් වෛරී ප්‍රකාශවල පහත වැටීමේ රටාවන් සමග යමින්, දේශපාලන වේදිකාවල සහ මාධ්‍ය ආවරණ තුළ ද සිදු වන වෛරී ප්‍රකාශවල යම් අඩුවීමක් දක්නට ලැබෙන මාධ්‍ය විශ්ලේෂකයින් සටහන් කරති.[498] මෙම ධනාත්මක වෙනස එසේ තිබියදීත්, ශ්‍රී ලංකාවේ පවතින සාම්ප්‍රදායික මාධ්‍ය ප්‍රවණතා විසින් ජනවාර්ගික-ආගමික කණ්ඩායම්වල පැරණි යල් පැන ගිය අදහස් දිගටම පවත්වා ගෙන යමින්, FoRB සම්බන්ධ කාරණා පිළිබඳ වගකීම් සහගත වාර්තාකරණයක් සිදු කිරීමට බාධා කරයි.

ශ්‍රී ලංකාවේ මාධ්‍ය ආයතන හිමිකාරිත්වයේ ස්වභාවය අනුව එම මාධ්‍යය විසින් බහුතරය ගැන නොසලකමින් සහ අපක්ෂපාතීත්වය අවතක්සේරු කරමින්, දැඩි පක්ෂග්‍රාහීත්වයෙන් යුක්තව යම් සාම්ප්‍රදායික අදහස් ප්‍රවර්ධනය කිරීමට යොමු වීම ප්‍රධාන ගැටලුවක් වී ඇති බව මාධ්‍ය නිරීක්ෂණ ආයතන විසින් ප්‍රකාශ කර තිබේ.[499] මෙය ඉස්මතු කරමින්, 2018 Verité ආයතනය මගින් කළ අධ්‍යයනයකින් නිගමනය කරන ලද්දේ, දේශපාලනික වශයෙන් ස්වාධීන මාධ්‍යකරණයක් වෙත ප්‍රවේශ වීමේ හැකියාව ඇත්තේ ශ්‍රී ලාංකික පුරවැසියන් පස් දෙනෙකුගෙන් එක් අයෙකුටත් අඩුවෙන් පමණක් වන බවයි.[500] රාජ්‍ය හිමිකාරිත්වය යටතේ පවතින මාධ්‍ය, එම අංශයේ ප්‍රමුඛ ස්ථානයක් ගන්නා අතර සාමාන්‍යයෙන් ඒවා පාලක පක්ෂයේ ප්‍රචාරක අංශ ලෙස සැලකේ. එහි සිටින මාධ්‍යවේදීන්ට හිමි ස්වාධීනත්වය ද අඩුය.[501]

---

496 ගයන් මදුෂංක ආදීන්, ශ්‍රී ලංකාවේ මුද්‍රණ මාධ්‍ය පාඨකයින්ගේ සමීක්ෂණය 2024: ජනසංඛ්‍යාත්මක දත්ත, අන්තර්ගත කැමැත්ත සහ විශ්වාසනීය පාඨක පදනමක් සඳහා හැසිරීම් තොරතුරු, (වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ චිත්‍රපට හා දුරදර්ශන නිෂ්පාදන තාක්ෂණ දෙපාර්තමේන්තුව, 2024 ඔක්තෝබර්), https://www.researchgate.net/publication/384928539_Print_Media_Readership_Survey_2024_in_Sri_Lanka_Demography_Content_Preferences_and_Behavioral_Insights_for_a_Loyal_Readership_Base, පිටු 19-22.

497 දීපංජලි අබේවර්ධන විසින් කළ ප්‍රකාශයක්, අමාන්ථ පෙරේරා විසින් උපුටා දැක්වූ ලෙස, "ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික මාධ්‍යය පරණ දේශපාලන පන්තිය සමග එකට විසිවීමේ අවදානමකින් යුක්තයි," හිමාල් සවුත්ආසියන්, 2024 දෙසැම්බර් 4, https://www.himalmag.com/politics/sri-lanka-media-freedom-politics-memes-aragalaya-protests-election.

498 "මාධ්‍ය පරිසරය: ශ්‍රී ලංකාව 2024," රෙපෝටර්ස් විතාඕට් බෝඩර්ස්, 2025 ජනවාරි 25 දින ප්‍රවේශ වූවකි, https://rsf.org/en/country/sri-lanka.

499 "මාධ්‍ය හිමිකාරීත්ව මොනිටරය ශ්‍රී ලංකාව - 2018," වෙරිටේ රිසර්ච්, 2018 නොවැම්බර් 8, https://sri-lanka.mom-gmr.org/.

500 අමාන්ථ පෙරේරා, "ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික මාධ්‍යය පරණ දේශපාලන පන්තිය සමග එකට විසිවීමේ අවදානමකින් යුක්තයි."

501 "ශ්‍රී ලංකා මාධ්‍ය මාර්ගෝපදේශය," බීබීසී නිවුස්, 2024 ඔක්තෝබර් 4, https://www.bbc.com/news/world-south-asia-12000330.

එලෙසම, පෞද්ගලික හිමිකාරීත්වය යටතේ පවතින මාධ්‍ය සංවිධාන ද රජයට පක්ෂව හෝ විපක්ෂයට පක්ෂව, ඒවායේ හිමිකරුවන් විසින් අනුගමනය කරන අන්තර්ගතයන් ඉදිරිපත් කරයි. මෙහිදී රූපවාහිනී ප්‍රේක්ෂකයින්ගෙන් වැඩි කොටසක් පෞද්ගලික අයිතිය යටතේ ඇති නාලිකාවලට ආකර්ෂණය වන බව සැලකිල්ලට ගත යුතුය.[502] මාධ්‍ය විශ්ලේෂකයින් පවසන්නේ රටේ මාධ්‍ය වෙළඳපොළ ඉතා සුළු පිරිසක් අතර මධ්‍යගත වී ඇති බවත්, බලගතු කණ්ඩායම් කිහිපයක් විසින් සියලුම මාධ්‍ය වේදිකාවල (රූපවාහිනී, ගුවන්විදුලි, මුද්‍රිත සහ සමාජ මාධ්‍ය ආදී ලෙස) හිමිකාරීත්වය දරන බවත්ය.[503] ඊට අමතරව, ලැබී ඇති දත්ත අනුව මුද්‍රිත මාධ්‍යවල සිටින ඉහළම හිමිකරුවන් සිව්දෙනා හට සමස්ත පාඨක ප්‍රතිශතයෙන් 75%ක වැඩි කොටසක් ඇත.[504] මේ නිසා ඔවුන්ට පොදු ජන මතය පාලනය කිරීමට, වාර්තාකරණයේ විවිධත්වය අඩු කිරීමට සහ පක්ෂග්‍රාහී බව වැඩි කිරීම සඳහා වැඩි බලයක් ලැබෙන බවත් විශ්ලේෂකයින් පවසති.[505]

මෙම ක්‍රමය විශේෂයෙන්ම ඩයස්පෝරා මාධ්‍ය අතර ද පැහැදිලිව පෙනෙන බව නිරීක්ෂණය කර තිබේ. එම මාධ්‍ය බහුතරයක් ඔවුන්ට අවශ්‍ය කරන විශේෂිත න්‍යාය පත්‍ර පදනම් කර ගෙන තම වැඩසටහන් සකස් කර ඇත.[506] මෙම වසරේ දෙමළ ඩයස්පෝරා විසින් පාලනය කරන ලද ප්‍රවෘත්ති වෙබ් අඩවි පිළිබඳ කරන ලද කෙටි දළ විශ්ලේෂණයකින් හෙළි වී ඇත්තේ යුධ සමයේ සිදු වූ සිදුවීම් සම්බන්ධයෙන් යුක්තිය සහ වගවීම සඳහා බල කිරීම වෙනුවෙන් දැඩි අවධානයක් යොමු කර ඇති බවත්, ඒත් සමගම මහජනතාව අතර දෙමළ ජාතිකවාදය ජනප්‍රිය කිරීමට අදහස් කරන මාධ්‍යකරණයක් භාවිතා වී ඇති බවත්ය. මේවාට LTTE නායකයින් සිහිපත් කිරීමේ අනුස්මරණ උත්සව සහ යුද්ධයට සම්බන්ධ දෙමළ සැමරුම් උත්සව පුළුල් ලෙස ආවරණය කිරීම ඇතුළත් වේ.

මුස්ලිම් ඩයස්පෝරා කණ්ඩායම් විසින් සහාය දක්වන මාධ්‍ය මගින්, MMDA ප්‍රතිසංස්කරණ විරෝධී ආඛ්‍යාන ප්‍රවර්ධනය කරන බවත්, එම ක්‍රියාකාරීන් ඉස්ලාමීය මූලධර්මවලට ද්‍රෝහී වුවන් ලෙස හඳුන්වමින්, ඔවුන්ගේ අදහස් වෙනස් කිරීමට බිය මත පදනම් වූ මාධ්‍යකරණයක් භාවිතා කරන බවත් නිරීක්ෂණය කර ඇත. [3 පරිච්ඡේදය, 3.3 කොටස බලන්න] එවැනි ක්‍රියාකාරීන් බොහොමයක් කීර්තිය හානි කිරීමේ වැඩසටහන්වල ඉලක්ක වී ඇති බවත්, ඔවුන්ගේ සදාචාරාත්මක භාවය ප්‍රශ්න කරමින්, ඔවුන් බටහිර දෘෂ්ටිවාදයන්ට යටත් වූ ලෙස චෝදනා එල්ල කරමින් යම් යම් ක්‍රියාන්විතයන් සිදු වී ඇති බවත් හඳුනා ගෙන ඇත.[507]

---

502 හැෂ්ටැග් ජෙනරේෂන් කේන්ද්‍රික කණ්ඩායම; රම්කුමාර් රවීචන්ද්‍රසර්මා, සම්මුඛ සාකච්ඡාව.

503 "මාධ්‍ය හිමිකාරීත්ව මොනිටරය ශ්‍රී ලංකාව - 2018," වෙරිටේ රිසර්ච්.

504 දීපංජලි අබේවර්ධන (මාධ්‍ය පර්යේෂණ කණ්ඩායමේ ප්‍රධානී, වෙරිටේ රිසර්ච්), අමාරා නිලාෆ්දීන් විසින් 2024 ඔක්තෝබර් 29 දින සම්මුඛ සාකච්ඡාව; නාලක ගුණවර්ධන, සම්මුඛ සාකච්ඡාව.

505 හැෂ්ටැග් ජෙනරේෂන් කේන්ද්‍රික කණ්ඩායම; රම්කුමාර් රවීචන්ද්‍රසර්මා, සම්මුඛ සාකච්ඡාව.

506 මුක්ද්දසා අබ්දුල් වාහිඩ්, සම්මුඛ සාකච්ඡාව; "මුස්ලිම් විවාහ හා විවාහ බෙදීම පිළිබඳ පනත: මාර්ගගත සංවාදය සහ සංවාදය සෙවීම," හැෂ්ටැග් ජෙනරේෂන්, 2024 අප්‍රේල් 2, https://hashtaggeneration.org/exploring-the-muslim-marriage-and-divorce-act-navigating-online-discourse-and-dialogue/.

507 නාලක ගුණවර්ධන, ශ්‍රී ලංකා මාධ්‍ය පරිශීලක අධ්‍යයනය 2019: අප්‍රසන්න කාලයකදී පුවත් පරිභෝජනය; "ශ්‍රී ලංකාවේ මාධ්‍යය තුළ ජාතිවාදී හැඳින්වීම් සහ භාෂා භේදය: 'ඇතික්ස් අයි' සහ 'ද ඩිවයිඩ්' මගින් පෙන්වා දුන් ගැටලුව," වෙරිටේ රිසර්ච්, 2021 සැප්තැම්බර්, https://www.veriteresearch.org/wp-content/uploads/2021/09/VR_RB_ENG_Sep2021_Racial-Profiling-and-Language-Polarisation-in-Sri-Lankan-Media-1.pdf.

## 7.2 වියුක්ත මාධ්‍ය

මාධ්‍ය හිමිකරුවන් විසින් ප්‍රවර්ධනය කරන අදහස්වලට අමතරව, ශ්‍රී ලංකාවේ මාධ්‍ය, භූගෝලීය පිහිටීම සහ තම ප්‍රේක්ෂකයින්ගේ මනාපයන් අනුව ද ධ්‍රැවීකරණය වී ඇති බව අධ්‍යයනවලින් සොයා ගෙන ඇත.[508] මෙය ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස (FoRB) බලපාන සිදුවීම් පිළිබඳ වාර්තා කිරීමේදී එයට අනිවාර්යයෙන්ම බලපානු ලබයි.

මෙම ගතිකබව උතුරු සහ නැගෙනහිර ආගමික සිද්ධස්ථාන පිළිබඳ වාර්තා කිරීමේ දී හොඳින් පිළිබිඹු වේ. විශේෂයෙන්ම, සමහර කලාපීය සහ ඩයස්පෝරා අරමුදල් වලින් බලගැන්වෙන මාධ්‍ය ආයතන, අසම්පූර්ණ හෝ අතිශයෝක්තියෙන් යුතු වාර්තා ප්‍රකාශයට පත් කරනු නිරීක්ෂණය වී ඇති බව මාධ්‍ය විශේෂඥයින් අනාවරණය කරති. අනෙක් අතට, සිංහල මාධ්‍යවල වාර්තාකරණය බොහෝ විට ජාතිකවාදී අදහස් ප්‍රවර්ධනය කරන සහ ගෝඨාභය රාජපක්ෂ පරිපාලනය තුළ හැඩගැසුණු ක්‍රමවේදයේම දිගුවක් පෙන්නුම් කරයි [2 පරිච්ඡේදය, 2 කොටස බලන්න].[509]

වවුනියාවේ ආගමික ස්ථානයක් තුළ බාධාවට ලක් වූ මහා ශිවරාත්‍රි උත්සවය පිළිබඳ සිංහල සහ දෙමළ පුවත්පත් වාර්තා කළ ආකාරය තුළ මෙම රටාව පිළිබිඹු වෙන බව වෙරිටෙ මාධ්‍යය (Verité Media) විශ්ලේෂණය කරයි. [2 පරිච්ඡේදය, 2 කොටස බලන්න] සිංහල පුවත්පතක් වන ලංකාදීප විසින් එම සිදුවීම, "අනවසර උත්සවයක්" ලෙස හැඳින්වූ අතර, එය "දෙමළ දේශපාලනඥයන් කණ්ඩායමක්" විසින් සංවිධානය කරන ලද බවත්, ඔවුන් "ප්‍රකෝපකාරී ලෙස හැසිරුණු" බවත් වාර්තා කළේය. අනෙක් අතට දෙමළ පුවත්පතක් වන වීරකේසරී එය වාර්තා කළේ එහි සංවිධායකයන් "පරම්පරා පහක් තිස්සේ ආති ලිංගේෂ්වරාර් දෙවියන් වන්දනා කළ" භක්තිකයින් වන බවත්, ඔවුන් පොලිසිය සමඟ "සහයෝගයෙන්" කටයුතු කරමින් තම "ආගමික චාරිත්‍රවල භක්තිවන්තව" නිරත වූ බවත් ය.[510]

මෙම වසර පුරා, MMDA පනත වටා වූ සිදුවීම් පිළිබඳ මාධ්‍ය වාර්තා කළ ආකාරය මගින් ද මෙම වෙනස හොඳින් පිළිබිඹු කරන ලදි. තෝරාගත් සිංහල සහ දෙමළ රාජ්‍ය රූපවාහිනී නාලිකාවල Verité විසින් කරන ලද පුවත්පත් විශ්ලේෂකයන්ගෙන් හෙළි වූයේ, එවකට කැබිනට් ප්‍රකාශක විජිත හේරත් විසින් රජය මෙම පනතට කිසිදු වෙනසක් සිදු නොකරන බවට කළ ප්‍රකාශය (3 පරිච්ඡේදය, 3.3 කොටස බලන්න), දෙමළ නාලිකාවල ආවරණය කර තිබුණු නමුත් සිංහල නාලිකාවල ආවරණය කර නොතිබූ බවයි.[511] මෙය මුස්ලිම් ජාතිකයින්ට අදාළ ගැටලු පිළිබඳ වාර්තා කිරීම කෙරෙහි සිංහල මාධ්‍යවලින් දැක්වූ උදාසීන බව පෙන්නුම් කරයි.

## 7.3 ජනවාර්ගික-ආගමික කරුණු පිළිබඳ වාර්තාකරණය

මාධ්‍ය කර්මාන්තයේ ඇති මෙම ස්වාභාවයෙන්ම තිබූ සහ පසුව පෝෂණය කරන ලද ජනවාර්ගික-ආගමික කරුණු පිළිබඳ වාර්තා කිරීමේදී සිදු කරන පක්ෂග්‍රාහීත්වය, පාස්කු ඉරිදා ප්‍රහාරවලින් පසුව සහ නැවතත්

508 රම්කුමාර් රවීච්චන්ද්‍රසර්මා, සම්මුඛ සාකච්ඡාවරී නාලක ගුණවර්ධන, සම්මුඛ සාකච්ඡාව.

509 "වවුනියාවේ විවාදස්පද පූජනීය ස්ථානයක්", ද ඩිවයිඩ්, වෙරිටේ මාධ්‍ය, https://media.veriteresearch.org/features/the-divide/contested-sacred-site-in-vavuniya-contested-coverage/, 2025 පෙබරවාරි මාසයේදී ප්‍රවේශ වූවකි.

510 "මුස්ලිම් විවාහ හා විවාහ බෙදීම පිළිබඳ පනත පිළිබඳ රජයේ ස්ථාවරය", ද ඩිවයිඩ්, වෙරිටේ මාධ්‍ය, https://media.veriteresearch.org/features/the-divide/governments-stance-on-the-muslim-marriage-divorce-act-mmda/, 2025 පෙබරවාරි මාසයේදී ප්‍රවේශ වූවකි.

511 "ශ්‍රී ලංකාවේ මාධ්‍යය තුළ ජාතිවාදී හැඳින්වීම් සහ භාෂා භේදය", වෙරිටේ රිසර්ච්.

කොවිඩ්-19 වසංගතය අතරතුර ඉහළට පැමිණි ක්‍රියාදාමයකි.[512] ශ්‍රී ලංකාවේ සංස්කාරක සංසදය විසින් සකස් කරන ලද ආචාර ධර්ම පනතේ සඳහන් වන්නේ මාධ්‍යවේදීන් "ජාතිය, වර්ණය, ආගම පිළිබඳ පූර්ව නිගමන හෝ අපහාසාත්මක යෙදුම්, අදාළ සන්දර්භයට සෘජුවම අදාළ නොවන අවස්ථාවල සිදු නොකළ යුතු" බවයි.[513] කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ මාධ්‍ය විසින්, සන්දර්භයට අදාළ නොවන අවස්ථාවලදී පවා විශේෂයෙන්ම සුළුතරය සම්බන්ධ පුවත්වලදී, සෘණාත්මක ආකාරයකින් අවධාරණය කර ඇති බව අධ්‍යයනවලින් පෙන්නුම් කර ඇත.[514]
මෑත වසරවල මෙම හැසිරීම් ප්‍රශංසනීය ලෙස පහත වැටීමක් දක්නට ලැබුණද, ඇතැම් සිදුවීම්වලින් පෙන්නුම් කරන්නේ මෙම ප්‍රවණතාව මාධ්‍යයෙහි සමහර අංශවල තවමත් දිගටම පවතින බවයි.

මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයන් නිරීක්ෂණය කරන Verité හි එතික්ස් අයි (Ethics Eye) විසින් හෙළි කළ පරිදි, සිංහල ජාතිකවාදී ස්ථාවරයක් දැරීම වෙනුවෙන් ප්‍රසිද්ධ සිංහල භාෂා පුවත්පතක් වන දිවයින මගින්, ආරුගම්බේ ප්‍රදේශයේදී ඊශ්‍රායල් ජාතිකයින් වෙත එල්ල වීමට නියමිත ප්‍රහාරයක් පිළිබඳ වාර්තා කළ අවස්ථාවේදී [2 කොටස සහ 2 පරිච්ඡේදය, 8 කොටස බලන්න] රජයේ පරීක්ෂණවලින් එය අන්තවාදී ප්‍රහාරයක් නොවන බවත්, සංවිධානාත්මක අපරාධවලට සම්බන්ධ ප්‍රහාරයක් බවත් ලෙස හෙළි වුවද, එකී පුවත්පත හරහා එය "ඉස්ලාමීය ත්‍රස්ත කණ්ඩායමක්" විසින් ශ්‍රී ලංකාවේ සිටින ඊශ්‍රායල් ජාතිකයින් වෙත ප්‍රහාරයක් එල්ල කිරීමට නියමිත බව හැඟවෙන සන්දර්භයක සිට එම පුවත වාර්තා කළ බවයි.[515]

හිමිකරුවන්ගෙන් ඇති වන බාධා, පක්ෂග්‍රාහීත්වය සහ පොදු උනන්දුවක් නොමැතිකම වැනි සාධක ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස (FoRB) බලපාන සිදුවීම් ආවරණය කිරීමේදී බලපාන බව පැවසුවත්, ඊට අමතරව එයට සම්පත්, පුහුණුව සහ වෘත්තීයභාවයේ ඌනතාව ද විශාල බලපෑමක් සිදු කරන බව ද හඳුනා ගෙන ඇත. පුවත් සත්‍යාපනය කරන වේදිකාවලට බොහෝ අවස්ථාවල සම්පත්, පුද්ගලයින් සහ වේගවත් ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය යාන්ත්‍රණවල අඩුවක් පවතින බවත්, එම නිසා වැරදි තොරතුරු නිවැරදි කිරීමට ප්‍රථමව ඒවා පුළුල් ලෙස ව්‍යාප්ත වන බවත් මාධ්‍ය විශේෂඥයින් පවසති.[516] මෙය අවසානයේ වාර්තාකරණයේ ගුණාත්මකභාවය සහ සමතුලිතතාවයට බලපාන අතර, පක්ෂග්‍රාහීබව වෙත සහ ආචාර ධර්ම ප්‍රමිතීන් අඩු වීමට හේතු වේ.[517] කෙසේ වෙතත්, නව NPP පරිපාලනය, මාධ්‍ය කර්මාන්තයට බලපාන ප්‍රධාන ගැටලු විසඳීම කෙරෙහි යම් උනන්දුවක් පෙන්නුම් කර ඇත. මෙය එහි මැතිවරණ ප්‍රකාශනයේ ද ඉස්මතු කර ඇති අතර, එහිදී පක්ෂග්‍රාහී ජනමාධ්‍ය ලෙස ඔවුන් හඳුන්වා දී ඇති අංශ විවේචනය කරමින්, "මාධ්‍යවේදීන්ගේ වෘත්තීමය ගරුත්වය" ආරක්ෂා කිරීමේ සැලසුම් ප්‍රකාශ කරන ලදී.[518]

---

512 "ශ්‍රී ලංකා සංස්කාරක මණ්ඩලයේ වෘත්තීමය චර්යාව පිළිබඳ නීති කෙටුම්පත (චර්යා සංග්‍රහය) ද ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිෂන් සභාව විසින් 2016 දී අනුමත කළේය", https://www.fmmsrilanka.lk/wp-content/uploads/2019/05/2016-Code-of-Professional-Practice_Eng.pdf.

513 "ශ්‍රී ලංකාවේ මාධ්‍යය තුළ ජාතිවාදී හැඳින්වීම් සහ භාෂා භේදය", වෙරිටේ රිසර්ච්.

514 වෙරිටේ මාධ්‍ය (@media'veriteresearch), "2024 ඔක්තෝබර් 23 දින, විදේශීය තානාපති කාර්යාල කිහිපයක් අරුගම්බේ ප්‍රදේශයේ පහරදීමක් සිදුවිය හැකි යන්න පිළිබඳ විශ්වාසදායක තර්ජනයක් හේතුවෙන් ගමන් මාර්ග සළකුණු නිකුත් කළහ. එය 'ඉස්ලාමී ප්‍රහාරයක්' ලෙස හඳුන්වා දුන් සිංහල පුවත්පත් ආදර්ශය කුමක්දැයි දැන ගන්න පිටුව හැරවන්න", 2024 ඔක්තෝබර් 26. https://www.instagram.com/p/DBlpjMrouPv/?utm_source=ig_web_copy_link&igsh=MzRlODBiNWFlZA%3D%3D&img_index=1

515 මොහොමඩ් ෆයිරූස්, සම්මුඛ සාකච්ඡාව.

516 මොහොමඩ් ෆයිරූස්, සම්මුඛ සාකච්ඡාවරී ස්වාධීන මාධ්‍යයට සහය දක්වන ලාභ රහිත ආයතනයක ප්‍රධාන සාමාජිකයෙකු සමඟ අම්මාරා නිලාෆ්දීන් පවත්වූ සම්මුඛ සාකච්ඡාව, 2024 නොවැම්බර් 18.

517 ජාතික ජන බලවේගයේ මැතිවරණ ප්‍රකාශය, සංවර්ධනය වූ ජාතියක්, සිරිලක ජීවිතයක්, (ජා.ජ.බ. ශ්‍රී ලංකාව, 2024 අගෝස්තු), https://www.npp.lk/up/policies/en/npppolicystatement.pdf, 2024 සැප්තැම්බර් 1 දින ප්‍රවේශ වූවකි.

518 දීපංජලි අබේවර්ධන විසින් ප්‍රකාශ කරන ලද්දේ අමන්ථ පෙරේරාගේ "ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික මාධ්‍යය එහි පැරණි දේශපාලන නායකයන් සමගින්ම ඉවත දැමිය හැකි අවදානමකට ලක්වී තිබේ" නමැති ලිපියෙහිදීය.

පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසු, රජය යටතේ පවතින සිලෝන් ලිමිටඩ් පුවත්පත් සමාගම විසින්, එහි පුවත්පත්වල ඉහළ සංස්කාරක තනතුරු සඳහා අලුතින් අයදුම්පත් කැඳවා සිටි බව වාර්තා වේ. අතීතයේදී, මෙම තනතුරු සාමාන්‍යයෙන් දේශපාලන පත්වීම්වලින් පත්වූ ඒවා විය.[519] මීට සමගාමීව, මාධ්‍යවේදීන් විසින් රජය සහ අදාළ කණ්ඩායම් සමග සහයෝගයෙන් කටයුතු කරමින්, නිල මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත් කරන ලෙස ඉල්ලා සිටි බව වාර්තා වේ. වසර ගණනාවක් තිස්සේ, රජයන් විසින් තම ආධාරකරුවන් වෙත, ඔවුන්ගේ මාධ්‍යවේදී තත්ත්වය පවා නොසලකමින් මාධ්‍ය හැඳුනුම්පත් ලබා දීම නිසා මෙම හැඳුනුම්පත්වල විශ්වසනීයත්වය අහිමි වී ඇති බව නිරීක්ෂණය කළ හැකිය.[520]

ආගමික සහ ජනවාර්ගික සුළුතරයන් පිළිබඳ වඩා හොඳ වාර්තාකරණයක් වෙනුවෙන් පෙරමුණ ගන්නා විකල්ප සිංහල මාධ්‍ය ආයතනවල ඉහළ යාම ද ධනාත්මක දෙයක් ලෙස සඳහන් කළ හැකිය.[521] 2019 වර්ෂයේ දී සිංහල ජනමාධ්‍යවේදී තරිඳු ජයවර්ධන විසින් ආරම්භ කරන ලද MediaLK යනු එවැනි ආයතනයක් වන අතර, එමගින් ගවේෂණාත්මක වාර්තාකරණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින්, දූෂණය හා මානව හිමිකම් ගැටලු සහ ජනවාර්ගික-ආගමික සුළුතරයන්ට බලපාන ගැටලු පිළිබඳව කරන සාකච්ඡා ද ඇතුළුව, බොහෝ විට ප්‍රධාන සිංහල මාධ්‍ය විසින් නොසලකා හරින මාතෘකා ආවරණය කරනු ලබයි.[522]

519 අමන්ථ පෙරේරා, "ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික මාධ්‍යය එහි පැරණි දේශපාලන නායකයන් සමගින්ම ඉවත දැමිය හැකි අවදානමකට ලක්වී තිබේ."

520

521 අමන්ථ පෙරේරා, "ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික මාධ්‍යය එහි පැරණි දේශපාලන නායකයන් සමගින්ම ඉවත දැමිය හැකි අවදානමකට ලක්වී තිබේ."

522 නාලක ගුණවර්ධන, සම්මුඛ සාකච්ඡාව.

## ලකුණු රැස් කිරීම සහ RAG ශ්‍රේණිගත කිරීම

සෑම උප දර්ශකයක්ම 1-10 පරිමාණයකින් ශ්‍රේණිගත කර ඇත. එකතු කරන ලද ලකුණු වල සාමාන්‍යය එක් එක් ප්‍රධාන දර්ශකය සඳහා වන ලකුණු සංඛ්‍යාව තීරණය කරයි [වැඩිදුර විස්තර සඳහා 'දර්ශක සහ ලකුණු රැස් කිරීම/පර්යේෂණ ක්‍රමවේදය' පිළිබඳ 2 වන කොටස බලන්න].

මෙම පරිච්ඡේදය මගින් "ප්‍රධාන මාධ්‍යවල ජනවාර්ගික-ආගමික කණ්ඩායම් සහ ගැටලුවල නිරූපණය" සම්බන්ධ දර්ශකයක් සඳහා ඇගයීමක් හෝ ලකුණක් ලබා නොදේ. [වැඩි විස්තර සඳහා 'සීමාවන්/පර්යේෂණ ක්‍රමවේදය' පිළිබඳ 3 වන කොටස බලන්න]

| සූචකය | ලකුණ | තර්කය | RAG ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| **සූචකය 1: ජනවාර්ගික-ආගමික කණ්ඩායමකට එරෙහිව සෘජු ක්‍රියාමාර්ගයන් සඳහා ප්‍රජාවන් එක්රැස් කරන සහ උපදෙස් දෙන සමාජ මාධ්‍ය අන්තර්ගතයන් පිළිබඳ සාක්ෂි** | | | |
| 1. ජනවාර්ගික-ආගමික කණ්ඩායම්වලට එරෙහිව තිබෙන අන්තර්ගතයන්, සැලසුම් කරන ලද ඒවා බවට සාක්ෂි තිබේද? | 6 | 2024 වසර පුරා පළ වූ සමාජ මාධ්‍ය අන්තර්ගතයන් පිළිබඳ සැලකීමේදී, වවුනියාවේ වේදුක්කුනාරි සහ මුලතිව්හි කුරුන්දුරමලයිහි යන ආගමික ස්ථාන සම්බන්ධයෙන් පමණක් ආගමික නිදහස (FoRB) කෙරෙහි බලපාන ලෙස සැලසුම් සහගත වැඩසටහන් තිබූ බව යෝජනා කරයි. | |
| 2. තම ආගමික විශ්වාසයන්ට හෝ අනන්‍යතාවයන් නිසා යම් කණ්ඩායම්වලට හෝ පුද්ගලයින්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය දියත් කිරීමට ආරාධනා කරන ආකාරයේ අන්තර්ගතයන්වලට සාක්ෂි තිබේද? | 5 | ක්‍රිස්තියානි ආගමට මාරු වූ පුද්ගලයින්ට සහ බුදුදහම 'විකෘති' කරන බව සැලකෙන බෞද්ධ දේශකයින්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය දියත් කරන ලෙස දැක්වූ ඇතැම් අන්තර්ගතයන් හඳුනා ගත හැක. ඊට අමතරව, ප්‍රසිද්ධ බෞද්ධ භික්ෂු නමක් වන රාජාංගනේ සද්ධාරතන හිමි ද ඇතුළුව සමාජය තුළින් ජෙරොම් ප්‍රනාන්දු පියතුමාට එරෙහිව ද ප්‍රචණ්ඩත්වය දියත් කරන ලෙස හැඟවෙන අන්තර්ගතයන් දක්නට ලැබිණි. | |
| 3. නීත්‍යානුකූල ආගමික උත්සව හෝ චාරිත්‍රානුකූල එක් රැස්වීම්වලට භෞතික බාධා ඇති කිරීමට දායක වූ අන්තර්ගතයන්වලට සාක්ෂි තිබේද? | 6 | සමාජ මාධ්‍යවල පළ වූ සැලසුම් සහගත අන්තර්ගතයන්, ගැටුම් උත්සන්න කිරීමට, විශේෂයෙන්ම හින්දු භක්තිකයින්ට වවුනියාවේ වේදුක්කුනාරි සිද්ධස්ථානය වන්දනා කිරීමට ඇති ප්‍රවේශයට බලපාන අන්දමින් කටයුතු සිදු වීමට දායක වූවා යැයි හැඟවෙන අවස්ථා ඇත. කෙසේ වෙතත්, මෙම බලපෑමේ නිශ්චිත ප්‍රමාණය අපැහැදිලිය. | |
| 4. ප්‍රචණ්ඩත්වය හෝ ගැටුම්වලට තුඩු දෙන ආකාරයේ අන්තර්ගතයන්වලට සාක්ෂි තිබේද? | 9 | ප්‍රචණ්ඩත්වයට හෝ ගැටුම්වලට තුඩු දෙන ආකාරයේ අන්තර්ගතයන්වලට සාක්ෂි නොමැත. | |

| සූචකය 2: තම ජනවාර්ගික-ආගමික අනන්‍යතාවය පදනම් කර ගෙන පුද්ගලයින් හෝ කණ්ඩායම් ඉලක්ක කරගත් වෛරී ප්‍රකාශ සඳහා සාක්ෂි | | | | |
|---|---|---|---|---|
| 1. | අනර්ථකාරී අදහස් සහිතව ජනවාර්ගික කණ්ඩායමක් සමච්චල් කිරීමට හෝ විවේචනය කිරීමට පළ කරන ලද අන්තර්ගතයන් සඳහා සාක්ෂි තිබේද? | 4 | අපහාසාත්මක භාෂා රටාවක් භාවිතා කරමින්, මුස්ලිම් ප්‍රජාවට එරෙහිව කරන ලද වෛරී ප්‍රකාශවලට [කොටස 2] සහ කතෝලික හා ක්‍රිස්තියානි ප්‍රජාවට එරෙහිව සිදු කරන ලද ප්‍රහාර [කොටස 3] සඳහා සාක්ෂි තිබේ. මෙහිදී මැතිවරණ ප්‍රතිඵල පදනම් කර ගෙන සුළුතර ජනවාර්ගික-ආගමික කණ්ඩායම් වෙත එල්ල වූ වෛරී ප්‍රකාශ [කොටස 6.2] ද සැලකිය යුතුය. | |
| 2. | විශේෂිත ජනවාර්ගික-ආගමික කණ්ඩායමකට අයත් සංස්කෘතික චාරිත්‍ර සහ විශ්වාසයන් අවමානයට ලක් කරන ආකාරයේ අන්තර්ගතයන් සඳහා සාක්ෂි තිබේද? | 5 | ඉස්ලාමීය චාරිත්‍ර සහ භාවිතයන් පදනම් කර ගෙන මුස්ලිම් ප්‍රජාව ඉලක්ක කරගත් වෛරී ප්‍රකාශ සඳහා සාක්ෂි තිබේ [කොටස 2.2]. | |
| 3. | දේශපාලන ප්‍රතිඵල වෙනුවෙන් දේශපාලනික වශයෙන් අභිප්‍රේරණය වූ වෛරී ප්‍රකාශ සඳහා සාක්ෂි තිබේද? | 8 | ප්‍රාදේශීය මට්ටමින් [කොටස 6.1], එවැනි හුදකලා සිදුවීම් වූ බවට වාර්තා ඇත. නමුත් දේශපාලනය නිසා අභිප්‍රේරණය වූ වෛරී ප්‍රකාශ පිළිබඳ වාර්තා වීම්වල සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබේ. | |



# ප්‍රධාන නිර්දේශ

## ආගමික නායකයින්, ආගමික සිද්ධස්ථාන, සහ ආගමික විශ්වාස මත පදනම් වූ සංවිධාන

1. සමාජය තුළ ආගමික දේශකයින් හා ගුරුවරුන් විසින් ඉස්මතු කරන බෙදුම්වාදී හා හානිකර දේශනවලට අභියෝග කරන්න. එවැනි ක්‍රියාවන්වලට විරුද්ධව ආගමික භක්තිකයින්ට කතා කිරීම සඳහා වේදිකා සොයන්න. (සියලු ආගම් හා විශ්වාස)

   - සමාජය තුළ වෙනත් ආගමික සමූහයන් ඉලක්ක කරන හා වෙනස් කොට සැලකීම් හෝ ප්‍රචණ්ඩත්වය ප්‍රවර්ධනය කරන මූලධර්මවාදී ආගමික සංවිධාන වලට මුල් අවස්ථාවේම විරුද්ධ වෙන්න. (සියලු ආගම් හා විශ්වාස)

2. නව උප නිකායන් හෝ නව කණ්ඩායම්ද ඇතුළුව, යම් ආගමක ඇති විවිධ අර්ථකථන සඳහා ප්‍රජාව තුළින්ම ඉවසීම ප්‍රගුණ කරන්න. ආගම මාරු කළ අයට, ආගම මාරු කිරීමට ඇති අයිතියට සහ සංස්කෘතියට සංවේදී ආකාරයකින් තම ආගම ප්‍රචාරණය කිරීම සඳහා සියලුම ආගම්වලට ඇති අයිතිය තහවුරු කරන්න. (සියලු ආගම් හා විශ්වාස)

3. ශබ්ද නියාමනය සහ ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය ඇතුළුව පරිසරයට හා සංස්කෘතියට සංවේදී වෙමින්, එයට ගරු කරමින්, වන්දනාමාන කටයුතු සිදු කරන්න. (සියලු ආගම් හා විශ්වාස)

4. එවැන්ජලික හා ප්‍රධාන ක්‍රිස්තියානි සභාවන් අතර ඇති විය හැකි ගැටුම් විසඳා, අන්‍යෝන්‍ය ගරුත්වය හා අවබෝධය වර්ධනය කිරීම සඳහා කතෝලික/ ක්‍රිස්තියානි සභාවල අභ්‍යයන්තර සහජීවනය ප්‍රවර්ධනය කරන්න. (පුළුල් කතෝලික/ක්‍රිස්තියානි සමාජය)

5. එවැන්ජලික සභාවන් ඉලක්ක කිරීම පිටුපස ඇති සත්‍ය සහ අනුමාන කළ හැකි චේතනා අවබෝධ කර ගැනීම සඳහා ගවේෂණාත්මක අධ්‍යයනයක් සිදු කරන්න. එවැන්ජලික සමාජයට එරෙහිව විශාල වශයෙන් ප්‍රහාර එල්ල වන ප්‍රදේශවල සිටින පූජකයින් හා භක්තිකයින්ගේ හැසිරීම් සමාලෝචනය කරන්න. (එවැන්ජලික සමාජය)

6. සංස්කෘතික වශයෙන් සංවේදී වන්දනා ක්‍රම, සංස්කෘතික වශයෙන් සමජාතීය ප්‍රදේශවල සිද්ධස්ථාන ස්ථාපනය කිරීම සහ ප්‍රචාරණයේ සීමා ගැන එවැන්ජලික පූජකයින් හා භක්තිකයින් වෙනුවෙන් පුහුණුවීම් සංවිධානය කරන්න. (එවැන්ජලික සමාජය).

## ජාත්‍යන්තර ප්‍රජාව

7. බෙදුම්වාදී සහ ජනවාර්ගික කොටස්වලට එරෙහි අදහස්වලට අභියෝග කිරීම සඳහා රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවලට දේශපාලන, සමාජයීය හා ආගමික නායකයින්ව (දමිළ හා මුස්ලිම් ප්‍රජාවන්ගේ නායකයින් ඇතුළුව) යොමු කරන්න.

8. දේශීය ප්‍රජාවන් තුළ බෙදීම් ඇති වීම හා ස්වදේශීය ක්‍රියාකාරීන්ගේ අවදානම වැඩි කරන ඩයස්පෝරා අදහස් හා හැසිරීම් පිළිබඳ ගැටලු පිළිබඳ කතා කිරීම සඳහා මුස්ලිම් හා දමිළ ඩයස්පෝරා ප්‍රජාවන්ද ඇතුළුව ඩයස්පෝරා ප්‍රජාවන් සමග සම්බන්ධ වීමේ අවස්ථා භාවිතා කරන්න.

## රජය

9. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අරමුදල් යෙදවීමේ ක්‍රියාවලිය යළි සමාලෝචනය කර, මෙහෙයුම් පාරදෘශ්‍ය බවත්, දේශපාලනික අරමුණු රහිත බවත් සහ ප්‍රධාන පුරාවිද්‍යා ස්ථාන මග නොහැරෙන ලෙසත් අරමුදල් ක්‍රියාවලිය සකස් කරන්න. අරමුදල් ක්‍රියාවලිය, මුදල් වෙන්කිරීම්, සහ ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම සඳහා ස්වාධීන විශේෂඥයෙකු පත් කිරීම සලකා බලන්න. (බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යංශය / පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව)

10. උරුම කළමනාකරණය පිළිබඳ සිදු කෙරෙන සාකච්ඡා සහ සම්මන්ත්‍රණවලට, සුළුතර ප්‍රජාවන්ට අදාළ වන සිද්ධස්ථාන අයිති ප්‍රදේශද ඇතුළුව, සුළුතර ප්‍රජාව නියෝජනය වන ආකාරයෙන් විශේෂඥයින් දායක කරගන්න. (බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යංශය / පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව).

11. පුරාවිද්‍යා කැණීම් සඳහා උතුරු හා නැගෙනහිර ප්‍රදේශ ඇතුළුව, එම එක් එක් ප්‍රදේශයට අයත් පුරාවිද්‍යාඥයින්, විද්වතුන් සහ ශිෂ්‍යයින් සහභාගී කරගන්න. (බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යංශය / පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව)

12. සුළුතර නිකායන් / නව කණ්ඩායම් ද ඇතුළුව, ආගමික සංවිධානවල නියෝජිතයින් සමග සාකච්ඡා කරමින්, ප්‍රධාන ආගමික නිකායන් තුළ ඇති උප නිකායන්වල පැවැත්ම හා මුහුණ දෙන ගැටලු (විශේෂයෙන්ම තම ඇදහීම් නිසා ප්‍රහාරයට ලක් වෙන සමූහවල) නිසි ලෙස හඳුනා ගන්නා පරිදි බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යංශයට සහ එහි ආගමික දෙපාර්තමේන්තු වෙත ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන්න. (බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යංශය)

13. 2019 පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු මුස්ලිම් සමාජයට එරෙහිව පවතින, ඉස්ලාමීය ග්‍රන්ථ ආනයනය කිරීමේදී මුහුණ දීමට සිදුවන බාධාද ඇතුළු අනෙකුත් සීමා කිරීම් පිළිබඳ සමාලෝචනය කර එවාට විසඳුම් ලබා දෙන්න. (බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යංශය / මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව)

14. සිද්ධස්ථාන ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ඇති නියාමනවල අවශ්‍යතාව නැවත විමසා බලන්න.

- නියාමන හඳුන්වාදෙන්නේ නම්, ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාව සඳහා අධික ලෙස බලපෑමට ලක් වූ ප්‍රජාවන්ද ඇතුළුව සියලුම ආගමික කණ්ඩායම්වල නියෝජිතයින් සමඟ සාකච්ඡා කරමින් එම නියාමන සකස් කරන්න.
- ආගම හෝ සිද්ධස්ථානයේ තත්ත්වය යනාදිය නොසලකා, සෑම සිද්ධස්ථානයකටම සමාන ලෙස බලාත්මක වන පරිදි පැහැදිලි උපදෙස් සහිතව එම නියාමන ප්‍රකාශයට පත් කරන්න.
- නියාමන හඳුන්වාදෙන්නේ නම්, එවා මහජනතාවට පැහැදිලිව ඉදිරිපත් කර ඔවුන් හට එවාට අනුගත වීමට ප්‍රමාණවත් තරම් කාලය හා අවස්ථාව ලබා දෙන්න. (බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යංශය)

15. මානව හිමිකම් කොමිෂන් සභාවේ (SLHRC) ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස (FoRB) පිළිබඳ ලබා දී නිර්දේශ සහ රාජ්‍ය නිලධාරීන් සඳහා දී ඇති මාර්ගෝපදේශවලට අවශ්‍ය සහය ලබා දෙන්න.

- ICCPR (ජාත්‍යන්තර සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය) අදාළ කරගැනීමේදී අනුගමනය කරන ලෙස මානව හිමිකම් කොමිෂන් සභාව ලබා දුන් නිර්දේශ නැවත විමසා බලමින්, පොලිස් නිලධාරීන්ට නීතිය සුදුසු පරිදි භාවිතා කිරීම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතා ලබා දෙන්න. (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව)

16. නීතිය හා සාමය පවත්වාගැනීම සඳහා වන රජයේ කාර්යභාරයට අනුකූලව, බලධාරීන් විසින් සමාජ ගැටුම් විසඳීමේදී නිරපේක්ෂ හා අපක්ෂපාතී ලෙස ක්‍රියා කරන බවට සහතික වෙන්න. ජාතික උරුම සහිත ස්ථාන සම්බන්ධයෙන් ඇති නියාමන හා අධිකරණ නියෝග, සමාන හා අපක්ෂපාතී ලෙස බලාත්මක කිරීමද මෙයට ඇතුළත් වේ. (මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය)

## සිවිල් සමාජය

17. අන්තර්-ආගමික හා සහජීවන ක්‍රියාන්විතයන් ප්‍රවර්ධනය කරමින් සහ ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස (FoRB) දේශීය හා ජාත්‍යන්තර ආරක්ෂාව කෙරෙහි අවධානය යොමු කරමින් පුහුණු වැඩසටහන් සංවිධානය කරන්න. විශේෂයෙනම ප්‍රචාරණය, ආගම් මාරු කිරීම, ආගමික ප්‍රකාශන සීමා, සහ පොදු සම්පත් වලට ඇති ප්‍රවේශය පිළිබඳ නීති ද එයට ඇතුළත් කරන්න.

18. දිවයින පුරා ඇති ආගමික සිද්ධස්ථානවල පැවැත්ම (උතුරු-නැගෙනහිරෙන් පිටත ප්‍රදේශද ඇතුළුව) පිළිබඳ සාක්ෂි සහිත පර්යේෂණ හා විශ්ලේෂණ ආරම්භ කිරීම ගැන සලකා බලන්න.

19. ජනවාර්ගික-ආගමික ගැටලුවලට තුඩුදෙන හින්දු ආගමික කණ්ඩායම් සහ එවැන්ජලික කණ්ඩායම් අතර අර්බුද ඇති ඇති වන්නේ යැයි කියැවෙන මධ්‍යම පළාතේ පර්යේෂණ සිදු කිරීම පිළිබඳ සලකා බලන්න. එසේම, දකුණේ එවැන්ජලික කණ්ඩායම් සහ මුල් ආගමික කණ්ඩායම් අතර ගැටුම් වැඩි වශයෙන් පවතින ප්‍රදේශවල ප්‍රධාන ප්‍රවණතා අවබෝධ කර ගැනීම සඳහා සාක්ෂි සහිත පර්යේෂණ සිදු කරන්න.

20. ජනවාර්ගික-ආගමික කණ්ඩායම් පිළිබඳ වාර්තාකරණය සම්බන්ධ පූර්ව මගපෙන්වීම් සහ පොත් පත් (ශ්‍රී ලංකා සංස්කාරක සංගමය විසින් සකස් කරන ලද ඒවාද ඇතුළුව) මහජනතාව සමඟ බෙදාගැනීමට අවස්ථා නිර්මාණය කරන්න. මෙය ප්‍රවෘත්ති වගකීම් සහගත ලෙස භාර ගැනීම, ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වැනි ආයතන සමඟ සහයෝගීතාව ඇති කර ගැනීම, සහ වගකීම් විරහිත හානිකර වාර්තාකරණය වළක්වා ගැනීමට උපකාරී විය හැක.



# ඇමුණුම 1

RTI 04

## Decision to Provide Information

Registration Number of the Request – ARCH/INFO/281
Date Request Received – 15th November 2024
Name of the Public Authority – Ms. jovita Arulanantham

1. This is to inform you that in accordance with section 25 (1) of the act we have decide to provide you with the information/part of the information requested by you through application dated **15th November 2024** with the registration number of **ARCH/INFO/281** (in case if the decision is to provide only part of the information, The information should clarified the reasons in detail and under which clause/s of the section 5 the exception was made)

   **I am kindly submitting herewith the information sent by the Excavation Division of the Department of Archaeology. I will send if I get any other information as soon as I receive them.**

2. ~~We have decided to withhold the following parts of the requested information because they are considered as exempted information under the section 5 (..................) of the RTI act due to the detailed reasons given below ........................................................................~~

3. In order to provide the Information please pay the necessary fee of **Rs. 00.00** by cash, bank draft or pay order or postal order or postage stamps to our office.

4. We will provide you with the information within 14 days of payment of the required fee. We will also inform you within the same period (with reasons) if there is any extension needed to the time period in which to provide the information.

5. If you have not satisfied with the time frame mention in the section 04 you may submit and appeal to the designated officer within two weeks by RTI 10 form. Name and address of the designated officer is given below.

Designated Officer

Name – [redacted]
Designation – [redacted]
Address – [redacted]
Contact details – [redacted]

Date- 2024/12/12

Yours,
Faithfully,

.............................................
Information Officer
(Sign, Name & Designation)

[redacted]
Acting Director (Promotions)
Department of Archaeology
Sir Marcus Fernando Mawatha,
Colombo - 07.

RTI 04

## තොරතුරු සැපයීමට ගත් තීරණය

තොරතුරු ඉල්ලීමේ ලියාපදිංචි අංකය - ARCH/INFO/281
තොරතුරු ඉල්ලීම ලැබුණු දිනය - 2024 නොවැම්බර් 15
පොදු අධිකාරියේ නම - ජොචිටා අරුලනන්තම් මෙය

1. පනතේ 25(1) වගන්තියට අනුව, 2024 නොවැම්බර් 15 දින ඉදිරිපත් කරන ලද ලියාපදිංචි අංක ARCH/INFO/281 ඉල්ලීම පරිදි / අයදුම්පත හරහා ඔබ විසින් ඉල්ලා සිටින ලද තොරතුරු/ තොරතුරු වල කොටසක් ඔබ වෙත සැපයීමට අපි තීරණය කර ඇති බව ඔබට දැනුම් දීමට කැමැත්තෙමු. (යම් හෙයකින් තොරතුරු වලින් කොටසක් පමණක් ලබා දීමට තීරණය කරන්නේ නම්, තොරතුරු ලබා නොදීමට හේතු විස්තරාත්මකව පැහැදිලි කළ යුතු අතර, ඒවා 5 වන වගන්තියේ කුමන උප වගන්තිය/ වගන්ති යටතේ සිදු කල ව්‍යතිරේකය ද යන්න පැහැදිලි කර යුතුය.)

   **පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කැණීම් අංශය විසින් එවන ලද තොරතුරු කාරුණිකව මේ සමඟ ඉදිරිපත් කරමි. වෙනත් තොරතුරු මා වෙත ලැබුනහොත්, එවා ලැබුනු වහාම ඔබ වෙත ලබා දීමට කටයුතු කරන්නෙමි.**

2. ~~පහත දක්වා ඇති සවිස්තරාත්මක හේතුන් නිසාවෙන්, ඔබ විසින් ඉල්ලා සිටින ලද තොරතුරුවල පහත සඳහන් කොටස් තොරතුරු දැනගැනීමේ පනතේ 5 වන වගන්තියෙන් මුක්ත කල තොරතුරු ලෙස සලකනු ලබන බැවින් ඒවා ලබා දිම අත්හිටුවීමට/ ලබා නොදීමට අපි තීරණය කර ඇත්තෙමු.~~

3. තොරතුරු ලබා දීම සඳහා කරුණාකර අවශ්‍ය ගාස්තුව වන රු. 00.00 ක් මුදල, මුදල් නෝට්ටු, බැංකු අණකරයක් මගින්, ගෙවීම් ඇණවුමක්, තැපැල් ඇණවුමක් හෝ තැපැල් මුද්දර මගින් අපගේ කාර්යාලයට ගෙවිය යුතු ය.

4. අදාල ගාස්තුව ගෙවා දින 14ක් ඇතුළත අප විසින් ඔබට තොරතුරු ලබා දෙනු ඇත. තොරතුරු ලබා දීමට ගතවන කාලය දීර්ඝ කිරීමට අවශ්‍ය නම්, එම කාල සීමාව තුළම අපි ඔබට ඒ පිළිබඳව (හේතු සහිතව) දන්වන්නෙමු.

5. 04 වන වගන්තියේ සඳහන් කාල රාමුව පිළිබඳව ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, ඔබට සති දෙකක් ඇතුළත RTI 10 පෝරමය මගින් නම් කරන ලද නිලධාරියා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. නම් කරන ලද නිලධාරියාගේ නම සහ ලිපිනය පහත දක්වා ඇත

නම් කරන ලද නිලධාරියා

නම : (විස්තරය මකා / පාරාන්ධ කර තිබේ)
තනතුර : (විස්තරය මකා / පාරාන්ධ කර තිබේ)
ලිපිනය : (විස්තරය මකා / පාරාන්ධ කර තිබේ)
සම්බන්ධතා විස්තර : (විස්තරය මකා/පාරාන්ධ කර තිබේ)

දිනය 2024/12/12

ඔබගේ,
විශ්වාසී,
(අත්සන තබා ඇත)
තොරතුරු නිලධාරි
(අත්සන, නම සහ තනතුර)

(විස්තරය මකා / පාරාන්ධ කර තිබේ)
වැඩ බලන අධ්‍යක්ෂ (ප්‍රවර්ධන)
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
සර් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ - 07.

24/31/2

04/DEC 2024

File No: D.Arch/HO/Exc/06/07
Assistant Director (Excavation)

2024.12.03

Director (Promotion)

**Providing information under 24(3) of the Right to Information Act No. 12 of 2016**

The letterNo ARCH/INFO/281, dated 15.11.2024requested information about the excavation activities requested by the applicant under No. 5 is attached to this letter.

**As a government department, the Department of Archaeology of Sri Lanka does not carry out excavation work based on religion, ethnicity or other specialities, and only archaeological heritage sites are subjected to excavation work.**

Section 11 of Amendment No. 24 of 1998 relating to the Antiquities Act, of 1940 defines it as follows:

> *"Archaeological heritage" means that part of the material heritage of mankind in respect of which archaeological methods provide primary information and includes all vestiges of human existence and places relating to all manifestations of human activity abandoned structures and remains of all kinds (including subterranean and underwater sites), together with all the portable cultural material associated with them:..."*

Considering the number of archaeological heritage sites in Sri Lanka, the amount allocated annually to the Sri Lanka Department of Archaeology is not sufficient for the necessary excavations. As a result, excavations are carried out by the Sri Lanka Department of Archaeology with external provisions, and the majority of the excavations indicated in this list were accomplished in this manner.

I am kindly informed that if any party needs to carry out excavations in archaeological heritage sites on external provision, after a field test, the relevant estimates will be given to the concerned party and the relevant excavation work will be carried out according to regulations of the Department of Archaeology.

[redacted]

( 2024 දෙසැ 04 දින යෙදූ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ
ප්‍රවර්ධන අංශයේ මුද්‍රාව තබා තිබේ.)

ගොනු අංකය :D. Arch/HO/EXC/06/07
සහකාර අධ්‍යක්ෂ (කැණීම්)
2024.12.03

අධ්‍යක්ෂ (ප්‍රවර්ධන)

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ 24(3) වගන්තිය යටතේ තොරතුරු සැපයීම

අයදුම්කරු විසින් අංක 5 යටතේ, කැණීම් කටයුතු පිළිබඳ තොරතුරු ඉල්ලා සිටිමින් ඉදිරිපත් කරන ලද 2024.11.15 දිනැති අංක ARCH/INFO/281 දරන ලිපිය මෙම ලිපියට අමුණා ඇත.

**ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව රජයේ දෙපාර්තමේන්තුවක් ලෙස, ආගම, ජනවාර්ගිකත්වය හෝ වෙනත් විශේෂතා මත පදනම්ව කැණීම් කටයුතු සිදු නොකරන අතර පුරාවිද්‍යාත්මක උරුම ස්ථාන පමණක් කැණීම් කටයුතුවලට භාජනය කරනු ලබයි.**

1998 අංක 24 දරණ පනතින් සංශෝධිත 1940 පුරාවස්තු පනතේ 11 වන වගන්තිය මඟින් පහත එය පරිදි අර්ථ දක්වා ඇත

> "පුරාවිද්‍යාත්මක උරුමය" යන්නෙන්, මනුෂ්‍ය වර්ගයාගේ භෞතික උරුමයේ යම් කොටසක් පිළිබඳ ප්‍රාථමික තොරතුරු පුරා විද්‍යාත්මක ක්‍රමවලින් සැපයෙන්නේ ද ඒ කොටස අදහස් වන අතර ඊට මානව පැවැත්මේ සියලු ශේෂ ලාංඡන, සහ මානව ක්‍රියාකාරීත්වයේ සියලු ලක්ෂණ වලට අදාළ ස්ථාන ද අත්හැර දමන ලද ව්‍යුහය ද (පොළොව යට හා දිය යට ස්ථාන ද ඇතුළුව) සියලු වර්ගවල නෂ්ටාවශේෂ සහ ඒවා ආශ්‍රිත පහසුවෙන් ගෙන යා හැකි සියලු සංස්කෘතික ද්‍රව්‍ය ද ඇතුළත් වේ."

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුම ස්ථාන ගණන සලකා බලන විට, ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට වාර්ෂිකව වෙන් කරන ලද මුදල අවශ්‍ය කැණීම් සඳහා ප්‍රමාණවත් නොවේ. එහි ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් බාහිර ප්‍රතිපාදන සහිතව කැණීම් සිදු කරනු ලබන අතර මෙම ලැයිස්තුවේ දක්වා ඇති කැණීම්වලින් බහුතරයක් මේ ආකාරයෙන් සිදු කරන ලදී.

කිසියම් පාර්ශවයකට බාහිර ප්‍රතිපාදන මත පුරාවිද්‍යාත්මක උරුම ස්ථානවල කැණීම් සිදු කිරීමට අවශ්‍ය නම්, ක්ෂේත්‍ර පරීක්ෂණයකින් පසු, අදාළ ඇස්තමේන්තු අදාළ පාර්ශවයට ලබා දෙන අතර අදාළ කැණීම් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලට අනුව සිදු කරනු ලබන බව කරුණාවෙන් දන්වා සිටිමි.

(අත්සන් තබා ඇත.)
(විස්තරය මකා / පාරාන්ධ කර තිබේ)
සහකාර අධ්‍යක්ෂ (කැණීම්)

## 2023 - Excavation List

| | Name of the Project | Provision Type | District | Province | Excavation Period |
|---|---|---|---|---|---|
| 01 | Pabbatharama Sapumalgaskada Excavation , East Enrance | External Provision | Wauniya | North | |
| 02 | Excavation of Stupa & Maluwa of Dathusena R.M.V | | Kurunegala | North West | |
| 03 | Rajanganaya - No 06 Sudarshana Stupa Excavation | External Provision | Anuradhapura | North Central | |
| 04 | Kegalle Rockhill Test Excavation | External Provision | Kegalle | Sabaragamuwa | |
| 05 | Papiliyana Sunethradevi Purana Viharaya Excavation | External Provision | Colombo | Western | April - May |
| 06 | Samangala Stupa Excavation | External Provision | Ampara | East | February - December |
| 07 | Deegavapiya Stupa Excavation | External Provision | Ampara | East | October - December |
| 08 | Dehiwatta Mandalagiri Vihara Stupa | External Provision | Trincomalee | East | October - December |
| 09 | Happoruwa Raja Maha Viharaya Stupa Excavation | External Provision | Monaragala | Uva | |
| 10 | Mihinthale Anulathisa Stupa Excavation | External Provision | Anuradhapura | North Central | |
| 11 | Sapumalgaskada pabbatharamaya Excavation | External Provision | Wauniya | North | |
| 12 | Kuragala Research Excavation | Department Provision | Rathnapura | Sabaragamuva | |
| 13 | Mahagal Kanda Old Road Excavation | Department Provision | Western | Kaluthara | |

## 2023 - කැණීම් ලැයිස්තුව

| | ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන වර්ගය | දිස්ත්‍රික්කය | පළාත් | කැණීම් කාලය |
|---|---|---|---|---|---|
| 01 | පබ්බතාරාම සපුමල්ගස්කඩ කැණීම, නැගෙනහිර පිවිසුම | බාහිර ප්‍රතිපාදන | වවුනියාව | උතුර | |
| 02 | ධාතුසේන ආර්.එම්.වී. ස්තූපය සහ මළුව කැණීම | | කුරුණෑගල | වයඹ | |
| 03 | රාජාංගනය - අංක 06 සුදර්ශන ස්තූපයේ කැණීම | බාහිර ප්‍රතිපාදන | අනුරාධපුරය | උතුරු මැද | |
| 04 | කෑගල්ල රොක්හිල් පර්යේෂණ කැණීම් | බාහිර ප්‍රතිපාදන | කෑගල්ල | සබරගමුව | |
| 05 | පැපිලියාන සුනේත්‍රාදේවි පුරාණ විහාරය කැණීම | බාහිර ප්‍රතිපාදන | කොළඹ | බස්නාහිර | අප්‍රේල් - මැයි |
| 06 | සමන්ගල ස්ථූපයේ කැණීම | බාහිර ප්‍රතිපාදන | අම්පාර | නැගෙනහිර | පෙබරවාරි - දෙසැම්බර් |
| 07 | දීඝවාපිය ස්තූපය කැණීම | බාහිර ප්‍රතිපාදන | අම්පාර | නැගෙනහිර | ඔක්තෝබර් - දෙසැම්බර් |
| 08 | දෙහිවත්ත මණ්ඩලගිරි විහාර ස්තූපය | බාහිර ප්‍රතිපාදන | ත්‍රිකුණාමලය | නැගෙනහිර | ඔක්තෝබර් - දෙසැම්බර් |
| 09 | හප්පෝරුව රජ මහා විහාර ස්තූපය කැණීම | බාහිර ප්‍රතිපාදන | මොනරාගල | ඌව | |
| 10 | මිහින්තලා අනුලතිසා ස්ථූපය | බාහිර ප්‍රතිපාදන | අනුරාධපුරය | උතුරු මැද | |
| 11 | සපුමල්ගස්කඩ පබ්බතාරාමය කැණීම | බාහිර ප්‍රතිපාදන | වවුනියාව | උතුර | |
| 12 | කුරගල පර්යේෂණ කැණීම | දෙපාර්තමේන්තු ප්‍රතිපාදන | රත්නපුරය | සබරගමුව | |
| 13 | මහගල් කන්ද පැර පාර කැණීම | දෙපාර්තමේන්තු ප්‍රතිපාදන | බස්නාහිර | කළුතර | |

## 2024 - Excavation List

| | Name of the Project | Provision Type | District | Province | Excavation Period |
|---|---|---|---|---|---|
| 01 | Bandarawela Pre Historic Sites Excavation | External Provision | Badulla | Uva | January - December |
| 02 | Nagadeepa, Image House Excavation | External Provision | Badulla | Uva | January - December |
| 03 | Weerakatiya Ovagiriya Rajamaha Viharaya ruins | External Provision | Hambanthota | South | January - December |
| 04 | Dambulla, Eraulla, AIA | External Provision | Matale | Central | February - March |
| 05 | Dedarangamuwa Old Ruins | Department Provision | Rathnapura | Sabaragamuva | January-May |
| 06 | Seethawaka Rajasinghe Palace & Datch Foteress | Department Provision | Kegalle | Sabaragamuwa | January-November |
| 07 | Deegavapiya Oluwill road Excavation | Department Provision | Ampara | East | February - April |
| 08 | Alankulama Test Excavation | Department Provision | Ampara | East | February - December |
| 09 | Excavaton Of Deegawapiya Stupa Maluwa | Department Provision | Ampara | East | March - December |
| 10 | Colombo fort Baternburg Rampart | External Provision | Colombo | West | June - June |
| 11 | Samangala Stupa Maluwa Excavation | External Provision | Ampara | East | |
| 12 | Vessagiriya Archaeological Site | Department Provision | Anuradhapura | North Central | October - November |
| 13 | Public toilet Complex - AIA | External Provision | Galle/Matara | | |
| 14 | Rockhillwatta, Private land (AIA) Excavation | External Provision | Kegalle | Sabaragamuwa | August - December |
| 15 | Galewala Pathkolagolla Stupa Excavation | External Provision | Matale | Central | |
| 16 | Asha Mineral Test Excavation | External Provision | Kurunagala | North West | |
| 17 | Punchi Halmillawa Kirimatiyava Excavation | Department Provision | Anuradhapura | North Central | |

| 2024 - කැණීම් ලැයිස්තුව | | | | | |
|---|---|---|---|---|---|
| | ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන වර්ගය | දිස්ත්‍රික්කය | පළාත් | කැණීම් කාලය |
| 01 | බණ්ඩාරවෙල ප්‍රාග් ඓතිහාසික ස්ථානයේ කැණීම | බාහිර ප්‍රතිපාදන | බදුල්ල | ඌව | ජනවාරි - දෙසැම්බර් |
| 02 | නාගදීප, ප්‍රතිමාඝරය කණීම | බාහිර ප්‍රතිපාදන | බදුල්ල | ඌව | ජනවාරි - දෙසැම්බර් |
| 03 | වීරකැටිය ඕවගිරිය රජමහ විහාරයේ නටබුන් | බාහිර ප්‍රතිපාදන | හම්බන්තොට | දකුණ | ජනවාරි - දෙසැම්බර් |
| 04 | දඹුල්ල, එරාවුල්ල, AIA | බාහිර ප්‍රතිපාදන | මාතලේ | මධ්‍යම | පෙබරවාරි - මාර්තු |
| 05 | දෙදරන්ගමුව පැරණි නටබුන් | දෙපාර්තමේන්තු ප්‍රතිපාදන | රත්නපුරය | සබරගමුව | ජනවාරි - මැයි |
| 06 | සීතාවක රාජසිංහ මාලිගය සහ ලන්දේසි බලකොටුව | දෙපාර්තමේන්තු ප්‍රතිපාදන | කෑගල්ල | සබරගමුව | ජනවාරි - නොවැම්බර් |
| 07 | දීඝවාපිය ඔලුවිල් මාර්ගය කැණීම් | දෙපාර්තමේන්තු ප්‍රතිපාදන | අම්පාර | නැගෙනහිර | පෙබරවාරි - අප්‍රේල් |
| 08 | ආලන්කුලම පර්යේෂණ කැණීම | දෙපාර්තමේන්තු ප්‍රතිපාදන | අම්පාර | නැගෙනහිර | පෙබරවාරි - දෙසැම්බර් |
| 09 | දීඝවාපිය ස්ථූපයේ මළුව කැණීම | දෙපාර්තමේන්තු ප්‍රතිපාදන | අම්පාර | නැගෙනහිර | මාර්තු - දෙසැම්බර් |
| 10 | කොළඹ කොටුව බැටරන්බර්ග් බැම්ම | බාහිර ප්‍රතිපාදන | කොළඹ | බස්නාහිර | ජුනි - ජුනි |
| 11 | සමන්ගල ස්තූප මළුව කැණීම | බාහිර ප්‍රතිපාදන | අම්පාර | නැගෙනහිර | |
| 12 | වෙස්සගිරිය පුරාවිද්‍යා ස්ථානය | දෙපාර්තමේන්තු ප්‍රතිපාදන | අනුරාධපුර | උතුරු මැද | ඔක්තෝම්බර් - නොවැම්බර් |
| 13 | පොදු වැසිකිළි සංකීර්ණය AIA | බාහිර ප්‍රතිපාදන | ගාල්ල/මාතර | | |
| 14 | රොක්හිල්වත්ත, පෞද්ගලික ඉඩම (AIA) කැණීම | බාහිර ප්‍රතිපාදන | කෑගල්ල | සබරගමුව | අගෝස්තු - දෙසැම්බර් |
| 15 | ගලේවල පත්කොලගොල්ල ස්ථූපය කැණීම් | බාහිර ප්‍රතිපාදන | මාතලේ | මධ්‍යම | |
| 16 | ආශා බනිජ පර්යේෂණ කැණීම් | බාහිර ප්‍රතිපාදන | කුරුණෑගල | වයඹ | |
| 17 | පුන්චි හල්මිලෑව කිරිමැටියාව කැණීම් | බාහිර ප්‍රතිපාදන | අනුරාධපුර | උතුරු මැද | |